# ප්‍රබන්ධොපදෙශය

මුනිදස කුමාරණතුංගයන්

විසිනි.

කොළඹ,

පහන් පහරෙහි

මුද්‍රිත යි

2482

# හැඳින්වීම

සිංහල පාඨශාලාවලැ ඉතා අඩු සැලැකිල්ල ලැබෙන ඉගැන්වීමෙක් වේ නම් පැබැඳීම යි. එය ඉගැන්වීමක් නැති වැ මැ කළ හැක්කෙකැ යි බොහෝ ශික්ෂකයෝ සිතති. ශිෂ්‍යයන් එ සේ සිතුව වරදෙක් ද? හැම අතින් මැ වරදට හෙතු වනුයේ අනෙකෙකි. එ නම් ගුරු නම් ගැනීමට මේ තාක් පොතක් නැති වීම යි. ඒ පාඩුව හැකි පමණින් පිරිමසනු සඳහා යැ මේ පොත සැපැයුණේ.

බොහෝ පාඨශාලාවලැ පැබැඳුම් දුට සිනා උපදී. කුමක් ගැනැ කළ ද පබඳ අග මුල සමාන යැ. සියල්ල පටන් ගැනෙනුයේ මෙ ලොවිනි. කෙළවර වනුයේ පර ලොවිනි. එ නම් පටන් ගත් ලොවට ඉඳුරු වෙනස් වූ ලොවෙකිනි. 'මේ ලොකයෙහි මනුෂ්‍යයනට ප්‍රයොජනවත් වන්නා වූ නොයෙක් ගස් වගී තිබේ. එයින් ඉතා ප්‍රයොජන වත් ගස නම් පොල් ගස ය.' මේ පටන් ගැන්ම යි. කොස් ගස ගත ද පටන් ගැන්ම මෙ මැ යැ. වෙනස් වත් හොත් ගසේ නම පමණෙකි. ගස් ගැනැ එ සේ මැ වේ වා, සතකු ගැනැ වුව ද පතක් පොතක් ගැනැ වුව ද ගඟක් කන්දක් ගැනැ වුව ද මෙ සේ මැ ඇරැඹෙන පබඳ කැරේ නම් කො තරම් විනොද-යට හේතුවෙක් ද? පාඨශාලා ලොකයෙහි යම්තම් ලියුමක් ගළපා ගත හැක්කකු සොයා ගැන්ම පහසු නො වේ යැ යි කියන්නේ කවර හෙයින් ද යනු දැන් පැහැදිලි වියැ යුතු යි.

කො පමණ මහත් ගණනක් ශාස්ත්‍ර මාත්‍රකා දත ද අදහස් නිරාකුල ලෙස රසවත් ලෙස බලවත් ලෙස වදිනා ලෙස පැවැසීමේ ශක්තිය නැත්තේ ශාස්ත්‍ර ලොකයෙහි අත්‍යන්ත ප්‍රමාණයේ දුබලයෙකි. එ හෙයින් ශික්ෂකයෙක් වේ වා, ශිෂ්‍යයෙක් වේ වා, ඉතා මහත් උත්සාහයක් කළ යුත්තේ ප්‍රබන්ධනයෙහි ශක්තිය වඩා ගැන්මට යැ. වහලක් නැති වැ එය කළ හැක්කෝ විරලයෝ යැ. මාත්‍රකාව පමණක් ලැබුණු කලැ උඩ බැලියැ හැකි, බිම බැලියැ-

හැකි, කාලය අවසන් වන්නට ලං වූ විටැ යම් කිසි ප්‍රලාපයක් ලියා සුසුමක් හෙළා ගෙදර බලා ගිය හැකි. සෙවරි වැ ප්‍රබන්ධයක් කිරීමේ විශේෂෝපදේශ ලැබුණෙහොත් කරුණු මෙයට ඉදුරා වෙනස් වන්නේ යැ. මේ පොත එ බදු උපදේශාංශුවක් දෙති යි සිතම් හ.

ඇතැම් ශික්ෂකයෝ තමනට හැකි පමණින් ප්‍රබන්ධයක් තනා එය දරුවනට දී 'මෙ සේ ලියව' යි අණ කෙරෙති. අප පරීක්ෂක කම් කරද්දී එක් පාඨශාලාවෙකැ අවසාන වර්ගයේ ශිෂ්‍යයෝ, දුන් මාතෘකා පසකට ලා, ඔවුනට රිසියුණු අන්‍ය මාතෘකාවක් යට ප්‍රබන්ධයක් කළෝ යැ. අපි ඇස් උඩට හරවා මුව අයා හුස්ම නවත්වා සිටියම්හ 'මා ඊයේ මෙය ලියා නො දෙන්නට මේ ටිකවත් නො කරන්නාහ' යි ප්‍රධාන ශික්ෂකයාණෝ මහත් උදර ලීලායෙන් කී හ. මේ නම් දීර්ඝ ප්‍රබන්ධයකට ප්‍රමාණ වන ප්‍රවෘත්තියෙකි.

ශික්ෂක වරයන් අයදුම් හ. ශිෂ්‍යයනට වැඩක් මැ සිදුවන සේ සැලැකුව මැනැවි. සෙවරි භාවය මනුෂ්‍යත්වයේ පරමොච්ච භාගය යි. ප්‍රබන්ධය තරම් එය දක්වියැ යුතු අන්‍ය ස්ථානයෙක් නැත්තේ යැ. එහි ලා සෙවරි වන්නට ශිෂ්‍යයන් පුරුදු කළ මැනැවි. ප්‍රබන්ධ මාතෘකාව ශිෂ්‍ය වර්ගයා මධ්‍යයෙහි හෙළා තළා අඹරා සුනු කොට විමසන සේ යෙදියැ යුතු යැ. ඉන් පසු තත්ත්වය වටහා ගත් ශිෂ්‍යයෝ තමතමන් ගේ ශක්ති ප්‍රමාණයෙන් අභිනව ප්‍රබන්ධයක් කෙරෙත් වා. එයට ඔබ ගේ අනුග්‍රහය මෑනුව මැනැවි.

මේ ග්‍රන්ථයට දීර්ඝ සංඥෙපනයක් අවශ්‍ය නො වේ. කළ යුතු දෑ පොත පවසයි. එයට අනුකූල නුවූව ද වරදෙක් නො වේ. තමා ගේ බුද්ධිය වැඩියක් කිරීමට පොහොසත් නම් එයට මැ ඉඩ දුන යෙහෙකි.

මුනිදාස කුමාරණතුංග

2482 වප් අව 14
පාණදුරේ පල්ලිමුල්ලේ දී යැ.

# පටුන


| | | පිට |
|---|---|---|
| 1. | ප්‍රබන්ධ වස්තුව | 1 |
| 2. | සන්ධිය | 43 |
| 3. | ඡේදය | 48 |
| 4 | වාක්‍යය | 58 |
| 5. | දෝෂාපහරණය | 75 |
| 6. | රසාවෙෂණය | 88 |
| 7. | රීත්‍යනුගමනය | 93 |
| 8. | අලඞ්කරණය | 97 |
| 9. | ප්‍රබන්ධාභ්‍යාසය | 133 |
| 10. | වින්‍යාසාභ්‍යාසය | 202 |
| 11. | උක්තශීර්ණාභ්‍යාසය | 213 |

# ප්‍රබන්ධ සඞ්ග්‍රහය

---

ප්‍රබන්ධොපදෙශයේ වින්‍යාස කළ සියලු මාතෘකා සම්පූර්ණ ප්‍රබන්ධ රූපයෙන් එයි. අවින්‍යස්ත මාතෘකාවලැ වින්‍යාසය පළ වෙයි. විසිතුරු කථා, විස්මයජනක විවරණ, ප්‍රබෝධකර විචාරණ, චමත්කාර ජනක කල්පන ආදියෙන් පරිපූර්ණ යි. සියලු ගැට ලිහා ලයි.

**මිල රුපියල් 2 යි.**

ලබන (1938 නොවැම්බර) මසැ 25 වනදට පෙරැ ඉල්ලන්නවුනට රු. 1 යි.

මුදල් නො එවන්නැ. මේ 'කූපන' පුරවා එවන්නැ.

කොළොඹ 1 වන මරදානේ 115,
පහන් පහරට යැ.

ප්‍රබන්ධ සඞ්ග්‍රහයෙන් රුපියල ගණනේ පිටපත් ............ක් මට වෙන් කළ මැනැවි.

අස්සන : ........................................................

තැපැල් : ........................................................

නිවෙස : ........................................................

නගතුර: ........................................................

නම : ........................................................

# ප්‍රබන්ධොපදේශය

## 1. ප්‍රබන්ධ වස්තුව

අදහස් ප්‍රකාශ කිරීම සමාජ ජීවිතයෙහි ඉතා උත්තම කාර්‍යයෙකි. දන්නවුන් ගේ දැනුම් දැන, නො දත්තෝ ද දත්තෝ වෙති. සමාජය ගුණඥතාදි උත්තම මනුෂ්‍ය ධර්මයෙන් වැඩෙනුයේ ඒ මඟිනි. අධ්‍යාපනයේ උසස් මැ අභිලාෂයක් නම් ශිෂ්‍යයා ගේ අදහස් සෙස්සවුනට ඉදුරා පවසන්නට පුරුදු කිරීම යි.

පැවැසීමේ ප්‍රධාන ක්‍රම දෙකෙකි. එකෙක් කීම යි. අනෙක ලියා දැක්වීම යි. එක් කාරණයක් අරමුණු කොටැ ගෙනැ ඒ පිළිබඳ වැ දැන්වියැ යුතු සියල්ල පිඬු කොටැ ගෙනැ පිළිවෙළකට සකස් කොටැ, දන්වන්නහු ගේ ද දැන්වෙන්නවුන් ගේ ද ශක්තියට අනුරූප වන සේ කියා හෝ ලියා හෝ පාති. කියා පාන කලැ එයට දේශනාවෙකැ යි ද, ලියා පාන කලැ ප්‍රබන්ධයෙකැ යි ද කියත්. සත්‍ය වශයෙන් නම් දෙ තන්හි මැ වනුයේ එක මැ ප්‍රබන්ධය යි. වෙනස් වනුයේ ඒ ප්‍රබන්ධය ප්‍රකාශ කිරීමේ ක්‍රමය පමණෙකි.

'ප්‍ර' යන උපසර්ගය යැ 'බන්ධ' යන්න යැ යන දෙක එක් වැ 'ප්‍රබන්ධ' යනු නිපන්නේ යැ. 'උසස් ලෙස' යනු යැ 'ප්‍ර' උපසර්ගයේ අර්ථය. 'බන්ධ' යනු 'බඳනා ලද' යන අර්ථ ඇත්තේ යැ. එ හෙයින් ප්‍රබන්ධයෙක් නම් උසස් කොටැ බඳනා ලද්දෙකි.

කිමෙක් බඳනා ලැබේ ද?
කෙසේ බඳනා ලැබේ ද?
කෙසේ උසස් කරනු ලැබේ ද?

යන ප්‍රශ්න තුනෙක් මෙහි ලා උපදී. ප්‍රබන්ධය නිසි පරිදි සැදිනැ ගන්නට නම් මේ ප්‍රශ්න තුනට සුදුසු උත්තර සැපැයියැ යුත්තේ යැ.

### කිමෙක් බඳනා ලැබේ ද?

අනුන් විසින් දැනැ ගත යුතු වූ අර්ථයෙන් බඳනා ලැබේ; සහල් නැළියක් මනන්නකු විසින් නැළිය යන්නා තාක් සහල් එහි ලියැ යුතු යැ. අඩු වුව හොත් නැළියෙක් නො වේ. වැඩි වුව හොත් පිට යෙයි. අර්ථයක් ප්‍රකාශ කරන්නක්හු විසිනුත් එය අඩු නො කළ යුත්තේ යැ, වැඩි ද නො කළ යුත්තේ යැ. යම් සේ සහල් නැළිය අනූන කොටැ අනධික කොටැ මනනා ලද්දේ ප්‍රමිත නම් වේ ද, එ සේ මැ අර්ථය අනූන කොටැ අනධික කොටැ බඳනා ලද්දේ 'ප්‍රබන්ධ' නම් වේ. එ සේ බඳනා ලබන අර්ථයට 'වස්තු' යනු නමි.

### කෙසේ බඳනා ලැබේ ද?

වාක්‍යයෙන් බඳනා ලැබේ. මෙය කියවන්නෝ 'වාක්‍ය' නම් කිමෙක් ද යනු දනිති. වස්තුව අනූනාධික කොටැ පැවැසීමට යම් පමණ වාක්‍ය වුව මනා වේ ද, ඒ සියල්ලෙහි වස්තුව බඳනා ලද්දේ යැ. වාක්‍ය බන්ධනයට සන්ධී යැ යි කියත්. නිසි පරිදි එක් කොටැ ගොතන ලද්දේ 'සන්ධී' නමි.

### කෙසේ උසස් කරනු ලැබේ ද?

ක්‍රමවත් කිරීමෙන්, නිදෙස් කිරීමෙන්, රසවත් කිරීමෙන් උසස් බව (උත්කර්ෂය) ඇති වේ. මේ සියල්ලට සාධාරණ ධර්මයෙකි. එ හෙයින් බන්ධනය උසස් වැ ප්‍රබන්ධ බවට පැමිණීමට නම්, වස්තුව ද, එය බැඳීමට ගන්නා වාක්‍ය ද, ක්‍රමවත් වියැ යුතු යැ. නිදෙස් වියැ යුතු යැ, ගුණවත් වියැ යුතු යැ, රසවත් වියැ යුතු යැ. තව ද ඒ ඒ ස්ථානයට සුදුසු වූ ස්වභාවයෙක් වේ ද, එයිනුදු යුක්ත වියැ යුතු යැ.

එ හෙයින් පුරාතනයෝ 'ප්‍රබන්ධයෙක් නම් සංඝටිත ප්‍රභාෂා වාක්‍ය සමුදායයෙකි' යි කී හ.

මෙ සේ ප්‍රබන්ධයෙහි ලා කරුණු තුනක් උගත යුතු බව පෙනේ.

එනම් —

(1) වස්තු
(2) සන්ධි
(3) උත්කර්ෂණ

යන මේ තුන යි. මේ එක එක විස්තර වශයෙන් පිරික්සා බැලිය යුතු වේ.

වස්තුව

මනා වැ වැඩුණු ගසක් දෙස බලමු. මුල ස්ථිර වැ සිටියේ ය. කඳ මහත් ය, ශක්තිමත් ය. සුදුසු තැනින් අතු බෙදී ගියේ ය. එක් එක් අත්ත කොළින් ගැවැසුණේ ය, මලින් විසිතුරු ය, පලින් බර ය. මෙසා විශාල වූ මෙසා වර්ණවත් වූ මෙසා ඵලවත් වූ මේ වෘක්ෂ රාජයා කෙසේ ඇති වී ද? එක් කුඩා බිජුවටක් නිසා ඇති වූයේ ය. තතු දන්නකුට අසු වූ ඒ කුඩා බිජුවට සුදුසු බිමෙක්හි උන්වන ලද්දේ ය. නිසි කාලයෙහි බිජුවට හැප්සිණ (ඇස්පුණේ ය.) පළමු කොටැ කුඩා අත්තක් නික්මි ය. එක්බිති ඒ දෙකොට වැ බෙදිණ. කුඩා පෙති දෙකෙකි. ක්‍රමයෙන් වැඩෙත් වැඩෙත් කඳ මහත් වැ, අතු බෙදී, රිකිලි වෙන් වී, දළු ලිදිරී, කොළ කිමිතිරී, මල් පිහිදී, පල ඉදී පැසී විලික්සී, ලොවට වැඩ වඩන මහ ගසක් වැ සිටියේ ය.

ප්‍රබන්ධය ද මෙ සේ ඇති වූවෙකි. ගසෙහි මෙන් මැ ප්‍රබන්ධයෙහි ද පටන් ගැන්ම එක් කුඩා බිජුවටෙකි. ඒ 'අරමුණු' නම් වෙයි. 'මැ' 'මාතෘකා' යන නම් ද සෙදේ. 'වස්තු බීජ' යැ යි ද කිය හැකි යි. අඩග සම්පූර්ණ වස්තුවක්

නිපැදීමට බීජය (බිජුවට) වන හෙයිනි. විචක්ෂණයකු විසින් ස්වකීය බුද්ධි නමැති රස බිමෙහි උන්වන ලද්දේ, අකුරු ඇදී, කඳ වැඩී, අතු බෙදී, රිකිලි වෙන් වී, දළු නැගී මුහුකුරා, මල් පිපී, පල බර වී, විසිතුරු ප්‍රබන්ධයක් බවට පැමිණේ.

වස්තුව ප්‍රබන්ධයෙහි සාරය යි. එය බුද්ධි විෂය වෙයි. බුද්ධිය නම් වටහා ගැනීමේ ශක්තිය යි. යමෙක් වටහා ගත යුත්තේ ද එය බුද්ධි විෂය වෙති යි කියති. ප්‍රබන්ධය කරන්නේ එහි වස්තුව ස්වකීය බුද්ධියෙන් යොදා, වඩා, බෙදා හැඩගසා ලයි. එ සේ කිරීම 'වස්තු විරචන' නම් වේ. ප්‍රබන්ධය අසන්නෝ හෝ කියවන්නෝ එහි වස්තුව තමා ගේ බුද්ධියෙන් උරා එහි මූල මේ යැ, මැද මේ යැ, අග මේ යැ, සම්බන්ධය මේ යැ, රසය මේ යැ, යනා ආදි විසින් විභාග කෙරෙති. එ හෙයින් ප්‍රබන්ධ වස්තුව බුද්ධි විෂය වන්නේ නමැ.

## වස්තු වර්ග

නිපැදවීමේ ආකාරය සලකා බලා ප්‍රබන්ධ වස්තු පළමු කොටැ වර්ග පසකට බෙදියැ හැකි වේ.

(1) කාර්‍ය (කියැ යුතු)
(2) වර්ණ්‍ය (වැණියැ යුතු)
(3) විවාර්‍ය (අවි විවරණය කළ යුතු)
(4) විචාර්‍ය (විමසියැ යුතු)
(5) කල්ප්‍ය (නිර්මාණය කළ යුතු)

යන මේ යැ ඒ පස.

## කාර්‍ය වස්තු

ප්‍රබන්ධ කාරයා විසින් නිපැදවියැ යුත්තෙක් මෙහි නැති. ඔහු විසින් කළ යුත්තේ තමා ඇසූ හෝ දුටු හෝ ප්‍රවෘත්තියක් තතුවූ පරිදි කථනය කිරීම යි — කියා පෑම යි. වස්තුව කාර්‍ය නම් වනුයේ එ හෙයිනි.

සාමාන්‍ය වශයෙන් තුන් වර්ගයෙකැ කථ්‍ය වස්තු ඇති බව පෙනේ.

(1) වෘත්තාන්ත
(2) ඉතිහාස
(3) චරිත

යනු ඒ තුන් වර්ග යි.

(1) පුරාණයන් අතර කථා නාමයෙන් ගැනුනේ වෘත්තාන්ත යි. වෘත්තාන්තයක් වස්තුව වූ කලැ ප්‍රබන්ධ කාරයා විසින් කළ යුත්තේ එහි ආ කරුණු නො වෙනස් කොටැ කීම යැ. පද මාලාව ඔහුට රිසියෙන පරිදි යොදා ගත හැකි යැ. එහෙත් වස්තුව පිළිබඳ වැ මඳ වූ ද වෙනසක් නො කළ හැක්කේ යැ. කළ හොත් ඒ වෘත්තාන්ත නාමයට නුසුදුසු වෙයි. ප්‍රධාන වස්තු මාර්ගය නො පෙරළා ගත් කල්හි අනුකූල වන විස්තර යොදා ගැනීම වස්තුව වෙනස් කිරීමක් ලෙස නො ගැනේ.

වෘත්තාන්ත වස්තුවක් ගෙනැ දැන් විමසා බලමු.

## සුදු සකුර

රජුට සකුරු සපයන්නකු ගේ සකුරු ඉතා හොඳ වූයෙන් රජ පැහැදුණේ යැ. සකුරු සපයන්නා ගෙන්වා ඒ සකුරු එ තරම් සුදු එ තරම් මිහිරි කරන්නේ කෙසේ දැ යි රජ ඇසී යැ. 'උඩු වියන් බැඳ, බිමැ, කිරි පැන් ඉසැ, රන් බඳුනක් උඳුනේ තබා, රන් සැන්දෙන් කලතමින් පැණි උණු කොටැ, රන් පියල්ලෙහි වත් කරන හෙයින්, සකුරු සුදු වන බව, මිහිරි වන බව, සකුරු සපයන්නා කී යැ. රජ තෑගි දී ඔහු යැවී යැ.

වෙස් වළා ගත රජ දිනක් ඒ සකුරු සපයන්නා ගේ ගෙය පසු කොටැ ගියේ යැ. ඔහුට දක්නට ලැබුණේ දුම්

ගැසුණු මඩුවෙනැ, අළු ගොඩක් ළඟැ ළිපෙනැ, කබල් මැටි බඳුනෙනැ, පොල් කටු සැන්දෙකින් පැණි කලතමින්, පොල් කටු පියලි කිහිපයක් ළඟ තබා ගෙනැ ඔහඳිය වගුරුවමින් හුන් සකුරු සපයන්නා යැ. රජු උඩු වියන්, රන් බඳුන්, රන් හැඳි, රන් පියලි මතක් කළ විටැ සකුරු සපයන්නා, සියන පිට අඩිය නොවැ කීම සිරිත බව කියා, කමාව අයැදූ සිටියේ ය. රජ සිනා සෙමින් මැ යන්නට ගියේ යැ.

වෘත්තාන්ත වස්තු හැඳින්වීමට බොහෝ නිදර්ශන නුවුව මනා යැ. කථා නො දත්තකු සොයා ගැන්ම ද දුෂ්කර වන හෙයිනි.

(2) සිදු වූවක් පිළිබඳ ප්‍රවෘත්තිය ඉතිහාස නම්. ඉතිහාස නාමය ලැබීමට නම් ඒ සත්‍ය වූ ප්‍රවෘත්තියක් විය යුතු යැ. අසත්‍ය දූ එක් වූ ප්‍රවෘත්තිය ඉතිහාස නාමයට නුසුදුසු වේ.

**ඉතිහාස වස්තු නිදර්ශනය**

## සතුරු මිතුරුව

මහසෙන් රජ කුමාර කාලයෙහි ශාස්ත්‍ර උගත්තේ සඞ්ඝමිත්‍ර නම් වෛතුල්‍යයකු ගෙනි. සඞ්ඝමිත්‍ර, මහා විහාරවාසී භික්ෂූන් වෛතුල්‍ය මත ගැන්වියැ නො හැකි වී නම් ඔවුන් ගේ විහාර මුලිනුදුරුවා ලන්නට ප්‍රතිඥව දුන්නෙකි. ඒ ප්‍රතිඥව සමෘද්ධ කරන්නට ශිෂ්‍යයා ගේ රාජ්‍ය සමයෙහි දී ඉඩ ලැබිණ. මහසෙන් රජ ගුරු බස ගෙනැ විහාර විනාශ කරවා මහාවිහාරවාසී භික්ෂූනට දන් දීම ද තහනම් කෙළේ යැ.

මහසෙන් රජු ගේ පරම මිත්‍ර වූ මෙඝවණ්ණ නම් අමාත්‍යයා රජු ගේ නො පනත් කම් නිසා කිපී, දමරිකා වැ, රජු හ

යුද්ධයට සැරසුණේ යැ. රුහුණු රටැ දූරතිස්ස නම් වැව අසලැ දී යුද්ධ කරන්නට දෙ පක්ෂය මැ සැරසුණ හ.

යුද්ධයට නියම වූ දිනට පෙර දා මෙසවණීයාට මිහිරි මසෙක් ද පානයෙක් ද, ලැබිණ. පෙරැ එ බන්දක් ලැබුණු විටැ, රජු ද කැවුල් කැරැ ගැනීම අමාත්‍යයා ගේ සිරිත යැ. එදා ද එයට වෙනසක් නො කෙරෙමි යි සිතා, අමාත්‍යයා ඒ මාංසය ද පානය ද ගෙනැ, හුදෙකලා වැ මැ රජු ගේ කඳවුරට ගියේ යැ.

රජ අමාත්‍යයා දැකැ සුදුම් වියැ. දෙදෙන මැ හිඳැ ගෙනැ ඒ මස් කෑ හ, පැන් පූ හ. යුද්ධය එ පමණෙකි. මහසෙන් රජ යො මගින් මහට වැටී, තමා නැසූ සියලු විහාර නැවැතැ කැරැ වී යැ. මෙසවණී යළි දූ ඔහු ගේ පරම මිත්‍ර වී යැ.

ඉතිහාස වස්තු ද ඉතා පහසුයෙන් තනා ගත හැකි යැ ඉතිහාසය එ බඳු වස්තු මහත් රාශියෙකින් පිරුණු භාණ්ඩාගාරයෙකි.

(3) පුද්ගලයකුහු ගේ ජීවිත ප්‍රවෘත්තිය චරිත නම් වේ. ඒ දැන් නැති හෝ ඇති හෝ පුද්ගලයකු පිළිබඳ වියැ හැකි යැ චරිතයෙහි ඉතා අවශ්‍ය ලක්ෂණය නම් සත්‍ය බව යි.

ඉතිහාස චරිත යන දෙකෙහි වෙනස කිමෙක් ද? ඉතිහාසයෙහි ප්‍රධාන වනුයේ රට ජාතිය යන දෙක යි; සම්බන්ධ වන්නෝ අප්‍රධාන වෙති. චරිතයෙහි ප්‍රධාන වන්නේ පුද්ගලයා යැ; රට ද ජාතිය ද අන් සියල්ලෝ ද අප්‍රධාන වෙත්. චරිතය ඉතිහාසයෙහි ඇතුළත් යැ. [illegible] සය සම්බන්ධ යි. චරිතය එහි එක් සුළු කොටසෙකි.

**චරිත වස්තු නිදර්ශනය**

## විහාර දේවිය

පෙර කැලණිය අසලැ රට මුහුදට යට වන්නට වියැ. රජ කුමක් කළ යුතු දැ යි නිමිති දන්නවුන් විචාළේ යැ. ඔහු මුහුදට බිල්ලක් දියැ යුතු යැ යි කී හ.

රජු ගේ දේවී නම් දුව මුහුදට බිලි වන්නට සැරසුණා යැ. රජ ඇය රන් ඔරුවෙකැ ලා මුහුදට යැවී යැ. මුහුද ගැලීම නැවැතිණ.

ඔරුව රුහුණේ වෙරළට පා වියැ. කාවන්තිස් රජ කුමරිය තමාට අග බිසෝ කෙළේ යැ.

මහත් නුවණ ඇති ස්ත්‍රියකි. ලංකාව නිදහස් කරන අටියෙන් පුතුන් තැනුවා යැ.

දෙටු පුත් දුටුගැමුණු රජු හට මහත් පිටු බලයක් වූයේ මව ගේ නුවණ යි. ඒ රජු ලක් දිවැ එක් සත් කිරීමේ ගෞරවයෙන් වැඩියක් හිමි වියැ යුත්තේ මවට යැ.

ඉතිහාසය චරිත වස්තු ආකරයෙකි. පෙර දිගැ බෝහෝ ඉතිහාස කාව්‍ය ස්වරූපයෙන් සිටීම අභාග්‍යයෙකි. අධික වර්ණනයක් නැති තත්හි කාව්‍යයක් නැතැ යි සිතා දෝ, ඇතැම් පුරාතනයෝ සමහර ඉතිහාස වස්තු නො හැඳිනියැ යුතු තරම් අධික වර්ණනයෙන් සැරසූ හ. එ හෙයින් ඉතිහාසයෙන් චරිත වස්තු උපුටා ගැනීම මැනැවින් පිරික්සා කළ යුත්තෙකි.

**වර්ණ්‍ය වස්තු**

වර්ණනය හෙවත් වැනීම නැති ගුණ ඇති පමණ උසස් බසින් කීම නො වේ. නියම වර්ණනය නම් යම් කිසිවක්

වරදවා නො ගත හැකි පරිදි හඳුන්වා දීම යි. එහි අල්ප-මාත්‍ර වූ ද අසත්‍යයක් ඇති නො විය යුතු ය.

වර්ණනයෙහි දී කිය යුත්තේ තමන් ගේ ඥානය යි හෙවත් දැනීම යි. නො දන්නා දැය කියන්නට තැත් කරන්නේ තමා මෝඩයකු බව ඉතා පහසුයෙන් හඟවයි. එබන්දක් නො කළ මැනැවි. නො දන්නා දැය පළමු කොට සොයා, බලා, අසා උගත යුතු ය.

වර්ණ්‍ය වස්තු නිදර්ශනය

## ඇතු වග

ගොඩ සතුන් අතර ඉතා විශාල ශරීර ඇත්තේ ඇතා ය. උගේ සොඬ පුදුම අවයවයෙකි. එ නම් නාසය මැ යි. අතක් ලෙස ද යෙදේ. කඳ ඉතා මහත් හෙයින්, බෙල්ල ඉතා කොට හෙයින්, මේ අතෙහි හෙවත් සොඬයෙහි පිහිට නැති වැ කිමැ වූ දෙයක් ගැනීම නො කළ හැකි ය.

ඇතා ගේ දත් ද විස්මයජනක යි. මුවින් පිටට වැඩී රියන් කීපයක් දික් වැ සිටුනා දත් දෙකක් සමහර ඇතුනට වෙයි. එ බඳු දත් ඇති ඇතින්නෝ ඉතා විරල වෙති.

හිස එ තරම් විශාල වුව ද, ඇතා ගේ මොලය නම් කුඩා ය. ඇස් ද ඉතා කුඩා ය.

ඇතා මස් බුදින්නෙක් නො වේ. ගස්වැල්වලැ කොළ, ලා රිකිලි, තණ ආදිය ඌට ආහාර වෙයි. කිතුල් වැනි ගස්වලැ බඩ ඇතාට ඉතා ප්‍රිය ය. හිසින් ඇනැ එ බඳු ගස් හෙළා, දළින් කඳ පළා, බඩ නගා ගෙන බුදී.

අප්‍රිකා මහාද්වීපයේ ද ජම්බු ද්වීපයේ ද ඇත්තු වෙසෙති. අප්‍රිකා ඇතා දඹ දිවැ ඇතාට වඩා උස් යැ, දිග යැ එහෙත් දඹ දිවැ ඇතා වඩා බර වෙයි. දඹ දිවැ ඇතා ගේ හිස මහත් යැ. කන් කුඩා යැ. අප්‍රිකා ඇතා ගේ හිස එ තරම් මහත් නො වේ, කන් එ තරම් කුඩා නො වේ.

දඹ දිවැ ඇතා මිනිසා ගේ මිත්‍රයෙකි. හීලෑ වූ පසු මිනිසාට ඉතා බර කටයුතු කැරැ දේ. බිළිඳකු රැකෑ හැක්මෙහි යෙදීමට සුදුසු වන තරම්, ඇතා හීලෑ කළ හැකි යැ. ඔහු ගේ වැටැහෙන නුවණ ද ඉතා මහත් යැ. එහෙත් කිපුණු කලැ ඉතා දරුණු යැ. අප්‍රිකා ඇතා හීලෑ කිරීම පහසු නො වේ. උගේ අගය වනුයේ වටිනා දළෙහි යැ. එය ලබනු සඳහා බොහෝ ඇත්තු අවුරුදු පතා මරනු ලැබෙති.

වර්ණ්‍ය වස්තුයෙන් ලොව පිරී සිටියේ යැ. දින පතා මැ අපි එ බඳු දෑ හැඳිනැ ගනිමු. ඇස නිසි සේ යොදන්නේ වර්ණ්‍ය වස්තු සපයන්නෙකි.

**විචාර්‍ය වස්තු**

යම් කිසිවෙකැ අර්ථය පැහැදිලි කිරීම විවරණ නම් වේ 'කතාව දෝලායෙන්, ගමන පයින්' යනු පුරුදු පිරුළෙකි. එහෙත් එහි නියම අර්ථය දන්නෝ බොහෝ නො වෙති එ බඳු තැනක් ප්‍රබන්ධයකට මාතෘකා වුව හොත් ඒ විචාර්‍ය වස්තු නම් වෙයි.

**විචාර්‍ය වස්තු නිදර්ශනය**

## කටේ දෝලාව

ඇතැම් මිනිසුන් බොහෝ විටැ කරන වරදෙක් නම් තමන් ගේ පුළුවන් කම් වැඩි කොටැ කීම යි. නිසි විදීමට

නො වරදින උපායයෙකි. කෙසේ කිව ද, කිරීමට පැමිණි තන්හි දී ඇත්ත එළි වන බව නො සිතීම මිනිස් කමට නො හොබී.

ඇත්ත ඇති සැටියට කීම ඉතා උසස් ගුණයෙකි. මේ ගුණය ඇත්තෝ අනුන් ද තමන් වැන්නවුනැ යි සිතත්. එ හෙයින් කියන දෑ අදහති, ඒ බොරු බව දැනැ ගත් විටැ පිළිකුල් කෙරෙත්, කී තැනැත්තවුන් මිනිස් ගති නැත්තවුහැයි සලකත්

වීර අධිෂ්ඨානය ඇත්තෝ තමන් අදහස් කළ දෑ නො අඩු කොටැ මැ කියති. එ සේ මැ කෙරෙති. කී දෑ නො කළ හ යි කියනු විඳීමට ජීවිතයට නම් ඉඩක් නො දෙත්. මධ්‍යම මනුෂ්‍යයෝ අදහස් කළ පමණට අඩුවක් කියා පාති. එ හෙයින් සියලු කල්හි ඔවුන් අතින් කැරෙනුයේ කී පමණට වැඩියෙති. ප්‍රශංසාව නිතර මැ ඔවුන් කරා එයි. අධමයෝ කළ හැකි පමණට වැඩියෙන් කියා, කී සේ කොටැ ගත නො හී, නින්දාවට වැටෙත්.

පෙරැ උසස්හු ගමන් යන කලැ දෙලායෙන් යෙති. සෙස්සෝ පයින් මැ යෙත්. නැති උසස් කම කටින් හඟවා ලන්නට රිසි වූවෙක් 'මම සෙට අසුවල් ගමන දෝලායෙන් යෙමි' යි ප්‍රසිද්ධයේ කී ල. අසල්ලු ඒ විසිතුර බලන්නට රැස් වූ හ. ඔවුනට දෝලායෙන් යන්නෙක් නො පෙනිණ. පෙනුණේ පත් කුඩය කිසිල්ලේ ගත්තා ගෙනැ, විළියෙන් බිම බලා ගෙනැ, වහවහා ඇදී ගිය දරණ පුරුදු තිබ්බයා යැ. 'කතාව දෝලායෙන් ගමන පයින්' යනු එ තන්හි දී එකකු කී බසි.

විවාසී වසතු බවට කුමක් වුව ද හැරැවියැ හැක්කේ යැ. ප්‍රවීණයකු විසින් කළ යුත්තෙකි. යම් කිසිවෙක් අවිවර වැ,

වැසී, සැඟැවී සිටී නම්, ඒ විවර කළ යුත්තේ යැ, විදහා පෑව යුත්තේ යැ, වැසුම් හළ යුත්තේ යැ. ඒ යැ නියම විවරණ නම්. දුර්බෝධ වූයේ ද විවරණයෙන් පසු සුබෝධ වෙයි.

විචාර්‍ය වස්තුව පිරැළක් මැ නිසා වන්නේ යැ යි වරදවා නො ගත යුතු. ගුප්ත වූ — සැඟැවුණා වූ — අර්ථ ඇති ක්‍රමක් වුව ද, විචාර්‍ය වෙයි. ප්‍රවෘත්ති මාත්‍රයක් නො වන බැවින්, ඒ කථ්‍ය වස්තුවෙක් නො වේ; බෙදා වෙන් කොටැ එකා හැඳින් වියැ යුත්තක් නො වන බැවින්, වර්ණ්‍ය වස්තුවෙක් ද නො වේ; විචාර්‍ය වස්තුවක් හෝ කල්ප්‍ය වස්තුවක් හෝ නො වන පරිදි මතු විස්තර වන්නේ යැ.

**විචාර්‍ය වස්තුව**

හේතුයෙන් ඵලයට බසිමින්, ඵලයෙහි සිටැ හේතුව සොයා යෙමින්, විචාරණයට — විමර්ශනයට මං සලසනුයේ විචාර්‍ය වස්තු යි. අපට ප්‍රත්‍යක්ෂ දෑ යම් යම් හේතු නිසා වූයේ නම්, ඒ හේතු පහදා ගැනීම විචාරණයෙහි එක් අඞ්ගයෙකි. ඒ දෑ අනාගතයෙහි යම් යම් ඵල ඉපැදවීමට හේතු වන සේ පෙනේ නම්, ඒ ඵල කෙබඳු වියැ යුතු දෑ යි විමැසීම තවත් අඞ්ගයෙකි. මේ දෙක මැ සම්බන්ධ වූ ද විමැසීම් ඇති වියැ හැකි.

විචාර්‍යය මෙ බඳු විමැසීමක් පිට රඳා සිටිනුයේ නො වේ. හේතු ඵල එ තැනට අවශ්‍ය යැ. සහේතුක වැ හෝ අහේතුක වැ හෝ යම් තැනෙකැ යම් අර්ථයෙක් වැසී පවතී නම්, එය නිරාවරණය කිරීම මැ විවරණය යි. විචාරණයෙහි දී ප්‍රධාන වනුයේ හේතු ඵල දෙ පක්ෂය මැ යි.

**විචාර්‍ය වස්තු නිදර්ශනය**

## පෘථිවියේ ගෝලත්වය

පෘථිවිය ගෝලයෙකි. අපට ඒ බව නො පෙනේ. දෙඹමෙකු ඉන්නා කුහුඹුවාට දෙඹම වට බව නො පෙනෙන්නා මෙනි. එ තරම් කුඩා දෙඹම වට බව ඒ මතු පිටැ ඉන්නහුට නො පෙනෙන කලැ, මෙ තරම් විශාල පෘථිවිය වට බව අපට කෙසේ නම් පෙනේ ද?

පෙනීම කුමක් වුව ද, පෘථිවිය නම් ඉතා මහත් ගෝලයෙකි. ඒ අහස්හි හැසිරෙයි. ඉර හඳ ආදිය මෙන් මැ එ ද ආකාශ වස්තුවෙකි. නුවණින් විමසා බලා ඒ බව වටහා ගත යුත්තේ යැ.

පෘථිවිය ගෝලාකාර බව අපි කෙසේ වටහා ගනිමු ද? අන්‍ය ආකාශ වස්තු ගෝලාකාර බව අපට මැනැවින් පෙනේ. අන් සියලු ආකාශ වස්තු ගෝලාකාර වේ නම්, ගෝලාකාර බව ආකාශ වස්තුවකට සුදුසු මැ වූ ලක්‍ෂණය බව පෙනේ නම්, පෘථිවිය ද ආකාශ වස්තුවෙක් වේ නම්, එය ද ගෝලාකාර යැ යි කීම තර්කානුකූල යැ.

හාත්පසැ පෙනෙන තැනකට ගොස් බැලුව හොත් සියලු අතින් අහස පොළොවට ගැටෙන්නා සේ පෙනේ. කොතැනට ගියත් ඒ පෙනෙන තැන අපට සමදුර යැ. මෙ සේ වනුයේ පෘථිවිය ගෝලාකාර වන හෙයිනි.

තොටෙකැ සිටැ යන නැවක් දෙස බලා සිටිමු. නැව ඈත් වන විටැ දුර දක්නයෙකින් බලමු. පළමු කොටැ නො පෙනී යන්නේ නැව් කඳ යැ. කෙළවරට නො පෙනී යන්නේ කුඹගෙහි මුදුන යි. කවර අතට යන නැවක්

බැලුව ද, මේ මෙසේ මැ යැ. පෘථිවිය ගෝලාකාර නො වේ නම්, මේ නො සිදු වියැ හැක්කෙකි.

නැවෙක් එක් තැනෙකැ සිටැ නැගෙන හිර හෝ බස්නාහිර හෝ බලා යේ; ගොඩක් හමු වූ විටෙකැ දී පමණක් මඟ හැරැ යළි දු යන ඉරට මැ වැටේ. එ සේ මැ ගිය හොත් ඒ නැව නැවැතැ පැමිණෙනුයේ පිටත් වූ තැනට මැ යැ. ගෝලාකාර නුවූ පෘථිවියෙකැ නම්, ඒ සිදු වියැ හැක්කෙක් ද?

පෘථිවියේ සෙවණැල්ල චන්‍ද්‍රයා මතු පිටට වැටීමෙන් චන්‍ද්‍ර ග්‍රහණය සිදු වේ. මේ සෙවණැල්ල වට බව පිරිසෙවි ඇසින් දක්නා හැකි යැ. වට සෙවණැල්ලක් වැටෙනුයේ ගෝලාකාර වස්තුවෙකිනි.

මේ සියල්ල මෙ සේ මැ වේ වා. පෘථිවිය ආකාශ වස්තු-වෙකැ යි අපි කෙසේ නිශ්චය කෙරෙමු ද? පෙරැ කෙසේ වුව ද, දැන් නම් එය කිසි සේත් දුෂ්කර නො වේ. ගගන යානයෙකින් අහසටැ නැඟී, අහසින් මැ පොළොව වටා ගොස්, නික්මුණු තැනට මැ පැමිණියැ හැකි යැ. උඩ යැ යට යැ කියැ හැකි තැනක් පොළොවට නැති බව ද, පොළොව අහසෙහි මැ රැඳී සිටුනා බව ද, එ කලැ ප්‍රත්‍යක්ෂ වෙයි. ආකර්ෂණ බලයෙන් සියලු අතින් ඒ අන්‍ය ආකාශ වස්තුවලට ඇදී පවත්නේ යැ.

කල්පිත වස්තුව

බුද්ධියෙන් ඉපැදැවියැ යුත්තේ, කල්පනය කොටැ ගත යුත්තේ, කල්පිත නම් වේ. අන්‍ය වස්තු හා මෙහි සාම්‍යයෙක් නැති. මනුෂ්‍යයා ගේ බුද්ධි බලය සීමාරහිත යැ. එයින් අමුතු මැ ලොකයක් මැවියැ හැකි යැ. අමුතු මැ කථා මැවියැ හැකි බව කියැ යුතු නො වේ.

ඇතැම් කල්පිත වස්තු කථ්‍ය වස්තු ලෙස පෙනී සිටී. ඇතැමෙක් වර්ණ්‍ය වස්තු ලෙස ද ඇතැමෙක් විචාර්‍ය වස්තු ලෙස ද අතැමෙක් විචාර්‍ය වස්තු ලෙස ද පෙනී සිටී මැ යැ. නුවණ නැත්තෝ ඒ එසේ මැ හදහති එහෙත් නුවණැත්තෝ කල්පිත වස්තුව හඳුනා ගනිති. ස්වභාව ධර්මයට අනුකූල වන ලෙස විරචිත වූ අතිපුරාණ කල්පිත වස්තු ඇතැම් විටැ නිපුණ නුවණට ද අසු නො වේ.

කල්පිත වස්තු නිදර්ශන

## නියම ජය

පොරොවෙකු, කියතෙකු, යකුළෙකු, ගිනි සිළුවෙකු යන සතර අතරෙහි වාදයෙක් විය. සෙස්සවුනට වඩා බලවත් වූයේ කවරෙක් ද යනු තෝරා ගන්නට යැ වාදය. තමා මැ උසස් බව, බලවත් බව, එකාඑකා කියන හෙයින්, එ තන්හි වූයේ මහත් කෝලාහලයෙකි.

පොරොව ගොරවමින් මෙ සේ කී යැ:- "ඉහළට හෝ දෙ පසට හෝ පතිමින් පහර දෙන කලැ, එය ඉවසන්නෙක් ලොවැ නො සිටී. මහ ගස් මගේ පහරින් බිමැ නිඳයි; මහ කඳ දෙපළු වැ යෙයි. තොප අතරින් කවරෙක් එ බන්දක් කෙරෙයි ද?"

යකුළ කෝපයෙන් බිණී යැ:- "මැරෙන ගස් කෙළන්නව, දිරන දර පළන්නට මම නො යමි. යතොත් යන්නේ පොරෝ දහසෙකිනුත් නො සෙල්විය හැකි මහ ගල් සුනු විසුනු කරන්නට යැ. නටන ගැහැනියක මෙන්, මම දෙ පසට නො පතිමි. පතිතොත් උඩට මැ යැ. ඒ ගොරවන පොරොව එ තරම් සිහින් වූයේ ද මගේ දරුවකු ගේ පහරිනි."

කියත සියලු දත් පෙනෙන ලෙස සිනා සුණේ යැ:– "උඹ පැනැ බිම වැටෙන වර්ගයට මම අයත් නො වෙමි. ඉතා අඩු උත්සාහයෙන් ඉතා මහත් කාර්යයක් කිරීම යි සමර්ථකම. මදක් ඉදිරියට යමින්, මදක් පසු බසිමින්, 'උඹ' නො පැනැ, සෙමෙන් සෙමෙන් මා කරන කාර්ය කවුරුත් හඳුනති."

ගිනි සිළුව ශාන්ත වැ දෙඩුවේ යැ:– "කිමෙන් කිම? කිරීමෙන් සපත් කම් දක්වමු. මේ අප ඉදිරියෙහි වූ ලෝහ ඛණ්ඩය මෘදු කොටැ බලමු. එය මෘදු කළහු සැබෑ සමර්ථයා ලෙස පිළිගනිමු."

සියල්ලෝ එකඟ වූහ. පොරෙව යත්තම් දුන්නේ තුන් පහරෙකි. තවත් පහරක් නො දියැ හැකි තරමට මුව ඇද වී ගියේ යැ. යකුළ දස දොළොස් පහරක් මැ දුන්නේ යැ. එයින් වූයේ ලෝහ ඛණ්ඩය තව තවත් තද වීම පමණෙකි. කියත තමා ගේ කාර්යයට වන්නේ යැ. කන් බිහිරි වන තරම් 'බ්‍රාස්, බ්‍රාස්' යන හඬෙක් ඇසෙන්නට වියැ. ඒ විනාඩි කිහිපයෙක් පැවැතිණි. සියලු දත් ඇද වී හෝ කැඩී හෝ ගිය හෙයින්, කියත ද අස් වියැ.

ගිනි සිළුව ළං වැ ලොහො කඩ වැලැඳැ ගත්තේ යැ, සර්වාඞ්ගය සිඹැ මහත් වූ ආදරය දක්වූයේ යැ. ආදරයට ආදරය දක්වන්නා මෙන්, ලොහො කඩ ද රත් වියැ. තද බව ක්‍රමයෙන් පහ වී, හේ මෘදු වැ සිටියේ යැ. ආදරයට ජය අත් වියැ.

මෙ තම් සිදු වූවක් නො වන බව ද, එ හෙයින් කල්පිත බව ද පැහැදිලි යැ. එහෙත් කො තරම් රසවත් ද? වස්තු කල්පනය උගත් කම මැ පිහිට කොටැ ඇත්තේ නො වේ. ඇතැම් නූගත් පිටිසරයෝ ඉතා මනහර වස්තු කල්පනය

කෙරෙති. එ තරම් මැ මනහර පද මාලායෙන් ඒ වස්තු පැවැසීමට ඔවුන් නො පොහොසත් වන බැවින්, ඔවුන් ගේ ස්වාභාවික දක්ෂ භාවයෙන් බැහැර ලොකයට වැඩෙක් නො වේ. ඇතැම් දරුවෝ ද කල්පන ශක්තිය කුඩා කාලයේ මැ දක්වති. අඥ වෘද්ධයෝ, ගෙදරට එන සරසවියට මෝහොල් පහර දෙන්නා සේ, දරුවන් ගේ ඒ ශක්තිය වනසා ලති, "මොහු බොරු කියන්නාහු යැ" යි ඔවුනට දඬුවම් දෙයි කෙරෙති, නරකයට යන බව කියා බිය නෙයි ගන්වති. බලවත් අපරාධයෙකි.

**වස්තු වින්‍යාසය**

ගෙයක් මවන්නකුට පළමු මැ ඇති වනුයේ 'ගෙය' යැ යන සංඥා මාත්‍රය පමණෙකි. ඉක්බිති හේ සිතන්නට වෙයි. පතක් ගෙනැ, වුව මනා පරිදි ගෙහි කොටස් බෙදා වෙන් කොටැ දක්වන සටහනක් අඳී. එ කලැ ප්‍රවේශය මේ යැ, ආලින්දය මේ යැ, උපවේශන ශාලාව මේ යැ, ශයනාගාරය මේ යැ, භොජන ශාලාව මේ යැ යන ආදි වශයෙන් ගෙයි කොටස් වෙන් වැ පෙනී යේ. ඉන් පසු කළ යුත්තේ සැලැස්මට අනුකූල වන පරිදි උපකරණ රැස් කොටැ ගෙනැ ගෙය නිමැවීම පමණෙකි. පළමු කොටැ සැලැස්ම නො කළ හොත් ගෙය අඞ්ග සම්පූර්ණ නො වියැ හැකි යැ. එක් භාගයකට සරි ලන සේ අනෙක් භාගය නුවුව හොත් අන්තිමයේ දී ගෙය අශොභන වෙයි, දුර්වල ද වෙයි. 'මෙ තෙක් දිග, මෙ තෙක් මහත දූව වුව මැනැව, මෙතෙක් ගඩොළු වුව මැනැව, මෙතෙක් සුනු වුව මැනැව' යන ආදී විසින් විනිශ්චයයක් ද සැලැස්මක් නැති වැ කළ නො හැකි වේ. ගෙය පිළිබඳ වැ පළමු කොටැ මෙ සේ භාග වෙන් කොටැ බෙදා ගැන්මට 'ගෘහ වින්‍යාස' යැ යි කියති.

ප්‍රබන්ධ වස්තුවක් පිළිබඳ වැ ද මෙ බන්දක් කළ යුතු යැ. පළමු කොටැ පැමිණෙනුයේ වස්තු මාතෘකාව පමණෙකි.

ප්‍රබන්ධ වස්තුවෙකැ ද ගෙයකා මෙන් මැ ප්‍රවේශයක් ඇති වියැ යුතු යැ, මධ්‍ය ලෙස මෙන් නානා ලද ඒ ඒ භාග ඇති වියැ යුතු යැ, අවසානයක් ඇති වියැ යුතු යැ. ඒ ඒ භාග ආදියෙහි දී මැ බෙදා වෙන් කොටැ ගත හොතින්, ප්‍රබන්ධ නිර්මාණය පහසු වනුයේ. එ සේ ප්‍රබන්ධ වස්තුව විභාග කොටැ වෙන් කැරැ ගැනීම වස්තු වින්‍යාස නම් වේ.

### වස්තු ප්‍රමාණය

ගෙය කොතරම් වියැ යුතු ද? කරුණු කිහිපයක් සලකා එය විනිශ්චය කළ යුත්තේ යැ. බිම, වියදම, වසන්නවුන් ගේ ගණන යන මේ සැලැකියැ යුතු කරුණු වලින් කිහිපයෙකි. ගෙය තැනියැ යුත්තේ බිමට ගැළැපෙන ලෙස යැ. එකොළොස් රියන් බිමෙකැ තෙළෙස් රියන් ගෙයක් තැනියැ හැකි නො වේ. බිම කොතරම් මහත් වුව ද, වියදමට ඇත්තේ දහස නම් ගෙය එයින් කළ හැක්කක් වියැ යුතු යැ. වාසයට ඉන්නෝ පස් දෙනෙක් වෙත් නම්, පස් විසි දෙනෙකුට තරම් වන ගෙයක් තැනැවීම නුවණට නුහුරු යැ.

ප්‍රබන්ධ වස්තු ප්‍රමාණය මැ නෙතුයේ ද මේ නයින් මැ යැ. කාලය යැ, වක්තෘ ශක්තිය යැ, ශ්‍රොතෘ ශක්තිය යැ යනාදි කරුණු කිහිපයක් සලකා වස්තු ප්‍රමාණය නිශ්චය කළ යුතු වේ. ප්‍රබන්ධය කිරීමට යම් කාලයෙක් නියම වැ ඇත් නම්, ඒ කාලය තුළැ දී නිම කිරීමට හැකි වන තරම් වස්තුවක් සලසා ගත යුතු යැ. මහත් කොටැ සිතා පටන් ගෙනැ මැදැ දී නවත්වන්නට වූව හොත්, ගත් ආයාසය ද නිරර්ථක වෙයි. පිටු දස දෙළොසක් මැ පුරවා ලන ප්‍රබන්ධයක් කළ හැකි මානුෂකාවෙක් වේ වා, කාලය ඇත්තේ දෙ පිටක් පුරවන තරම් ප්‍රබන්ධයක් කිරීමට නම් වස්තු වින්‍යාසය කළ යුත්තේ එ පමණට මැ යැ. නියම කාලයෙන් ප්‍රමාණවත් කොටසක් අගැ දී ඉතිරි වන ලෙසක් ද බලා ගත යුතු යැ. කළ ප්‍රබන්ධය නැවැතැ ද කියවා බලා සම කරනු පිණිස යැ.

ප්‍රබන්ධය කරන්නේ 'වක්තෘ' නම් වේ. 'වක්තෘ' යන්නෙහි අර්ථය නම් 'කියන තැනැත්තේ' යනු යි. ලියැවෙන්නේ ද කියන දෑ මැ යැ. එ හෙයින් භේදය නො සලකා, කියන හෝ ලියන හෝ ප්‍රබන්ධයක් කරන්නහු 'වක්තෘ' නාමයෙන් ගැනීම යෙදේ. වක්තෘහු ගේ ප්‍රබන්ධ කරණ ශක්තිය යම් පමණ ද, එයට ද ප්‍රබන්ධ ප්‍රමාණය අනුකූල වියැ යුත්තේ යැ. ශක්තිය අධික වුව ද, කාලය තුළැ දී නිම නො කළ හැකි තරම් ප්‍රබන්ධයකට වස්තු වින්‍යාසය කළ යුතු යැ යි මෙයින් නො කියැ වේ. කියැවෙනුයේ අල්ප ශක්තිය ඇත්තකු විසින්, මෙ තරම් කාලය ඇත්තේ නො වේ දැ යි සැලැකීමෙන්, තමා ගේ ශක්තියට වැඩියක් ගන්නා ප්‍රබන්ධයකට වස්තු වින්‍යාසය නො කළ යුතු බව යි. අඩග සම්පූර්ණ ප්‍රබන්ධයකට සුදුසු වන වස්තු වින්‍යාසයක් කොටැ, අසම්බන්ධ කොටැ, අශෝභන කොටැ තුබූ කල්හි, ඒ සඳහා ලැබෙනුයේ සංග්‍රහයෙක් නො වේ, මහත් නිග්‍රහයෙකි.

ප්‍රබන්ධයෙන් ප්‍රයෝජන විඳින්නට ඉන්නේ ශ්‍රොතෘ නම්. 'ශ්‍රවණය කරන්නේ' (අසන්නේ) යනු 'ශ්‍රොතෘ' යන්නෙහි අර්ථය යි. කියුවක් නම් අසන්නේ යැ. ලියුවක් නම් බලන්නේ යැ. ලියැවෙනුයේ ද කියැවෙන දෑ මැ යැ. එ හෙයින් ප්‍රබන්ධය අසන බලන දෙ පක්ෂය මැ ශ්‍රොතෘ නාමයෙන් ගැනීම යෙදේ. ශ්‍රොතෘහු ගේ ශක්තියට ප්‍රබන්ධ වස්තු වින්‍යාසය අනුකූල වියැ යුත්තේ යැ. අල්ප ශක්තිය ඇත්තකුට සුදුසු වූ වස්තු වින්‍යාසය මහා ශක්තිය ඇත්තහුට නීරස වෙයි. මහා ශක්තිය ඇත්තකුට සුදුසු වූ වස්තු වින්‍යසය අල්ප ශක්තිය ඇත්තහුට, ළ දරුවකුට දුන් ලෙලි පොලක් මෙන් වෙයි ප්‍රබන්ධ කරණයෙහි දී ශ්‍රොතෘ ශක්තිය නියම කිරීම සිරිත නො වේ. වරදෙකි. කාලය නියම කරන්නා සේ මැ ශ්‍රොතෘ ශක්තිය ද නියම කළ යුත්තේ යැ. වස්තු වින්‍යාසයත් වාක්‍ය රචනයත් එයට අනුකූල වන ලෙස කරන්නට පුරුදු වීම ඉතා වැඩ දායක යැ. කලට තැනට සුදුසු ප්‍රබන්ධ කරන්නවුන් ඇති වනුයේ එයිනි.

**වස්තු අඞ්ග**

ගෙයෙහි ආලින්ද, ශයනාගාර, භෝජනාගාර යනාදිය මෙන් ප්‍රබන්ධ වස්තුයෙහි ද බෙදීම් වෙයි. ඒ එක් එක් බෙදීමට 'අඞ්ග' යන නම්. 'කොටස' යනු ඇති හි.

ප්‍රවේශන, ස්කන්ධ අවසාන යන ති, ප්‍රධාන වස්තවඞ්ග (වස්තු අඞ්ග) වෙයි. ප්‍රවේශනය නම් වස්තුවට බැස ගැනීම යි. නියම වස්තුව ඇතුළත් වනුයේ ස්කන්ධයෙහි (කඳෙහි) ය. අවසානයෙහි අමුත්තක් නො කියැවේ. වස්තු ස්කන්ධයෙහි කියැවුණු දුයින් කළ යුතු විනිශ්චයය දුන මනා වී නම්, ඒ අවසානය ලෙස යෙදේ. වස්තු ස්කන්ධය ශ්‍රොතෘහු ගේ සිත්හි බැදැ ලනු සඳහා, ඔහු පෙරළ දත් දූයක් හා සසඳ ලීම ද, අවසානයෙන් කළ හැකි ය. ස්කන්ධය අතරෙහි දී වූ අඩුවක් පිරිමසා ලීමට ද අවසානය වහල් වෙයි. ඇතැම් විට ප්‍රවේශනය ද, ඇතැම් විට අවසානය ද, තවත් ඇතැම් විට ඒ දෙක මැ ද වස්තුවට අනවශ්‍ය ය.

එක් අඞ්ගයෙක් මහත් වේ නම්, ඒ තැවැතැ ද කොටස් - වලට බෙදේ. ඒ එක එක කොටස උපාඞ්ගයෙකි.

දූත් අඞ්ග සම්පූර්ණ වස්තුවක් ගෙනැ වින්‍යාස කොටැ බලමු.

වස්තුනාමය — ඔරලෝසුව

## වස්තු වින්‍යාසය

ප්‍රථමාඞ්ගය — ප්‍රවේශනය

ඔරලෝසුවක් ඉදිරියෙහි ඇති සේ සලකා එය කනට තබන්නට, එය දෙස බලන්නට කීම, එහි එක් වර මැ සිතට වදනා දේ සඳහන් කරන්නට කීම.

**ද්විතීයාඞ්ගය — ස්කන්ධය**

**(ප්‍රථම උපාඞ්ගය)**

මුහුණ — පිටි පැත්ත — අඞ්ක කටු —

**(ද්විතීය උපාඞ්ගය)**

අඞ්ක දොළොස — දොළොසක් වීමට හේතු — හෝරා කටුවේ ගමන —

**(තෘතීය උපාඞ්ගය)**

එක් අඞ්කයෙකැ සිටැ අනෙක් අඞ්කය දක්වා අතර බෙදීම් — මිනිත්තුව — මිනිත්තු කටුවේ ගමන — මිනිත්තු කටු හෝරා කටු යන දෙකේ සම්බන්ධය.

**(චතුර්ථ උපාඞ්ගය)**

කුඩා චක්‍රය — සැකැංඩු කටුව — සැකැංඩු මිනිත්තු සම්බන්ධය.

**(පඤ්චම උපාඞ්ගය)**

ඔරලෝසුවේ ප්‍රයෝජනය.

**තෘතීයාඞ්ගය — අවසානය**

පුරාතනයන් වේලාව දැන ගත් සැටි — ඔවුන් ගේ කාල මානයත් ඔරලෝසු කාල මානයත් අතර වෙනස.

ඔරලෝසුව මාතෘකා කොටැ ගෙනැ ප්‍රබන්ධයක් කරන්නකු විසින් කොටැ ගත යුතු වස්තු වින්‍යාසය යැ මේ. මෙහි ප්‍රවේශනය ද අවසානය ද නැතත්, වින්‍යාසයෙහි අඩුවෙක් නො වේ. ප්‍රවේශනය බෙහෙවින් මැ ප්‍රයෝජවත් වනුයේ නියම වස්තු ස්කන්ධයට බසින්නට පෙරැ මැ ශ්‍රොතෘහු ගේ

අවධානය තදින් ඇදැ ගන්නා පිණිස යැ. අවසානයෙහි දී, වස්තු ස්කන්ධයෙහි ඇතුළත් දැ ශ්‍රොතෲහු ගේ සිහියෙහි තද කොටැ බැඳැ තබනු සඳහා, ඔහු ගේ පුරාණ දැනීම හා සැසැඳීමෙක් කැරිණ. එ ද, ප්‍රවේශනය මෙන් මැ, නියම වශයෙන් වස්තුවට වැදැ ගත්තේ නො වේ.

වින්‍යාසයෙහි ලා සියලු වස්තුවලට සාධාරණ වූ ක්‍රමයක් දියැ නො හැකි යැ. දියැ යුතු ද නො වේ. මනුෂ්‍ය බුද්ධියේ නිර්මාණ ශක්තියට එය නුවූව මනා සම්බාධයක් වන හෙයිනි. එක මැ මාතෘකාවක් ගෙනැ, දහස් දෙනකුට දහස් අයුරෙකින් වස්තු වින්‍යාසය කළ හැකි වේ. එහෙත් බොහෝ ශිෂ්‍යයෝ ඉතා ප්‍රසිඬ මාතෘකාවක් ලැබැ ද, දස පෙළෙකැ ප්‍රබන්ධයක් කොටැ ගත නො හැකි වැ ඇඹැරෙති. ඔවුන් ගේ වරද නො වේ. ඔවුන් ගේ නිදහස මකා ලන්නවුන් ගේ වරද යැ. කවර නම් දරු-වෙක් තමා දුටු දැය තම මවට නො කියා ද? එහි ලා ඔහුට ආත්ම විශ්වාසය අසම්පූර්ණ වැ ඇත. තමා කියන දැය ආදරයෙන් ප්‍රීතියෙන් අසන්නට විනා, උදාර ලීලායෙන් එහි දොස් මැ දක්වන්නට, එයට සිනා සෙන්නට, එයට වඩා හොඳින් තමාට කියැ හැකි බව හඟවන්නට, මව නො සැරසෙන බව, දරු මැනැවින් දනී. එයින් ඔහුට විශ්‍රම්භය හෙවත් ආත්ම විශ්වාසය ඇති වේ. එයින් අභීතත්වය වැඩේ. එයින් අදහස් නිදහස් වැ ගලා එයි, වචන වහවහා නැඟෙයි, ප්‍රබන්ධය සම්පූර්ණ වේ.

දරුවන් ගොළු වනුයේ රීති නීති පළමු කොටැ උගන්-වන්නට යෑමෙනි. උනට රිසි පරිදි කියන්නට අවසර දුන මැනැවි, කරන්නට අවසර දුන මැනැවි, තමනුදු බැඳුණ මැනැවි, වරද නිකම් මැ හරි ගැස්සෙන්නට ඉඩ දුන හොත්, හරි ගැස්සීමේ ගෞරවයට ලොල් නුවූව හොත්, රීති නීති

නො දන්වා මැ ලං වෙයි. දැන් උගන්නා දරුවෝ රීති නීති පොත් පුරා දනිති; එහෙත් නිවැරැදි වැකියක් ගළපා ගන්නට නම් නො දනිත්.

**වින්‍යාස රීති**

වස්තුව වින්‍යාස කැරැ ගන්නා ක්‍රමය මෙහි රීති නමින් ගන්නා ලැබේ. ප්‍රධාන රීති දෙකෙකි,

(1) සරල
(2) චිත්‍ර

යන විසින්.

**සරල රීතිය**

ස්වාභාවික රීතිය සරල නම් වෙයි. 'ඍජු' (වක්‍ර නුවූ - ඇද නැති) යනු සරල යන්නෙහි වචනාර්ථ යි. ඒ රීතියෙන් වස්තුවක් වින්‍යාස කරන කල්හි, එය සියලු අතින් ස්වභාවික වියැ යුතු යැ. කථාවෙක් නම්, පටන් ගැන්මෙහි සිටැ අග තෙක් පිළිවෙළින් ප්‍රවෘත්තිය සඳහන් කරනු වෙයි. වර්ණනයෙක් නම්, පළමු කොටැ මැ හමු වන තැනින් පටන් ගෙනැ ක්‍රමයෙන් එක් එක් කොටස තනා හඳුන්වනු වෙයි. විවරණයෙක් නම්, පළමු කොටැ පිණ්ඩාර්ථය දී, එක්බිති අවයවාර්ථ දෙනු වෙයි. විචාරණයෙක් නම්, නැඟියැ යුතු සියලු ප්‍රශ්න ගාම්භීර්‍යය වැඩි වන පමණට පෙළ ගසා ගෙනැ ක්‍රමයෙන් විසඳනු වෙයි. කල්පනයෙක් නම්, පළමු මැ මැවියැ යුතු තැනින් පටන් ගෙනැ ක්‍රමයෙන් මවා කෙළවර කරනු වෙයි.

මෙහි පළමු මැ නිදර්ශිත කරන ලද වස්තු සරල රීතියෙන් වින්‍යස්ත වූයේ යැ. එය නැවැතැ කියවා බලා සරල නාමයට ඒ එක එක සුදුසු වේ දැ යි විමසන්නේ යැ.

සරල රීතිය සාමාන්‍ය වශයෙන් නීරස යැ. නැවැත කියැවීමේ ආශාවක් තිපැදීමට එයින් ඉඩෙක් නො ලැබේ. එහෙත් අභාග්‍යයකට මෙන් සිංහල රචනය කොතරම් පහත් අඩියකට බැසැ සිටී ද යත හොත්, සරල නුවූ තන්හි ප්‍රබන්ධයෙකැ අර්ථය වටහා ගැනීමට සමර්ථ වූවෝ සිංහලයන් අතරැ ඉතා විරලයෝ යැ. අතරින් පතරැ එ බන්දෙ වෙත් නම්, විමසා බැලුව හොත් ඔවුන් අන්‍ය භාෂාවෙකින් කළ පත් පොත් ඉගෙනැ අවබොධ ශක්තිය තියුණු කැරැ ගත්ත-වුන් බව වැටැහෙනු නිසැක යැ. අවබොධ ශක්තිය අතිශයින් දුර්වල වන හෙයින් මැ, අප ගේ පද්‍ය කාව්‍යයෙක් වේ නම්, එයට පදනුපදික සන්නයෙක් ද වුව මනා යැ. විසිතුරු ගද්‍යයෙක් වේ නම්, එයට අතිදීර්ඝ ගැටපද විවරණයෙක් වුව මනා යැ. නුවුව හොත් පදය යන්තම් වරද්ද වරද්දා කිය-වති; වැටැහීම එ තරම් ගණනකට නො ගනිත්. මේ දොෂ-යෙන් මිදෙනු පිණිස නම්, සරල මැ නුවූ රීතියෙන් කරන ලද ප්‍රබන්ධ ප්‍රථමාවස්ථායෙහි සිටැ මැ කියැවීමට දරුවන් පුරුදු කැරැවීම අවශ්‍ය වෙයි. එහි දු මහත් සම්බාධයෙකි. බොහෝ ශික්ෂකයෝ වැටැහීමේ ශක්තිය භයඞ්කර රෝගයක් කොටැ සලකති. තමනට එය මඳ වශයෙන් වත් ඇති වුව හොත්, වහවහා එයින් මිදෙන්නට තැත් කෙරෙත්; ශිෂ්‍යයනට එය ඇති වන ලෙසක් පෙනුණ හොත්, එය ඉක්මනින් ශමනය වීමට සුදුසු වූ පිළියම් නො වළහා යොදත්. විසිතුරු රචනයෙන් උද්දීප්ත වූ පත පොත ශිෂ්‍යයන් කෙරෙන් හැකි තරම් ඈත් කරන්නටත්, නීති විරොධ වූ, රීති විරොධ වූ, නීරස වූ, සියලු රහස් එළිරෝ ලා ඇඹූ බලියක් මෙන්, නුවණෙහි වහලක් නැති වැ මැ කියැවෙන විරැවෙන අර්ථ ඇත්තා වූ, ග්‍රාම්‍යාලාප මාලායෙන් කිළිටි වූ පත පොත හැකි තරම් ළං කරන්නටත්, ඇතැම් ශික්ෂයන් කරන විශෙෂ ප්‍රයත්නයෙන් මේ බව මොනොවට පැහැදිලි වේ.

## චිත්‍ර රීතිය

'චිත්‍ර' යනු 'විසිතුරු' යන අර්ථ ඇත්තේ යැ. කුමක් වුව ද විසිතුරු කිරීමට නම්, එහි සරල බව බුරුල් කළ යුතු වේ. සරල භාවයේ බුරුල වැඩෙන පමණට චිත්‍ර භාවය ද වැඩෙයි. ඒ නිකම් මැ සරල භාවය හැරීමෙන් ඇති වන්නෙක් නො වේ. එය හරිමින්, එයට වඩා රමණීය වූ මඟක් ගැනීමෙන් ඇති වන්නෙකි. සරල චිත්‍ර දෙ පක්ෂයේ වෙනස මෙ සේ දැක් විය හැකි යැ :-

| සරලය | චිත්‍රය |
|---|---|
| ඍජු යැ | වක්‍ර යැ |
| නීරස යැ | රසවත් යැ |
| තෘප්ති කර යැ | අතෘප්ති කර යැ |
| නග්න යැ | අලඞ්කෘත යැ |
| විවෘත යැ | සංවෘත යැ |
| අව්‍යාඝී යැ | ව්‍යාඝී යැ |
| අඥ ගෝචර යැ | ප්‍රාඥ ගොචර යැ |

මෙ සේ සඞ්ක්ෂෙප විසින් දත යුත්තේ යැ. විස්තර කරත් හොත්, ග්‍රන්ථය ඉතා දික් වෙයි.

සරලයෙන් දැක්වෙන්න ස්වභාවය බව යටැ කියැවිණ. 'ස්වභාව' යනු ද 'ස්වරූප' යනු ද සමානාර්ථ යි. එ හෙයින් අසරල වූ වස්තුව දක්වනුයේ ස්වරූපය නො වේ, අන්‍ය රූපයෙකි. එය සැලැකීම චිත්‍ර වස්තු විමර්ශනයෙහි දී ඉතා ප්‍රයෝජනවත් යැ.

## චිත්‍ර විභාගය

වස්තුවෙක් කෙසේ චිත්‍ර වේ ද? ස්වරූපය එයින් කෙසේ කෙසේ අන්‍ය රූප භාවයට පැමිණේ ද? විය හැකි අන්‍ය රූප කෙතෙක් ද?

චිත්‍ර කාරයා ගේ ශක්තියට සීමාවෙක් නැති, ඔහුට වර්ණයෙන් (සායමින්) හිඟයෙක් නො වේ නම්, ඔහු ගේ තෙලි තුඩ නො ගෙවුණේ නම්, පට (රෙදි කඩ) රිසි පරිදි ලැබේ නම්, එක මැ වස්තුව අනෙකාකාරයෙන් දැක්වීම බරෙක් නො වේ. ප්‍රබන්ධ චිත්‍ර කාරයා ගේ ශක්තිය එයට ද වඩා අසීම යැ. එ හෙයින් වස්තු චිත්‍රය සම්පූර්ණ ලෙස විභාග කළ හැක්කේ නො වේ.

එකකු එක් ලෙසෙකින් චිත්‍ර භාවයට පමුණුවන වස්තුව මැ අනෙකෙක් තවත් ලෙසෙකින් චිත්‍ර භාවයට පමුණුවයි. තවත් සියයකට, ඒ වස්තුව මැ, තවත් සිය ලෙසෙකින් චිත්‍ර භාවයට පැමිණැවියැ හැකි යැ. චිත්‍ර කාරය සාමාන්‍ය වශයෙන් හැඳිනැ ගන්නට නිදර්ශන කිහිපයක් දක්වා නැවැත්ම එ හෙයින් නුවණට හුරු වෙයි.

## කුම්භීල පක්ෂිය

අප්‍රිකා මහාද්වීපයේ නයිල් නම් මහ නදියෙක් වෙයි. මේ මිශ්‍ර දේශයේ ප්‍රාණය යි. එ හෙයින් මිශ්‍ර දේශ වාසීන් ඒ නදියට දක්වන්නා වූ ආදරය ඉතා මහති.

නයිල් නදිය මිශ්‍රයනට ප්‍රාණ දානය කරන්නාක් මෙන් මැ ඇතැම් විටැ ඔවුන් ගේ ප්‍රාණ ආදානය ද කෙරේ. නදි-යෙහි නහන්නට හෝ නදියෙන් දිය ගෙනෙන්නට හෝ ගියවුන් අතුරින් එකකු පෙරළා නො ගිය වාර බොහෝ යැ. වර්ණ සම්පන්න වස්ත්‍රයෙන් සැරැසී, මිහිරි ගීයක් කියමින්, ප්‍රීතිය බෝ කෙරෙමින්, කළය ගෙනැ දියට ගිය රූමත් තරුණියක ගේ ලෙයින් නදියෙහි දිය රත් වූ වාර කෙතෙක් ද? මතු නො වන්නට මැ දිය යටට ඇදී ගිය නෑයකු නිසා වැලැපෙන්නන් ගෙන් ගං ඉවුරැ වැසී ගිය වාර කෙතෙක් ද?

ඉතා විශාල කිඹුල්ලු මේ නදියෙහි වෙසෙති. එහි දිගපාන්තට මෙන් ඔහු දික් වෙති; නදිය සතුටු කරන්නට මෙන් තර බිලි ගනිත්. ඉතා දුර වූ ද ලක් ගන්නන් ගේ වෙඩි පහර පවා, ගංගාහි කිඹුලුන් නැති කිරීමට අපොහොසත් යැ.

මේ කිඹුලුන් සතුරන් ගෙන් රක්නා ඉතා ආශ්චර්‍යභූත වූ යහළු කෙනෙක් වෙත්. මේ යහළු කම නිසා මැ ඔහු 'කුම්භීල පක්ෂි' යන නාමයෙන් ප්‍රසිද්ධයෝ ය. දියෙහි වේ වා, ගොඩෙහි වේ වා, මේ යහළුවනට නො හඟවා, නයිල් නදියෙහි කිඹුලකුට ළං විය හැක්කෝ අතිශයින් විරල ය හ.

හිරු රස් වැටී මුතු පට මෙන් දිළියෙන වැලි තලාමත්තෙහි අවුව තැපීමට කිඹුලා කැමැති යැ. නයිල් නදියෙහි කිඹුලා ද මේ සම්පත්තිය නො විඳින්නේ නො වේ. බල, එකෙක් ඇති. අප රටෙහි කිඹුලුන් මෙන් නො වැ ඔහු තමන් රැක්ම යහළුවනට පවරා, නිඃශඞ්ක වැ මැ ඒ ප්‍රීතිය විඳිත්. එ පමණෙක් මැ නො වේ. ඒ යහළුවන් ලවා මෙහෙවර ද කරවා ගනිත්.

කිඹුලා ගොඩට ඇදී, සුදුසු තැනකට වී, මහත් කොටැ මුඛය අයයි. යහළුවෝ ඔහු වටා ගනිති. ඇතැමෙක් පිට උඩට යෙති; ඇතැමෙක් දකුණත් පසැ වෙති; ඇතැමෙක් වමත් පසැ වෙති; ඇතැමෙක්, මඳකුත් නො පැකිලැ, ඉදුරා මුව තුළට මැ යෙත්. කිඹුලාට එ තරම් සැපයෙක් කොයින් ද? හේ ඇස් නදින් පියා ගෙනැ, මඳකුදු නො සැලී, ඒ සුඛය සිත් පුරා විඳී. ඔහු ගේ දත් අතුරෙහි ද කිසිලි ආදි මෘදු තන්හි ද වූ කුඩැල්ලන්, කුඩා බෙල්ලන් ආදි වූ සත්ත්වයෝ ඔහුට දෙන වද ක්‍රමයෙන් නවත්වති. කිඹුලා මේ සතුන් ගෙන් මිදීමේ සම්පත්තියට ද, යහළුවෝ මේ සතුන් බිදීමේ සම්පත්තියට ද, එක සේ පැමිණෙති. මේ, යහළු කම තර වීමට මැ ප්‍රමාණ නො වේ ද?

කිඹුල් කුරුල්ලෝ කුඩා සතුන් බිදීමට මැ සැරසුණාහු නො වෙති; යහළුවා රැක්මට ද සැරසුණාහු යැ. එ හෙයින් කිහිප දෙනෙක්, අසලැ රුක් මුදුනෙහි වෙත්. සැක කට යුත්තකු ඇතැ දුටු විටැ, මේ මුර කරුවෙක් එක්තරා නාදයක් කෙරෙයි. ඇතුලෙහි වූවෝ වහා නික්මෙත්. ඒ මහ මුව වැසෙයි. කඳ වේගයෙන් ඇදෙයි. නදියෙහි දිය දෙ බේ වෙයි. එ පමණෙකි.

මඳ වේලාවකට පසු එ තැනින් ඈතැ, නදියෙහි අනෙක් ඉවුරෙහි, සුරක්ෂිත ස්ථානයෙකැ වූ රුකෙකැ පක්ෂි නාදයෙක් ඇසේ. සමහර පක්ෂීන් නදිය දෙස බලනු ද පෙනේ. ඔවුන් යම් කිසිවකු බලා සිටින බව ද හැඟෙයි. ඒ එ සේ මැ යැ. අසලැ නදී ජලය සැලෙන්නට වෙයි. මහ කඳෙක් කුරුල්ලන් සිටි තැනට ඇදෙයි. එහි මහත් කොන දෙපළ වැ උඩු පළෙයෙහි කොන ඉහළ යෙයි. කුරුල්ලෝ තමන් ගේ කාර්‍යය පෙරැ සේ මැ අරඹිත්.

මේ ඔවුන් හැම ද පැවැතුම යි. කිඹුලා රැකෙනු ආශාවසීයෙක් ද? ඇතැම් විටැ කිඹුලා ගොඩට ළං වන් මැ කුරුල්ලෝ හය දකිති; ක්ෂණයෙකින් ඒ බව කිඹුලාට ද දන්වති. මොහොතෙකින් කිඹුලා පෙරළා ගැඹුරැ දියට වැදූයෙයි. මුළු දිනක් රැකැ සිටිය ද, කුරුල්ලන් සිටියැ දී කිඹුලාට ළං වන්නට ලැබේ නම්, ඒ මහත් පුදුමයෙකි.

කිඹුලා හය දත් කෙණෙහි මැ මුඛය වැසුව හොත්, ඇතුළත පිරිසිදු කෙරෙමින් සිටි යහළුවනට කිමෙක් වේ ද? නො නැඟියැ යුතු ප්‍රශ්නයෙකි. එබඳු මුව වැසීමෙක් කිසි කලෙකැත් නො වේ. වී නම්, යහළු කම් කෙළවර යැ, රැක්ම කෙළවර යැ. තිරිසනුන් ගේ ද යුතු කම් සැලැකීමේ මහිමය බැලූව මැනැවි.

මේ චිත්‍ර වස්තුවෙකි. එ මැ සරල වූයේ මෙ සේ සිටී:-

## කුම්භීල පක්ෂිය

අප්‍රිකාවේ නයිල් නම් මහා නදියෙක් වෙයි. එහි ඉතා ලොකු කිඹුල්ලු වෙසෙති. උන් මිනිසුනට මහත් අන්තරාය කරන නමුදු එකකු මැරීම ඉතා දුෂ්කර යැ. ඔවුනට අන්තරාය දන්වන්නා වූ පක්ෂියකු නිසා යැ. මේ පැවැත්ම නිසා ඒ පක්ෂියාට කුම්භීල පක්ෂි යන නාමය යෙදේ.

මේ රටැ කිඹුලා මෙන් මැ නයිල් ගඟෙහි කිඹුලා ද ගොඩට ඇදී ඉර අව්ව තපින්නට කැමැති යැ. ඌට වෙඩි පහරක් යැවීමට මේ හොඳ වේලාවෙකි. කිඹුල් කුරුල්ලා නිසා එයට ඉඩෙක් නො ලැබේ. කුරුල්ලෝ කීප දෙනෙක් එකතු වැ කිඹුලා රැක්මෙහි යෙදෙති. දෙ තුන් දෙනෙක් ගසක් මුදුනට නැගී බලා සිටිත්. සැක කළ යුත්තකු පෙනුණු විගසැ එකෙක් එක්තරා නාදයක් කෙරේ. කිඹුලා ඒ නාදය දනී. එ හෙයින් වහා දියට ඇදී යෙයි.

එ පමණෙකින් අවුව තැපීම නො නවතී. හේ අනෙක් ඉවුරෙහි සුදුසු තැනකට ඇදේ. එ තැනැ භයෙක් වේ නම් කුරුල්ලෝ කලින් මැ දන්වති. එ විටැ කිඹුලා ඇදෙනුයේ ඉනුදු අන් තැනකට යැ.

කිඹුල් කුරුල්ලෝ කිඹුලාට තව ද මෙහෙවරක් කෙරෙති. කිඹුලා ගොඩට ඇදී නිභීය ස්ථානයකට වූ පසු, කුරුල්ලෝ එකකු දෙන්නකු මූරට යවා, කිඹුලා ගේ ඇඟෙහි මෘදු තැන්වලැ ඇලී ලේ බොන්නා වූ කුඩා සතුන් ඇදූ ගන්නට වෙති. කිඹුලා උගේ මහත් මුව ද හරී. සමහර කුරුල්ලෝ එහි ද පිවිසැ දත් අතරෙහි ඇලී සිටි සතුන් ඇද ගනිත්.

කුමක් කළ ද කිසිවකු ද, කුරුල්ලෝ ද නිතර මැ [illegible] මුර කුරුවකු ගෙන් අනතුරක නිවේදනයක් ලත් කොණෙහි මැ සෙවකයෝ වහා ඒ මකර කටින් ඉවත් වෙති. කිඹුලා දියට ඇදේ.

* *

මේ වස්තු දෙක සමාන කොට බලන්නැ. සාරයෙන් වෙනසෙක් වේ ද? නො වේ නම්, දෙ ලෙසකට නිර්මාණය කරනුයේ කුමකට ද? මෙ දෙකින් කුමක් කියැවීමට ද ඔබ ගේ සිත ඇදෙනුයේ? කවර හෙයින් ද යනු පිරික්සා බලන්නැ.

මේ දක්වුණේ වර්ණ්‍ය වස්තුවෙකි. කථ්‍ය වස්තුවෙක් දැන් දක්වේ.

## සතුරු – මිතුරුව

මෙයට අවුරුදු එක් දහස් සසිය පස් පනසකට පෙරැ ලක් දිවැ රජ පැමිණි මහාසේනයෝ මහාවිහාරයෙහි භික්ෂූන් ගේ මතයට විරුඬ වූ කෙනෙකි. ඔවුන් ගේ ගුරු වූවෝ සඞ්ඝමිත්‍ර නම්හ. ඔවුන් මහාසේනයන් ගේ පිය රජ සමයෙහි ජම්බුද්වීපයෙන් ලංකාවට පැමිණියේ, "මහාවිහාර භික්ෂූන් වෛතුල්‍ය මත ගන්වමි, නැත හොත්, ඔවුන් ගේ විහාරයන් මුලිනුදුරුවා පියමි" යන ප්‍රතිඥාව කොටැ ගෙනැ යැ.

මහාසේනයෝ සිය ගුරුනට ඉතා භක්තිමත් වූහ. එ හෙයින් ඔවුන් ගේ සමයෙහි දී ගුරුහු ස්වකීය ප්‍රතිඥාව සමෘඬ කැරැ ලීමට අවකාශ ලද්දෝ යැ. රජුන් ගේ අනුමතිය ඇති වැ, සඞ්ඝමිත්‍රයෝ "මහාවිහාරවාසී ශ්‍රමණයක්හට අහරක් දුන් හකුට සියක් දඩ යැ" යි අණක්

ලැබූ හ. මහාවිහාර භික්ෂූහු අහර නො ලැබැ, මලයයට ද රුහුණට ද ගියෝ යැ. සඞ්ඝමිත්‍රයෝ මහාවිහාරය විනාශ කරවා, වෙහෙර බිම සාවා, උඳු වැපිරවූ හ.

මහාසේනයන් ගේ මිත්‍ර වූ මේඝවර්ණ නම් අමාත්‍ය කෙනෙක් වූවෝ යැ. සඞ්ඝමිත්‍රයන් ගේ ශාසන නාසන ක්‍රියා මොවුන් ගේ මිත්‍ර ධර්මය ලිහිල් කෙළේ යැ. නවුරුදු නවයකට පසු, සඞ්ඝමිත්‍රයන් මහාවිහාරය, ලෝවාමහ පාය ආදිය ඇතුළු විහාර තුන් සිය සූ සැටක් බිඳැ හෙළූ පසු, රට වැසියන් තදින් කිපුණු පසු, මේඝවර්ණයෝ මලයයට ගොස්, එහි සෙනඟ රැස් කොටැ, ගෙනැ, රුහුණට ගියෝ යැ. එහි මිනිස්සු මේඝවර්ණයන් ගේ සේනාව ඉතා මහත් කළ හ.

මෙ සේ සර්වාඞ්ග සම්පූර්ණ වූ මහා සේනාව පිරිවරා, මේඝවර්ණයෝ අනුරාධ පුරය බලා නමා ගත් හ. මේ ප්‍රවෘත්තිය ඇසූ මහාසේනයෝ ද, "යහළුවා ඔහු ගේ තැනෙහි දී මැ, සුදුසු පරිදි දකිමැ" යි තමන් ගේ සේනාව සන්නද්ධ කොටැ ගෙනැ, දකුණ බලා ගමන් ගත්තෝ යැ. ඔහු වහවහා යන්නාහු, කිහිප දිනෙකින් මැ සතුරු සෙනඟට නුදුරු වූ හ. රජ සෙනඟ පැමිණි බව අසා, මේඝවර්ණයෝ මහගමට නුදුරු දූරතිස්ස නම් වැව සමීපයෙහි කඳවුරු ලා ගත් හ මහාසේනයන් ගේ කඳවුර එයට නුදුරු වූ සුරක්ෂිත ස්ථානයෙකැ වියැ.

යහළුවන් ඔවුනොවුන් ගේ ලෙනෙයෙන් කඩු පත් සුරත් කරන දින සෙට යැ. අද දෙ කඳවුරෙහි මැ භටයෝ කවස බැඳුම් ලති, කඩු මුවහත් කෙරෙති, දුනු දඬු දුනු දිය ගි විමසති. නායකයෝ මුළු සෙනඟ පිරික්සා, නො තර තැන් තර කෙරෙති. එක් කඳවුරෙක චරයෝ අනෙක් කඳවුරට වෙස් වලා වැද, එහි ශක්තිය දැනැ ගෙනැ, දුර්වල ස්ථානයන් දැනැ ගෙනැ, ස්වකීය පක්ෂය

දන්වති. සෙනාධිපතීහු, "මෙ තෙක් දෙන පහර දෙන්නෝ යැ, මෙ තෙක් දෙන උභයාංශය රක්නෝ යැ, මෙ තෙක් දෙන පසු කඩ ගෙනැ යන්නෝ යැ, මෙ තෙක් දෙන ආපදාදියෙහි දී එන්නට ඉන්නෝ යැ" යනා ආදීන් සේනා සංවිධානය කෙරෙති.

ඇඳිරි ගැසෙත් මැ, දෙ කඳවුරෙහි මැ ... හවල් ඉතා තර ය. සඳි රක්‍ෂකයා නො හඬවා, ඔහු ගේ තෝමරය එල්ල වනු නො දැනැ, කඳවුරට වදනෝ සුලභ පමණෙකි. ඇතැම් භටයෝ නිසැක වැ නිදත්. ඇතැම්හු සන්නාහ සන්නද්ධ වැ, අදිසි පහරකට මුහුණ පාන්නට සැරැසී සිටිති. වරින් වර නායකයෙක් කඳවුර වටා ගොස් සඳි බලා, රකවල් බලා එයි.

හිරු බැසැ හෝරා දෙකෙක් ගත වියැ. රජ කඳවුරෙහි රක්‍ෂකයෙක් සතුරු කඳවුරින් එන්නකු දිට. රක්‍ෂකයා තෝමරය තර කොටැ අල්ලා ගත්තේ යැ, තොල් තද කැරැ ගත්තේ යැ, එන්නහු ඇසි පිය නො හෙළා බලා සිටියේ යැ. එන්නේ නො නැවැතැ මැ එයි. දුන් කඳවුරෙහි පන්දම් එළිය ඔහුට වැටෙයි. හේ ශොභමාන පුරුෂයෙකි, සුවිනීත ලෙස සුදු වතින් සැරසුණෙකි, සුදු වතින් වැසූ තටුවක් දෑතින් ගත්තෙකි.

ඔහු හා රක්‍ෂකයා හා අතර දුන් තුන් බඹයෙක් පමණ යැ. රක්‍ෂකයා ගේ තෝමරය එල්ල වියැ. ඔහු ගේ මුව විවර වියැ. ඉන් හඬෙක් නැගිණ.

"හෝ, නවතිනු. කවරෙක් දැ?"

"මම, මෙසවණී. රජ සවාමින් දක්නට යෙමි. මා දක්වව."

රක්ෂකයා දික් කළ තෝමරය ඇද, අමුත්තා වැදැ, "මෙ සේ මෙ සේ වඩිනු මැනැවැ" යි කියමින් පෙරටු වියැ. ක්ෂණයෙකින් මහාසේන මේඝවණ්ණ යන දෙ දෙන යළි දු මුණ ගැසුණෝ යැ. මේඝවණ්ණයෝ රජුන් වැදැ, තටුව පසෙකැ තබා, වැස්ම ඉවත් කළෝ යැ.

"මේ මක් ද, මේඝවණ්ණයෙනි?"

"දෙවයන් වහන්ස, මට මලය රටින් ලැබුණෙකි. මේ ප්‍රණීත මාංසයෙකි. මේ මධුර පානයෙකි. පෙරැ මෙ බත්දක් ලත් කලැ මට සිහි වන සේක් ඔබ වහන්සේ යැ. අද ද මෙතෙසේ නො වී යැ. එ හෙයින් ගෙනැ ආමි. කැව මැනැවැ, පුව මැනැවැ,"

"තෙපි ද හිඳැ ගනුව, මේඝවණ්ණයෙනි" යි කියමින් මහාසේනයෝ හිඳැ ගත් හ. මේඝවණ්ණයෝ ද හිඳැ ගත් හ. තටුව මදින් මද හිස් වියැ. "ඉතා මිහිරි යි, මේඝවණ්ණයෙනි, ඉතා මිහිරි යි" යනු අතරතුරැ කිහිප විටක් මැ රජුන් ගේ මුවින් නික්මිණ.

කා බී කෙළවර වූ පසු, යහළුවෝ දෙ දෙන එක් වැ හිඳැ ගෙනැ, කථාවට වැටුණෝ යැ.

"මා ගේ පරම මිත්‍ර වූ තෙපි මට කවර හෙයින් දුමරික වූ හු ද?"

"ඔබ වහන්සේ හට මම දුමරික නො විමි. ඔබ වහන්සේ ගේ ශාසන නාශන ක්‍රියාවට මම දුමරිකයෙමි. මහා විකාරය නැසීමෙන් ශෝකයට පත් වැ මෙ සේ කෙළෙමි."

“මේඝවර්ණයෙනි, මා මුළා වැ කළ වරදෙකි. මම මහා විහාරය නැවැත කරවන්නෙමි. තෙපි මා ගේ වරද ක්‍ෂමා කරවු ද?

“ඒකාන්තයෙන් මැ, දෙවයන් වහන්ස, ක්‍ෂමා කෙරෙමි. මහා විහාරය කැරැවීමට සහාය ද වෙමි. මා ගේ වරද ද ක්‍ෂමා කළ මැනැවි”

දෙ මිතුරෝ මිතුරෝ මැ වූ හ.

යුද්ධය එ පමණෙකි. මේ ප්‍රවෘත්තිය විදු ලිය මෙන් දෙ කඳවුරෙහි පැතිරැ ගියේ යැ. පසු දිනැ උදයෙහි එහි දක්නට ලැබුණේ කඳවුරු උගුළුවා යන්නට සැරැසෙනු පමණෙකි. සත්‍ය වූ මිත්‍ර ධර්මයක් බැලුව මැනැවි. දහස් ගණන් ජනයා ගේ මරණය වැළැකිණ. මහා විහාරය පමණක් නො වැ, නසන ලද සියලු විහාර මැ පෙරළා කැරැවිණ. මහා ජනයා ගේ කෝපය නිවිණ. රට සුව පත් විණ.

* * *

මෙ ද චිත්‍ර වස්තුවෙකි. සරල වූ විටැ සිටුනා අයුරු මේඝවර්ණාභය අමාත්‍ය ප්‍රවෘත්තියෙහි යටැ දැක්විණ.

වස්තුවක් චිත්‍ර කරන අයුරු දැන් සාමාන්‍ය වශයෙන් වැටැහියැ යුතු යැ. ඒ ආදියෙහි මැ පටන් ගනු නො මැනැවි. පැසුණා වූ බුද්ධිය ද, ගලන වචන සම්පත්තිය ද, නො පැකිලෙන පුරුද්ද ද ඇති වූ පසු, චිත්‍ර වස්තු නිර්මාණය නිතම් මැ පැමිණේ. එ තෙක් සරල වස්තුයෙන් සෑනැහුණ මනා යැ.

ප්‍රකෘති වස්තුව සමාන රූප වූ අන්‍ය වස්තුවක් බවට පෙරළා ගැනීම ඉතා උසස් චිත්‍ර කරණෝපායයෙකි.

# පළමු වන මහ වෙදැදුරා

පන්තියේ ළමයි කවුරුත් තමන් තමන් දන්නා වෙදුන් ගේ නම් කීවෝ ය, ඒ ඒ වෙදුන් ගේ සමර්ථ කම් වර්ණනා කළෝ ය. ගුරු තුමා ද තමා හඳුනන පළමු වන මහ වෙදු ගේ තොරතුරු කියන්නට පටන් ගති.

“මෙ කී වෙද්දු කවුරුත් සමර්ථයෝ ය. ලෙඩක් වූ කලැ මොහු අවුත් බෙහෙත් කිරීම් කෙරෙති, අපේ මුදල ද ගෙනැ යෙති. මේ සියල්ලන්ට මැ වඩා සමර්ථ වූ වෙදකු ගැන මම කියමි. ඔහු හොඳින් හැඳිනැ ගෙනැ, ඔහු ගෙන් වැඩ සලසා ගන්නට උත්සාහ කළ යුතු යි.

“මා කියන මේ වෙදු නම් ලෝකයෙහි ඇති තාක් වෙදුන් අතුරින් ප්‍රධානයා ය. එහෙත් ඔහු ගෙන් වෙද කම් ගැනීම තරම් පහසු වූ කාර්යයෙක් වෙන නැත. වෙන වෙදුන් කැඳවා ගෙනැ ඒමට නම්, යම් කිසිවකු යා යුතු යි, රථයක් ගෙනැ යා යුතු යි, පඩුරු ගෙනැ යා යුතු යි. මේ මහ වෙදු කැඳවා ගෙනැ ඒමට යාම, නුවුව මනා ය. ඔහුට රථ නුවුව මනා ය. ඔහුට පඬුරු නුවුව මනා ය. කැඳැවීමක් නැති වැ, හේ තෙමේ මැ එයි.

“මේ මහ වෙදු නියම වේලාවට එයි, නියම කාලයක් නවතී, නියම වේලාවට යෙයි, කා ගේ ගෙදරටත් එයි, කාටත් වැඩ කෙරෙයි. ‘මේ දුප්පතා ය, මේ පොහොසතා ය’ යි වෙනස් කොට සැලැකීමෙක් ඔහු ගේ නැත. පඬුරු නො ගන්නා බැවින්, ගරු බුහුමන් නො තකන බැවින්, ඔහුට කවුරුත් එක සමාන වෙති. මිනිසුන් පමණක් නො වැ, තිරිසන්නු ද, ගස් වැල් ආදිය ද, ඔහු ගෙන් එක සේ ප්‍රයෝජන ලබති. අහෝ, කො තරම් ගුණවත්, කො තරම් උතුම් වෙදෙක් ද!

"මේ පුදුම මහ වෙද දොරිනුත් එයි, කවුළුයෙනුත් එයි, බිත්තියෙහි හෝ පියස්සෙහි හෝ වූ සිදුරිනුත් එයි; එ සේ අවුත් නිදන්නන් පුබුදුවයි, ගෙයි අඳුරු නැති කොටැ, තෙත් වූ තැන් වේළා දමයි, කුණු ඇති තැන් පෙන්නා දෙයි, ලෙඩ බෝ කරන කුඩා සතුන් එළවා දමයි. එ හෙයින් නුවණ ඇති අය මේ මහ වෙද තුමාට බොහෝ ගෞරව කෙරෙති, ඔහු එන වේලාව දැනැ, ඇති තාක් දොර කවුළු අදිය හැරැ දමති, ගෙයි සියලු තන්හි මැ ඔහුට රිසි සේ හැසිරෙන්නට ඉඩ දෙති.

"මේ වෙද කිසි කලෙකැත් කිසි බෙහෙදක් නියම නො කෙරෙයි, 'මේ මේ දෑ කරව' යි අවවාදයකුදු නො දෙයි, කළ යුත්තක් ඇත හොත් එය තෙමේ මැ කෙරෙයි. ඔහු ගේ සියලු උත්සාහය ලෙඩ වැළැක්වීමට යැ, ලෙඩ ආ කලැ එයට පිළියම් කිරීමට නො වේ. එ හෙයින් මේ මහ වෙද ගෙන් සුදුසු වැඩ ගන්නට දන්නා අය ගේ ගෙදරට වෙන වෙදුන් ගේ පැමිණීම ඉතා අඩු යැ.

"නුවණ නැති කම්මැලි අය මේ වෙද උතුමාට සුදුසු තරම් ගෞරව නො කෙරෙති, ඔහුට පහසුයෙන් එන්නට දොර කවුළු ආදිය හැරැ නො දමති, ඔහුට ගෙයි සියලු තන්හි හැසිරෙන්නට ඉඩ නො දෙති. මේ නිසා එ බඳු අය ගේ ගෙදරැ එක් පසෙකැ සොටු සූරන අය වෙති, එක් පසෙකැ කහින අය වෙති, එක් පසෙකැ උණින් කෙඳිරි ගාන අය වෙති; සමහරු කසාය උණු කෙරෙති, සමහරු බෙහෙත් අඹරති, සමහරු කැඳ උයති, සමහරු වෙදුන් කැඳවා ගෙනැ එන්ට යෙති, සමහරු වෙදුනට ගෙවීමට, බෙහෙත් ගැනීමට මුදල් සොයති. අහෝ කො තරම් නුනුවණ කමෙක් ද!

"දැනින් මා කියන මහ වෙද උතුමා ගේ ද, වෙන වෙදුන් ගේ ද වෙනස හොඳින් පෙනේ. මේ වෙද උතුමා හඳුනන්නහු ද?"

ගුරු තුමා මෙ සේ කී කල, සියලු ළමයි දකුණත් දිගු කොට සූර්ය රශ්මිය දක්වූ හ.

* * *

මේ වස්තුයෙහි චිත්‍රවිධය පැහැදිලි ය. සූර්ය රශ්මියෙන් සිදු වන වැඩ ඉඳුරා පවසනු ලද්දේ නම් ඒ සරල වස්තු යි. අගැ දී දරුවන් සූර්ය රශ්මිය පෙන්වූ බවක් කියනු ලද නමුත්, වස්තුයෙහි හෝ ප්‍රවෙශනයෙහි හෝ ඒ සඳහන් නො කැරිණ. සඳහන් කැරුණේ මිහ වෙදකු ගේ තොරතුරු යි. ප්‍රකෘති රූපය සැරූ සමාන වූ වෛද්‍ය රූපයක් ගැනුණු හෙයින්, මේ සමාන රූප චිත්‍රයෙකි.

ප්‍රකෘති රූපයෙන් දක්විණි නම් ලැබෙනුයේ මෙ බන්දෙකි:-

## සූර්ය රශ්මිය

සූර්ය රශ්මිය ලෝකයට අප්‍රමාණ වැඩ සලසන්නේ ය. කිසි වියදමක් නැති ව, වෙහෙසක් නැති ව එය ලබා ගත හැකි ය. තමන් සිටිනා තැනට මැ ඒ පැමිණේ නම්, කුමන වියදමෙක් ද? කුමන වෙහෙසෙක් ද?

නියම වේලාවෙකැ මැ එන හෙයින් ද, නියම වේලාවක් පවත්නා හෙයින් ද, නියම වේලාවෙකැ මැ යන හෙයින් ද, සූර්ය රශ්මියෙන් වැඩ සිදු කැරැ ගැනීම විශෙෂයෙන් මැ පහසු ය. දුප්පත් පොහොසත් පහත් උසස් සියලු දෙනාට සූර්ය රශ්මිය එක සේ ලැබේ. එයින් මහත් වැඩ සිදු වනුයේ මිනිසුනට මැ නො වේ. තිරිසනුනට ද ගස් වැල් ආදියට ද එයින් එක සේ වැඩ සිදු වේ.

කල යුත්තේ සූර්ය රශ්මිය එන මඟ නො වැසීම පමණෙකි. ගෙයෙකැ නම් බොහෝ දොර කවුළු ඇති වියැ යුතු යැ. එ කලැ දොරින් කවුළුයෙන් ඇතුළට වැටෙන සූර්ය රශ්මිය කාරණ කොටැ ගෙනැ, අඳුරු දුර වෙයි. තෙත තැන් වියැළෙයි, ලෙඩ ඇති කරන කුඩා සත්තු දුරු වෙති, උණුසුම ඇති වේ. මේ හේතු කොටැ ගෙනැ ඒ ගෙය ලෙඩින් තොර වන්නේ යැ.

* * *

දැන් බලන්නැ මේ එක මැ වස්තුවේ දෙ ආකාරයෙහි වෙනස. කිමෙක් ඔබ ගේ සිත් ගනී ද? කවර හෙයින් ද? සිත් ගන්නා වස්තුවට ඔබ යම් සේ කැමැති වෙත් ද, සෙස්සෝ ද එ සේ මැ කැමැති වෙති. එ හෙයින් ඔබ ගේ වස්තු නිර්මාණයකට අනුන් ගේ සිත් තදින් ඇදැ ගන්නට කැමැත්ත වේ නම්, වස්තුව චිත්‍ර කිරීමේ සමර්ථ භාවය ඇති කැරැ ගත මැනැවි. එයට පෙරැ ලොකය නුවනිනුත් නුවණිනුත් බලා, හැකි තරම් සාරය ඇදැ ගැනීමත්, දක්ෂයන් ගේ යෙදුම් බලා, පොළා, පෙළා, අවුළා පෙරළා, නො පැකිළෙන රචනා චාතුර්ය නිපැදැවීමත් අවශ්‍ය වේ මැ යැ.

තව ද චිත්‍ර වස්තුවකට සිත යොමු කරන්නැ.

## මහා ප්‍රේතය

අපට නො පෙනෙන ප්‍රේතයන් ගැන පිටිසර මිනිස්සු බොහෝ කථා කියති. ඇතැම් විටැ ප්‍රේතයෝ අපේ ගෙවලට එත් ලු, ගෙට නොයෙක් අපල කෙරෙත් ලු, ගෙයි අයට දරුණු රෝග ද පමුණුවත් ලු. එ හෙයින් සමහර මිනිස්සු, "මේ ප්‍රේතයන් දුරු කරනු පිණිස" යැ කියා පිදැවිලි දෙති, තොවිල් ආදිය ද කරවති.

නො පෙනෙන ප්‍රේතයන් ගෙන් වන දෙස් දුරු කිරීමට මෙ තරම් උත්සාහ කරන නමුත්, ඇසට පෙනිපෙනී මහත් අපල කරන මහා ප්‍රේතයන් ගැන මිනිසුන් දන්නා බවෙක් නො පෙනේ. පුදුමයෙකි! මේ ප්‍රේතයෝ සියලු දිනෑ මෑ පෙනිපෙනී ගෙයි හැසිරෙති, ආහාරපානයන් කිලිටි කෙරෙති. භයඞ්කර රෝගයනුදු උපදවත්. එහෙත් මෝඩ මිනිස්සු මේ ප්‍රේතයන් ගෙයින් එළැවීමට වත්, ගෙට නැවැතෑ පැමිණීම වැළැක්වීමට වත් කිසි උත්සාහයක් නො කෙරෙති.

මෙ වර්ගයේ ප්‍රේතයන් ගෙන් ඉතා දරුණු එකකු ගැනෑ මම කියමි. උඹ හැඳිනෑ ගෙනෑ, නො පෙනෙන ප්‍රේත-යනට වඩා උගෙන් වන අනතුරු භයානක බව දැනෑ, උඹ දුටු දුටු තැනෑ දුරු කරන්නටත්, උඹට සතුරකු ගේ වත් ගෙටෑ පැමිණීමට ඉඩ නො දෙන්නටත් උත්සාහ කළ යුතු යෑ.

මේ ප්‍රේතයා විශාල ශරීර ඇත්තෙක් නො වේ. එහෙත් ආහාරපානයන් ගෙන් කිසි විටෙකැත් තෘප්තියට නො පැමිණේ. නො පෙනෙන ප්‍රේතයෝ ආහාරපානයට බැල්ම පමණක් හෙළත් ලු. එහෙත් මේ ප්‍රේතයා ආහාරයක් හෝ පානයක් හෝ දුටු විටෑ වහා එයට ගොස් වදී. අතිශයින් පිළිකුල් කට යුතු වූ සෙම්, සොටු ආදි වූ හෝ, කුණු කසළ ආදි වූ හෝ, යම් කිසි අපවිත්‍ර ද්‍රව්‍යයක් දුටු ද, වහා එයට වදී. පවිත්‍ර යෑ අපවිත්‍ර යෑ යි මේ චෙතසක් නො කෙරෙයි. අපවිත්‍රයෙන් පවිත්‍රයට ද, පවිත්‍රයෙන් අපවිත්‍රයට ද එක සේ පැමිණේ.

පාද සයෙකින් ද අත් හැඳි සතරෙකින් ද මහත් ඇස් දෙකෙකින් ද, නළයක් වැනි මුඛයෙකින් ද යුක්ත වූ මේ ප්‍රේතයා අපවිත්‍ර දෑයෙකෑ හුන් කලෑ, ඒ දෑය තමා ගේ පාදයන්හි තවරු ගනී, රොග උපදවන ඉතා සියුම්

සතුන් සහිත වූ ඒ දූය තුඩින් උරා ගනී, එයින් ගොස් මිනිසුන් ගේ ආහාර පානාදියට වදී; තමා උරා ගත් පණුවන් සහිත අපවිත්‍ර දෑ එහි වමාරයි, යළි එ තැනින් යම් කිසිවක් උරා ගනී, මෙ සේ කිරීමේ දී තමා ගේ පාදාදියෙහි තැවැරුණු කුණු ද මේ ආහාර පානයනට එක් කෙරෙයි.

අහෝ, දරුණු කමක් බැලුව මැනැවි. මෙ සේ කිලිටි කරන ලද ආහාර-පානයන් වැළැඳූ අයට ඇතැම් විටැ මරණය හෝ පැමිණේ, මරණය හා සමාන දුකෙක් හෝ වෙයි. කවර හෙයින් ද? එ බඳු ආහාරපාන සේවන-යෙන් අතීසාර, සන්නිපාත ජ්වර ආදි මාරක රොගයන් ඇති වන හෙයිනි.

රෝග භය ඉපැදවීමට මෙ ප්‍රේතයා කරනුයේ ආහාර-පානයන් කෙලෙසීම පමණක් නො වේ. මේ කුණු කසළ උරා තවරා ගෙනැ අවුත් ඇතැම් විට අපේ ඇඟෙහි හිඳැ ගනී, ඇතැම් විටැ අපේ තොලෙහි ද හිඳැ ගනී, හුන් හුන් තැනැ කෙලෙසයි. මෙ සේ වැකුණු කසළක් යම් කිසි ලෙසෙකින් මුඛයට වැදුණ හොත්, පෙරළා කී භය උපදී මැ යැ. අසරණ බිළිඳුන් ගේ අත්, තොල් ආදියෙහි හිඳැ ගනීමෙන් මේ ප්‍රේතයා කරන අනතුරුයෝ ඉතා බොහෝ යැ.

එක් තැනෙකැ දී උරා ගත් දූය අන් තැනෙකැ දී වමාරා දැමීම මේ ප්‍රේතයා ගේ ඉතා මහත් නීච ගතිය යි. වරක් කැ දූය වමාරා අන් කිසිවක් කෑම තරම් ප්‍රේත භාවයක් තවත් ලෝකයෙහි ඇතැ යි නො සිතේ. එ හෙයින් මේ ප්‍රේතයාට වඩා මහත් ප්‍රේතයෙක් නැත්තේ මැ යැ යි සිතියැ යුතු තරම් යැ.

කුණු වන්නා වූ ආහාර ද්‍රව්‍යයන් ඇති තන්හි මේ ප්‍රේතයෝ බෙහෙවින් හැසිරෙති. එ හෙයින් මූත් දුරැ

කිරීමට කැමැත්තාහු, ගෙහි හෝ ගෙය අසලැ හෝ කිසි ද්‍රව්‍යයක් කුණු වන්නට නො හරිත්, ගෙහි සියලු තැනැ මැ මහත් සැලැකිල්ලෙන් පිරිසිදු කොටැ, ඇති තාක් තසළ ගින්නෙන් දවා හළු කොටැ දමත්. මෝඩ මිනිස්සු ගෙය අසලැ තසළ ගොඩක් කැරැ ගනිති. මෙයින් භයානක උපද්‍රව පැමිණේ. එහි ලක්ෂ ගණන් ප්‍රේතයන් ඇති වන හෙයිනි. තසළ යම් තැනෙකැ වේ ද, ප්‍රේතයෝත් එ තන්හි මැ වෙති.

උදය මැ ප්‍රේතයනට මහත් පිපාසාවක් ඇති වනු සිරිති. එ හෙයින් ඔහු දිය බිඳුන් ආදියට ලං වැ පැන් බී එය කෙලෙසති. පැන් බඳුන් මනා සේ වසා තිබීමෙන් මේ උවදුරු දුරු කැරැ ගත හැකි වේ. ආහාර භාජනයන් ද ප්‍රේතයනට ලං වියැ නො හැකි පරිද්දෙන් සුරක්ෂිත කිරීම අවශ්‍ය යැ. මේ සඳහා ලොහො දැලින් කැරැණු වැසුම් භාවිත වෙයි. ප්‍රේත දෙෂයන් ගෙන් වළකින්නට නම්, මෙ සේ ද කොටැ, ආහාරපානාදියක් වළඳන්නට පෙරැ මුව ද, අත් ද මනා සේ සෝදා පිරිසිදු කළ යුතු යැ.

නුවණ ඇති මිනිස්සු ගෙය පිරිසිදු කළ ඉක්බිති 'ගිනි දිය' නම් ඖෂධ ජලය ඉසිති. ප්‍රේතයෝ මෙයට ලං නො වෙත්. සියලු තැනැ හොඳකාර හැමැදැ, තසළ හළු කොටැ, ගිනි දිය ඉසැ, සුවඳ දුම් දෙන ගෙයින් ප්‍රේතයෝ දුරු වන්නාහු යැ.

අපට නො පෙනෙන ප්‍රේතයන් එළැවීමට හෝ සතුටු කිරීමට හෝ පලමු, පෙනිපෙනී මේ තරම් භයානක උපද්‍රවයන් කරන ප්‍රේතයන් දුරු කිරීම නුවණට හුරු නො වේ ද? වේ නම්, අද මැ ඊට හිත යොමු කළ යුතු යැ. මේ ප්‍රේතයා අනෙකෙක් නො වේ, මැස්සා යැ.

කොතරම් රමණීය චිත්‍රයෙක් ද? මෙහි වස්තුව සරලාකාරයෙන් දක්වන්නැ. එය ද මෙය ද කියවා බලා, මේ ප්‍රශ්නවලට උත්තර දුන මැනැවි:-

1. කිමෙක් වඩා කොට ද?

2. කිමෙකැ අර්ථය වඩා පැහැදිලි ද?

3. කිමෙක් වඩා රමණීය ද?

4. එසේ වීමට, හේතු කිම?

5. වඩා යොග්‍ය වනුයේ ඉතා සැකෙවින්, ඉතා පැහැදිලි වැ තේරෙන ලෙස කීම ද? නොහොත් වක ගසා, දික් කොටැ, නළවා, ලෙළවා කීම ද?

6. සියලු තන්හි එක්බඳු කොටැ කීමෙන් කවර අවැඩෙක් සිදු වේ ද?

7. එබඳු අවැඩක් සිදු නො වන්නට නම් කළ යුත්තේ කිමෙක් ද?

වස්තු චිත්‍රන මෙතෙකින් කෙලවර කළ නො හැකි වනු දු දූනට මේ පමණි. මෙයින් රසාශාව ඇවිස්සුණු කලැ විමර්ශන බුද්ධින නිතර පිබිදී සිටී. මහා ශ්‍රේෂ්ඨ රචකයන් ගේ යෙදුම් බලබලා එහි රස විඳින්නටත්, නීරස වූ ශාස්ත්‍ර විරොධි වූ, ග්‍රාම්‍යාලාප මාලාවත් හැඳිනැ දුරැ කරන්නටත් පුරුදු වනුයේ එයිනි. ඒ පුරුද්ද චිත්‍ර වස්තු සාගරයෙහි ඔබ තිම්බගලයකු බවට පමුණුවන්නේ යැ.

# 2. සන්දර්භය

විත්‍යාස කරන ලද වස්තුව කීමෙන් හෝ ලිවීමෙන් හෝ අන්‍යයනට ද ප්‍රකාශ වූයේ සඳැහී නම්. වස්තුව මනස ගොචර යැ. සඳැහිය බණනා ලද්දේ ශ්‍රැති (කණී) ගොචර වෙයි, ලියන ලද්දේ දෘෂ්ටි ගොචර වේ.

වස්තුව මෙ සේ බෙදා විත්‍යාස කරනු ලද්දේද, සඳැහීයක් ලියූ කල්හි එ සේ මැ බෙදී සිටී. මේ එක් එක් බෙදුම ඡේද නම් වෙයි. වස්තු නිදශීත යැ යි දක්වූ සියලු තන්හි වස්තු සඳැහි යන දෙක මැ ඇති බව දුන් වැටැහෙනු නිසැක යැ. දෘෂ්ටි ගොචර වූ සඳැහී-යෙන් තොර වැ මනස ගොචර වූ වස්තුව දක්වියැ නො හැකි යැ. වාක්‍යයෙකින් දක්වියැ යුතු. දෑ පදයෙකින් දෙකෙකින් යන්තම් අඟවමින් වස්තු සවරූපය මඳ කොටැ හැඳින්වියැ හැකි වුව ද, එ ද සඳැහී සාරය ලෙස ගත යුතු වන බැවින්, සඳැහී සහයෝගය වන්නේ මැ යි.

**සඳැහී නාමය**

සඳැහී රචනයට පෙරැ හෝ පසු හෝ නාමයක් යොදා ගත යුතු යැ. වස්තු විත්‍යාසයට පෙරැ මැ නමක් යොදා ගත ද වරදෙක් නො වේ. අනුන් විසින් දෙන ලද නාමයෙක් වේ නම්, ඉතිරි වැ ඇත්තේ වස්තු විත්‍යාස-යත් සඳැහී රචනයත් පමණෙකි. තමන් විසින් නම දියැ යුතු වේ නම්. ඒ ඉතා සැලැකිල්ලෙන් කළ යුත්තේ යැ.

නම් දීමේ රීතියක් පසිඳැ ගන්නට පෙරැ, පුරාතනයන් සවකීය සඳැහීයනට නම් දුන් පරිදි මඳක් විමසා බලමු.

1. මූව දෙව් දාව
2. ස්තූප වංශය
3. පැරකුම්බා සිරිත
4. පොළොන්නරු පුර වර්ණනාව
5. විශුද්ධි මාර්ගය
6. කර්ම විභාගය
7. ජානකී හරණය

මේ සියලු නම් නපුංසක ලිඞ්ග බව පෙනේ. සිංහල සම්ප්‍රදායයට අනුව, සඳැහියකට නපුංසක ලිඞ්ග නුවූ නාමයක් දීම වරදෙකි. පුල්ලිඞ්ග ස්ත්‍රී ලිඞ්ග නාමයක් මුල් කොට, ගෙන, නිපැදවුණ සඳැහී නාමය නපුංස නාමයක් ලෙස වරනැඟිය, හැකි විය යුත්තේ මැ ය. තුන් වැනි ඉන් — එන් — පස් වැනි අ — එහි — විබත් ගැන්විය හැකි වේ නම්, ඒ නපුංසක ලිඞ්ග නාමයක් බවට සාක්ෂ්‍ය යි. මූව දෙව් දායෙන් — මූව දෙව් දායෙහි — යනාදි විසින් 'මූව දෙව් දා' නාමය වරනැඟිය හැකි වන බැවින්, ඒ නපුංසක ය. සෙසු නන්හි දු මේ මැ නය යි.

ඉංගිරිසි ක්‍රමය බලා.

කුම්භීල පක්ෂියා
මිතුරු සතුරෝ
ගැහැනියක්
හිඟන කොල්ලා

යනාදි විසින් සඳැහියකට නම් කිරීමේ සිරිතෙක් මෑතෙකැ දී බෝ වන්නට විය. එහෙත් ඒ සිංල සම්ප්‍රදායයට ඉඳුරා විරුද්ධ ය. තුන් වැනි පස් වැනි විබත් ගැන්විය නො හැකි වන බැවින් එබඳු නන්හි සිංහල රීතියෙන් නම් විය යුතු කෙසේ ද?

කුම්භීල පක්ෂිය
මිතුරු සතුරුව
ගැහැනිය
සිඟන කොලුව

යන විසිති.

ගුත්ති ලය
සෞන්දරනන්දය
ශකුන්තලය
මුද්‍රාරාක්ෂසය

යනාදි පුරාතන සඳැහී නාමයන් පිරික්සීමෙන්, අප දක්වන නාම කරණ ක්‍රමය සුදුසු බව පැහැදිලි වෙයි. ගුත්තිලයා පිළිබඳ වැ කළ සඳැහීය 'ගුත්තිලය' නම් වියැ. සුන්දරිය ද, නන්දයා ද අරමුණු කොටැ කැරුණේ 'සෞන්දරනන්ද' නාමයෙන් හැඳින්ණ. 'ශකුන්තලය' නම් ශකුන්තලාව (එ නම් ස්ත්‍රිය) නිසා ඇති වූයේ යැ. මුද්‍රාවත් (මුන්දත්) රාක්ෂසයාත් සම්බන්ධ වැ කැරුණු සඳැහීයට 'මුද්‍රාරාක්ෂසය' යන නාමය යෙදිණ. දැන් පුරුදු වන්නා සේ ඉංගිරිසි ක්‍රමයට ඉඩ දෙමු නම්—

| | |
|---|---|
| ගුත්තිලයා | (Guttila) |
| සුන්දරිය හා නන්දයා | (Sundari and Nanda) |
| ශකුන්තලාව | (Sukuntala) |
| මුද්‍රාව හා රාක්ෂසයා | (The Ring and Rakshasa) |

යන විසිති නම් යෙදියැ යුතු වන්නේ. අපි ද ඇතැම් විටැ එ බඳු සඳැහී නාම යෙදූමු. එ හෙත් ඒ වැරැදි බව ඉඳුරා පෙනෙන හෙයින්, සිංහල රීතියට අනුකූල වන ලෙස මෙයින් ආරාධනය කෙරෙමු.

සඳැහී නාමය කුමක් මුල් කොටැ තෙනැ හැරනු ලැබේ ද? ප්‍රබන්ධ කාරයාට අභිමත වූවක් මුල් කොටැ යැ.

(1) තැනෙක වස්තු සාරය නම දෙති.

මහාවංශය

යනු නිදර්ශන යි, මහතුන් ගේ වංශය යනු එහි අර්ථ යි. සියලු වස්තු සාරය මෙයින් හැඟැවේ.

(2) ඇතැමෙක වස්තුයෙහි අන්තර්ගත වූ ප්‍රධාන ප්‍රවෘත්තිය නාමයට හේතු වේ.

ජානකී හරණය

යනු මෙති. 'ජානකිය (සීතාව) පැහැර ගෙන යාම' යි අර්ථ යි. වස්තුයෙහි සඳහන් ප්‍රවෘත්ති අතුරින් ප්‍රධාන වූයේ ඒ යැ.

(3) තැනෙක නායක නාමය හෝ නායිකා නාමය හෝ දෙක මැ හෝ සඳහී නාමය වේ.

නෛෂධය
ශකුන්තලය
මාලතීමාධවය

යනු මෙති.

(4) වර්ණ්‍ය ප්‍රබන්ධයකට සාමාන්‍ය වශයෙන් වනුයේ වර්ණ්‍ය නාමය මැ යැ.

සිංහයා
විශාඛාව
ලෝකය

යනාදි විසිති

(5) ශාස්ත්‍රීය සඳහීය කෘතී නාමයෙන් ද ගැනේ.

පාණිනීය
සුශ්‍රුතය

යනාදි විසිති.

(6) ප්‍රබන්ධ වර්ගීය හඟවන උපපදයෙකින් අන්ත වන නාම බෙහෙවින් යෙදේ.

දහම් සොඬ වත
පැරකුම්බා සිරිත
පොළොන්නරු පුර වර්ණනාව

යනාදි විසිති.

(7) ඇතැම් ප්‍රබන්ධ කාරයෝ ස්වකීය ප්‍රබන්ධයේ උසස් බව හෝ ප්‍රයෝජනවත් බව හෝ හඟවන නාමයයෝ යොදත්.

කාව්‍ය ශේඛර
සාහිත්‍ය දර්පණය

යනාදි විසිති.

# 3. ඡේදය
# PARAGRAPH

වස්තු වින්‍යාසය කොටැ ගත් පසු ඡේද වෙන් කිරීම අමුතුවෙන් කළ යුත්තෙක් නො වේ. එ හෙත් වින්‍යාසයේ දී බරක් නො දන්නෝ ඇතැම් විටැ සැඳහී රචනයෙහි දී ඡේදය පුරවන්නට ගොස් ඇඹැරෙති. වින්‍යාසයට පළමු මැ සිතා බැලියැ යුතු යැ. සතකු වර්ණනය කරන්නට සිතා වස්තු වින්‍යාසය කරත් හොත්—

(1) හිස
(2) කඳ
(3) පාද
(4) නගුට
(5) පැවැත්ම
(6) ප්‍රයොජන

යැ යි ඡේද මාතෘකා වෙන් වෙන් වශයෙන් දියැ හැකි. එහෙත් ප්‍රබන්ධ කාරයා ඒ සත්ත්වයාට හිසක් ඇති වියැ යුතු බව මුත්, ඒ හිසෙහි හැඩය, ප්‍රමාණය, අන්‍ය සත්ත්වයන් ගේ හිස් හා සමාන නොකොටැ බැලූ කලැ පෙනෙන වෙනස් කම්, එ බඳු හිසක් ඒ සත්ත්වයාට ඇති වීමට හේතු යනාදිය නො දනී නම්, ප්‍රබන්ධයේ ප්‍රථම ඡේදය වශයෙන් ගත හැකි වන්නේ 'හිස' යනු පමණෙක් මැ යැ. එ හෙයින් ඔහුට සිදු වනුයේ හිස මැ බදා ගෙනැ ප්‍රබන්ධයට නියමිත මුළු කාලය ගෙවන්නට යැ.

සෙසු තැන් පිළිබඳ වැ ද මෙයට වඩා වෙනසෙක් නො වේ. පැවැවියැ යුතු දෙයෙක් නැත් නම්, ගැල සරනා මිදුලට නෙනැ ඊට අවියෙක් නැති. කියැ යුතු දැ හිතින් නියම කැරැ නො ගැනිණි ද, ඡේද මාතෘකා

පමණක් ඇඳ ගැනීමෙන් වැඩෙක් නො වේ. එ හෙයින් පළමු කොට මැ කළ යුත්තේ කියැ යුතු කරුණින් සිත පුරවා ගැනීම යැ. කියන්නට සුදුසු දෑ ඇත හොත් සුදුසු වචන හිඟ නො වේ.

පළමු කොට ප්‍රබන්ධ වස්තුව බෙදා ගත යුත්තේ ප්‍රබන්ධයට තමන් දෙන්නට යන ඡේද ගණනට යැ. සතකු වනන තන්හි, හිස මැ මුලට ගත යුතු යැ යන නියමයෙක් නැති. සත්‍ය වශයෙන් වස්තු විභාගය පිළිබඳ රීතියක් නියම කිරීම වරදෙකි. විභාගය වනුයේ වැනුම් කරු ඒ සතා දෙස බලන අයෝ හැටියට යැ. එකෙක් අවයව දෙස නො වැ සතා දෙස මැ පළමු කොට බලා, එක්බිති එක් එක් අවයවය වෙන් කොට විමසයි. අනෙකෙක් ඒ සතා ගේ ආහාරවිහරණාදිය පිරික්සා, අනතුරු වැ ඔහු ගේ ශරීරය දෙස බලයි. තවත් එකෙක් ඒ සතා ගේ එක් එක් අවයවය වෙන් කොට බලා විමසා, යළි ඒ අවයවයෙන් යුත් මුළු සතා පිරික්සා, ඉන් පසු ඔහු ගේ ආහාර-විහරණාදියට බසී. එහි දු හිස දෙසින් ළං වන්නේ හිසෙහි සිටැ වනයි; පසු දෙසින් ළං වන්නේ නගුටෙහි සිටැ වනයි; අසෙකින් ළං වන්නේ අසෙහි සිටැ වනයි; ඒ සතා ගේ විශෙෂ අවයවයකට නෙත් සිත් යොමු කරනුයේ එ තැනින් පටන් ගනී. මේ එකකුදු වරදක් නො කෙරෙයි.

කෙසේ ළං වුව ද, කො තැනින් ගත ද, ප්‍රබන්ධයෙහි ඡේදය-

(1) අනූන වියැ යුතු යැ
(2) අනධික වියැ යුතු යැ
(3) අනාකුල වියැ යුතු යැ.

(1) අන්‍යූන වීම නම් ඒ ඡේදයෙහි මුලැ හෝ මැද හෝ කවර තැනෙක්හි හෝ සඳහන් වූ යම් කවර කරුණක් නිසා ද අපේක්ෂා කළ යුතු වූ සියල්ල එහි ඇතුළු වීම යි.

"ඇතා ගේ නාසය අපූර්වාකාර යැ. එහි සිදුරු දෙකෙකි. වෙන සතුන් මෙන් මැ ගේ නාසයෙන් ශ්වසනය කෙරෙයි. එ හෙයින් දිය යටැ සිටීමෙන් හෝ අන් කිසි ලෙසෙකින් හෝ නාසය හිර වී නම්, ශ්වසනය නැවැතීම කරණ කොටැ ගෙනැ මරණය පැමිණේ."

මේ ඌන ඡේදයෙකි. 'අපූර්වාකාර' යැ යි කියත් මැ, අසන්නෝ එය කවර හෙයින් අපූර්වාකාර ද යනු දැනැ ගනු රුසිති ඒ රිස්ස පුරන එක ද බසෙක් මෙහි නො කියැවිණ. එ හෙයිනි ඌනත්වය.

"ඇතා ගේ නාසය අපූර්වාකාර යැ. ඒ අඩි පහක් හෝ හයක් හෝ දිග යැ. මුල මහත් යැ ක්‍රමයෙන් සිහින් වැ ගොස් අගැ මිනිස් අතක් පමණ වෙයි. එහි කුඩා තොලක් වැනි දෙයෙක් වේ. ඉතා කුඩා දෙයක් වුව ද එයින් අවුලා ගත හැකි යැ. ශ්වසනය කරන හෙයින් ඒ නාසයෙකි. බිමැ හුණු දැයක් ඇහිදීම, ගසෙකැ අත්තක් කැඩීම, මිනිසකු බඳ උස්සා ගැනීම, යනාදිය කළ හැකි බැවින්, ඒ ඉතා හොඳ අතෙකි. දිය කළයක් පමණ ඇදැ ගෙනැ, බිමට මුව තුළට හෝ නෑමට ඇඟ මතට හෝ දියැ හැකි වන බැවින්, ඒ ඉතා හොඳ දිය විතෙක් ද වේ."

'අපූර්වාකාර' යනුයෙන් අසන්නහු ගේ සිත්හි උපදනා කුහුල මෙයින් සන්හිඳෙන හෙයින්, මේ ඡේදය අන්‍යූන යැ. තව ද ඡේදයක් ඌන වියැ හැකි නානා නියර වෙයි. ඒ සියල්ල වෙන් විසින් දැක්වියැ නො හැක්කැ. නො ලෙඩ වූ සිහියෙන් ඡේදයක් කියවන්නහුට, එහි ඌනත්වයෙක් වේ නම්, එක් වර මැ පෙනියැ යුත්තේ යැ.

(2) අනධික වීම නම්, තර්කානුකූල වැ ඡේදය තුළැ නො පැතියැ හැකි වූ කරුණු එහි ඇතුළත් නො වීම යි. අධිකත්වය මහා දෝෂයෙකි.

"ඇතා ගේ නාසය අපූර්වාකාර යැ. ඒ නාසයෙක් මැ නො වේ. ශ්වසනයෙහි දී ඒ නාසයෙකි. කට යුතු කිරීමෙහි දී ඒ අතෙකි. බීමෙහි දී ද නෑමෙහි දී ද ඒ දිය විතෙකි. හොඳ ඇතුන් ගේ වලඟ මෙන් මැ නාසය ද බිමැ ගැවෙන තරම් දිග ලු. එ හෙත් නාසය වලග මෙන් සිහින් නො වේ. වලගෙහි මෙන් තද රළු ලොම් නැහැය අගැ නැත්තේ යැ."

අධිකත්වයට නිදර්ශන යි. වලග මෙන් සිහින් වූ නාසයක්, වලගෙහි මෙන් අගැ තද රළු ලොම් ඇති නාසයක් වියැ යුතු සේ කාවුරු සිතත් ද? එ බන්දක් නො සිතියැ හැකි වන බැවින්, මේ ඡේදයෙහි අගැ කී දෑ අත්‍යර්ථයෙන් මැ අධික යැ. එ හෙයින් නාසයේ දිග කී පමණින් නැවැත්තේ නම් මැනැවි.

(3) අනාකූල වීම නම් ඡේදයෙහි ඇතුළත් වන කරුණු සුදුසු තැනැ මැ සුදුසු පිළිවෙළින් මැ සඳහන් වීම යි. ප්‍රසාද ගුණය (පැහැදිලි බව) ඇති වීමට ඒ මහත් හේතුවෙකි. කියවන්නහු නො කුප්පන්නට නම්, පිනවන්නට නම්, අනාකූලත්වය අවශ්‍ය ගුණයෙකි.

"ඇතා ගේ සොඬ නාසය යි. ඔහුට අතෙක් ද වෙයි. මිනිසකු ගේ අතින් කළ හැකි දෑ ඒ අතින් කළ හැකි යැ. මිනිසා බිමැ හුණු ඉදි කටුවක් ඇහිඳැ ගන්නේ අතිනි. ඇතා එය ඇහිඳැ ගන්නේ සොඬිනි. එ පමණෙක් මැ නො වේ. ඇතා අතින් දිය ගෙනැ කටෙහි වත් කැරැ ගනී."

කොතරම් අවුලෙක් ද?

(අ) ඇතා ගේ සොඬ නාසය යි.

(ආ) ඔහුට අතෙක් ද වෙයි.

(ඉ) මිනිසකු ගේ අතින් කළ හැකි දෑ ඒ අතින් කළ හැකි යෑ.

(ඊ) මිනිසා ඉඳි කටුවක් ඇහිඳෑ ගන්නේ අතිනි.

(උ) ඇතා එය ඇහිඳෑ ගන්නේ සොඬිනි.

(ඌ) ඇතා අතින් දිය ගෙනෑ කටෙහි වත් කැරැ ගනී.

ඇතා ගේ සොඬ අත බව මෙහි නො කියැවිණ. සොඬ නාසය යෑ කීමෙන් ඉපැදැවියෑ හැකි කුහුල මෙහි නිකම් මැ වියැළී ගියේ යෑ. මිනිසා අතින් ඇහිඳෑ ගන්නා ඉඳි කටුව ඇතා සොඬින් ඇහිඳෑ ගනී ලු. කුකුළා එය හොටින් ඇහිඳී. ඇතා ගේ සොඬ නොවයෙකෑ යි කියමු ද? අතෙකෑ යි කියමු ද?

"ඇතා ගේ සොඬ ඔහුට නාසය යි, අත යි, දිය විත යි. සැපුමට, කට යුතු කැරුමට, බොනු සඳහා නානු සඳහා දිය පුරවා ගැනුමට යෙදෙන්නේ ඒ එක මැ සොඬ යි. බිමැ හුණු ඉඳි කටුවක් මිනිසකු අතින් ඇහිඳෑ ගන්නා සේ, ඇතා සොඬින් ඇහිඳෑ ගනී. මිනිසකු විතෙකින් ගන්නා සේ, ඇතා සොඬින් දිය ගනී."

මෙ සේ ගත හොත් ඡේදය අනාකුල වෙයි.

ඡේද ප්‍රමාණය

මෙ ද ඉතා සැලැකියෑ යුත්තේ යෑ. සියලු ඡේද එක් පමණ වියෑ යුතු යෑ යන නියමයෙක් නැති. එහෙත් එක් තැනෙකෑ ඡේදය යෑ යි පෙළක් හෝ දෙකක් දී, තවත් තැනෙකෑ පිටු ගණනක් මැ එක් ඡේදයක් කොටැ දීම

විභාග ක්‍රම නො දැනීමෙන් කැරෙනුයේ යැ. ඉතා කොට වීම මෙන් මැ ඉතා දිගු වීම ද ඡේදය කෙලෙසන්නේ යැ.

එක් කරුණෙක් සඳහන් කළ යුතු මැ නම්, එ ගැනැ කියැ යුත්ත පෙළෙකින් හෝ දෙකෙකින් කෙළවර වේ නම්. කිමෙක් ද කළ යුතු? එ කරුණ තවත් එබඳු සුදුසු කරුණු එකක් හෝ කිහිපයක් හෝ සමග එක් කොටැ එක් ඡේදයෙක්හි සඳහන් කිරීම යැ.

ඇතා ගේ ශරීර වර්ණනයෙක්හි දී තඟුට සඳහන් කළ යුතු යැ. එ හෙත් හිස මෙන් හෝ සොඬ මෙන් හෝ එක් ඡේදයකට ප්‍රමාණ වන තරම් වැදගත් දැ තඟුට ගැනැ කියැ හැකි නො වේ.

'තඟුට සිහින් යැ, දිග යැ. එහි අගැ සිහින් ඉරටු වැනි තද රළු ලොම් ඇත්තේ යැ'

මෙ නම්. ඡේදයකට කිසි සේත් ප්‍රමාණ නො වේ. එ හෙයින් අන් කිසි අවයවයක් වනත තන්හි තඟුට ද එක් කිරීම මැනැවි. පාද සමග නෙතැ එක් ඡේදයකට යෙදියැ හැකි වේ.

“ඇතා ගේ පාද ඉතා මහත් යැ, වට යැ, ලී කොට වැනි යැ. එ තරම් විශාල ශරීරයක් දැරීමට එ තරම් මහත් පාද ඇති වියැ යුතු මැ යි. පයෙහි ඇඟිලි නැති, ඇඟිලි පිහිටියැ යුතු තන්හි මහත් නිය වෙයි. පතුල ඝන සමෙකින් යුතු යැ. පාදවලැ මහතට ඉඩ දෙන්නට මෙන් තඟුට සිහින් වැ සිටියේ යැ. ඒ දිග යැ අගැ සිහින් ඉරටු වැනි තද රළු ලොම් වෙයි.”

ඇතා ගේ හිස වැනි අවයවයක් වනන කල්හි ඇතැම් විටැ එක් ඡේදයකට වැඩි තරම් වන කරුණු කියැ යුතු වෙයි. එ බඳු තන්හි ඡේද දෙකක් හෝ වැඩියක් යෙදීම සුදුසු සි. එක් අවයවයක් පිළිබඳ සියලු දෑ එක මැ ඡේදයෙක්හි ඇතිරියැ යුත්තේ යැ යන නියමයෙක් නැති.

"ඇතා ඉතා මහත් වන බැවින්, හිස ද , මහත් වීම සුදුසු වෙයි. මහත් සිරුරකට කුඩා හිසක් ඇති වීම සවභාවයට විරුද්ධ යැ. හිස කුඩා වී නම් එහි වන කට ද කුඩා වන්නේ යැ. මහත් සිරුරක් පැවැත්වීමට ප්‍රමාණ වන ආහාර කුඩා කටෙකින් කනු නො හැකි වන බැවින්, හිස කුඩා වීම මහත් සතකු ගේ ජීවත් වීමට බධාවෙකි.

'හිසේ පමණට මොලය ද මහතැ යි නො සිතියැ යුතු. ප්‍රමාණානුකූල ලෙස බලන හොත් ඇතාට ඇත්තේ ඉතා කුඩා මොලයෙකි. එහෙත් එහි සතාට සුදුසු තරම් නුවණ නැත්තේ නො වේ. යම් යම් දේ තේරුම් ගැනීමේ මහත් ශකතියක් ඇතාට ඇති බව බොහෝ තන්හි දී හීලෑ ඇතුන් ගේ පැවැතුම්වලින් පෙනේ.

''ඇත් හිසට 'කුම්භ' යන විශෙෂ නාමයෙක් වේ. උතුම් ඇතුන් ගේ කුම්භයෙහි ඉතා අගනා මුතු ඇති බවක් පුරාතනයන් ගේ කියුම්හි සඳහන් යැ. ඇත් දළ තුළැ තිබී මුතු ලැබුණු බවෙක් අසන්නට ලැබේ. හසති කුම්භය පළා මොළ කන සිංහයනුදු වූ බවෙක් ද කවීන් ගේ කියුම්හි පෙනේ. එහෙත් දූන් එ බන්දකට පොහොසත් සිංහයෝ නැත්තාහ. හස්ති කුම්භයට ළං වූ සිංහයකු සැණෙකින් හස්ති පාදයට යට නුවව හොත් ඒ මහත් ආශචයර්යෙකි."

ඇත් හිස ගැන කිය යුතු ක[illegible]තෙක්හි ලා මෙසේ දක්විය හැක්කේ ය. සියල්ල එක් ඡේදයකට යට වූයේ නම් නො හොබී.

**ඡේද සම්බන්ධය**

එක් ඡේදයෙකැ සිට අනන්තර ඡේදයට ස්වාභාවික සංක්‍රමණයක් ඇති විය යුතු ය. හිණෙකැ පෙර පසු දෙ පෙත්තක් අතරෙහි මෙනි. එක් පෙත්තෙකැ සිට අනෙක් පෙත්ත පය නො පොහොනා තරම් දුරින් පිහිටියේ නම්, එ තන්හි ස්වාභාවික සංක්‍රමණයෙක් නො වේ. ප්‍රබන්ධයෙකැ ඡේදයන් අතරැ ද හිණෙකැ පෙති අතරැ ද සම්බන්ධය එක් බඳු ය. එක් ඡේදයක් කියවා අවසන් කරනු හා සමඟ මැ, එක්බිති ඡේදයෙහි ඇති විය යුත්තේ මෙ බඳු කරුණෙකැ යනු හැඟී යේ නම්, ඒ ඡේද දෙක අතරෙහි ඉතා මහත් ස්වාභාවික සංක්‍රමණය ඇත්තේ ය.

වෙනසෙකුදු වේ. ඇතැම් විටැ මහා ශූරයෝ අතර්කිත ඡේදයක් ඇඳ හෙළති. ප්‍රථම ඡේදය කියවා එක්තරා කරුණක් ද්විතීය ඡේදයෙහි ඇති සේ සලකා ගන්නට සිදු වේ. ද්විතීය ඡේදයට බසුත් මැ ඒ නුයේ නො තැකුණෙකි. කුහුල වැඩේ රසය ඇවිස්සේ. බොහෝ විටැ ගත ඡේදය යළි දු කියවන්නට රිසි උපදී. මහා ශූරයන් ගේ මෝහන ක්‍රමයක් වන බැවින්, ප්‍රවීණ වැ කළ යුත්තෙකි.

ආධුනිකයෝ බද්ධ –,ඡේද කොට මැ ප්‍රබන්ධ කෙරෙත් වා. එසින් තර්කණය ක්‍රමවත් වේ. ප්‍රබන්ධයකට ප්‍රථම කොට මැ අවශ්‍ය වනුයේ මැද නො සිඳුණු තර්කණය යි. එය නැති තන්හි බෙහෙවින් ඇති වනුයේ ප්‍රලාප රාශියෙකි.

තර්කණය නො ලෙඩ සිහිය ඇත්තවුනට ස්වභාවයෙන් ඇති වන්නෙකි, වැර වඩා අර ඇදැ උගත යුත්තෙක් නො

වේ.. යම් කිසිවක් ගැන ක්‍රමානුකූල වැ සිතීම යැ තර්කය නම්. එය ඇති වූ තන්හි ඉතා යහපත් ප්‍රබන්ධ වස්තුවෙක් ඇති වේ. භාෂා ව්‍යවහාරය පුරුදු නම් විශිෂ්ට සඤ්ඤාවක් ඇති වීමට බාධා නැති.

"බල්ලා මිනිහා ගේ මිත්‍රයෙකි. ආදි මැ මනුෂ්‍යයා දඩයමින් ජීවත් වූ බව සැබෑ නම්, සතුන් අතුරින් මනුෂ්‍යයාට මුලැ දී මැ මිත්‍ර වූයේ බල්ලා යැ යි කීම වරදෙක් නො වේ. දඩයමෙහි දී මනුෂ්‍යයාට පළමු කොටැ මැ හවුල් වූ සතා බල්ලා බව තිරශ්චීය වංශයෙන් කිය හැකි බැවිනි.

"බල්ලා ගේ නිය දිගු යැ. පොළොව සීරීමට විනා සතුන් ඇල්ලීමට හෝ මැරීමට හෝ නියෙන් පිහිටෙක් නැති. බළලා ආදි නිය-අවි සතුන් ගේ මෙන්, බල්ලා ගේ නිය කොපු ඇතුළෙහි නො පිහිටියේ යැ. එ හෙයින් බල්ලා යන එන කලැ නිය බිම වදී. ඉන් හඬෙක් නැගේ. දිවීමෙන් පරදවා සතුන් ඇල්ලීමට යැ බල්ලා උපන්නේ. බළලා මෙන් සැඟැවී සිටැ ශබ්ද නො කැරැ මඳින් මඳ ළං වැ හොරෙන් පැන සතුන් ඇල්ලීමක් නුවුව මනා බැවින්, නිය බිම වැදීමෙන් නැගෙන හඬ බල්ලාට බාධාවෙක් නො වේ."

මේ ඡේද දෙක මනා වැ නො බැඳේ. බල්ලා මිනිසුන් ගේ මිත්‍රයකු බව කීමට අනතුරු වැ මැ බල්ලා ගේ නිය සඳහන් කිරීම කෙසේ නම් සුදුසු වේ ද? කියැ යුත්තේ මිනිසා ගේ දඩයමට හවුල් වීමට බල්ලාට ඇති විශේෂ සුදුසු කම් යැ.

ඡේද වර්ග

එක් එක් ඡේදයේ කාර්ය සලකන කල ඡේද කිහිප වර්ගයකට බෙදිය හැකි යැ.

### (1) ප්‍රවේශ ඡේද

ප්‍රබන්ධයකට ප්‍රස්තාවනාවක් ලෙස සිටිනුයේ 'ප්‍රවේශ' ඡේද නම්. පළමු වන මහ වෙදයෙහි ප්‍රථම ඡේදය නිදර්ශන යි.

### (2) සඞ්ක්‍රමණ ඡේද

වස්තුයෙහි එක් එක් පාදය – අඩිය – වෙන් වශයෙන් ගෙනැ ඇරැ දක්වනුයේ 'සඞ්ක්‍රමණ' ඡේද නම්. ප්‍රබන්ධ-යෙකැ ප්‍රවේශයත්, අවශානයත් අතරැ බෙහෙවින් වනුයේ මේ සඞ්ක්‍රමණ ඡේද යි. වස්තු ප්‍රමාණයට අනුකූල වැ සඞ්ක්‍රමණ ඡේද ගණන අඩු වැඩි වන්නේ යැ.

### (3) සඞ්ග්‍රහ ඡේද

දීර්ඝ ප්‍රබන්ධයෙකැ කරුණු මහත් රැසක් දක්වූ කල්හි සඞ්ග්‍රහයෙක් අවශ්‍ය වේ. සඞ්ග්‍රහය නම් කියන ලද කරුණු පිඬු කොටැ සැකෙවින් දැක්විම යි. එ සේ නො කරන ලද නම්, ඇතැම් විටැ කී කරුණින් කිසිවක් මතක නැති වියැ හැකි යැ, ඇතැම් විටැ අනතුරු වැ කියැවෙන දූය හා පෙරැ කියැවුණු දූය හා සම්බන්ධය නො පෙනියැ හැකි යැ. පිඬු කිරීමට යෙදෙනුයේ 'සඞ්ග්‍රහ' ඡේදය යි.

### (4) විවරණ ඡේද

ඇතැම් තන්හි දී කී කරුණක් සුබෝධ කළ යුතු වෙයි සඥහී ශක්තිය නො පිරිහෙළා පැවැත්වියැ යුතු වන බැවින් සඞ්ක්‍රමණ ඡේදයෙහි ප්‍රමාණවත් විවරණය-කට අවකාශයෙක් නො ලැබේ. විවරණය ද නො කැරිණි නම් වස්තු අවබෝධයට බාධාවෙක් නෝ වන්නේ යැ; අනභිමත අර්ථයක් ගැනීමට ඉඩ හෝ පෑදෙන්නේ යැ. එ බඳු තන්හි විවරණය අතිශයින් අවශ්‍ය යැ. එය කැරෙනු-යේ 'විවරණ' ඡේදයෙහි.

### (5) අවශාන ඡේද

වස්තුව කෙළවර වූ පසු ඇතැම් විටැ නිගමනයක් — විනිශ්චයයක් — ප්‍රකාශ කළ යුතු වෙයි. එ බඳු තන්හි යෙදෙනුයේ 'අවශාන' ඡේදයෙකි.

## 3. වාක්‍යය

ඡේදය වාක්‍යවලින් බැඳුණේ ය. එ හෙයින් ඡේදය නිවැරැදි වන්නට පෙරැ වාක්‍යය නිවැරැදි විය යුත්තේ ය.

'වාක්‍යය නම් කිමෙක් ද' යනු උගන්වන්නට මේ තො තැනි. වාක්‍යය, වාක්‍ය වර්ග, වාක්‍ය සංශ්ලෙෂණ විශ්ලෙෂණ, වාක්‍ය විභාග යනාදිය දත්තවුන් සඳහා ය. මේ උපදෙශය කැරෙනුයේ. සැක ඇති තන්හි ව්‍යාකරණ ග්‍රන්ථයෙකැ වහල ලැබැ ගත යුතු.

### වාක්‍ය ලක්ෂණ

ඡේදයෙහි මෙන් මැ වාක්‍යයෙහි ද අවශ්‍ය ලක්ෂණ තුනෙකි.

(1) අනූනත්ව
(2) අනධිකත්ව
(3) අනාකූලත්ව

යන මේ තුන යි.

### අනූනත්වය

වාක්‍යාඞ්ග සම්පූර්ණ වී ඇත් නම් එහි ඌනත්වයෙක් නො වේ. අසන්නහුට වුව මනා සියලු අඞ්ග නො පිරුණේ නම් එ තන්හි වනුයේ ඌන වාක්‍යයෙකි.

'දරුණු කොටියා මැරී යැ!

කවරෙක් කොටියා මැරී ද යනු මෙ තැනින් නො හැඟේ. අඩුවෙකි.

### අධිකත්වය

ආකාඞ්ක්ෂාව (දැනැ ගනු කැමැත්ත) සම්පූර්ණ නම් එ පමණි. එයට වැඩියෙක් යම් වාක්‍යයෙකැ වේ ද ඒ අධිකයෙකි. නිදර්ශන දුටුව මනා යැ.

### අනාකූලත්වය

වාක්‍යයෙහි අතිශ්‍රේෂ්ඨ ලක්ෂණය නම් මේ යැ. ආකුල වූ තන්හි සම්පූර්ණ අර්ථාවබොධයෙක් නො ලැබේ. අර්ථාවබොධය අවුල් කරන වින්‍යාසයක් ලිවීම අපරාධයෙකි.

නිරාකුල වාක්‍ය නිර්මාණයෙහි ලා පිළිපැදියැ යුතු ප්‍රධාන උපදෙශ නම් මේ යැ:-

1. වාක්‍යයෙන් පවසන්නට අදහස් කරන ලද අර්ථය පළමු කොටැ නිරවුල් කැරැ ගන්නැ.

අර්ථය ආකුල නම් වාක්‍ය කෙසේ අනාකුල වේ ද? අදහස ආකුල ද අනාකුල දැ යනු වාක්‍යයෙන් දත නො හැකි යැ. අනාකුල අදහස ආකුල වාක්‍යයෙකින් කියුවා වියැ හැකි බැවිනි.

2. වාක්‍ය සම්බන්ධය ව්‍යාකරණානුකූල කරන්නැ.

සත්‍ය වශයෙන් නම් ව්‍යාකරණය බිඳුණු තන්හි වාක්‍යයෙක් නො වේ. වාක්‍ය යැ යි කියැ හැක්කේ ව්‍යාකරණානුකූල සම්බන්ධය ඇති පද සමුදායයට යි.

3. වාක්‍යයට සියලු අතින් යෝග්‍ය පද මැ තෝරා ගන්නැ.

අර්ථ වශයෙන් ද රූප වශයෙන් ද පද යෝග්‍ය වේ, ගසට වැල යයි කියුව හොත් අර්ථ වශයෙන් අයෝග්‍ය යැ. පදය ව්‍යාකරණ විරුද්ධ වුව හොත් රූප වශයෙන් අයෝග්‍ය යැ

4. එක් එක් වාක්‍යයෙන් එක මැ අර්ථයක් පවසන්නැ.

“සිංහයා මස් බුදින්නෙක් ද දවල් නිදන්නෙක් ද වේ.’ මෙහි අර්ථ දෙකෙකි. එක් වාක්‍යයෙන් ඒ දෙක පැවැසූ සේ නො මැනැවි.

5. සඞ්කීර්ණ වාක්‍යයෙහි අවයව වචයෙකැ විස්තර බාහුල්‍යය දුරු කරන්නැ.

‘රජ, අගතිගාමි වූ නීති ශාස්ත්‍රාර්ථ මනා ලෙස නො දත් බැවින් අර්ථානර්ථ දෙක යම් සේ හංසයා කිරි දිය දෙක වෙන් කැරැ ගනී ද එ සේ වෙන් කැරැ ගන්නට අසමර්ථ වූ අමාත්‍යයන් ගේ බස් නෙතැ රට පෙළා නම්, රට වැසියන් විසින් කළ යුත්තේ ඔහු නෙරපීම යි.’

මෙහි අවයව වචයේ විස්තර බාහුල්‍යය නො ඉවැසියැ හැකි යැ.

6. අන්‍යොන්‍ය සම්බන්ධ වූ පද පාද වච යන සියල්ල සුදුසු පරිදි ලං කොටැ සුදුසු තන්හි යොදන්නැ.

‘වෙත නික මල් මහ රැ
මුතු ලැල් ලකළ පිය ක රැ
සුපිපි කිණි හිරි තු රැ
සැදී බැබැළෙන රන් තොරණ යු රැ’

‘නිකමල් වෙතැ සුපිපි කිණිහිරි තුරු මහරු පියකරු මුතු ලැල් ලකළ සැදී බැබැළෙන රන් තොරණ අයුරු’ යැ යි සිටියැ යුතු වාක්‍යය යැ. ඒ පද ද පාද ද නුසුදුසු තන්හි ඇත් වැ සිටි හෙයින් අර්ථය නිරවුල් කැර ගැන්ම පහසු නො වේ.

‘‘බෝධිසත්ත්වයන් දරුවන් කති යි ව්‍යාඝ්‍ර ධේනුව වළකනු සඳහා මසක් සෙවූ බව පෙනේ.”

මහත් අවුලෙකි. එවය සුදුසු තන්හි නො යෙදිණ.

‘ව්‍යාඝ්‍ර ධේනුව දරුවන් කති යි වළකනු සඳහා බෝධිසත්ත්වයන් මසක් සෙවූ බව පෙනේ’

යැ යි යෙදුව නිරවුල් වේ.

7. එක් එක් සර්ව නාම පදයේ උද්දේශ්‍ය පදය පැහැදිලි ලෙස පෙන්වියැ යුතු යැ. උද්දේශය අනියත නම උද්දේශ්‍ය පදය නැවැතැ ද ඇඳූ ලන්නා, අන්‍ය ක්‍රමයකින් හෝ පහදා දෙන්නා.

‘පියා පුතු දුටුයේ යැ. ඔබ කොහි ගිය නියා දැයි ඔහු ඇසූ කලැ හේ මුවින් නො බිණී යැ.’

‘ඔහු’ යන්නෙහි උද්දේශ්‍යය කිමෙක් ද? මෙ බඳු තන්හි සර්ව නාමය අර්ථය අවුල් කෙරේ.

8. විශේෂණ ද සැකයට ඉඩ නැති සේ යොදන්නැ.

සිහිල් දිය ද බත් ද ලෙඩට අපථ්‍ය යි.

සිහිල් නුවූ බත් පථ්‍ය ද? එ සේ නම් මෙ සේ යෙදීම මැනැවි. නො එ සේ නම්

'බත් ද සිහිල් දිය ද ලෙඩට අපථ්‍ය යැ'

යි යෙදියැ යුතු වේ.

9. අර්ථයෙන් ද යෝගයෙන් ද සමාන වූ වාක්‍ය අන්වයෙන් ද සමාන කරන්නැ.

'පියා සිහන්නාට සත පහක් දිනි. හේ මව හෙන් ලද්දේ සත දෙකෙකි පුතු විසින් ඔහුට සතයෙක් දෙන ලද්දේ යැ.'

නුවූම මනා අන්වය විපර්‍යාසයෙකි.

'පියා සිහන්නාට සත පහක් දුන්නේ යැ. මව සත දෙකක් දුන්නී යැ. පුතු සතයක් දිනි.'
මෙ සේ යෙදුව මැනැවී.

10. ලුප්තාඞ්ග වාක්‍ය සුපරීක්ෂ්‍යකාරි වැ, අසන්නහුට බරක් නො වන සේ ගළපන්නැ.

'මට දූන් රුපියලක් ඇත් නම්!'

පූර්වාපර සම්බන්ධයෙන් පිහිටක් නො ලැබෙන කොත් මේ අර්ථ රහිත යැ.

11. වාක්‍ය මව යොග්‍ය නිපාතයෙකින් බඳින්නැ.

පොත උගනුව ගුරු සිසුහු ඇණැවී යැ.

මේ සම්බන්ධ රහිත යැ.

"පොත උගනුව" යි ගුරු සිසුහු ඇණැවී යැ.

ඒ උපදෙශ තිසි සේ පිළිපදිමින් රචනය කරන ලද වාක්‍යය සියල්ලවුන් ගේ පහසුව පිණිස ද ප්‍රසාදය පිණිස ද වන්නේ යැ.

**වාක්‍ය ගුණ**

අසන්නවුන් ගේ සිත් ගැන්මට නම් වාක්‍යය ගුණවත් වියැ යුත්තේ යැ. කොතරම් ව්‍යාකරණානුකූල වුව ද, කොතරම් තිරුකූල වුව ද, ගුණවත් නුවූ වාක්‍යය කුහුල ඉපැදැවීමට අසමර්ථ වෙයි. එ හෙයින් රචකයන් විසින් උත්සාහයෙන් කළ යුත්තේ වාක්‍යය හැකි තරම් ගුණවත් කිරීම යැ.

(1) ප්‍රසාද
(2) මාධුර්‍ය
(3) ඕජස්

යැ යි වාක්‍ය ගුණ තුනෙකි.

**ප්‍රසාද ගුණය**

යම් වාක්‍යයෙකැ අර්ථය අසන්නහුට සුව සේ මැ අවබෝධ වේ නම් ඒ ප්‍රසාද ගුණයෙන් යුතු යැ. 'ප්‍රසාද' යන්නෙහි අර්ථය 'පැහැදිලි' යනු යි. අර්ථය පැහැදිලි නො වන තන්හි රචකයා ගේ ව්‍යාපාරය නිරර්ථක වෙයි. සියලු රචනා අසන්නවුන් සඳහා කැරෙයි. අසන්නවුනට අර්ථය දුරවබෝධ වේ නම්, ඒ රචනාව නො කැරුණේ මැ මැනැවි.

**ත්‍රිවිධ ශ්‍රාවක ශක්තිය**

ශ්‍රාවකයෝ (අසන්නෝහු) ශක්තියෙන් තුන් වැදෑරුම් වෙති. අල්ප - ශක්ති, මධ්‍ය - ශක්ති, මහා - ශක්ති යන විසිති. වාක්‍ය ප්‍රසාදය ශ්‍රාවක ශක්තියට අනුරූප වියැ යුත්තේ යැ.

මහා - ශක්තීන් සඳහා සැලැසුණු වාක්‍යය මධ්‍යශක්ති-අල්පශක්තීනට ගාඪ වෙයි. අල්පශක්තීන් සඳහා කැරුණු ප්‍රබන්ධය සෙස්සවුනට අතිශිථිල වෙයි, එහෙයින් මැ අප්‍රසාද ජනක වේ. ත්‍රිවිධ වූ ශ්‍රාවකයන් සඳහා ප්‍රසාද ගුණය ත්‍රිවිධ වියැ යුත්තේ යැ. අල්ප - ශක්තියෙක් තමා මහා - ශක්තියකු කොටැ සිතා ගෙනැ උත්තම ප්‍රබන්ධයකට අවමන් කෙරේ නම්, ඒ හුදෙක් ඔහු ගේ අඥත්වය ප්‍රකාශ කිරීමෙකි.

වාක්‍යාර්ථ වනාහි ඵල සමාන වෙයි ඇතැම් ඵල සිවි පිටින් මැ මුවෙහි ලා ගෙනැ කැව හැකි යැ. ඇතැමක් කැව යුත්තේ ලෙලි ඉවත් කොටැ යැ. ලෙලි ඉවත් කොටැ, ඇතුළෙහි වූ තද කටුව ද බිඳැ, මද තඟා ගෙනැ කෑ යුතු ඵල වර්ග ද වේ මැ යි. මේ සියලු ඵල වර්ග දුටු විගස කටෙහි ලා ගත හැකි පරිදි නො උපන්න යි ස්වභාව ධර්මයට නින්දා කරන්නෝ මෝඩයෝ යැ. සියලු වාක්‍ය ඇසූ විගසැ විදුලිය වේගයෙන් හිතට වදනා අර්ථ ඇති වියැ යුතු යැ යි කියන්නෝ ද ඒ ගණයට මැ සරි ලන්නෝ යැ.

## ප්‍රත්‍යක්ෂ ප්‍රසාදය

ඇතැම් තැනෙකැ වාක්‍යාර්ථ පතුරැ ගසමින් ඉන්නට කල් නැති. එ බඳු තන්හි අර්ථය තෙමේ මැ ප්‍රත්‍යක්ෂ වියැ යුත්තේ යැ. බිළිඳකු මෙහෙයන තන්හි, ලෙඩකු අනුසස්නා තන්හි, මහාජනයාට රජ නීතිය දක්වන තන්හි මෙනි. එහි වනුයේ ප්‍රත්‍යක්ෂ ප්‍රසාදය යි. ප්‍රත්‍යක්ෂ ප්‍රසාදය ඇති විටැ දුෂ්කර වනුයේ අර්ථය වටහා ගැන්ම නො වේ, අර්ථය වටහා නො ගෙනැ සිටීම යි. අර්ථය තෙමේ මැ අවුත් බලාත්කාරයෙන් සිතට වදී.

## ශ්‍රාව්‍ය ප්‍රසාදය

කිසි තැනෙකැ අර්ථය, කිලිටි නො වන පිණිස දේ, සිවියෙකින් මෙන්, මදක් වැසී සිටී. සිවිය ප්‍රත්‍යක්ෂ යැ.

එය ඉවත් කිරීම පමණකුදු කරන්නට මැලි වන්නේ එහි අර්ථය නො ලබයි. හේ එය ලැබීමට නුසුදුස්සේ යැ. මනුෂ්‍ය බුද්ධිය අභ්‍යාසයෙන් දියුණු කරනු සඳහා යෙදිය යුතු සියලු තන්හි වාක්‍යාර්ථ මෙබඳු විය යුතු යැ. තමා කිසි කමක් නො කොට, අනුන් විසින් මුවට ලං කළ දෑයක් ගිලැ දිවි රක්නේ නීරෝග මනුෂ්‍ය ශරීරයට නින්දා කෙරෙයි. ප්‍රත්‍යක්ෂාර්ථ වාක්‍යයෙන් වචන රසය විඳීමට පතන්නේ සවසප් වූ මනුෂ්‍ය බුද්ධියට නින්දා කෙරෙයි. එ හෙයින් නුවණැත්තවුන් විසින් නුවණ කැමැත්තවුන් සඳහා ලියැයෙන වැකිය, යටත් පිරිසෙයින් සිවියෙන් රැකුණු අර්ථයෙන් සාරවත් කළ යුත්තේ යැ. එ බඳු තන්හි ද ප්‍රසාද ගුණය වෙයි ගත යුතු වන බැවින් ඒ ග්‍රාහ්‍ය ප්‍රාසාද නම් වේ.

**අන්වේෂ්‍ය ප්‍රසාදය**

බුද්ධිමතුන් සඳහා ලියැයෙන වැකියෙහි අර්ථ සොයා බලා ගත යුත්තේ යැ. උත්තම මනුෂ්‍යයෝ අටුව වියෙන් පිරී සිටි කල්හි දු, ඇඟ වෙහෙසවා උපයා ගත් දෑ බිදීමට පෙලැඹෙති. බුද්ධිමත්හු ලියා විමසා බලා ගත යුතු වාක්‍යාර්ථයෙන් කුල්මත් වෙති. එ සේ කිරීම ඔවුන් ගේ බුද්ධියට හිතකර , අභ්‍යාසයක් වන හෙයිනි. බුද්ධිය මෙහෙයා සෙවීම, විමැසීම, අන්වේෂණ නම් වේ. එ හෙයින් එ බඳු තන්හි වනුයේ අන්වේෂ්‍ය ප්‍රසාද ගුණය යි.

**ප්‍රසාද ගුණාරෝපණය**

ප්‍රසාද ගුණය කෙසේ ඇති කළ යුත්තේ ද? එය උත්සාහයෙන් ඇති කළ යුත්තක් නො වේ. අන්‍ය සියලු දක්ෂයන් මෙන් මැ රචනයා ද සහජ වාසනා ගුණ ඇත්තෙකි. ඉගැනීමෙන් ද විමැසීමෙන් ද අභ්‍යාසයෙන් ද, ඒ ගුණය තියුණු වෙයි. එ බන්දන් ගේ වාක්‍යයට ත්‍රිවිධ වූ ප්‍රසාද ගුණය මැ පැමිණේ. එ බඳු මහිමයක් නැත්තවුන් විසින් එය ලබා ගැනීමට කළ යුත්තේ —

(1) උද්ග්‍රහණය
(2) විභාගය
(3) අභ්‍යාසය

යන තුන යි.

### (1) උද්ග්‍රහණය

මහා ශූරයන් ගේ යෙදුම් සාවධාන වැ කියැවීම යැ උද්ග්‍රහණ නම්. එයින් ඔවුන් යොදන පද ද ඔවුන් ඒ පද ගළපන සැටි ද තමන් අයත් බවට පැමිණේ. අභිමත අර්ථයක් පැවැසීමට යෝග්‍ය ශබ්දය සිතට නො නැගේ නම් රචනය කළ නො හැක්කේ ය. එ හෙයින් රචකයා ගේ සිහිය අනූන වූ ශබ්ද නිධානයක් වියැ යුතු යැ. එක් එක් ශබ්දය දැන්ම මැ ප්‍රමාණ නො වේ. ශබ්ද සුදුසු වේශයෙන් සුදුසු තන්හි පිළිවෙළට යෙදී අර්ථ ප්‍රකාශය කෙරේ. ඒ සියල්ල එක් තන්හි දී දැනැ ගැනීමට නම් ශූරයන් ගේ යෙදුම් මැ පිහිට කොටැ ගත යුතු යැ.

### (2) විභාගය

ශූර ප්‍රයෝග සිහියෙහි නිකම් මැ රැස් කැරැ ගැනුම ප්‍රමාණ නො වේ. ඒ රැස් කැරැ ගත් දැනුම විමැසියැ යුතු යැ, බෙදියැ යුතු යැ, වගී කළ යුතු යැ. වගක් විභාගයක් නැති වැ බඩු රැස් කරන්නෝ කල් යත් යත් ඒ බඩුයෙන් නිසි ඵල ලබන්නට නො පොහොසත් වේ. කිමෙක් කො තන්හි වේ දැ යි එක් වරැ මැ නිශ්චය කැරැ ගත නො හෙන හෙයිනි. වගක් විභාගයක් නැති වැ යම් කිසිවක් උගන්නේ ද එ බඳු මැ නිවහල් අඩියකට පැමිණේ.

### (3) අභ්‍යාසය

ශක්තිය ස්ථිර භාවයට පැමිණෙනුයේ අභ්‍යාසයෙනි. මම ඒ දනිමැ යි නිසැක වැ සිතා ගත් කී දෙනෙක් කාර්‍ය වේලාවෙහි දී එරෙත් ද? කළ දෑයක් බලා සොයා 'එය

සම්පූර්ණයෙන් විමසා බැලුයෙමි. මා නො දන්නා එක ද තැනෙක් දුන් එයි නැති. එ හෙයින් එය මට මනා සේ කළ හැකි යැ' යි සිතන්නෝ බොහෝ වෙති. ඔවුන් ගේ මෝඩ කම් ඔවුනට මැ හෙළි වන්නේ කාර්‍ය්‍යාවස්ථාව එළැඹුණු විටැ යැ. අභ්‍යාසයක් නැති වැ හුදු හැඟීමෙන් කටයුතු සිදු නො වන බව ඔහු නොදන්නෝ යැ.

පසු වැ ලජ්ජාවට නො පැමිණෙනු කැමැත්තවුන් විසින් කළ යුතු දය මැනැවින් අභ්‍යාස කළ යුත්තේ යැ, නිරතුරු අභ්‍යාස කළ යුත්තේ යැ, බොහෝ කල් අභ්‍යාස කළ යුත්තේ යැ, අනූන කොටැ අභ්‍යාස කළ යුත්තේ යැ. සම්පූර්ණත්වය ඇති වනුයේ එයිනි.

පළමු කොටැ ගුරු පාඨයන් අනුගමනය කරන්නට පුරුදු වීම මැනැවි. එක්බිති ඒ අර්ථය අමුතු පද මාලාවෙන් පැවැසීම සුදුසු යැ. එහි නිපුණත්වය ඇති වූ පසු එයට සමාන වූ අන්‍ය අර්ථයන් අනුරූප වූ පදයෙන් දැක්වීම වටනේ යැ. තමන් ගේ මැ අර්ථයක් නිපදවා ලීම මඳක් නිසැක වැ කළ යුත්තෙකි.

ප්‍රසාද ගුණය කුමක් කුමක් නිසා ඇති වේ ද? ශිෂ්ට සම්ප්‍රදායානුරූපත්වය ප්‍රසාද ගුණයට ප්‍රධාන හේතුව කොටැ සැලැකියැ හැකි යැ. භාෂාව අසින් ශිෂ්ටයෝ නම් භාෂාව නිවැරදි ලෙස සවල්ප ලෙස යොදන්නෝ යැ. ශිෂ්ටයන් විසින් අවිශේෂයෙන් සම්මත කරන ලද ක්‍රමය ශිෂ්ට සම්ප්‍රදාය නම් වේ. නවීනයන් විසින් කළ යුත්තේ ඒ ශිෂ්ට සම්ප්‍රදායයට අනුවීම යි.

පදසම්ප්‍රදාය යැ, යෝග සම්ප්‍රදාය යැ යි, ශිෂ්ට සම්ප්‍රදායය දෙ වැදෑරුම්. ශබ්දෝත්පත්තිය කුමක් වුව ද, ශිෂ්ටයන් විසින් සම්මත වූ අර්ථය මැ නො වෙනස් වැ ලැබෙන සේ ශබ්ද යෙදීම පද සම්ප්‍රදාය යි. ශබ්ද වෙන් කොටැ සැලැකූ කලැ අන් කවර අර්ථයක් ලැබෙතුදු, එක් පද

යෝගයෙකින් ශිෂ්ටයෝ යම් අර්ථයක් ගනිත් ද ඒ අර්ථය දෙන්නට මැ ඒ පද යෝගය කිරීම යෝග සම්ප්‍රදාය නම් වේ.

පියුමෙහි පත් සියයෙක් මැ නො වේ. එහෙත් 'සියපත්' යනු පියුම් අරුත්හි මැ ශිෂ්ටයෝ යොදති. එය වෙනස් කළ යුතු නො වේ. පද සම්ප්‍රදායට නිදර්ශන යි

'පිටු' යනු 'මස්' යනු 'කෑම' යනු නො සැඟැවුණු අරුත් ඇත්තේ යැ. එහෙත් ශිෂ්ටයන් 'පිටු මස් කෑම' යැ යි කී කලැ ලැබෙනුයේ ඒ එක ද පදයෙකින් නො ලැබෙන අර්ථයෙකි. ඒ පද යෝගයට ඒ ශිෂ්ටයන් සම්මත කැර ගත් අර්ථය යි. එ හෙයින් යෝග සම්ප්‍රදායට මේ නිදර්ශන වේ.

මහා ගුරින් ගේ ප්‍රබන්ධයන් පරීක්ෂ්‍යකාරි වැ කියවන කලැ ඔවුන් ගේ සම්ප්‍රදාය බෙහෙවින් මැ ශබ්ද සඞ්ග්‍රහණය මුල් කොටැ ඇති බව පෙනේ. කෙබඳු කෙබඳු ශබ්දයන් ඔහු තෝරා ගත්තෝ ද?

**සමර්ථ ශබ්ද**

අභිමත අර්ථය දෙන්නට සමර්ථ වූ — පොහොසත් වූ — ශක්තිය ඇත්තා වූ — ශබ්දය 'සමර්ථ' නම්. එසේ නුවූයේ අසමර්ථ යි. අසමර්ථ ශබ්ද යොදන්නාහු විරල වෙති.

ගේ අකුවට කොටැ අහර විකයි.

මෙහි යෙදුණු 'අකු' ශබ්දය අභිමත අර්ථය දෙන්නට පොහොසත් නො වේ. අකුව එකෙකි. හක්ක අනෙකෙකි.

**ප්‍රසිද්ධතම ශබ්ද**

එක් අර්ථයක් දෙන්නට ශබ්ද කිහිපයක් වේ නම් ඉන් ප්‍රසිද්ධතම ශබ්දය — අන් සියල්ලට වඩා ප්‍රසිද්ධ වූ ශබ්දය —

තෝරා ගත යුත්තේ යැ. ඇතැම් පර්‍යාය ශබ්ද එක සේ ප්‍රසිද්ධ යැ. එහි දී රචකයාට අභිමතයක් තෝරීමට බාධා නැති. එහෙත් ප්‍රසිද්ධිය සමාන නුවූ තන්හි ප්‍රසිද්ධතමය බලය ලබයි.

බදු—අය බදු—කර—කරවුවර— යන මේ ශබ්ද සමානාර්ථ යැ. එහෙත් බදු—අය බදු— යන දෙකින් එකක් නො ගෙන ඉතිරි දෙකින් එකක් ගනිමු නම් එකාන්තයෙන් වරදක් නො කෙරෙමු.

'රට වැසියා ගෙන් අය කර ගන්නා කර වුවර...' යන තන්හි 'කර වුවර' යන්නු එ හෙයින් ප්‍රසාද ගුණය නසන්නේ යැ.

පද්‍යයෙහි දී ඇතැම් විටැ අප්‍රසිද්ධ ශබ්දයක් යෙදීමට හේතු ඇති වේ. අනුප්‍රාස වෘත්ත ලක්‍ෂණ යනාදිය යි. එ හෙයින් —

'අළු සඳ අසඳ බඹු සොඳ සපිරි සිහිලඹා'
(පරෙවි)

යන තන්හි සූර්‍ය පර්‍යාය වූ 'අසඳ' යනු වැන්නකට ඉඩ ලැබේ.

සංසර්ගානුරූප ශබ්ද

සංසර්ගයට — එක් තන්හි යෙදීමට — පැමිණෙන ශබ්දයට අනුරූප වන ශබ්දයක් තෝරා යෙදීම ඉතා මැනැවි.

ශිෂ්ට යෙදුම්
ප්‍රාඥ මිනිහා
වෘද්ධ ගොනා
මහලු ස්ත්‍රිය
නුවණැති මනුෂ්‍යයා
දිග මාර්ගය

යනාදි තන්හි පෙනෙනුයේ සංසර්ගානුරූප ශබ්ද නො වේ. 'ශිෂ්ට' යනු සංස්කෘත ශබ්දයෙකි. 'යෙදුම' යනු සිංහල ශබ්දයෙකි. ඒ දෙක එක් වීම ගවාශ්ව සංයෝගයක් මෙන් අප්‍රියකර යැ.

'අප ගේ ජීවිත පවා විනෂ්ට විය හැකි බව පෙනේ. මෙහි විනෂ්ට යනු උද්වේගකර යැ. 'අප ගේ ජීවිත පව, වැනැසිය හැකි බව' යැ යි කිව කවර වරදෙක් ද?

### සිංහල ශබ්ද

සිංහල ව්‍යවහාරයට අනුකූල වූ ශබ්දයන් මැ තෝරා ගත යුත්තේ යැ. පර භාෂාවෙකැ ශබ්දයක් ප්‍රබොධනය සඳහා ඇදූ ගනුතුදු එය සිංහල සවභාවයට හැරවීම අවශ්‍ය වෙයි.

පවුණ්ඩ
ගැලන්
සිගරැට්
ට්‍රේනිංග්

යනාදිය සිංහලයට කිසි සේත් හුරු නො වේ.

පවුම්
ගැලුම්
සිගැරැට්ටු

යනාදිය නම් හුරු වෙයි. ක්‍රියා ශබ්ද අන්‍ය භාෂාවෙකින් ගැනීම නො යෙදේ. එ හෙයින් 'ට්‍රේනිං' යනු වැන්නකට ඉඩෙක් නො ලැබේ.

### අග්‍රාම්‍ය ශබ්ද

අශිෂ්ටයන් පමණක් යොදන ශබ්ද ග්‍රාම්‍ය නම් වේ. එ වැනි ශබ්දයකට ඉඩ දෙන්නේ තමා ගේ වාක්‍යය කොලෙසයි, අසන්නහු කලඹයි.

'ඡෝ ශ හමයි දේවයන් වහන්ස!'
'කාමක් නැහැ.,
'ඔහු ගේ මෝස්තර...'
'ශෝ බලන්න!'

යනාදිය ග්‍රාම්‍ය යි, ශිෂ්ට වාක්‍යයට නුසුදුසු යි.

(2) මාධුර්ය ගුණය

ශ්‍රවණයට ප්‍රියකර වූ ශබ්ද පරම්පරාව යම් තැනෙක්හි වේ ද මාධුර්ය ගුණය ද එ තැන්හි වේ. ප්‍රසාද ගුණයට හේතු වන සංස්කෘතානුරූප ශබ්ද සිංහල ශබ්ද, අග්‍රාම්‍ය ශබ්ද මාධුර්ය ගුණය දෙයි. එයට විරුද්ධ වූ ශබ්ද කනට දුක් උපදවයි.

සිංහලයෙහි මිහිරි බව බෙහෙවින් ඇති වනුයේ සිංහල ශබ්ද බහුල වාක්‍යයෙහි යැ.

'කියඟ, සොඳුර, මහ බඹ තෙමේ සඳින් සෝම ගෙනැ, රන් ගලින් පහන් පැහැ උකහා ගෙනැ, වන විලින් මත් හස් යුවළක් ගෙනැ, තුන් රන් පියුමක් ඇරැ, එතක් තබා දෙතක් ඉරා හා ගෙනැ, ල ඟෝ පල්ලෙහි සිහිලස් ගෙනැ, ලා හෙල්මැල්ලෙහි මෙලෙකස් ගෙනැ, සැහැසි හනා වනා, බමර බර පුල් ලෙළ ලිය ගෙනෙක්හි එවැ තී මවමින් ලය කිසේ ගල කෙළේ දෝ!'

ගුරුළුගෝමින් ගේ මේ වැකිය හුදු මිහිරින් තිමැවුණේ නො වේ ද?

වාක්‍ය කොට වීම මිහිරි බව වඩන්නේ යැ.

'දසනුදසැ සැඟැවූ තිල් වදුල් හා සමඟ කල් වියෝ ළුළු කාලිඟු කුමර හට වන සෝ කල් බොල් වියැ; වලා කල හා සමඟ මියෙනුඩුහුරු තල මිම් යැ; විදු ලිය හා සමඟ මන වෙව්ලී යැ; වැසි දහරා හා සමඟ කඳුළු දහරා වැහිණ; දිනන්හි දිවැ ගත් මත් බලා පෙළ මැ කිරි වලා සේ පැහිණ; දල ලඹ කළඹින් වැදිලි ගත් තැන් මැ දිවයුරු තෙදින් දම් තැන් සේ පැහිණ; කොළොඹ වන හිසින් මමත මුවරද රොන් මැ රජ කද සේ පැහිණ; බමර බැරැ පුල් ළෙළ ලියනගා මැ

දසනු දෙසෙහි සඟඳුම් ලැවු දල සේ පැතිණ; වලා- තෙලෙන් මමන සිඟිලැල් පොද මැ කුරුරස් ගොර- මිරිඟු දල සේ පැතිණ. හේ ඕවුනට සිහිලස් දෙන වහරෙයෙක් නො වී යැ; සතැවුලි කරන මහ- ගිමෙක් වී.'

මෙහි ගුරුළුගෝමීහු අදීර්ඝ වාක්‍යයෙන් මෝහනය කෙරෙති.

වාක්‍ය මැ නො වේ. පද ද කොට වුව හොත් මිහිරට මිහිරි හෙළුවා සේ වෙයි. දීර්ඝ පදය, කඨෝර පදය, කර්කශාක්ෂර යුක්ත පදය මිහිර නසන්නේ යැ. සංස්කෘත සමාස පද බහුල වාක්‍ය මෙයට නිදර්ශන වේ. සංස්කෘත ශබ්ද බහුල වීම මැ මාධුර්ය විනාශයට මහත් හේතුවෙකි.

'මාතෘව සාහස වැ උපස්ඛලන ගමන නිෂදන ව්‍යූත්ථාන පරිවර්තනාදියැ සුරාධූර්ත හස්ත ගත එළුවක්හු සෙයින්, ආහිතුණ්ඩික හස්ත ගත සර්ප පෝතකයක්හු සෙයින්, ආකර්ෂණ පරිකර්ෂණ අවධූනන නිර්ධූනනාදි උපක්‍රම- යෙන් අතිමාත්‍ර දුඃඛානුභව කෙරෙයි. මව ශීතෝදක පාන කාලයෙහි ශීත තරඟෝත්පත්තියක්හු සෙයින්, උෂ්ණාහාරාභ්‍යවහරණ කාලයෙහි අඞ්ගාර වාෂ්ප සම්පරිකීර්ණයක්හු සෙයින්, තීව්‍ර දුඃඛානුභව කෙරෙයි.'

කවර මාධුර්යයෙක් ද? කවර ප්‍රසාදයෙක් ද?

මිහිරි ගුණ කැමැත්තහු විසින් අර්ථය නො සලකා එක්වන් පද තෝරා ගත යුතු නො වේ. අර්ථය අන් සියල්ලට වඩා සැලැකිය යුත්තේ යැ. එයට බාධා නැත් නම් අනුප්‍රාස- රසයෙන් යුත් පද තෝරා ගැන්ම වරදෙක් නො වේ. මිහිර ද වැඩි වුව හොත් අමිහිරි වන බව පමණක් මෙනෙහි කළ යුතු යැ.

'එ කල්හි සුළු කලිඟු කුමර ...... නුවරින් නික්මැ, ගම් නියම් ගම් ජනවු මල මඬුලු ගෙවා ගොස්, හිමවත් අබියෙසට

වැදූ, නිල් අඹරෙහි උල්කාපාත සෙයින් මතැත් යුද්හි දළ
ගැහැටමෙන් නිල් වන අතුරින් පලන ගිනි දල බලමින්,
මරු සල වටහි සිදී වගුළු පියුම්රා මිණි රූ සෙයින්
නව සඳල පෙළෙවැ මත් මුව රදුන් නිය පදුරින් පැළැ
මතැත් කුඹින් මුත් මුතු කැල දක්මින්, මේ ගබ්හි විදු ලිය
සෙයින්, අගසින් ගොස් වන අතුරට වදනා සිදඹුවන්
සීයෝ සහකාග සිදූ බලන් නගමමින්, බමර පිය රැවින්
නොබනා සුපිපි තරු වනගණ් බලමින්, සඳකත් ගලුල්
උපල් කෙළැ, කොළොම්බ් වැදූ මුවරඳ රොන් තවර
ගෙනැ දවන රවන බඹහ බමර වැළු අළලමින් බට
හිමවූ පවන් පහස් ලැබෙමින් ගෙඃස්, සොමි සිසිල් සිතිඳු
පහන් දිය ඇති ගොයක් වෙතැ රමණී පියෙසෙක්හි
අසපුවක් කොටැ ගෙනැ, තවුස් පැවිජි වැ විසී.'

දීඝී වාක්‍යයෙකි. එහෙත් පද තෝරා ගැනීම ඉමහත් සැලැ-
කිල්ලෙන් කැරුණු හෙයින්, අර්ථයට මඳ වූ ද හානියක්
නො කැරුණු හෙයින් මෙහි මධුර ගුණය පිරී සිටී.

(8) ඔජෝ ගුණය

අර්ථය නො නසමින් ම වචනාඩම්බරය ඇති කරන
වාක්‍යය 'ඔජස්' නම් වූ ගුණයෙන් යුක්ත වන්නේ යැ.
අතරින් පතර මෙය ඇති වීම ප්‍රබන්ධ ගරුත්වයට මහත්
හේතුවෙකි.

'සුන්දරිය, මෙහි බලව. මේ පාණ්ඩ්‍ය රජයා යැ.
උභයාංශයෙහි අර්පිත වූ මුක්තාහාර ඇත්තේ යැ.
හරිචන්දනයෙන් කරන ලද අඞ්ගරාග ඇත්තේ යැ. එ
හෙයින්, තරුණ රවි කිරණයෙන් රක්තවර්ණ වූ කූට ඇති
ගලන නිර්ඣර ධාරා ඇති සජීව රාජයක්හු මෙන් බබළයි.
ලඞ්කාධිපති රාවණයා ද ඉන්ද්‍ර ලොකය ජය ගන්නා
පිණිසැ ගියේ මොහු හා සමග යැ. තාම්බූල වල්ලියෙන්
පරිනද්ධ වූ පූග වෘක්ෂයන් ඇති ඒලා ලතායෙන්

ආලිඞ්ගිත වූ චන්දන වෘක්ෂයන් ඇති තමාල පත්‍රමය ආභරණ ඇති මලය සථලයන්හි ක්‍රීඩා කිරීමට පහදුව. මේ රාජයා ගේ ශරීරය ඉන්දීවර ශ්‍යාම ය. ඔබ ගේ ශරීරය ගොරොචනා ගෞර ය. විද්‍යුල්ලතා මෙඝ කුට දෙ දෙනා ගේ මෙන්, අන්‍යොන්‍ය ශොභා පරිවර්ධනය පිණිස, ඔබ දෙ දෙනා ගේ සංයොගය වේ වා.'

ප්‍රතාපවත් රජයකු ගේ වර්ණනය කැරෙන තන්හි කොතරම් නොබනා පද මාලාවෙක් ද?

'බුලත් වැලින් වැසුණු පුවක් ගස් ඇති, එල් වැල් වෙළුණු සඳුන් ගස් ඇති .....'

යන මෙය ද,

'තාම්බූල වල්ලියෙන් පරිනද්ධ වූ පූග වෘක්ෂයන් ඇති ඒලා ලතායෙන් ආලිඞ්ගිත වූ චන්දන වෘක්ෂයන් ඇති......'

යන මෙය ද, සමාන කැර බලන්නැ. එ කලැ ඔජොගුණය යනු කිමෙක් දැ යි වැටැහී යේ. මේ තැනුදු කියවා බලන්නැ:-

'ඉතා බලසම්පන්න වූ යුරෝපා ජාතිකයනු දු වෙව්ලුවන තරම් තේජසින් ද බලපරාක්‍රමයෙන් ද යුක්ත වූ දෙ වැනි රාජසිංහ රජ්ජුරුවෝ සිංහාසනාරූඪ වැ අමාත්‍යයන් පිරිවරා සිටිය හ.'

'හිම වික්‍රමාන්විත ගජබාහු මහා රාජොත්තමයාණෙනි, ඔබට නමස්කාර වේ වා! ඒ ගිය දෙළොස් දහස පෙරලා සිය රට දුට හ; ඔබ ගෙනා දෙළොස් දහසින් එකෙකුදු නුදුටුයේ ය '

72 වන පිටෙහි දක්වුණු 'මාතෘව සාහස වැ.. ...' යනාදී නිබන්ධ ප්‍රදෙශය නියම ඔජො ගුණයෙන් යුක්ත නො වේ.

එහි ශබ්ද මාලාව කඨෝර බව සැබෑ යැ. ඔජෝගුණයට කඨෝරත්වය යෝග්‍ය වතුදු ඒ ඔජෝගුණයට හෝ ශබ්ද ගත කඨෝරත්වයට හෝ අස්ථාන යැ. මව ගේ යම් යම් පැවැතුම් නිසා ගැබෙහි දරුවාට වන ගහට වැනීමට කවර ඔජෝ-ගුණයෙක් ද? කවර කඨෝරත්වයෙක් ද?

## 5. දෝෂාපහරණය

සියලු තන්හි උසස් බව පයස්නා ලැබේ. එ හෙයින් ප්‍රබන්ධයෙහි ද ඒ ඇති කළ යුත්තේ යැ. ප්‍රබන්ධය උසස් කරන්නා වූ කරුණු පසෙකි.

(1) දෝෂාපහරණය
(2) ගුණාහරණය
(3) රසාවේශනය
(4) රීත්‍යනුගමනය
(5) අලඞ්කාරණය

යන මේ යැ.

### දෝෂාපහරණය

දෝෂයෙන් තොර මිදුණේ ප්‍රබන්ධයෙක් නො වේ. දූත් දූත් නූගත්තු තමන් ගේ වැරැදි සෙදුම් ද උසස් තන්හි සිටුවා ගනු කැමැත්තාහු වාක්‍යයන් පිළිබඳ නිර්දෝෂත්වය අනවශ්‍ය කොටැ සලකවන්නට තැත් කෙරෙති. 'අවශ්‍ය වනුයේ අර්ථය යි. ඒ පැහැදිලි නම් පද දෝෂ වාක්‍ය දෝෂ එ තරම් සැලැකියැ යුතු නො වේ' යනු ඔවුන් ගේ කීම යි. මේ නයින් බලත් හොත් බඩ ගිනි නිවීම පතන්නවුන් විසින් අහරක් නො නැහෙනැ ලා කෙසේ හිඳැ කැව ද වරදෙක් නො වේ; ඇඟ වැසුම් පතන්නකු විසින් කිමෙකින් කෙසේ එය කළ ද කමෙක් නැති.

කෑම් බීම් ඇඳුම් පැළඳුම් ආදියෙහි ලා ශිෂ්ටත්වය යම් පමණ අවශ්‍ය ද භාෂා ව්‍යවහාරයෙහි ද එ පමණ මැ අවශ්‍ය යැ. වත් කම් නැත්තවුන් ගේ අශිෂ්ට කම් බලා වත් කම් ඇත්තෝ තුමූ ද අශිෂ්ට නො වෙති. නූගතුන් වැරැදි වහරට වැටීම උගතුන් වරදට හරවා නම් ඒ ශිෂ්ට ධර්මයට ඉඳුරා වෙනස් යැ. එ හෙයින් ප්‍රබන්ධය පිළිබඳ වූ සර්ව නිරවද්‍යත්වය සියල්ලවුන් විසින් අපෙක්‍ෂා කළ යුත්තේ යැ. සියල්ලවුන් ගේ ප්‍රාර්ථනාව දුකින් මිදෙන්නට යැ. එක් වරැ මැ එ සේ කරන්නෝ කවරහු ද? එක් වරැ නො කළ හැකි වූ පමණින් දුකින් මිදීම නුවුවමනා යැ සිතියන්නෝ සිහි මඳ වූවෝ යැ. වැඩි දෙනා ගේ උදාසීනත්වය බලා, මෙ තෙක් කළ නැත හැරැ පියන්නට සිතන්නෝ නම් සැබැවින් මැ උමතුවෝ යැ.

**දෝෂ භෙද**

දෝෂ තුන් වර්ගයෙකි

(1) ශබ්ද දෝෂ
(2) රචනා දෝෂ
(3) අර්ථ දෝෂ

යන විසිනි.

**(1) ශබ්ද දෝෂ**

අක්‍ෂර වශයෙන් හෝ පද වශයෙන් හෝ වාක්‍ය වශයෙන් හෝ ඇති වනුයේ ශබ්ද දෝෂ යි. ව්‍යාකරණයට අනුකූල වීමෙන් බොහෝ ශබ්ද දෝෂ දුරු වන්නේ යැ. එ හෙයින් ඒ සියල්ල පිළිබඳ විස්තරයෙක් මෙහි නො කැරේ. එහි නො කියැවෙන කිහිපයෙකි.

කර්ණ කටුකත්වය

කොතරම් අර්ථවත් වුව ද කනට අමිහිරි වූ ශබ්ද ප්‍රබන්ධයට සාමාන්‍ය වශයෙන් නුසුදුසු යැ. අසන කනට පමණක් නො වැ කියවන කටට ද එ බඳු තැන් ආයාසකර වෙයි.

හ්‍ර්‍යපත්‍රපා (හ්‍රී + අපත්‍රපා = විළි බිය)
දෞර්ජන්‍යය (දුජන බව)
කාර්තාර්ථ්‍යය (කෘතාර්ථ බව)

යනාදිය නිදර්ශන යි. භාග්‍යයකට මෙන් පිරිසුදු සිංහලයෙහි මෙ බඳු තැන් නො ලැබේ.

ග්‍රාම්‍යත්වය

ශිෂ්ට ව්‍යවහාරයෙහි නො ලැබෙන පද හෝ වාක්‍ය හෝ ප්‍රබන්ධයට අයෝග්‍ය යැ. එ බඳු තැන් ගැමියන් අතර පමණක් භාවිත වන බැවින් ග්‍රාම්‍ය නාමයෙන් ගැනේ. නිදර්ශන 70 වැනි පිටෙහි එයි.

අප්‍රසිද්ධත්වය

මෙ ද 68 වැනි පිට බලා දත්තේ යැ. ප්‍රසිද්ධ ශබ්දය නො වී නම් එ තන්හි වනුයේ අප්‍රසිද්ධත්ව යි. දෝෂයෙකි.

අසිංහලත්වය

70 වැනි පිට බලත්තේ යැ. සිංහල සවභාවයෙන් නිත වූ ශබ්ද යෙදීම අසිංහලත්ව දෝෂය ඇති කෙරේ.

(2) රචනා දෝෂ

පද එක් කොටැ ගැලැපීමේ දී ඇති වන වරද මෙ නමින් හැනේ. එහි දු වැඩි යක් මැ ව්‍යාකරණ ශාස්ත්‍රයෙහි ලා ඉගැන්වේ. කිහිපයෙක් බැහැරින් උගත යුතු යැ.

අනනුරූපත්වය

එක් කොටැ යොදනු ලබන ශබ්ද දෙකෙකින් එකෙක් නෙකට අනුරූප නො වේ නම් අනනුරූපත්ව ඇති වේ. 9 වැනි පිට බලත්තැ.

## අභින්නත්වය

(1) එක ම ශබ්දය හෝ සමාන ශබ්ද හෝ නැවැත නැවැත යෙදීම ද, (2) වාක්‍ය එක් ලෙසෙකින් ම පටන් ගැනීම ද, (3) එක් ලෙසෙකින් ම කෙළවර කිරීම ද අභින්නත්ව දෝෂය ඇති කෙරෙයි. අභින්නත්වය නම් නො වෙනස් බවයි. ඔම්මට භට්ටයෝ එය අනවීකෘති නාමයෙන් ගනිති. කුස ජාතකයෙහි —

සොබමන් මදු රද හට දූ වැ ලා
නිදුකින් නුඹෙ කුසයෙන් බිහි වැ ලා
මෙ නගුන් සමගින් කෙළැ ඇති වැ ලා
මට දූන් ගමනක් වියැ තනි වැ ලා

යන තන්හි සතර පද අගැ ම 'වැ ලා' යනු එක සේ යෙදිණ. මහත් දොසෙකි.

සොබමන් කුස නිරිඳු නම් මම යැ පළ කොමැ
වසමින් සිරි නෙළුම් මල් පත් ඉවත් කොමැ
විලසින් දිය රකුසු තර කොසර නද කොමැ
බිසොවුන් කොමළ අත ගත් සඳෙහි තර කොමැ

යන්නෙහි 'කොමැ' සතර ද අභින්නත්වයට නිදර්ශන යි. වාක්‍ය එක් ලෙස ඇරැඹීමත් එක් ලෙස කෙළවර කිරීමත් බොහෝ ගද්‍ය ග්‍රන්ථයන්හි එන දොෂයෙකි. සද්ධර්ම රත්නාකර-යෙහි 'ඉක්බිති' යන්නෙන් ම ඇරැඹුණු වාක්‍ය ඉතා බොහෝ යැ. 'තව ද' යනුත් සිංහල වාක්‍යාදියෙහි බෙහෙවින් යෙදුණෙකි. ආඛ්‍යාතයෙන් ම වාක්‍යය අවසන් කිරීම දූන් රීතිය වැ සිටී. මේ එකකුදු ගුරු කමට ගත යුතු නො වේ.

## අනාසන්නත්වය

සම්බන්ධ වන්නා වූ පද එකක් අනෙකකට සුදුසු තරම් ආසන්න වැ නො සිටී නම් එහි අනාසන්නත්ව දෝෂය වෙයි. බොහෝ සිංහල රචකයන් මෙය දෝෂයක් කොට-

නො සලකන සේ පෙනේ. ඔවුන් සිතා ලියන දූෂයෙහි අරුත් ඔවුනට පැහැදිලි ය. ඒ ලියූ දෑ කියවා බලා තේරුම් ගන්නනට පිහිට වනුයේ පද පරිපාටිය යි. එය වැරැදි වූ කලැ ගැනෙන අර්ථය ද වැරැදි වන බව කවර අරුමයෙක් ද? 60 වැනි පිටේ 6 බැලුව මැනැවි.

**අවිරාමත්වය.**

විරාමය නම් වූ නැවැතීම නො සලකා වාක්‍ය රචනය කළ කලැ අවිරාමත්ව දෝෂය වෙයි. පුරාතන සිංහලයෝ විරාමය නො සැලැකූ හ. ලිවීමේ පහසුව සලකා ය. දැන් මුද්‍රණ ශිල්පය දියුණු ය. ලිවීම ද එ තරම් ආයාසකර නො වේ. එ හෙයින් නිසි සේ පද බෙදා විරාම ලක්ෂණ යොදා වාක්‍ය ගැලැපීම කළ මනා වැ ය. පුස් කොළ පොතක් ගෙනැ කියවා බැලූ කලැ අවිරාමත්වය කොතරම් අහිතකර ද යනු වටහා ගත හැකි වේ.

පද විරාමය
අඞ්ග විරාමය
වාක්‍ය විරාමය

යැ යි විරාමය ත්‍රිවිධ වෙයි.

**පද විරාමය**

පදයෙකින් පදයක් වෙන් කොටැ ලිවියැ යුතු ය. ඇතැම් සිංහල රචකයන් දුනුදු පද වෙන් කරන සැටි නො දැන්මෙන් පෙනී යනුයේ ඔවුන් පද නො හඳුනන බව යි. විශේෂයෙන් සැලැකියැ යුතු තැන් කිහිපයෙකි.

(1) වෙන් කොටැ වැනියැ හැකි සියලු පද වෙන් කරන්නෙන් යැ.

එ තන්හි මිනිස්සු දෙ දෙනෙක් වූ හ.
තමා හම පිහිට වූ මිනිසා හේ වැනැසී ය.
ඔහු ගේ මිත්‍රයා ගෙන් ලියමනෙක් ලැබිණ.

(2) පද දෙකක් අතර සන්ධියක් වී නම් මධ්‍යයෙහි විරාමයෙක් නො වේ.

අඹත් කජුත් මේ වත්තෙහි පෙනේ.
සිලුත් ගනුව, දහමුත් අසව.

'අඹ ත්' 'කජු ත්' යැ යි ලිවීම නො යෙදේ. 'අඹ + ද' යන දෙ පදය අතර සන්ධිය වීමෙන් 'අඹත්' යනු වී යැ. 'ත්' යනු තනි කොටැ කියැවියැ හැකි නො වේ.

(3) නිත්‍ය සමාසයක් නුවූ තන්හි විශෙෂණය විශෙෂ්‍යයෙන් වෙන් කොටැ යෙදීම සුදුසු යැ.

රන් කග
තුන් දෙස්
මේ දෙස

(4) යැ - මැ - හට - ගෙන් - ගේ - ද - නො - යනාදි නිපාත වෙන් කොටැ ලියන්නේ යැ.

හේ දූත් එන්නේ යැ.
හේ මා මැ දකී.
'හිමියන් හට දෙ ගුරු.'
මම ඇය ද ගෙන් පැනයක් අසමි.
'ඇය ද ගේ ලක්‍ෂණ බලා.........'
රජ රට නො රකී ද?

(5) 'යි' නිපාතය ද වෙන් කළ යුතු යැ. එහෙත් පූර්ව පදය හා සන්ධියෙක් වේ නම් වෙන් කළ වරදෙකි.

මට යි. ගස යි.
එහෙත් — වැටේ + යි = වැටෙයි.
බලා + යි = බලයි.

### අඩග විරාමය

මෙය යෙදෙනුයේ වාක්‍යාංගයක් වෙන් කොටැ ලීමෙන් අර්ථය නිරාකුල කරනු සඳහා යැ. ඒ දූන් ලකුණෙන් හඟවනු ලැබේ. කොමාව යැ ඉර යැ පෙරැළි කොමා යැ යනාදි ලකුණු ව්‍යවහාරයෙන් දක්තේ යැ.

### වාක්‍ය විරාමය

වාක්‍යාවසානය හඟවා ලයි. සිංහලයෙහි මේ සඳහා යැ – යි – හු – යනාදි නිපාත වෙති. ද – ලු – යන නිපාත ස්වාර්ථය සමඟ මැ සමාප්තිය ද හඟවයි. දූන් සමාප්ති ලක්ෂණයෙකුදු යෙදේ.

### භග්න – ප්‍රක්‍රමත්වය

පද යෙදුණු ක්‍රමය බිඳැ අන්‍ය ක්‍රමයකට හැරැවීමෙන් මේ දෝෂය ඇති වේ.

ඒ දරු නැමුමට හෝ ගැයිමට හෝ සමර්ථ නො වේ.'

'නැටීම්' යනු 'ඊම්' ප්‍රත්‍යයයෙන් වූයේ යැ. 'ගැයුම්' යනු 'උම්' ප්‍රත්‍යයයෙන් වූයේ යැ. දෙ ලෙසක් කරන්නට හේතු නැති.

'නැටීමට හෝ ගැයීමට හෝ'

යනු වේ වා. නොහොත් —

'නැටුමට හෝ ගැයුමට හෝ'

යනු වේ වා.

'සතුන් දිවි නැසුමු ත්
අන් සතු දෙය ගැනිමු ත්
පරදර රා බොනු ත්
මෙ පව් සිදු වේ කයින් සැක නැත්'

මෙහි තැසුම් — ගැනීම් — බොනු — යන විසින් තුන් ලෙසකින් යෙදුණු සැටි නො මනා යැ.

'දෙරණ ලිය දුනු ඔහුට එකුවන්'

'පමණ නැති මොහු ගු ණ
ඉක්මැ පවතී වැනුම් කිවි නැණ'

පළමු 'ඔහු.' ඉක්බිති 'මොහු.' නො යෙදේ.

'යස ගී එ නිපිඳුන'

'එ රජ සැප සේ රජ කරන සඳ'

තැනෙකැ බුහු බස. තැනෙකැ එක් බස. භග්න ප්‍රක්‍රම යි.

'කුඩ සහ සුපිපි නා
පුවක් මල් වල් විදු නා
සපු මල් පහනි නා
කරන පුද වැනි එ වන සුර නා'

'කුඩ' 'වල් විදුනා' යන දෙ තන්හි දෙ වන විබති. 'පහනින්' යන තන්හි තුන් වන විබති. භග්න ප්‍රක්‍රම යි.

'වෙහෙරඹර ඇම කලි නො කල් දෙව් දුනු සියන්
සිරිසිලි'

'බමර කැල බඳ ලොබ නිබඳ නද දෙති එ වෙනැ
වන ගබ'

එකෙක් අසු කලි. අනෙක වත්මන් කලි. භග්න ප්‍රක්‍රම යි.

'එකොළොස් මෙ පව් ක ළු
තිරිසන් පේ තිරැ ව ළු
උපදිති ඒ නො ක ළු
සදෙව් ලොව සැප ලැබේ සුලකළු'

'උපදිති' යි එකෙකු කර්තෘ කාරක යෝග යි. 'ලැබේ' යැ යි අනෙකෙහි කර්ම කාරක යෝග යි එ හෙයින් භග්න ප්‍රක්‍රම වෙයි.

**සඞ්කීර්ණත්වය**

එක් වාක්‍ය ප්‍රදෙශයකට අයත් පද අන්‍ය වාක්‍ය ප්‍රදෙශයෙක්හි බැඟීමෙන් සඞ්කීර්ණත්වය වෙයි.

'වෙතැ තිකමල් මහ රැ
මුතු ලැල් ලකළ පියක රැ
සුපිපි කිණිහිරි තු රැ
සැදී බැබැළෙන රන් තොරණසුරැ'

'වෙතැ තිකමල් ඇති සුපිපි කිණිහිරි තුරැ මුතු ලැල් ලකළ රන් තොරණ අසුරැ' යැ යි කියැ යුතු තැනි.

**දුෂ්ක්‍රමත්වය**

කියැ යුතු ක්‍රමය උල්ලඞ්ඝනය කළ කලැ දුෂ්ක්‍රමත්වය ඇති වේ.

'මට සතයක් හෝ පණමක් හෝ දෙන්නැ'

'පණමක් හෝ සතයක් හෝ' යැ යි කියැ යුතු තැනි. සතයක් දෙනු බැරි නම් පණමක් දෙනු නො බැරි ද?

'බු දු න් දහම් සඟ හට නො කෙළෙ ද අද ර
නි ව න් දකිත පිනකුත් නො කෙළෙ ද පවර
ලි ය න් තත නො සිපියෙ ද සිහිනෙන් විත ර
උ ප න් මව යොවුන් වනයට පොරෝ යු ර'

බුදුන් දහම් සඟ හට අදර කිරීම සඟ සැප දෙන පිනකැයි සිතමු. නිවන් දක්නා පින එ තරම් පහසු නො වන හෙයින් දෙ වන කොටැ දක්වීම වරදෙකි.

### ඌනත්වය

එ නම් අඩු බව යි. පද එකක් හෝ වැඩියක් හෝ අඩු වූ තන්හි ඌනත්ව දෝෂය වෙයි.

'කියත් බමුණුත් බැමිණි මේ ලෙස'

'බමුණුත් බැමිණිත් මේ ලෙස කියත්' යනු විය යුතු තැනි. 'බැමිණිත්' (බැමිණු + දු) යන තන්හි 'දු' නිපාතය අඩු වී යැ.

### අර්ථ දෝෂ

මහත් ගණනෙකි. කිහිපයෙක් මැ දැක්වෙයි.

### සන්දේහය

අර්ථ දෙකක් හෝ වැඩියක් හෝ ගත හැකි තන්හී කිමෙක් ගත යුතු ද යනු නිශ්චය කළ නො හැකි වේ නම් එහි වනුයේ සන්දේහය (සැකය) යි.

'සතුන් දිවි නො න සා
අන් සතු නො ගෙනැ වෙසෙ සා
ගැමි දම් බොරැ බ සා
දුරු වැ රා බොනු සමඟ මෙ පසා'

'මේ ප්‍රත්‍යයය සමඟ දුරට වී රා බොව' යි කී බසෙක් ද? මෙ සේ සැක ඉපැදීමට ඉඩ තබා කියනු නො යෙදේ.

'කැරැ නම ඉටු දෙවි ලෙස පුද සියලා'

'ස්වකීය ඉෂ්ට දෙවයා මෙන් සියලු පුද කොටැ' යන අර්ථය ගනිමු ද? නොහොත්, ස්වකීය ඉෂ්ට දෙවයා ලෙස කොටැ පූජා ශතයන් දමා යන අර්ථය ගනිමු ද?

### විරුද්ධ මතිකරත්වය

රචකයා ගේ මතයට විරුද්ධ වූ මතයක් ඇති කරන්නට යම් යෙදුමෙකින් ඉඩ ලැබේ ද එහි විරුද්ධ මතිකරත්වය වෙයි.

'න ම නම සිහි කළ සිතට සතුන්නේ
හැම දෙම්නස් දුක් වැද්ද නො දෙන්නේ'

(බුදු ගුණ අලඞකාරය)

හැම දෙම්නස් දුක් වැද්ද නො දෙන්නේ නම් සමහර දෙම්නස් දුක් වැද්ද දෙන බව සිතා ගත හැකි යැ. 'කිසි දෙම්නස් දුක්' යැ යි කියැවිණි නම් මේ දෙෂය නො වේ·

නිරර්ථකත්වය

යම් තැනෙක්හි යෙදුණු පදයෙකින් වාක්‍යාර්ථයට ප්‍රයෝජනයෙක් නො වේ ද ඒ නිරර්ථක යැ. එළිසම කවිහි මේ දෙෂය බෙහෙවින් පෙණේ. 'පවර', 'සුපවර', 'සොබමන්' යනාදිය යැ බොහෝ සෙයින් නිරර්ථක ලෙස යෙදෙන පද.

'සොබමන් කුස නිරිඳු නම් මම යැ පළ කොටැ'

මේ 'සොබමන්' යැ යි කියන ලද්දේ කුස රජු විසින් විසුළු මුව ගුත් තමා මැ සඳහා යැ.

'කිප දිනක් පසු කැරැ වියොවින් මහරැ'

මහාහී වූ වියෝගය! කොතරම් විසුළුවෙක් ද?

'මැරී පර ලොව ගියා වූ'

නො මැරී පර ලොව යාමක් නැති හෙයින් 'මැරී' යනු නිරර්ථක යි.

පුනරුක්තිය

වරක් කි දය මැ පෙරළා කීම පුනරුක්ති නම්. වාක්‍යය දීඝ කල කල්හි උක්ත පදාදිය නැවැතැ නැවැතැ යෙදීමෙන් පුනරුක්තියට ඉඩ දුන්නෝ බොහෝ වෙති· ගුරු කමට නො ගත යුතු.

'සුනිල් අහස නමැති නිල් මහ මුහුදෙහි'

යන තන්හි 'තිල්' යනු පුනරුක්තියෙකි. අභ්‍ය සුතිල් නම් එයට උපමිත වන වස්තුව ද තිල් මැ යෑ. කියැ යුතු නො වේ.

දෙශ විරොධය

එක් දෙශයෙක්හි නියම වශයෙන් ඇති දෙයක් අන්‍ය දෙශයෙක්හි ලා දුට හොත් දෙශ විරොධය වේ.

'නොමදින සුවඳ විහිදෙන සොඳ සඳුන් හර
කිඹ වන වසන වැදි අඟනෝ කෙරෙති දර'

සඳුන් වැතෙනුයේ මලයෂයෙහි යෑ.

කාල විරොධය

'සඳ දුවල් බබළයි'

කාල විරොධය මෙහි පැහැදිලි යෑ.

කලා විරොධය

'රසඥ තෙමේ ඒ හාස්‍ය රසයෙන් යුත් කාව්‍යය කියවා
තැති ගත්තේ යෑ.'

හාස්‍ය රසයෙන් යුත් කාව්‍යයෙන් උපදිනුයේ සිනාව යි, තැතිය නො වේ. මේ කාව්‍ය කලාවට විරුද්ධ යෑ.

ලොක විරොධය

'ඒ ඉදිබුවා මහත් වේගයෙන් පියා හඹන්නට වියෑ.'

පියා හඹන ඉදිබුංවෝ ලොකයෙහි නො වෙති.

ආගම විරොධය

'බුදුන් දහම් සඟ හට නො කෙළෙ ද අදර
තිවන් දකින පිනකුත් නො කෙළෙ ද පවර'

බුදුන් දහම් සඟ හට අදර නො කැරැ තිවන් දකින පිනක් කළ හැකි බව මෙයින් හැඟැවෙයි. ආගමනට විරුද්ධ යෑ.

### ප්‍රතිඥා විරොධය

'සේ ඇත් සොඬෙක වන් යුවළත් කුම් වැති ය'

'සුදු ඇත් සොඬ හා එක්වන්' යැ යි කීමෙන් යුවළතට සුදු ඇත් සොඬ උපමිත යැ යි ප්‍රතිඥ කැරිණ. 'කුම් වැති යැ?' යි යළි ඇසීම ඒ ප්‍රතිඥවට විරුද්ධ වෙයි.

### හෙතු විරොධය

'සූර්යයා චණ්ඩ වූ හෙයින් ඔහු පලස් පෙරෙවැ ගත් හ.'

සූර්යයා චණ්ඩ වූ හේතුවට පලස් පෙරෙවීම විරුද්ධ වෙයි.

### දෘෂ්ටාන්ත විරොධය

නිදේශයට දෘෂ්ටාන්තය විරුද්ධ වේ නම් එහි වනුයේ දෘෂ්ටාන්ත විරොධය යි.

'ස ම ගි න දුදන සත සහ වනු බදිනු වෙ ර
නොයෙදෙන කරුණු මැ යැ සුදනන් හට පව ර
ගිනි ගෙන දිලි අඟුරු ගත් කලැ දැවෙයි ක ර
නි වි තැ න රැගත් නොත් කළු වේ යැ නො විත ර'

සත සහ වනු ගැනීමෙකි. වෙර බදිනු හැරීමකි. දෘෂ්ටාන්ත පක්‍ෂයෙහි ගිනි අඟුරු ගැනීමත් ගැනීමෙකි, නිවි අඟුරු ගැනීමත් ගැනීමෙකි. නිර්දේශයෙහි හැරීමට දෘෂ්ටාන්තයෙහි ගැනීමක් සමාන නැරුණු හෙයින් දෘෂ්ටාන්ත විරොධ යි.

මේ ආදි විසින් වූ අනෙක දොෂයන් හැදිනැ ප්‍රබන්ධය ඒ සියලු දොෂයන් ගෙන් මිදීමට උත්සාහ කළ යුත්තේ යැ.

## ගුණාභරණය

ප්‍රසාද, මාධුර්ය, ඔජස් යන ගුණ ත්‍රයය පෙරැ පැවැසිණ. ස්ථානයට සුදුසු පරිදි ඒ ඒ ගුණය ගැන්වීම ප්‍රබන්ධයා ගේ උත්කර්ෂයට අවශ්‍ය වන්නේ යැ.

# 6. රසාන්වේෂණය

රස ඇවිස්සීම පහසු නො වේ. එ හෙයින් බොහෝ දෙනා ගේ ප්‍රබන්ධවලැ ඇත්තේ ප්‍රවෘත්ති මාත්‍රයෙකි. රස ගැන්වීම කවියකු විසින් කළ යුත්තෙකි. ඇතැම්හු ජන්මයෙන් මැ රසාන්වේෂණ ශක්තිය ඇත්තෝ යැ. ඔවුන් කථාවන් කියන කලැ ද අසන්නෝ කුල්මත් වෙති. ඇතැම්හු මහා කාව්‍යාදිය ඉගැනීමෙන් රසාන්වේෂණ ශක්තිය උත්සාහයෙන් ඇති කැරැ ගනිති. කෙසේ වුව ද ප්‍රබන්ධය උසස් කිරීමට නම් මෙ තරම් අවශ්‍ය වූ අනෙකෙක් නැත. කවීහු වනාහි 'රසය නැති තන්හි කාව්‍යයෙකුදු නැතැ' යි කියත්.

යම් වාක්‍යයෙකින් චමත්කාරය — කුල්මත — ඇති වේ ද ඒ රසවත් වේ. චමත්කාරය නම් 'හා! කොතරම් සිත් කලු ද?' යන ආදි විසින් හැඟී යාම යි.

කාම්‍ය, හාස්‍ය, කරුණ, රෞද්‍ර, වීර, භයානක, බීභත්ස, අද්භූත, ශාන්ත යැ යි ප්‍රබන්ධයකැ ඇති වියැ හැකි රස නවයෙකි.

කාම්‍ය රසය

යම් වාක්‍යයක් කියවන කලැ අසන කලැ එහි සඳහන් දෑය දැකීමට හෝ ඇසීමට හෝ සිඹීමට හෝ බිදීමට හෝ පැහැසීමට (ස්පර්ශ කිරීමට) හෝ සිතෙහි කාමය (ආශාව) උපදී ද එහි කාම්‍ය රසය ඇති වෙයි. මෙ නයින් කාම්‍ය රසය —

(1) දර්ශන කාම්‍ය යැ
(2) ශ්‍රවණ කාම්‍ය යැ
(3) ආඝ්‍රාණ කාම්‍ය යැ
(4) අනුභව කාම්‍ය යැ
(5) ස්පර්ශන කාම්‍ය යැ

යි පසෙක් වේ.

පුරාතනයෝ මේ රසය 'ශෘඞ්ගාර' නාමයෙන් ගෙනැ මෙහි දැක්වුණු පස් වැන්න පමණක් ඇදූ ගත් හ. දර්ශන කාම්‍යාදිය නො ගැන්ම අඩුවෙකි.

(1) දර්ශන කාම්‍යය

'සැ ලී සුපිපි සපු නා තුරුවලැ දිමූ තු
දි ලී කුසුම් බිඳැ බිඳැ නමනමා අ තු
ඇ ලී ඉදිත කොමල'ග තුනු සිරින් යු තු
බැ ලී තැනි තැන්තැ සැදි සොඳ උයන් ව තු'

මේ කියන සැටියෙන් ම, ඒ මල් තෙළමින් ගස් මිතැ ඉන්නවුන් දැක්මේ රිසි උපදී.

(2) ශ්‍රවණ කාම්‍යය

'තන්හි තන්හි පියුම් මී බී නඬන මත් රජ හසුන් පිය
රැවු අසවු. සල් මල්හි හි ගුමන බමරුන් ගේ
අදල ගුම් අසවු.'

මේ රැවු ඇසීමට කා ගේ සිත්හි නම් ආශා නූපදී ද?

(3) ආඝ්‍රාණ කාම්‍යය

'මල් අසුනට ළංවත් මැ ඇය ගේ සිතට එක් ඉන්ද්‍රිය-
යෙක් මී ඉහළ වී යැ. ඕ ඇස පියුවා යැ, නැහැ
අග මඳ මඳ කොටැ නැටැවූවා යැ, හුස්ම ද මඳ මඳ
කොටැ, ඇතුළු කළා යැ. ආඃ සුවඳ! රැක් ද? නා ද?
සපු ද? මහනෙල් ද? නෙළුම් ද? සමන් ද?
එකෙක් මැ නො වේ. මිශ්‍රණයෙකි.'

මෙයින් ඒ සුවඳ විඳුනා කැමැත්ත බලවත් සේ සිතට ඇදෙයි.

(4) අනුභව ශෘංගාරය

'කැකිරි 'මගඩිය' වටා තුන් තැනෙකින් පැළුණේ ය. ඉර අතරින් කපු පුළුන් හැටි සේ පෙනුණු සුදු මස මං මූව එතත් කෙළේ ය. මට ඉවැසුම් නැති විය. සිව්ය ඉවත් කොටැ ඇට වෙන් කොටැ සීනි මිලින් එක් කරන්නට පෙර මැ හැබැල්ලක් මූවට ගැසිමි.'

ඉදුණු කැකිරි කෑමේ ආශාව මෙයින් බලවත් සේ උපදී මැ යි.

(5) ස්පර්ශන ශෘංගාරය

'නො හඟ වන ඇතැ සි ලා දිව සළු ඇඟෙහි
සු ළ ඟ ගමන් වළකා වන'ගස් ගඟෙහි
මෙ රඟ සුව ගතට නො දතුමු පෙර සගෙහි
සු ර 'ඟ නෙති දිවෙමු දෙමු අත් මුදු තඟෙහි'

එ තරම් සිනිඳු සළු ඇඟැ ලීමට එ තරම් සිහිල් සුළඟ ඇඟැ පැහැස්වීමට කාමය උපදිනු සවභාව යි.

හාස්‍ය රසය

යම් වාක්‍යයෙක් සිනා ඉපැදීමට හේතු වේ ද, ඒ හාස්‍ය රසයෙන් යුක්ත වේ.

'මෙ තෙක් දවස් ම ගේ පොල් සොර කම් කළේ
    තෝ නමා! ඇයි, තා ම ගේ පොල් ගසට ගියේ?'
'අනේ, රාළහාමි ම ගේ වස්සාට තණ කොළ ටිකක්
    කපා ගන්නට ගියා.'
'හා හා! ඇයි, බල, පොල් ගසෙත් ඇද්ද තණ කොළ?'
'නැති නිසා නමා, රාළහාමි, මේ බහින්නේ?'

මෙය කා ගේ නම් සිනාවට හේතු නො වේ ද?

**කරුණ රසය**

අසන්නහු ගේ සිතෙහි ශෝකය උපදවන වාක්‍යය කරුණ රසයෙන් යුක්ත යි.

'ඇඹණියන් දරුවන් ඔබ සෝවුරන්
හිතැතියන් හැම එක් වැ හඬා දෙඩා
ඉවැසුමක් නො ලබා සිටි ඒ දවස්
එක බසක් නො කියූ ඔබ කුම් කියත්'

මෙය අසන්නහු ගේ ද සිතෙහි ශෝකයට දොර හැරේ.

**රෞද්‍ර රසය**

රෞද්‍ර රසයෙන් යුත් වැකිය අසන්නහු ගේ සිතෙහි කෝපය අවුස්සයි.

'දෙනක මස් පලහා බිඳු බී සුරා
දරුණු සොක් අවි ගත් සෙනගක් අවුත්
හැම මරම්හ කියා ගෙනැ වත් තැනේ
පුදුමෙනුත් පුදුම යි ඔබ ලත් රැකුම්'

එ වැනි දරුණු කමක් කරන්නවුන් කෙරෙහි අසන්නවුන් කුපිත කැරැවීමට මේ වැකිය සමත්.

**වීර රසය**

අසන්නහු ගේ සිතට එ බඳු ක්‍රියායෙහි උත්සාහය නංවන වාක්‍යය වීර රසයෙන් යුක්ත ය.

'එකෙක පාර ගසා තෙළෙසක් දතන්
බිමැ හෙළා පලවා හැම සිස් අතින්
පල කෙළේ එ දිනේ මැදි සෝවුරා
පරපුරේ පෙරැ වූ සැටියෙන් බිඳ යි.'

එ වැනි කාර්‍යයෙකැ දී උත්සාහය උපදවන්නට මෙ සුදුසු කියමනෙකි.

භයානක රසය

මෙයින් යුත් වැකිය අසන්නහු ගේ භය උපද-වන්නේ ය.

> 'රළු මතැත් මහ පොළොව අනුරාව දෙවමින් ගිගුරු හඬින් මුළු ලොව තතුණුවමින්, කොපයෙන් යදම් බිඳැ සුනු විසුනු කෙරෙමින්, බැඳැ ලූ තඹර පෙරළී සිටැ ඇතැ තුතු කෙරෙමින්, තමා ගේ සේයට ඇතැ ලූ ඇත්මෙන් මහ පොළොව දෑදුරු කොටැ දළ ඇවිළැ ගත් පසින් භයඞ්කර වැ දිවැ ලුහුබඳවා අල්ලා පළා පූ මිණී දළහැ අවුණා තගමින්, ලෙහෙයෙන් රැඳී ගිය මුහුණින් ලෙහෙයෙන් රැඳී ගිය දළින් ගොන් මිහිවුන් ලුහුබඳවා ගෙනැ ඇතැ පළමින්, ඔවුන් ගේ අතුණු බහතින් වෙළී ගිය දළින් බැලුබැලුවන් ඇස් පියවමින් කොපයෙන් සොඬ කටැ ලා ගෙනැ හිස සලසලා ගුගුරමින්, දෙරටු අමලු පවුරු පදනම් ඇතැ හෙළා සුනු විසුනු කෙරෙමින් අවුත් වීථියට වැදැ ගියේ යැ.'
>
> (බුත් සරණ — 79)

බීභත්ස රසය

අසන්නහු ගේ සිත්හි පිළිකුල උපදවනුයේ බීභත්ස රසයෙන් යුක්ත වූ වාක්‍යයෙකි.

'දින පසක් ගෙවී ඉදිමී එහි තුබූ ණු
ගෙරි කුණක් මෙතට වැදැ බලු කැල දරැ ණු
බඩ පළක් පළා පිටතට ආ අතු ණු
නොමිඳ දික් කෙරෙති ඇදැ ඇදැ ගෙලැ වෙළුණු'

මේ වැකිය සිතෙහි බලවත් පිළිකුල ඇති කෙරේ මැ යි.

**අද්භූත රසය**

පුදුමය ඇති කරන වාක්‍යය යැ අද්භූත රසයෙන් යුක්ත වනුයේ.

> 'සමනළ ගල තටත්තට වී යැ. මුල සිහින් වූ අග මහත් වූ අත් සතරෙක් ඉහළ නගී, පහළ බසී, මුදුන වටා යෙසී, කැකිළෙයි, විහිදෙයි. ඒ නම් මහවැලි, කැලණි, කළු, වලවේ යන නදී සතර යැ. සමන් දෙවි වහා අහසට පැන දෙව්නුවර දෙස බලා අත් පොළසන් දී "උපුල්වන් දෙවියෙනි, උපුල්වන් දෙවියෙනි" යි මහ හඬ නැඟී යැ.'

ඒ කවර නම් ආශ්චර්යයෙක් ද?

**ශාන්ත රසය**

යමෙකින් සිත විෂයාශායෙන් මිදී මෝක්ෂය දෙසට හැරේ ද ඒ ශාන්ත රස යුක්ත වාක්‍යයෙකි.

> 'ඇස වැසෙන්නැ, කන අගුළු ගන්නැ, නැහැය හිර වෙන්නැ, මුව ඇහිරෙන්නැ, කය ගල් ගැසෙන්නැ, සිත නවතින්නැ, මෙ ලොවැ පැවැත්ම දුක යැ.'

නිවනට සිත යොමු කරන කියමනෙකි.

රසය වස්තුව හා සම්බන්ධ වැ ඇති වන්නෙකි. පද මාලාව එයට සුදුසු විය යුතු යැ.

## 7. රීත්‍යනුගමනය

පද සංඝටනාව පිළිබඳ විශේෂාකාරය රීති නම් වේ. රචකයෝ නානාකාරයෙන් තමන් ගේ බන්ධනයන් කෙරෙති. සියල්ලෝ එක් අයුරින් මැ පද ගැළැපීම නො කෙරෙති. එක් එක් ඝටනා ක්‍රමයේ විශෙෂ ලක්ෂණය රීති නමින් දන්නා ලැබේ.

(1) කොමල යැ
(2) කඨින යැ
(3) මිශ්‍ර යැ

යි රචනා රීති තුනෙකි.

## (1) කොමල රීතිය

සඤ්ඤකාක්ෂරයෙන් ද දීර්ඝ සමාසයෙන් ද තොර වූයේ කොමල රීති යි. සිංහල පද්‍යය සාමාන්‍ය වශයෙන් කොමල රීතියෙන් මැ කැරෙන්නෙකි. ගද්‍යයෙහි ද මේ නො ලැබෙන්නේ නො වේ.

'මේ එකලා වැ මහ වල්හි මෙ වැනි රුවක් ගෙනැ, මෙ වැනි යොවුනක් ගෙනැ, අප ඇසට පැනුණු සේ ඉතා මැනැව. හිමි සඳ, තොප රූ දුනැ වෙවුලුම් ගත් මෙ හදවත් මදක් සනහන් යෙදේ. තොප යොවුන් තුරුහි මහණ දමින් ගිනි නො ලත් යෙදේ. මෙ වැනි බඳක් වසා පෙරෙවි සිවුරින් බලනුවන් ඇස්හි වස නො ලත් යෙදේ. රුවට මිඩි වූ තොප නරු ගිය ඇස් ඔස්සේ පසු පස්සෙහි ගිය මෙ සිත් නිවා සනහන රසවත් බැල්මක් කෙණෙක්හි දු මෙ දෙස්හි හෙළත් යෙදේ. ගල්හි නො කෙටුව, මැටියෙන් නො හැඹුව, පිදුරින් නො බැන්ද, දඬින් නො නෙළුව, මෙ දුක් බලබලා නො දත් වන් වනු නො යෙදේ. මෙ වැනි වසත් කලෙකැ සුපිපි ලිය මඬුවෙකැ තොප වැනි කෙළි යහළු කෙනෙකුන් නො ලත් ගැහැනියක සේ පව් කොලෝ නැති. තන්හි තන්හි පියුම් මී බී හඬන මත් රජ හසුන් පිය රැවු අසවු. සල් මල්හි ගී ගුමන බමරුන් ගේ අදල ගුම් අසවු. සුපුලඹෙහි කූල්නා කෙවිල්ලන් ගේ පිය තෙපුල් අසවු. මොනර කිළින් මැදු පිල් ඇක් විදහා බැහැවුම් නැටුම් ගත් නෙ කාල මිත මොනරුන් බලවු. අග

ඇඟින් යනයනා මුව මුළින් මුව පෙල්ලන් තෝරා ලැහැබට ගෙනැ වදනා වසත් මත් මුව පොල්ලන් බලවු. සුදේ සුදු වැලි තලා බලවු. ගලැඟින් හෙන මනා ගඟුල් හැලි බලවු. මල් මුව රද බර ඇදූ හමන මඳ මඳ පවන්හි මිහිරක් බලවු. මෙ හැම තොප වැනියන් ඇඟි නො ලද්දනට තැවුලියට මූල් වූ සේ බලවු.'

(බුත් සරණ — 32.)

බුත් සරණෙහි මෙන් මැ අමාවතුරෙහි ද, ධර්ම ප්‍රදීපිකා-යෙහි චුල්ල කාලිඞ්ග කුමාර කථා ආදි කිහිප තැනෙකැ ද මේ රීතියෙන් රුසැයුණු කෙළු වැකි වෙති.

(2) කඨින රීතිය

කර්කශාක්ෂරයෙන් ද දීර්ඝ සමාසයෙන් ද යුක්ත වූ සාඩම්බර පද මාලාව කඨින රීතියට නිදර්ශන වන්නේ ය. සිංහල ගද්‍ය ග්‍රන්ථයන්හි මේ බෙහෙවින් ලැබෙන්නෙකි.

'සද්ධර්ම-මකරන්ද-සන්දෝහ-නිෂ්‍යන්ද-පද්ම වූ පද්ම නම් ස්වාමිදරුවෝ, එක් සමයෙක්හි මධුරගුම්ගුම්රව-මුඛරමධුකරනිකරනිරන්තර වූ, ප්‍රචලප්‍රවාලජාල-දන්තුර වූ, තරුණ-සහකාරාඞ්කුරාස්වාදචපල-කෝකිලකුලයා විසින් කරන ලද කුහු කුහු රව-යෙන් මනෝහර වූ, ශීතලච්ඡායායෙහි හොත්තා වූ තරුණාරුණහරිණගණයා විසින් කරන ලද රොමන්ථයෙන් මන්ථර වූ, මන්දමාරුතාන්දෝලිත-නව-ලතාවනිතාවන් ගේ පල්ලවකරාභිඝාතයෙන් සන්-තුෂ්ට වැ ගත්තා වූ තරුණ පුෂ්පාඞ්කුර නමැති රොමාඞ්කුර ඇති ඡායා ද්‍රැමයෙන් හොබනා වූ, සන්තතාරබ්ධ-සිද්ධ-විද්‍යාධර-සඞ්ගීත-ප්‍රසඞ්ග ඇති, වනමහිෂ-විෂාණාඝාතඝූර්ණිතසංරුරොධස් ඇති, මත්තමාතඞ්ගයන් ගේ ස්ථූලකපොලභිත්තින් වැහෙන්නා වූ දානධාරානිපාතයෙන් සුරභීභූත වූ

භූමිභාග ඇති, කිසි තැනෙක්හි කපුරු සුනු සේ සුදු වූ වැලිතලා ඇති, කිසි තැනෙක්හි ශිඛණ්ඩි-මණ්ඩලයා ගේ එකජ්විකායමාන වූ විසතිණි වූ ශිලාතල ඇති, කිසි තැනෙක්හි නවශාඩ්වලකම්බ-ලාවගුණ්ඨිත-වනස්ථලීසීමන්තිනීන් ඇති, කිසි තැනෙක්හි විකසිතචම්පකවනොද්භූතසෞරභ්‍ය-ප්‍රසරයෙන් සුරභිභූත වූ වනමස්තක ඇති, කිසි තැනෙක්හි උද්ගන්ධිශීතගන්ධවිටපවිගලිතපුෂ්පාඞ්-කුරයෙන් කරල වූ භූමිමණ්ඩල ඇති, කිසි තැනෙක්හි විශාලශාලතරුවරයන් ගේ නූතන ප්‍රසූනසම්පත්තියෙන් පරමරමණීය වූ, කිසි තැනෙක්හි විකසිතවකුලධූලීපටලානයන-පරි-භ්‍රාන්ත-මන්දමාරුතසන්තානයෙන් දුරු කරනු ලබන්නා වූ ශරීරක්ලාන්ති ඇති, කිසි තැනෙක්හි ගිරි-ශිඛරයෙන් වැහෙන්නා වූ නිර්ඣරඣල්ලරීන් ගේ ඣඞ්කාරයෙන් මනොහර වූ කිසි තැනෙක්හි ස්වෛරවිහාරනිරතශබරපුලින්දසුන්දරීන් ගේ මධුර-ගායනයෙන් මනොහර වූ වනයකට වැඩ, අචෙතස්ක වූ වෘක්ෂයන් විසිනුදු මන්දානිලාන්දෝලිත-නවමඤ්ජරීචාමරයෙන් ව්‍යාධූයමාන වැ, පුෂ්පා-සවාදවිදග්ධ වැ හඬන්නා වූ කොකිලාවන් විසින් මැ සඞ්ගීයමාන වැ, වන සරසුන් වසින් පද්ම නමැති මුඛයෙහි තබන ලද රාජ හංස නමැති සකින් පුඹුනා ලදින්, අන්‍යොන්‍ය ප්‍රීතියෙන් යුක්ත වූ නිත්‍යවිරොධී සත්ත්වයන් පරම මෛත්‍රියෙහි රස දන්වමින්, එක් වෘක්ෂ මූලයෙක්හි, ප්‍රශාන්ත-චෛතන්‍යාවිරොධනිරොධ-සමාපත්තියට සමවැදැ වැඩැහුන් සේක.'

(දහම් සරණ — 55)

මෙහි වාගාඩම්බරය ස්ඵුට යැ. දහම් සරණ මෙ බඳු තැන් සිය ගණනින් යුතු යැ. ධම්ප්‍රදීපිකායෙහි ද නොයෙක් තන්හි මේ රීතිය දක්නා ලැබේ.

මිශ්‍ර රීතිය

කෙවල කොමලත්වයට හෝ කෙවල කඨිනත්වයට හෝ නො හැරී දෙකින් මුසු සේ රූසැයුණේ මිශ්‍ර රීතිය නදුන්වයි. බෙහෙවින් මැ සිංහල ගද්‍ය ග්‍රන්ථයන්හි දක්නට ලැබෙනුයේ මේ රීතිය යි

'ප්‍රත්‍යන්ත ප්‍රදේශයෙකැ ගොවියෙක් විසී යැ. හේ ඒ ප්‍රදෙශයෙහි සැලැකියැ යුත්තෙකි. දූලි රවුළු කැපීමක් ඒ පෙදෙස් වැස්සෝ නො දනිති. එ හෙයින් දෙ කොපුලෙහි මඳ වැ ද නිකටෙහි වැඩි වැ ද වැඩුණු කළු රළු කෙඳි ඡෙසවරී භාවයේ ලකුණු දක්වී යැ. ඒ එ සේ වුව ද අගින් මඳක් වක් වූ නැහැය ද කුඩා තියුණු ඇස් දෙක ද ඒ මුහුණෙහි ස්වාභාවික ශොභනත්වය අධික කෙළේ යැ.

සාමාන්‍යයාට සුදුසු වනුයේ ද මේ රීතිය යි.

ප්‍රබන්ධය එක්තරා රීතියකට අනුකූල වියැ යුතු යැ. කොටසක් කෙවල කොමල රීතියෙන් ද තවත් කොටසක් කෙවල කඨින රීතියෙන් ද බැඳුණු කලැ ඒ විෂම වෙයි, කන කුපිත කෙරෙයි.

---

## 8. අලඞ්කරණය

යම් කිසිවෙකින් ඉපැදූවියැ හැකි කුහුල අධික කරනු සඳහා යෙදෙන නානා උපක්‍රම වෙයි. රූපයෙකින් ඉපැදූවියැ හැකි කුහුල වැඩීමට ඇතැම් විටැ වර්ණය දීප්තිමත් කෙරෙති, ඇතැම් විටැ පරිසරය රමණීය කෙරෙති, ඇතැම් විටැ අඞ්ගයක් පමණට වඩා මහත් කිරීම් කුඩා කිරීම් ආදියෙන් විකෘත හෝ කෙරෙත්. මනුෂ්‍ය ශරීරය ද වර්ණවත් කෙරෙති,

ගන්ධවත් කෙරෙති, වස්ත්‍රාභරණාදියෙන් සරසති, වෙස් මුහුණු ආදියෙන් විකෘත හෝ කෙරෙත්. ප්‍රබන්ධයට ද මෙ බඳු දෑ කෙරෙත් මැ යි. ඒ යැ අලඞ්කරණ නම්.

(1) ශබ්දාලඞ්කාර
(2) වස්ත්වලඞ්කාර
(3) විවරණාලඞ්කාර
(4) සංවරණාලඞ්කාර
(5) සඞ්ක්ෂෙපණාලඞ්කාර
(6) පරිමිතීතාලඞ්කාර
(7) අතිශයතාලඞ්කාර

යන විසින් වාක්‍යාලඞ්කරණය සප්තවිධ වෙයි.

## (1) ශබ්දාලඞ්කාරය

මේ වාක්‍යයේ අක්ෂර ශබ්දයන් පිළිබඳ වැ ඇති වන්නෙකි. එයට 'අනුප්‍රාස' යනු නම්. ස්වරය අසමාන වුව ද ව්‍යඤ්ජන ශබ්දයා ගේ සමාන බව වේ නම් එහි අනුප්‍රාසය වෙයි.

'තුඟු ජුලකල පහ පැහැ තර තර පව ර
සැදි දෙරළ දෙරළ බිහි දෙර දද අඹල'ඹ ර
සෙන් සිඹුරඟ වේ මඟ මඟුළින් තිතො ර
දනු සිරි පිරි ගඟසිරි පුර වර මොන ර'
(මයූර සන්දේශය)

'පහ පැහැ තර තර පමර'

මෙහි 'ප' හඬ තුනෙකි, 'හ' හඬ දෙකෙකි, 'ර' හඬ තුනෙකි, 'ත' හඬ දෙකෙකි. මේ තැන් ද කන් දී අසන්නැ:—

'සැදි දෙරළ දෙරළ බිහි දෙර දද අඹල'ඹර'
('ද්' 6 යි. 'ර්' 4 යි. 'ඹ' 2 යි.)

'රඟ වේ මඟ මඟුලින් නිතොර'
('ඟ' 3 යි. 'ම' 2 යි.)

'සිරි පිරි ගඟසිරි පුර වර මොනර'
('ස' 2 යි. 'ර' 6 යි. 'ප' 2 යි.)

'පසිඳු සිඳුරු කර සිදුරැයි දුරැ ම තමා
සොඳුරු සිතිඳු රඳුදුල යුවල දඟ තමා
උසස පෙදෙස සිහිනැ යි යනු අඩුව තමා
මොනර තාර යැ සරි නම් යම්තමක් තමා'
(මයූර සන්දේශය)

මේ ද අතිමනෝහර අනුප්‍රාස රසයෙන් යුක්ත යැ. මයූර සන්දේශයෙහි අනුප්‍රාස රසය පිරී සිටී.

(1) සමාන ස්ථානානුප්‍රාසය යැ
(2) අසමාන ස්ථානානුප්‍රාසය යැ

යි අනුප්‍රාස දෙකෙකි.

**සමාන ස්ථානානුප්‍රාසය**

පද්‍යයේ පාද සතරෙහි මැ හෝ දෙකෙකැ හෝ සමාන තැන්හි සමානාක්ෂර යෙදේ නම් ඒ සමානස්ථානානුප්‍රාස යි. එයට 'එළිසමය' යනු ද නමි. එහි ලා ව්‍යඤ්ජනය සස්වර වී නම් ස්වර සාම්‍යය ද ඇති විය යුතු. එළි සම කවිහි අන්ත්‍යානුප්‍රාසය (පාදයේ අගැ එළිය) නිත්‍ය වෙයි. ඉහතැ දැක්වූ කවි දෙකේ සතර පෙළ අග බලන්නැ. පූර්වයෙහි 'ර' යන එක අකුරින් එළිය වී යැ. අපරයෙහි 'ත' යැ 'මා' යැ යන අකුරු දෙකින් මැ එළිය වී.

'ය' 'ව' 'හ' 'න්' යන සතරින් එකෙක් අගැ එළි වැට බඳී නම් එයට පූර්ව වැ ද එළි වැටෙක් ඇති විය යුතු යැ. ඒ උපාන්ත්‍යානුප්‍රාස නමි. මේ සිංහල පද්‍යයෙහි විශේෂ ලක්ෂණයෙකි.

'සව් සිරිනි සා   ර ය
නිරිඳු ගෙ බිම්බිසා   ර ය
එ පුරෙහි උද,   ර ය
වේළුවන නම් වී විහා   ර ය' (ගුත්තිල)

මෙහි අන්ත්‍යානුප්‍රාසය 'ය' යන්නෙන් වූයෙන් 'ර' යන්නෙන් උපාන්ත්‍යානුප්‍රාසයෙක් ද වී යැ.

'නව දිවයුරු ළ   මු ව
පුල් සිය පතෙව් නව   මු ව
සන්හුන් දුන් යො   මු ව
බලා සිරිගත එ කලැ සගමු ව' (කව් සේකර)

'ව' යන්නෙන් වූ අන්ත්‍යානුප්‍රාසය 'මු' යන්නෙන් වූ උපාන්ත්‍යානුප්‍රාසයක් ද ගත.

'තො හළ විරු සිරි   ය හ
රිපඳුරට රිවි උද,   ය හ
පබල මෙර දිරි   ය හ
නැඟී රිය රියැදුරෝ සිටි ය හ' (ගුත්තිල)

අන්ත්‍යානුප්‍රාසය 'හ' යන්නෙන් වූයෙන් ('ය' යන්නෙන් වූ); උපාන්ත්‍යානුප්‍රාසයෙක් ද අවශ්‍ය වියැ.

'ලෙළුකුළැ බැඳි සිඟින් ව සන්
අසින් පෙනෙන රුවන් රසන්
රතොට වතළ රසින් දසන්
කියු තියු ගී ලියෝ පසන්' (කව් සේකර)

මෙහි අන්ත්‍යානුප්‍රාසය 'න්' යන්නෙන් වූයේ යැ. එ හෙයින් 'ස' යන්නෙන් උපාන්ත්‍යානුප්‍රාසය කට ද තැන් වී යැ.

බොහෝ කවීහු මේ තැන් හැර සෙසු තන්හි දු අනුප්‍රාස න කෙරෙති. ඒ අයිත්‍ය යි.

'වෙ න් හස් ක රන විකුමන් මන්මති න් කි රු
ම න් හස් ද රන රජ දම් මිණි නිද න් ව රු
ර න් හස් ස රන සිරි ලක් සර සිරි න් ස රු
ස න් හස් ක රන සැමිඳුන් මන් රිසින් පු රු'
(මයූර සන්දේශය)

මෙහි අගැ එළිය හැරැ සෙසුදු එළි වැට සයෙක් වෙයි. අර්ථයට හානි නො කොටැ පද විරූප නො කොටැ එළි වැට බැඳීමෙහි සමර්ථයෝ යැ මයූර සන්දේශ කාරයෝ.

අනන්‍ය නුවූ සමානස්ථානානුප්‍රාසය ඇතැම් විටැ ස්වර-යෙනුදු වේ

'ගුණ බෝ මුනි රජුට මුළු තුන් ලෝ කිරැ එ
පෙරැ ලෝ ඇදුරැ පුදනුව බැරම ලොවින එ
කල ද්‍යෝ යටගැ බඳ නිල් මිණි සත එක එ
වැදැ බෝ දුමිඳු මොක් පුර සිරි ලබ යන එ'
(පරෙවි)

මෙහි බෝ - ලෝ - ද්‍යෝ - බෝ - යන සතරෙහි 'ඕ' යන්නෙන් අනුප්‍රාසය වී යැ.

මධ්‍යානුප්‍රාසය ඇතැම් තන්හි ස්වරය පිළිබඳ දීර්ඝත්ව මාත්‍රයෙනුදු වන සේ යැ.

'බඹ ද ත් රදූ රදුන් හට විස යෙ දූ ස ද
එ පවත් අසා සෙද සෙබළුන් ය වා සොඳ
ම හ ස ත් ගුණෙන් යුතු මහ ඔසු ප ඬි ස ද
දිය සෙත් කෙළේ එක් කිරිඳකු ස ඳ මෙ ද'
(ගිරා)

යෙදූ — යවා — පඬි — සඳ — යන තන්හි ස්වරයේ දීර්ඝත්වයෙන් මැ අනුප්‍රාසය වූයේ යැ.

අනුප්‍රාස ස්ථානයට පූර්ව වූ ස්වරය දීර්ඝ වේ නම් එහි දු අනුප්‍රාසය සුදුසු වෙයි.

'රුවන් රස් දෘ රු
ලෙස රත් කැලුම් බා රු
දසනුදස පැ රු
දිව් සක්වළ ගලින් බැ රු' —(ගුත්තිල)

බලාත්කාරයෙන් මෙන් ඇදූ ලූ වචනයෙහි වන අනුප්‍රාසය වාක්‍යය කෙලෙසන්නේ යැ.

'දල සිළු කැකුළු කොක වැළු දුළු සිරුරු කළු
මද වෙළු කකු ළු බිගු නැළු කත් තල තිලෙළු
රුපු රළු ගි ම ළු පි හි කු ළු ගත කුළු එකළු
ගජ මුළු නැබුළු සු ල කු ළු මළු බල යහළු'
(පරෙවි)

මහත් උත්සාහයෙන් ඇදූ කෙලා ගත් පද සමූදායයෙකි. එ හෙයින් පැසැස්ස යුතු අනුප්‍රාසයට නිදර්ශන නො වේ.

(1) සර්වාන්ත්‍යානුප්‍රාසය
(2) අපරාර්ධාන්ත්‍යානුප්‍රාසය
(3) සමාන්ත්‍යානුප්‍රාසය
(4) සමවිෂමාන්ත්‍යානුප්‍රාසය

යැ යි අන්ත්‍යානුප්‍රාස සතරෙකි.

(1) පාද සතරෙහි මැ වනුයේ සර්වාන්ත්‍යානුප්‍රාස යි. උදාහරණ පෙරැ දැක්වුණු සේ යැ.

(2) පද්‍යයේ අපරාර්ධයෙහි (තුන් වැනි සතර වැනි පාද-වලැ) පමණක් වනුයේ අපරාර්ධාන්ත්‍යානුප්‍රාස යි.

'යස රැසිකළුර ලෙව්
කැරැ එ තර තා තා කැන්
කෙළෙ පුවතින් වි දුනා
සිසි කැලුමැස කුමු දුනා'
(කව් සිළු මිණ)

මෙහි තෘතීය චතුර්ථ පාදාන්ත 'දුනා' යන්න අනුප්‍රාසය දක්වයි.

(3) දෙ වැනි තුන් වැනි පාද අන්තයෙහි වනුයේ සමාන්තානුප්‍රාස යි.

'කාතොත් ගසේ අතුත්
බොතොත් පැනුත් ති බේ
තො කා තො බී ගොතා
ඉ දී බැ දී කා ඬේ'
(කියවන නුවණ)

දෙ වැනි සතර වැනි පාද 'බේ' යන්නෙන් අනුප්‍රාසය දක්වයි. (අක්‍ෂරයක් අනුනාසික වීමෙන් අනුප්‍රාසය නො බිළකී.)

(4) විෂම (පළමු වැනි තුන් වැනි) පාද අන්ත එක් ලෙසෙකිනුත් සම (දෙ වැනි සතර වැනි) පාද අන්ත අන් ලෙසෙකිනුත් සමාන වේ නම් ඒ සමවිෂමාන්තානුප්‍රාස යි.

'ඉතා මැ සෝබමාන දෙව් ලි යන්
ගඳින් මලින් රතින් මිණින් සදවු
පුනාව රූපයෙන් සමානයන්
තිදස් පුරේ සොයා ද විත් බල වු'
(සුර පුර සැරසිලි)

විෂම පාද 'යන්' යන්නෙනුදු සම පාද 'වු' යන්නෙනුදු අනු- ප්‍රාසය කෙරෙයි.

අසමාන ස්ථානානුප්‍රාසය

පෙරැ මැ දක්වුණු 'තුඟු සුලකළ' යනාදි පද්‍යයෙහි ද 'පසිඳු සිඳුරු කර' යනාදි පද්‍යයෙහි ද අන්තානුප්‍රාසය හළු කලැ සෙසු තන්හි වනුයේ ද සමාන ස්ථානානුප්‍රාසය යි. පද්‍යයෙහි මේ බෙයෙවින් ඇති වන්නෙකි.

අසමාන ස්ථානානුප්‍රාසය පද්‍යයට මැ ඇරුණෙක් නො වේ. ගද්‍යයෙහි දු එය යෙදුණු තැන් අවිරල යැ.

'දවන රවන බමන බමර වැල අලලමින් බට හිමවු
පවන් පහස් ලදිනුදු අස්වස් නො ලද්.'

(ගුරුළු ගෝමි)

'වන' යන්නෙනුදු 'බම' යන්නෙනුදු 'ල' යන්නෙනුදු 'ප' යන්නෙනුදු 'ස්' යන්නෙනුදු වූ අනුප්‍රාසය පැහැදිලි යැ.

'එ කල්හි පුරුදු රිවි කල්හු කල් දස්නෙන්........'

(ගුරුළු ගෝමි)

මෙහි අනුප්‍රාසය 'කල්' යන්නෙහි. මේ තැනුදු විමසන්නැ :—

'පණු පැණි කිහිඹි කුහුඹු සිනි සකසිනි හිනිකුණු
උකුණු මකුණු ආදී.........' (විද්‍යා චක්‍රවර්ති)

'මධුර ගුමු ගුමු රව මුඛර මධුකර නිකර නිරන්තර වූ
ප්‍රවල ප්‍රවාල ජාල දන්තුර වූ, තරුණ සහකාරාඞ්කුරාස්වාද චපල කොකිල කුලයා විසින් කරන ලද කුහුකුහු රවයෙන් මනොහර වූ.......'

(පරාක්‍රම පණ්ඩිත)

'තරුණාරුණ හරිණ ගණයා විසින්........'

(පරාක්‍රම පණ්ඩිත)

## (2) වස්ත්වලඞ්කාරය

ප්‍රබන්ධයේ මැ හෝ වාක්‍යයෙහි හෝ වස්තුව (අර්ථය) පිළිබඳ වැ ඇති වන අලඞ්කාරය මෙ නමින් ගැනෙ. රූපයෙන් වර්ණයෙන් ක්‍රියායෙන් ඇති සැටි මැ යමක් හඳුන්වා දෙන කලැ එහි යම් අලඞ්කාරයෙක් වේ නම් ඒ වස්තුව පිළිබඳ මැ යැ. නිකම් මැ වස්තුයෙහි නම කී පමණින් හෝ එහි අවයව ගණන් එය ඇති තැන් යනාදිය දක්වූ පමණින් හෝ

අලඞ්කාරයෙක් නො වේ. නම නො කිව ද, විස්තරය කරත් කරත් මැ අසන්නහුට, 'මේ කියන්නේ අසුවල් වස්තුව ගැන යැ' යනාදි විසින් වැටැහේ නම් එහි අලඞ්කාරය වෙයි.

'වන විල් වැද්ද බොල් සෙවෙලැනැ තවරා
ගන විල් කැල ඇරැගෙනැ අගිනුදුරා
දී ගු උල් සිඟු යොමැ කැරැ කර අඹරා'

යැ යි කී පමණින් මැ —

'පිළි මල් වන මිහිවුත් දකු නුදුරා'
(ගිරා සන්දේශය)

යන සතර වැනි පාදය නො කිව ද, 'මේ මිහිවුත් ගැන යැ කියන්නේ' යනු වැටැහේ.

'වි ල් තෙරැ වළ බිඳැ ගනැ මඩ තවරා
ලො ල් කැරැ හෙළ නෙළුඹ'ල කම්නුදු රා
බො ල් කෙළ පෙණ පිඬු දෙ කොළිත් වගුරා'

යන මෙ පමණෙකින් මැ —

'ව ල් වැද්ද එන උඟරත් බල ඉදුරා'
(ගිරා)

යන්නෙන් කියැ යුතු අර්ථය පෙනෙන්නට වෙයි.

'වැ ද සෙ ද උනුනට පසු නො බසිමිනේ
කි ද කි ද මී අඹ කැන් ගෙනැ අතිනේ
ඇ ද ඇ ද තුරු වැල ගලපන ලෙසිනේ
රොද බැ ද එන' (ගිරා)

යනු පමණි.

'රිළවුත් දකු තොසිනේ'

යනු කියන්නට පෙරැ මැ අර්ථය අවබොධ වෙයි.

'දත් කැකුළු පෑ ලා
පුරතල් සිනා සී ලා
බොළඳ බස් දී ලා
කෙළි සියලඟැ දූලි ගා ලා'

(කව් සේකර)

නම නැති වැ ද මෙය අසන්නා ගේ නම් සිතෙහි බිළිඳෙක් නො ඇඳේ ද?

'අර බලන්නැ. අතු බෙදී ගිය තියුණු අං ඇති හිස යැ. උල් වූ දිග කන් යැ. දුඹුරැ සමෙහි සුදු තිත් රැසෙකි.'

මෙ පමණෙකින් මැ මුවා මනැසට යොමු වෙයි.

'මඳ රත් වකුටු තුඩ යැ. පලා වන් පියා යැ. ගෙලෙහි තුන් පෑ ඉරෙකි.'

ගිරවා හැදිනැ ගැනීමට මේ පමණි.

මෙයට ස්වභාවොක්ති යැ යි පුරාතන ආලඞ්කාරිකයෝ කී හ. හැම කියමනෙහි මැ අලඞ්කාරයක් දකිනු රිසි වූ ඇතැම්හු වෙන අලඞ්කාරයක් නැති සියල්ල ස්වභාවොක්ති අලඞ්කාරයෙන් යුතු සේ දකිත්.

'මිනිහා ගෙදර යයි'

යනුත් ඔවුනට ස්වභාවොක්ති අලංකාරයෙන් යුත් වැකි-යෙකි. ස්වභාව කථනය අතිදක්ෂ වූ විචාරකයකු විසින් කළ යුත්තෙකි. එ නෙයින් වස්ත්වලඞ්කාරයෙන් යුක්ත වාක්‍ය සුලභ නො වේ.

## (3) විවරණාලඞ්කාරය

කියැ යුත්ත වඩා ලා මැ පැහැදිලි කරනු සඳහා කැරෙන ප්‍රයත්නය විවරණ නම්. යම් කිසිවක් හොදින් හැදින්වියැ යුතු වූ තන්හි ඒ හා සමාන වෙන කිසිවක්

ඇඳ පෑම සිරිති. ගදුබුවා නො දුටුවකු හට ඇඳින්වීමේ දී 'හේ අශ්වයා වැනි යැ' යි කියැ හැකි යැ. එයින් ගදුබුවා ගේ හැඩය සාමාන්‍ය විශයෙන් වැටැහෙනු වෙයි. සිඝලු විවරණාලඞ්කාර මෙ සේ දෙ පක්‍ෂයෙකැ සමාන භාවයක් හැඟැවීමෙන් කැරෙයි.

උපමා

සමාන කැරෙන දෙ පක්‍ෂය දෙ පක්‍ෂයක් මැ ලෙස ගැණෙන කල්හි එහි වනුයේ 'උපමා' යැ යි ආලංකාරිකයෝ කියති.

(1) ප්‍රස්තුත පක්‍ෂය (උපමෙය)
(2) අප්‍රස්තුත පක්‍ෂය (උපමාන)
(3) සමාන ධර්මය
(4) සමානත්ව වාචකය

යැ යි සතරෙකින් උපමාව සම්පූර්ණ යැ.

ගදුබුවා රූපාකාරයෙන් අශ්වයා වැනි යැ.

මෙහි ගදුබුවා ප්‍රස්තුත පක්‍ෂය යි. හැඳින්විය යුත්තේ හේ යැ. අශ්වයා අප්‍රස්තුත පක්‍ෂය යි. හේ අරමුණ නො වේ, අරමුණ හැඳින්වීමට බැහැරින් ගැනෙන්නෙකි. මේ දෙ පක්‍ෂයේ සමාන බව පැවැසෙනුයේ රූපාකාරයෙනි. එ හෙයින් රූපාකාරය සමාන ධර්ම යි. සමාන බව කියැවෙනුයේ 'වැනි' යන පදයෙනි. එ හෙයින් 'වැනි' යනු සමානත්ව වාචකය යි.

සමාන ධර්මය නො කියැවුණ ද උපමාව වන්නේ යැ.
ගදුබුවා අශ්වයකු වැනි යැ.

රූපක

සමාන කැරෙන දෙ පක්‍ෂයෙන් ප්‍රස්තුත පක්‍ෂය අප්‍රධාන සේ ගෙනැ අප්‍රස්තුත පක්‍ෂයට ප්‍රධාන භාවය පැවැරේ නම් එහි වනුයේ රූපක නම් අලංකාරය යි.

ගේ ගදුබු අසු පිටැ යෙයි.

හේ අසකු පිටැ මෙන් ගදුබුවකු පිට යේ යැ යි කියවි වූ තැනි. මෙහි ' ගදුබුවකු පිටැ යන ' බව නො සැලැකුණු සේ යැ. සැලැකුණේ අසකු පිටැ යන සැටි යි. ප්‍රස්තුතාර්ථය වූ 'ගදුබු' යනු අප්‍රස්තුතාර්ථය වූ 'අසු' යන්නට විශේෂණ වැ. අප්‍රධාන වැ සිටියේ යැ.

'එ තිරිඳු පැදුම් ර ද
මහ දන් වැසි වසින ස ද
දිලිඳුන් ල වැ බ ද
උඩගු දල ලොබ මියර ගිය බි ද
(කව් සේකර)

මෙඝය මහ වැසි වස්නා කලැ වැවේ මියර බිඳැ ගෙනැ යන්නා සේ එ රජු දන් දෙන කලැ දිලිඳුන් හේ සිත්හි ලොභය බිඳී ගියේ යැ යි කියවි වූ තැනි. රජ ප්‍රස්තුත පක්ෂය යි. එය යට කොටැ අප්‍රස්තුත වූ මෙඝ පක්ෂයට ප්‍රධානත්වය දුන් හෙයින් රූපක යි.

උපමාව රූපක කොටැ ද රූපකය උපමා කොටැ ද දක්විය හැකි.

පුරාතන ආලඞ්කාරිකයෝ සමාන කිරීම මැ නානා අතට හරවා නානා අලඞ්කාරකයන් දක්වූ හ.

**සන්දෙහාලඞ්කාරය**

අප්‍රස්තුතය දෙකොයි සැක උපන් සේ කී කලැ සන්දෙහාලඞ්කාර යි.

'ඒ නිලවණි ආභරණයෙක් ද? හේ දිව්‍ය ඍෂියෙක් ද?
ඔහු ගේ මුහුණින් අර ගලනුයේ රිදී රසැ ධාරාවෙක් ද?'

නිල් තණ ඇතිරිය නිලාභරණයෙකැ යි ද චන්ද්‍රයා දිව්‍ය ඍෂියෙකැ යි ද ඔහු ගේ සුදු රවුල රිදී රස ධාරාවෙකැ යි ද සැක ඉපැදූ වූ තැනි.

### භ්‍රාන්ති අලඞකාරය

අප්‍රස්තුතය මැ යැ යි රැවැටුණු බව හැඟැවූ තන්හි භ්‍රාන්ති නම් අලඞකාරය වේ.

'විමලිඳු නිල්මිණි — කර පතර හෙබි මුහුදු දු
එ වෙත් නො වෙත්හි තිබී— යෙසෙතාහු කිරි මුහුදු හා'

(කව් සිළු මිණ)

කුස රජු ගේ කිර්තියෙන් සියල්ල සුදු වූ කලැ නිල් මුහුද ද කිරි මුහුද මෙන් වෙයි. විෂ්ණු තෙමේ කිරි මුහුද යැ යි නිල් මුහුදට වන්නේ යැ.

### අපහ්නුති අලඞකාරය

'ප්‍රස්තුතය නො වේ යැ. අප්‍රස්තුත යැ' යි ප්‍රකාශ කළ කල්හි අපහ්නුති නම් අලඞකාරය වෙයි.

'මේ මනුෂ්‍ය ස්ත්‍රියක් නො වේ, දිව්‍යාඞගනාවකි.'

### නිශචයාලඞකාරය

'අප්‍රස්තුතය නො වේ යැ, ප්‍රස්තුතය මැ යැ' යි නිශචය කළ තන්හි නිශචයාලඞකාරය වේ.

'මේ දිව්‍යාඞගනාවක් නො වේ, මනුෂ්‍ය ස්ත්‍රියකි.'

### උත්ප්‍රේක්ෂාලඞකාරය

ප්‍රස්තුතය අප්‍රස්තුතය මෙනැ යි සම්භාවනා කරන ලෙසක්, සලකන ලෙසක්, හඟවා නම් උත්ප්‍රේක්ෂාලඞකාරයි.

'ඇ මිනි බට සුරඟනකැයි සිතම්'

මෙය උත්ප්‍රේක්ෂා නාමයට සුදුසු වූයේ 'සිතම්' යනු යෙදුණු හෙයිනි. නො වන්නක් වන්නා සේ සැලැකීම උත්ප්‍රේක්ෂා යැ. තුල්‍යාර්ථවාචි නිපාතයක් යෙදුණ ද උත්ප්‍රේක්ෂාව වෙයි.

'දෙ සත බණ සඟ වැ ළු
උගත් ගිරවුන් නිසස ළු
කියත ඉඳැ බිලැ තු ළු
තුරු දු බණ නෙව් මගද ගා පෙළු'

(කව් සේකර)

මෙහි 'එව්' යන නිපාතය වී යැ.

## දෘෂ්ටාන්තාලඞ්කාරය

ප්‍රස්තුතය නිගමන රූපයෙන් ද අප්‍රස්තුතය දෘෂ්ටාන්තාකාරයෙන් ද දක්වන තන්හි දෘෂ්ටාන්තාලඞ්කාරය වෙයි.

'පසසත ගුණ මුත් — විලසින් කිම් මහත්මන්
පියගඳ පලොල් මලැ සේ — බුහුමන් කිම කිණි හිරේ'

(කව් සිළුමිණ)

කුස රජු ගේ සැලැකියැ යුත්තේ ප්‍රශංසනීය වූ ගුණ මැ මුත් රූපය නො වෙයි යන ප්‍රස්තුතය මෙහි නිගමන රූපයෙන් දැක්විණ. අප්‍රස්තුතය දැක්වුණේ දෘෂ්ටාන්ත මගයෙනි.

## නිගමනාලඞ්කාරය

ප්‍රස්තුතය සාධක කොටැ ගෙනැ අප්‍රස්තුතය නිගමනාකාරයෙන් දක්වත් හොත් නිගමනාලඞ්කාර යි.

'තෙමෙ ද වනසට පත්— මුළු ලෝ තැවූ ගිම් කල්
පරු වෙහෙස කළ දනෝ— වැනැසෙත් මැ නු බොහෝ සේ'

(සස දා)

## නිදර්ශනාලඞ්කාරය

ප්‍රස්තුත අප්‍රස්තුත වාක්‍යාර්ථ දෙක මැ එකක් සේ, නොවෙනස් සේ, දක්වන තන්හි නිදර්ශනාලඞ්කාරය වෙයි.

'හඟිම් ද මා මෙනෙන් — ගුණ හිමියා කියන්නට
පොහොම් නෙළුඹැසින'වුණා — පලඳුන් හොත් තුසර හර'
(මුවදෙව් දා)

මා ගේ අතිදුර්ශීල වූ චිත්ත ශක්තියෙන් බුදුන් ගේ ගුණ කියන්නට හැඟීම ද නෙළුම් නූලින් පිනිබිඳු අවුණා පැලැඳීම ද එකක් මැ යැ, නො වෙනසි.

**ව්‍යතිරෙකාලඞ්කාරය**

ප්‍රස්තුතය අප්‍රස්තුතයට වඩා උසස් බව හෝ පහත් බව හෝ හඟවන තන්හි ව්‍යතිරෙකාලඞ්කාරය වේ.

'ගති නුපුලේ පැහැ ගත හිමි තළල් තෙලේ
රැඳැ නිමලේ රන් පට වොරඳනෙක තුලේ
උදු සුතිලේ ගත පැහැනවල ගත වෙලේ
කිව විදුලේ කිම දිලියෙනු ද ඇම් කලේ'
(මයූර සන්දේශය)

ප්‍රස්තුතය වූ රන් පට හැම කල්හි දිලියෙයි. එය උපමිත වූ විදුලිය හැම කල්හි නො දිලියෙයි. එ හෙයින් ඒ ප්‍රස්තුතයට වඩා පහත් යැ.

'පසිඳු සිඳුරු කර සිදුරු සි දුරු ම තමා
කොඳුරු සිතිඳු රසුදුල යුවල සඟ තමා
උසස පෙදෙස සිහිකැ යි යනු අඩුව තමා
මොනර කර යැ සිහි තම් යන්තමක් තමා'

ප්‍රස්තුතය වූ ජඞ්ඝාව නොසිදුරු යැ, අප්‍රස්තුතය වූ ඇත් සොඬ සසිදුරු යැ. ප්‍රස්තුතය වූ ජඞ්ඝායෙහි උසස පෙදෙස මහත් යැ. අප්‍රස්තුතය වූ මයූර ග්‍රීවායෙහි උසස පෙදෙස සිහින් යැ.

ප්‍රස්තුතය පහත් සේ සැලැකුණු තැනට මේ උදාහරණ යි:

‘සියල්ලන් එක සේ — නො තවයි ඔබ තේද පුවල
මඳ අඩුවෙකි එහෙත් හිරු — කිරණ මැ උවම් කරනෙම්’

අප්‍රස්තුතය වූ සූර්‍ය්‍ය කිරණය සියල්ලන් එක සේ තවයි. මෙහි පැනුණු රජු ගේ තේජස සියල්ලන්. එක සේ නො තවයි. (සතුරන් තවන නමුත් මිතුරන් නො තවන හෙයිනි.) එ හෙයින් ප්‍රස්තුතය අප්‍රස්තුතයට වඩා පහත් සේ සැලැකිණ.

තව ද බොහෝ විවරණාලඞ්කාර ආලංකාරිකයෝ දක්වති. ඔවුහු ඒ හැම වෙන වෙන අලංකාර වශයෙන් ගනිත්, සියල්ල මැ අර්‍ථ විවරණය සඳහා යෙදෙන හෙයින් අපි විවරණාලඞ්කාර යැ යි එක් ගොඩෙකැ ලමු.

## (4) සංවරණාලඞ්කාරය.

සංවරණය නම් සැඟැවීම යි. කියැ යුත්ත කෙළින් මැ නො කියා එය ලිහා බලා විමසා ගත යුතු සේ කී කලැ එ තන්හි සංවරණ නම් වූ අලංකාරය වේ. එ ද විවිධ යැ.

### ධ්වනිය

යම් වාක්‍යයෙකැ වචනයෙන් කියූ අර්‍ථයට වඩා අතිශයින් චමත්කාර ජනක වූ අර්‍ථයක් වටහා ගත යුතු වැ සිටී;; නම් එහි වනුයේ ධ්වනි යි.

‘නො බා යනු මැනැවි — මෙ මඟැ උන් අර සැඩ ගොනු
දූන් මොනොතකට පළමු—කොටියෙක් නොසැඩ කැරැලී’

වන මඟෙකැ තවත් එකකු රහසින් හමු වන්නට සිටිනැ උන්නෙක් ඒ මඟැ යන අනෙකකු දුකැ මෙ සේ කී යැ. මැගියා හැරී දිවෙන්නට වන. කවර හෙයින් ද? පෙර මෙ මඟැ වූයේ සැඩ නොනෙකි. ඔහු කොටියෙක් දූන් මැරී

නම් කොවියා මෙහි වියැ යුතු යැ. මා තවත් ඔබට ගියහොත් කොවියාට ගොදුරු වනු එකාන්ත යැ. එ හෙයින් ආ පසු යනු නුවණට හුරු වෙයි. ගීයෙහි වචන කෙබඳු වුව ද වටහා ගත යුතු මෙ තෙක් අරුත් ඇති බැවින් මැගියා බාගියේ යැ. මේ යැ ධ්වනි නම්.

### පර්‍යායෝක්ති අලඞ්කාරය

කියැ යුතු අර්ථය එයට පර්‍යාය වූ (සමාන වූ) වෙන අර්ථයෙකින් හඟවා නම් එහි වනුයේ පර්‍යායෝක්ති නම් අලඞ්කාරය යි.

'සසිතිඳු පැහැ තද — කොමළු පොද'වල වලා මුළු
පොහොසත මෙහින් මත්තෝ — මලවන ලෙළු ලිය කලබ'
(මූවදෙව් දා)

මෘදු වූ පොද සහිත වූ වලා කුළු වැල් පඳුරක් වියැළීමට සමර් යැ යි කියැවිණ. මෘදු ගුණ යුක්ත වූ මඛාදෙව රජයා රට වැසියන් දුකට හෙළා තපසට යන්නට සමර් වන්නේ යැ යන්න මේ පර්‍යායයෙන් කී සැටි යි.

ප්‍රස්තුතය සඟවා කී හෙයින් මේ සංවරණයෙකි. පර්‍යායයෙන් කී හෙයින් පර්‍යායෝක්ති නම්.

### අප්‍රස්තුත ප්‍රශංසාලඞ්කාරය

අප්‍රස්තුත පක්ෂය වනා ප්‍රස්තුත පක්ෂය හඟවන තන්හි වනුයේ අප්‍රස්තුත ප්‍රශංසා නම් අලඞ්කාරය යි.

'සුනිල් වලා නව සඳ තිලුපුල් පබ ළු
විමල් සක් ගිජිඳු කුඹු සිරිවැස බැබැළු
විපුල් පුලින රඹ සිකි ගෙල මුතු ලදළු
ලකල් රත ලියන් සරනා බල යහ ළු'
(සැළලිහිණි සන්දේශය)

මෙහි ප්‍රස්තුත පක්ෂය නම් ස්ත්‍රීන් ගේ කෙස් තලල් ඇස් තොල් ගෙල ආදි අවයව යි. එහෙත් වැනුණේ ඒ හා සමානත්වයෙන් ගැනෙන අප්‍රස්තුත පක්ෂය වූ නිල් වලා නව සඳ තිලුපුල් පබළු සක් යනාදිය යි. ප්‍රස්තුත පක්ෂය සැඟැවුනු හෙයින් මෙ ද සංවරණාලඞ්කාරයෙකි.

### ව්‍යාජ ස්තුති අලඞ්කාරය

නින්දා ස්වරූප වූ වාක්‍යයෙන් ස්තුතියක් කළ බව වටහා ගත යුතු වේ නම් එහි ව්‍යාජ ස්තුති අලඞ්කාරය වෙයි

'මහගු ගුණෙන් මුළු — ලො මුදුන් වැ දෙ නිරිඳු සඳ
දිහියැ නො හිණි ලොල් බව් — අනා ගුණෙහි කෙනෙක්හි දු'

(මුව දෙව් දා)

ඒ රජ උසස් ගුණයෙන් ලොකයෙහි අග්‍ර යැ. එහෙත් අන්‍යයා ගේ ගුණයට කළ ආශාව ක්ෂණයෙක්හි ද හැරියැ නො හැක්කේ විය. තමන් එ පමණ පොහොසත් වැ සිටැ අනුන් ගේ දෙයට ලොබ කළ සේ කීමෙන් මතු පිටැ නින්දා-වෙක් පෙනෙයි. එහෙත් ඒ ලොභය ගුණයට කළ සේ කී හෙයින් අනුන් ගේ ගුණ හැඳිනැ එයට සම්භාවනා කරන බව හැඟැවෙනුයෙන් ඉතා උසස් ස්තුතියක් කළ සේ වටහා ගත යුතු වෙයි. ස්තුතිය නින්දා ස්වරූපයෙහි ලා සැඟැවුනු හෙයින් ව්‍යාජ ස්තුති නම් වූ සංවරණාලඞ්කාරයට නිදසුනි.

### ව්‍යාජ නින්දා අලඞ්කාරය

ස්තුති ස්වරූප වූ වාක්‍යයෙන් නින්දාවක් කළ සැටියෙක් වටහා ගත යුතු වේ නම් එහි ව්‍යාජ නින්දා නම් අලඞ්කාරය වන්නේ යැ.

'කැති නැකැතින් රෙහෙණට පත් පිරි සඳු ට
ඇ ති වෙයැ පුන් මන දෙළු වූ මෙන් ඔබ ට
ඉ ති දූ රැසින් හෙ යෙදෙයි ලෝ වැඩෙහි සෙට
ප ති සම තන් ඔබ හා ගත් ගෙය ලොවට'

පළමු කිරිය මළ හෙයින් දෙ වන කිරියක ගෙනැ ගෙදරට මැ වී සිටියකුට යැවුණෙකි.

කැති නැකැතේ සිටැ රෙහෙණ නැකතට පැමිණි පුණි චන්ද්‍රයාට ද ඔබට වූ මෙන් පිරුණු මන දෙළු ඇති වෙයි. ඒ චන්ද්‍රයා තමා ගේ රශ්මියෙන් ලොවට වැඩ කිරීමෙහි යෙදේ. එ හෙයින් ගෙය ලෝකය කොටැ ගත්තා වූ ඔබ හා සමාන භාවයට පැමිණියේ යැ.

'චන්ද්‍රයා ඔබ හා සමාන භාවයට පැමිණියේ යැ' යි කීමෙන් උඩු පිටැ ස්තුතියෙක් පෙනේ. 'චන්ද්‍රයා ලොවට වැඩ කෙරෙයි. ඔබ ගෙදර ලොව කොටැ ගෙනැ ඒ ලොවට මැ හෙවත් ඔබ ගේ ගෙදරට පමණක් වැඩ කෙරෙති.' මෙ සේ ලිහා බැලූ කලැ වැටැහෙනුයේ මහත් නින්දාවක් කළ සේ යැ.

නියම අර්ථය සැඟැවූ හෙයින් සංවරණයෙකි. එ ද ස්තුති ස්වරූපයෙන් කළ නින්දාවක් වන හෙයින් ව්‍යාජ නින්දාවෙකි.

## විරෝධාලඞ්කාරය

යම් තැනෙකැ බැලූ පමණින් විරුද්ධ භාවයෙක් පෙනේ ද විමැසූ කලැ අවිරුද්ධත්වය වැටැහේ ද එහි වනුයේ විරෝධ නම් අලඞ්කාරය යි.

'නො වත් තුනු මැද මා — යුග දඟ නො වත් යතුරින්
පියොදනුයෙ දුක් කුම් සේ — මන නෙත් කැලි දිගැසියන්,
(කව් සිළු මිණ)

ප්‍රභාවතිය තමා හැර ගිය කල්හි දූතව පැමිණි කුස රජු කී සේ යි.

'මා ඇය ගේ ඉඟ නො වන කල්හි, දඟ යුග නො වන කල්හි, ඒ දිගැසිය ගමනින් මට දුක් දෙනුයේ කෙසේ ද?'

ප්‍රභාවතිය යන කල්හි ඇය ගේ උඩු කයේ බර නිසා ඉඟට දුක් ඇති විය හැකි යි, දෙ වතොර බර නිසා දඟට (ජඞ්ඝාවට) දුක් ඇති විය හැකි යි. එ දෙකින් එකකුත් නො වන්නා වූ කුස රජුට කෙසේ දුක් ඇති විය හැකි ද?

මෙහි උඩු පිට විරොධය පැහැදිලි යි. ප්‍රියාව වල්ලභයා හැර යන කල්හි ඔහු ගේ සිතට දුක් උපදනා බව සැලකූ කල්හි විරොධය නැති වී යෙයි.

## (5) සංක්ෂෙපණාලඞ්කාරය

අර්ථය සම්පූර්ණ වශයෙන් ප්‍රකාශ නො කොට, හකුළුවා — සඞ්ක්ෂිප්ත කොට — කෙටි කොට — කියැවුණ හොත් එ තන්හි වනුයේ සඞ්ක්ෂේපණ නම් අලඞ්කාරය යි. එ ද විවිධ වේ.

### උපචාර සඞ්ක්ෂෙපණය

දෙකෙකින් එකක් අනෙක සේ සැලැකීම උපචාර නම්. එ සේ සැලැකීමෙන් යෙදෙනුයේ උපචාර නම් වූ සඞ්ක්ෂෙපණාලඞ්කාරය යි. ඒ තෙලෙස් වැදෑරුම්.

(1) සමීපය සඳහා සමීප වස්තුව ගත් තන්හි සාමීප්‍යොපචාරය වෙයි.

'මම වෙලේ ගෙදරට යමි.'

'වෙල සමීපයේ' යැ යි නො කියා 'වෙලේ' යැ යි කීමෙන් සඞ්ක්ෂෙපණය වී. වෙලේ (කුඹුරේ) ගෙදරෙක් නො වේ.

(2) එක් දෙසක් සඳහා මුළුල්ල කියැවුණු තන්හි එකදෙශොපචාරය වෙයි.

'හේ කැපුණු පයින් ගැසී යැ.'

කැපුණේ පයේ එක් තැනෙකි. එහෙත් මුළු පය මැ කියැවිණ.

(3) යමෙක් යමක් සහිත වී නම් ඒ සහිත වූයෙකි නමින් ඔහු හැඟැවුව ඒ සාහිත්‍යොපචාර නම්.

'කුඹුරෙහි උඳුලු දඟයක් යොදම්.'

යෙදෙන්නෝ උඳුලු ගක්නෝ යැ. උඳුලු මැ සාධීයෙහි නො යෙදේ.

(4) තැනෙහි වූවනු සඳහා සෑන කියැවිණි නම් ඒ ස්ථානොපචාර යි.

'ඇඳ ගොරවයි.'

මෙහි 'ඇඳ' යනුයෙන් ගැනුණේ ඇඳෙහි නිදන්නේ යැ.

(5) ප්‍රධාන වස්තු නාමයෙන් අප්‍රධාන වූ දෑ ද ගැනෙන සේ පැවැසුණු තන්හි ප්‍රාධාන්‍යොපචාරය වේ.

'රන් කග'

'මිණි වොටුණු'

රනින් මැ කැරුණු කගෙක් නැති. මිණියෙන් මැ කැරුණු වොටුන්නෙක් නැති. 'රන්' ප්‍රධාන වූ හෙයින් 'මිණි' ප්‍රධාන වූ හෙයින් එ සේ කියැවිණි.

(6) එක් අර්ථයක් හඟවන්නට පර්‍ය්‍යාය වූ අර්ථයක් ගැනුණ හොත් ඒ පර්‍ය්‍යායොපචාර යි.

'හේ සිවල් අඟක් සොයයි.'

'ලොවෙහි නැති දූයක්' යන්නට 'සිවල් අඟක්' යනු පර්‍ය්‍යාය යි.

(7) ඔවුනොවුන් හා විරුද්ධ වූ දෙ පක්ෂයෙකින් එක් පක්ෂයක් අනෙක් පක්ෂය හඟවන්නට ගැනුණ හොත් එහි විරුද්ධොපචාරය වෙයි.

'මේ කොටියා ගැල නො අදී.'

'කොටියා' යැ යි කියැවුණේ ගොනා සඳහා යැ. ගොනා හඟවන්නට උහු ගේ සතුරු ගේ නම ගැනිණ.

(8) වස්තුව මැ වස්තුවේ ගුණයෙන් පැවැසුණ හොත් ගුණොපචාරය වෙයි.

'මෙහි සුදක් අතුරනු'

සුදක් නම් සුදු වතෙකි.

(9) ඵලය හේතුයෙන් හැඟැවුණු තන්හි හේතූපචාරය වෙයි.

'ඒ රට දෙල්.'
'මේ බල මාළු.'

එකකු ගේ ඇඟෙහි කුෂ්ඨයක් දැකැ මෙ සේ කියුව එයින් හැඟැවෙනුයේ කුෂ්ඨයට රට දෙල් හෝ බල මාළු හෝ හේතු වූ බව යි.

(10) හෙතුව ඵලයෙන් හැඟැවුණු තන්හි ඵලොපචාරය වෙයි.

'හේ ගිනි වළඳයි.'

උෂ්ණය ඇති කරන දෑයක් වළඳ යැ කියූ සේ යැ. වළඳන දෑය හෙතුව යි. උෂ්ණය (ගින්න) ඵලය යි.

(11) යම් කිසි අර්ථයක් සඳහා වූ දෑයක් ඒ අර්ථයේ නාම-යෙන් දැක්වුණ හොත් තදර්ථොපචාර නම් වෙයි.

'ඕ දතක් පිසින්නී යැ.'

දත් දෙන පිණිස යම් කිසිවක් පිසිත්නී යැ යූ සේ යැ. පිසිනු ලබන්නේ දත නො වේ.

(12) එකකු සඳහා සමාන වූවකු ගේ නම කියැවුණ හොත් සදෘශොපචාරය වෙයි.

'අලියෙක් එයි '

අලියකු මෙන් මහත් වූ මිනිසෙක් ඒ යැ යි කියූ තැනි.

(13) ස්වාමියා ගේ නාමයෙන් ඔහු හා සම්බන්ධ වූවෙක් හැඟේ නම් ඒ සම්බන්ධොපචාර යි.

'මේ රජ යැ.'

මෙහි රාජ පුරුෂයා රජ නමින් හැඳින්විණ. රජු හා සම්බන්ධ හෙයිනි.

ශ්ලෂාලඞ්කාරය

පද වශයෙන් එක මැ වුව ද අර්ථ වශයෙන් දෙ පක්ෂයක් හඟවා නම් එ තන්හි වනුයේ ශ්ලෙෂ නම් අලඞ්කාරය යි.

'වෙසෙසින් පහන් පැහැ සර ගැඹුරු පිවිතුරු
බැලුව ත් ඇලුම් කරවන යළිඳු බියකරු
සිරි පින් රුවන් පිරි එ සුරිඳු සයුරු යුරු
මූවෙකි න් කියා නිමැවියැ හැකි ද රුසිරු'
(සැල ළිහිණි අස්න)

මෙහි 'වෙසෙසින් පහන්, පැහැ සර, ගැඹු රු, පිවිතුරු, බැලූවත් ඇලුම් කරවන, යළිඳු බියකරු, සිරි පින් රුවන් පිරි යන මේ විශෙෂණ සියල්ල සුරිඳු යැ සයුරු ඇ යන දෙ පක්ෂයට මැ සාධාරණ යැ. දෙ පක්ෂයේ විශෙෂණ වෙන වෙන මැ කියුව හොත් මේ වාක්‍ය ප්‍රදෙශය මෙ මෙන් දෙ ගුණයක් දික් වේ. එ සේ නො කොට සඞ්ක්ෂෙප කළ හෙයින් මේ සඞ්ක්ෂෙපණාලඞ්කාරයෙකි.

මෙහි 'වෙසෙසින්' 'පහන්' 'පැහැසර' 'ගැඹුරු' 'පිවිතුරු' 'බැලුවිත් ඇලුම් කරවන' 'යළිඳු බියකරු' යන මේ විශෙෂණ පද රූප වශයෙනුදු අර්ථ වශයෙනුදු 'සුරිඳු' 'සයුරු' යන දෙපක්ෂයට මැ සමාන යැ. එ හෙයින් මෙය අභින්නාර්ථ ශ්ලෙෂ යැ යි කියති. 'අභින්න' යනු නො වෙනස් යන අර්ථ ඇත්තේ යැ.

'තර තුර තම වෙත පත සත සතපමි න
වෙර සර තස නිවනුව සොඳ සිලිල් දෙන
තර සර බව යුතු සුදතන් ගුණ'යව න
පර තර කයැ පොල් උයනේ ඉඳැ වඩන'
(තිසර සන්දේශය)

මෙහි 'සුදත' 'පොල් උයන' යන දෙ පක්ෂයට සමාන විත සේ අභින්න වූ අර්ථ ඇති විශෙෂණයන් යෙදූ අයුරු ඉතා රමණීය යැ.

ඇතැම් තන්හි ශ්ලෙෂය භින්නාර්ථ ඇත්තේ යැ.

'ළද ලිය දෙන්නට — ගත කල් හට පටන් ගත්
තම් අකුරින් දෙ තුන් පත් — සිඛිනෙක් වන් වදන් දෙත්"
(කව් සිළු මිණ)

'සිඛින් (මොනරුන්) නිරන්තරයෙන් නාද කරන කල්හි තරුණ ලතාවෝ තමන් ගේ අඞ්කුරයෙන් පත් (කොළ) දෙකක් තුනක් මෙස කාලයා හට දෙන්නට පටන් ගත්තෝ යැ' යනු එක් පක්ෂයෙකැ අර්ථ යි.

'සඛින් (යෙහෙළියන්) නිරන්තරයෙන් බස් දෙන කල්හි තරුණ කාන්තාවෝ තමන් ගේ අක්ෂරයෙන් පත්‍ර (ලියුම්) දෙකක් තුනක් සත (භාග්‍ය සම්පන්න වූ) ප්‍රියයා හට දෙන්නට පටන් ගත්තෝ යැ' යනු අනෙක් පක්ෂයේ අර්ථ යි.

මෙ සේ උභය පක්ෂයට භින්න වූ වෙනස් වූ අර්ථ දෙන හෙයින් මේ භින්නාර්ථ ශ්ලෙෂ යි.

සමහර තන්හි ශ්ලේෂය භින්න වූ ද අභින්න වූ ද අර්ථයෙන් මිශ්‍ර යැ. පෙරැ දක්වුණු 'වෙසෙසින් පහන් පැහැසර' යනාදි පද්‍යය නිදර්ශන යි. ප්‍රථම ද්විතීය පාදවලැ අභින්නාර්ථ පද යෙදිණ. 'සිරි පින් රුවන් පිරි' යන තන්හි සුරෙන්ද්‍ර පක්ෂයෙහි 'සිරි' නම් ශෝභාව යි; සාගර පක්ෂයෙහි 'සිරි' නම් ලක්ෂ්මී යැ.

ඇතැම් තන්හි ශ්ලේෂයෙහි අර්ථ පමණක් නො වැ පද ද භින්න වෙයි. එ හෙයින් අභින්න පද ශ්ලේෂ යැ භින්න පද ශ්ලේෂ යැ යි යළි දු ශ්ලේෂය ද්විවිධ කොටැ දක්වියැ යුතු යැ. මේ තාක් දක්වුණු ශ්ලේෂ අභින්න පද යැ. භින්න පද ශ්ලේෂය ඇති තැනකට නිදර්ශන මෙ සේ යැ:—

'වැරැලි දුහුල් පලස් — මිඟිඟු සමත මියුරු ගී
මිණිලකළු අබරණ යුත් — බළු රැසිනුයන් පානා'

(කව් සිළු මිණ)

මේ වැටුම් මඬුව උයන වැන්නැ යි කී තැනි.

වැටුම් මඬුව —

වැරැලි (එල්ලන ලද වස්ත්‍ර) ද දුකූල ද පලස් ද මෘදඞ්ග ද සමර්ථයන් ගේ මධුර ගීත ද මාණික්‍යාලඞ්කෘත ආභරණ ඇති භට රැශින් ද ඇත්තේ යැ.

උයන —

වැරැලි, දුහුල්, කැල, මී යන ගස් ද කොකිලයන් ගේත් මයුරයන් ගේත් ගීත ද මිණිල, කළු, අබ, රණ (හුණ,) බළු, යන ගස් ද ඇත්තේ යැ.

එක් පක්ෂයකට 'මිණි' 'ලකළු' යි ගෙනැ අනෙක් පක්ෂයට 'මිණිල' 'කළු' යැ යි ද, එක් පක්ෂයකට 'අබරණ' යි ගෙනැ අනෙක් පක්ෂයට 'අබ' 'රණ' යැ යි ද පද වෙන් කරන ලද හෙයින් මේ භින්න පද ශ්ලේෂ යි.

## ඌනාලඞ්කාරය

ප්‍රසතුත අප්‍රසතුත යන පක්‍ෂ දෙකින් එකෙක් නො කියැවිණි නම් එහි 'ඌන' නම් වූ අලඞ්කාරය වෙයි.

අප්‍රස්තුත පක්‍ෂය නො වෙසෙසුණු තැනට නිදසුන් මෙසේ යැ :—

'සොඳුරු සිය නදන් අනුතුරු දෙසැ සිටින
කිනුරු නිසසරන් කද හස වෙතැ නො වන
ඉසුරු දනද සිය නිකෙලෙස් තැනැ රඳන
උතුරු දිගිඳු පුර දිනි මෙ පුර වැජැඹෙන'

(සැල ළිහිණි අස්න)

මෙහි දක්වුණේ ප්‍රස්තුත පක්‍ෂය වූ මෙ පුරට විශෙෂණ වන පද මාලාව පමණෙකි. 'නව නදන්, උතුරු දෙසැ සිටිනා කිනුරු නිසසරන් හැම කලැ නිවෙස් වන, ඉසුරු දනද එක වන, සකෙලෙස් තැනැ රඳන' යන මේ යැ අප්‍රස්තුත පක්‍ෂය වූ උතුරු දිගිඳු පුරට විශෙෂණ. මේ එකකු දු නො පැවැසුණු හෙයින් ඌනත්වය වෙයි. එයින් මැ වාක්‍යය සඞ්ක්‍ෂිප්ත වූයෙන් මෙ ද සඞ්ක්‍ෂෙපණාලඞ්කාරයෙකි.

ප්‍රස්තුත පක්‍ෂය නො වෙසෙසුණු තැනට මේ නිදසුනි :—

'දිනිඳු න'බියසෙහි කිසි නො ලබන'වස රේ
පුරුදු සපත් කම් දක්වන අඳුරැ ව රේ
පසිඳු නො තිර බව පල කැළැලැති පන රේ
නරිඳු ඔබට සම වෙද හිමි නවර'යු රේ'

අප්‍රස්තුත පක්‍ෂයේ මැ විස්තරය මෙහි පැවැසිණ. දිනිඳුන් (දිනෙන්ද්‍රයා — සූර්‍යා — හෝ ජන නායකයන්) අබිමුවෙහි කිසි අවසරයක් නො ලබන, රෑ කාලයෙහි පුරුදු සපත් කම් දක්වන, (අඩු වැඩි වන හෙයින්) අස්ථිර භාවය ප්‍රසිද්ධ වූ, පෙනෙන්නා වූ මහත් වූ කැළැල ඇති චන්ද්‍රයා, දිනිඳුන් ඉදිරියෙහි හැම අවසර මැ ලබන්නා වූ, එළියෙහි මැ

අලුත් අලුත් සපන් නම් දක්වන්නා වූ, ස්ථිර භාවය ප්‍රසිද්ධ වූ, කිසි කැළැලක් නැත්තා වූ ඔබ හා කෙසේ සමාන වේ ද? ප්‍රස්තුත පක්ෂයේ වර්ණනය නො පැවැසුණු හෙයින් මෙ ද සංක්ෂෙපණාලංකාරයෙකි.

## දීපකාලංකාරය

එක් පදයෙක්, එලි පතැ තුබූ ප්‍රදීපයක් දෙ පස මැ දීපනය කරන්නා සේ, පක්ෂ දෙකක් හෝ වැඩියක් හෝ දීපනය කෙරේ ද එ තන්හි දීපක නම් අලංකාරය වෙයි.

'තමා වරද'ස නො — මෙරමා දෙස් මැ දිස්නේ'
(කව් සිළු මිණ)

'තමා වරදස නො දිස්නේ
මෙරමා දෙස් මැ දිස්නේ'

යැ යි කියැ යුතු තන්හි 'දිස්නේ' යනු එක් වරක් මැ යොද සංක්ෂිප්ත කළ හෙයින් සංක්ෂෙපණාලංකාර විශෙෂයෙකි. මේ ක්‍රියා දීපක යි

'තොප සිත් පිනවා බවා සෙවා
හඬවා ලත්නට වත් වදන් කිණු
මුව දූත් තොප නත් නො ලත් හෙයින්
හො හරිම් මැ යි ගතු වත් තදින් පියා'
(සොහොවුරු විහොව)

'තොප සිත් පිනවා සෙවා ලත්නට වත් වදන් ද, තොප සිත් බවා හඬවා ලත්නට වත් වදන් ද' යි පූරණය වෙයි. මෙහි 'වදන්' යන විශෙෂ්‍යය දෙ වරක් නො යොද එක් වරක් යෙදූ හෙයින් විශෙෂ්‍ය දීපක යි.

එ කව කළහු ද එහි — නුදුටු මනත් අගය දුටු
තියුණු නුවණ නුවන වන — ඔබ ඇති කලැ රට නො සිස්'

මෙහි 'තියුණු' යන විශෙෂණය 'නුවණ' 'නුවන' (ඇස) යන විශෙෂ්‍ය ද්‍රව්‍යය මැ දීපනය කරන හෙයින් මේ විශෙෂණ දීපක යි.

'ලොව පෙරළෙයි ලෙව් පෙරළෙයි
කිවියා අසිරි වැ බැබැ ලෙයි
තෙමේ නො පෙරළෙයි නියැලෙයි
අන් හැම පෙරළෙයි හෙනැ ලෙයි'
(ගණිසුරු විදු ලිය පන්දම)

'කිවියා බැබැලෙයි, නො පෙරළෙයි, නියැලෙයි, පෙරළෙයි' යන තන්හි ක්‍රියා කිපයකට මැ 'කිවියා' යන කාරකය වී යැ. එ හෙයින් මේ කාරක දීපක යි.

**සහොක්ති අලඞ්කාරය**

වෙන් කොටැ කියැ යුතු අර්ථ දෙකක් 'සහ' යන නිපාතය හෝ එයට සමාන අනෙකක් හෝ යෙදීමෙන් එක් කොටැ කියා විසිතුරු අරුතක් පළ කරන තන්හි 'සහොක්ති' නම් සඞ්ක්‍ෂෙපණාලඞ්කාරය වේ.

'සහ දදනිඳු සනො    ස
දිනැ දිනැ වැඩිණි මැද දෙ    ස
සමඟ මැ ඔහු යස    ස
ඇඟ ද සුදුමැලි වී යැ මියුලැ    ස'
(කාව් සේකර)

දරුවකු පතමින් සිටි බමුණා ගේ බිරිය ගප් ලකුණු දක්වූ සැටි යැ මේ වැනුණේ.

බැමිණිය ගේ මැද දෙස දිනෙන් දිනැ මහත් වී යැ. එසින් බමුණු ගේ සනොතාෂය වැඩි වී යැ. මෙ සේ වෙන් කොටැ කියැ යුත්ත 'සහ' යන්නෙන් බැඳැ කෙටි කළ හෙයින් සහොක්ති නම් සඞ්ක්‍ෂෙපණාලඞ්කාර යි. අපරඞ්ගයෙහි ද මේ අලඞ්කාරය වන සැටි සලකන්නැ.

'පුතා පියා සමඟ ගමට ගියේ ය'

මෙහි 'සමඟ' යනු යෙදුණ ද අලඞ්කාරයෙක් නො වේ. වෙන් වූ අර්ථ ද්වයයක් පිළිබඳ රමණීය සඞ්ක්ෂෙපණයක් නැති හෙයිනි.

### විනොක්ති අලඞ්කාරය

වෙන් වූ අර්ථ දෙකක් 'විනා' යන්නෙන් හෝ එයට සමාන වූවෙකින් සැබැඳීමෙන් වනුයේ විනොකති නම් සඞ්ක්ෂෙපණාලඞ්කාරය යි.

'කැලැලැතියෙන් විනා
සම වෙයි වතට තුරු නා'

'කැලැල් ඇත්තේ හො වි නම් තුරුනා (සඳ) වතට (මුහුණට) සම වෙයි' යන මෙය විනා යොගයෙන් සඞ්ක්ෂිප්ත කොට විසිතුරු අරුතක් පැවැසූ සේ ය.

'නැත සරා සිසි මෙරජ — පුබුදී කවර කුමුදු විල්'

(මුවදෙව් දා)

මෙහි 'නැත' යනු විනාර්ථය දෙයි.

'තිලුපුල් වෙතෙහි බැස
පැලැඹෙන පැය එක ලෙස
එහි විල් ළිහිණි රැස
වෙනස නො දුතේ හඬත් නෙත් මිස'

(කව් සේකර)

මෙහි 'මිස' යනු 'විනා' තන්හි සිටියේ ය.

### සමාසොක්ති අලංකාරය

කාර්ය පිළිබඳ වූ හෝ ගුණය පිළිබඳ වූ යම් කිසි සමානත්වයක් නිසා ප්‍රස්තුත පක්ෂයෙන් අන්‍ය වූ පක්ෂයකුත් වටහවන තන්හි වනුයේ සමාසොක්ති නම් අලඞ්කාරය යි.

'නො ලදිනෙ 'කල් සොම් — පහස් පියොවුරු මඬලේ
මහ ගල් කල් නො පලන් — සිකි තැන් තිලිපුල් කලඹ'
(මූවදෙව් දා)

'මහ ගල් සිකි තැන් තිලිපුල් කලඹ නො පලන්' යන මෙහි සිකි තැන් තිලිපුල් කලඹ පැලැඳීම නම් වූ කාර්‍ය මහ ගලට මෙන් නව ද පක්‍ෂයකට සමාන යැ. පුරුෂයා ද තිලුපුල් පලඳී. මේ සමාන බව නිසා මහ ගල් නමැති පුරුෂ තෙමේ මයුර සමූහ නමැති තිලුපුල් කලඹ නො පැලැඳියේ යැ යි අර්ථයේ දෙ පක්‍ෂය සම්පූර්ණ කළ හැකි යැ.

'නුවන'යා මුහුණ — පොබයා ඇඟ ලෙළ දෙවා
විල් කල් හඟවා අඳර — දිවයුරු තර පහස ලැබූ'

(උපුල් නමැති) නුවන් අයා (පියුම් නමැති) මුහුණ පොබයා (දිය නමැති) ඇඟ ලෙළ දෙවා විල් (නමැති) කල් දිවයුරු (නමැති මල්ලහයා) ගේ තර (රුස දේ නොහොත් අත) පහස ලැබූ අඳර හඟවයි. 'විල් කල්' යැ යි ප්‍රස්තුත අප්‍රස්තුත උභය පක්‍ෂය එක් තැනෙකැ කියැවුණු හෙයින් ඉතිරිය ද උභය පක්‍ෂයට සුදුසු සේ පුරවා ගත යුතු වෙයි.

**යථාසංඛ්‍යාලංකාරය**

පළමු දැක්වූ අර්ථයනට පසු වැ දැක්වූ අර්ථයන් ක්‍රමයෙන් සම්බන්ධ වේ නම් ඒ යථාසංඛ්‍ය නම් අලංකාරය යි.

'සොබමන් වුවන් නෙත් පියොවුරු බැම සසල
අඟනන් දිය කෙළිනු දුටු මෙහි ගෙ දිගු විල
ගත රත් පියුම් තිලුපුල් තිසර බිඟු කැල
දත තැන් දතිති තොරතුරු ඇසුමෙන් තෙපුල'
(පරෙවි)

මෙහි වුවන්, නෙත්, පියොවුරු, බැම යන සතරට පියුම්, තිලුපුල්, තිසර, බිඟු කැල සතර ක්‍රමයෙන් සමාන වේ. එක් එක් යුගලය වෙන් කොටැ කියන ලද නම් වාක්‍යය දිගු වන්නේ යැ. මේ ක්‍රමයෙන් ඒ සංක්‍ෂිප්ත වී යැ-

'බැලූ මෙන් සිහි කිරීමෙන් පහසින් නිති න
ස සුතන් රකින මින්-කුමු-සියොතුන් ලෙසින'
(සුභාෂිතය)

මෙහි ද යථාසඞ්ඛ්‍යාලඞ්කාරය පෙනෙයි.

## (6) පරිවර්තනාලඞ්කාරය

පරිවර්තනය නම් පෙරළීම යි. ස්වාභාවික ආකාරය යම් කිසි ලෙසෙකින් පෙරළීමෙන් විසිතුරු බවෙක් ඇති වේ ද එ කලැ පරිවර්තන නම් අලඞ්කාරය වන්නේ යැ.

වාක්‍ය පරිවර්තන යැ අර්ථ පරිවර්තන යැ යි දෙකෙකි.

### වාක්‍ය පරිවර්තනාලඞ්කාරය

වාක්‍යයේ සාමාන්‍ය රීතිය පෙරළුණු තන්හි වාක්‍ය-පරිවර්තනාලඞ්කාරය වේ.

'මල බමරු අදී — වදී මී ඔහු තුඩු තුළැ
මෙදෙ රජයා හිස් පෙදෙස — ගුමු නද එ බව පවසා'

බමරු මලට යෙයි.
හේ මී බොයි.
හේ මත් වෙයි.
හේ ගුමු ගුමු නද දෙයි.

මේ සාමාන්‍ය රීතියෙන් කියූ කලැ සිටුනා සේ යැ.

'බමරු මලට යේ'

යන තන්හි 'බමරු' යනු උක්තය යි. 'මලට' යනු අපර සීමාව යි. 'යේ' යනු අකර්මක ආඛ්‍යාත යි.

'මල බමරු අදී'

යන තන්හි සාමාන්‍ය වාක්‍යයෙහි අපර සීමාව හැඟැවූ පදය උක්තය ද, උක්තය වූ පදය කර්මය ද වී යැ. ආඛ්‍යාතය සකර්මක බවට පෙරළිණ.

(1) හේ මී බොයි.
(2) මී ඔහු තුඩු තුළැ වදී.

මෙ දෙ තන්හි පරිවර්තනය ද පැහැදිලි යැ.

(1) හේ මත් වේ.
(2) මෙදෙ හිස් පෙදෙස රජයා.

**'මෙදෙ'** (මන්ත භාවය) හිස් පෙදෙස (බමරු ගේ ඔළුව) රජයයි (ආංඩු කෙරෙයි.) මෙහි වනුයේ ඉතා විසිතුරු පෙරළියෙකි.

(1) හේ ගුමු ගුමු නද දෙයි.
(2) ගුමු නද එ බව පවසා.

පෙරළි වැකියෙහි උක්තය ගුමු නද යි. මද හිස් පෙදෙසෙහි රජය කරන බව ගුමු නද ලොවට පවසයි. මෙ ද විසිතුරු පෙරළියෙකි.

පෙරළිය නො පැරළියට වඩා රමණීය යැ. එ හෙයින් කාව්‍යයෙහි ලා බෙහෙවින් යෙදෙනුයේ පෙරළි යෙදුම් යැ.

## අර්ථ පරිවර්තනාලංකාරය

එකකු එකක් කී කලැ පද බෙදා හෝ නො බෙදා හෝ අනෙකක් අන් අරුතක් ගනී නම් එහි වනුයේ අර්ථ පරිවර්තනාලඞ්කාරය යි.

'සතුරන් නො දකැ හේ — සොවී කිම රන් ඔහු සතු
සොරු පැහැරැ ගත්තු ද රැ — රැගත පැහැ රන් කොහි යේ'

ප්‍රථමයා 'සතුරන්' යනු 'ශත්‍රූන්' යන අර්ථය දෙන්නට යෙදී යැ. ද්විතීයයා එය 'සතු' යැ 'රන්' යැ යි පද දෙකක් කොටැ ගෙනැ ඔහු ගේ පැනය නැගී යැ. ප්‍රථමයාට ද්විතීයයා ගේ විකිළුව තේරී හේ 'පැහැරැ ගත්තු' යන

පද දෙක 'පැහැ රැගත්තු' යැ යි කඩා ගෙනැ තෙමේ ද පැතයක් ඉපැදවී යැ. පැහැ පමණක් රැගත්තේ නම් රත් කොංහි යේ ද?

මෙයට ආලඞ්කාරිකයෝ 'වක්‍රෝක්ති' යන නාමය දෙති. (වක්‍ර + උක්ති.) 'වක්‍ර (ඇද) කළ කීම' යනු අර්ථ යි.

මේ එක් ලෙසකට එකකු බෙදූ පද අන් ලෙසකට අනෙකකු බෙදා ගත් තැනි

සමංත පද අර්ථ පරිවර්තනයට නිදසුන් මෙ සේ යැ.

'පිය සමර දුටු ද — සකි අනඟ නො දුකියැ හැකි
සිඟු නැත්තහු දු පෙනෙතී — හැඟියෙමි නො විමසා ඔබ'

එම ද දෙබසෙකි.

1. පිය සමර දුටු ද?
2. සකි, අනඟ නො දුකියැ හැකි.
1. ඔබ නො විමසා සිඟු නැත්තහු දු පෙනෙතී හැඟියෙමි.

ප්‍රථමයා 'පිය සමර නම් කාව්‍යය දුටු ද' යි ඇසී යැ. 'සමර' යනු අනඞ්ගයාට ද නමෙකි. එ හෙයින් ද්විතීයයා 'ප්‍රියය, (මිත්‍රය,) අනඞ්ගයා දුටු ද?' යන අර්ථය ගෙනැ, 'සකි, අනඟ නො දුකියැ හැකි' යි විහිළුවක් කෙළේ යැ. 'අඟ' (අඞ්ග) නම් ශරීරය යි. අඟ (සිරුර) නො වන්නේ යමකුට ද හේ 'අනඟ' නම්. ශරීරය නැත්තකු දුකියැ නො හැකි හෙයින් ද්විතීයයා ගේ කීම යෙදෙයි. විහිළුවට විහිළුවක් කරනු කැමැති වූ ප්‍රථමයා ද 'ඔබ නො විමසා සිඟු නැත්තහු දු පෙනෙති යි හැඟියෙමි' යි පිළිවදන් දින. එහි හේ 'අඟ (ශෘඞ්ගය) නො වනුයේ යමකුට ද හේ අනඟ යැ' යි අරුත් ගත. සිඟු ඇත්තේ මැ පෙනේ නම් ඔබ මට පෙනෙන හෙයින් ඔබට සිඟු ඇති වියැ යුතු යැ. ඒ බව මම නො විමැසුයෙමි' යනු යැ ප්‍රථමයා හැඟැවූයේ.

මෙහි 'පිය' යනු ද 'සමර' යනු ද 'අනඟ' යනු ද සිරි සේ මැ සිටියැ දී අරුත පෙරළුණු හෙයින් අර්ථ පරිවර්තනයට නිදර්ශන යි.

(7) අතිශයනාලංකාරය

ලෝක සීමාව — ඇති විය හැකි පමණ — ඉක්මවා යම් තැනෙක වර්ණනයෙක් කැරේ ද, ඒ සියලු තන්හි අතිශයනාලඞ්කාරය වන්නේ යැ. මේ බෙහෙවින් අන්‍යාලඞ්කාරයන් හා මිශ්‍ර වැ සිටින්නෙකි, සිංහල කවීනට අතිශයින් ප්‍රිය වූවෙකි.

'සව් සිරි පිරි එ පු ර
වට කැරැ රැඳි ගැඹර ත ර
අගල පිළිබිඹි උ ර
සිරි නා සුර දෙ පුර හිමි කැ ර'

(අලගිය වන්න කුසදා)

'අගල බඹ දහයක් ගැඹුරැ යැ. පවුර බඹ දහයක් උස යැ' යි කිව ද මහත් අතිශයෝක්තියෙකි. එ බඳු අගල එ බඳු පවුරැ ලෝකයෙහි නො වන හෙයිනි. 'අගල නා ලොව දක්වා බටුයේ යැ, පවුර සුර ලොව දක්වා නැගියේ යැ' යි කිව කොතරම් අතිශයෝක්තියෙක් ද? 'අගල' ඉතා ගැඹුරැ යැ පවුර ඉතා උස යැ' යි මේ පර්‍ය්‍යායයෙන් කී පරිදි යි.

'නරතුරු රුදු පහා — කත සැත්තේ ගැහැටමෙන්
කර හුන් වනෙව් ඇහෙහි — සිසිනු සස ලේ ලෙස්නෙන්'

(මුවදෙව් දා)

එ නුවරැ මහත් ප්‍රාසාදවලැ රන් සියනෙහි (පියස්සෙහි) ගැටීමෙන් චන්ද්‍රයා ගේ ඇඟෙහි ශශලේඛාකාරයෙන් කර (ගැට) ඇති වූ වැනි යැ. චන්ද්‍රයා ගේ ඇඟෙහි සියන ගැටීමට නම් ප්‍රාසාද එ තරම් මැ උස් විය යුතු යැ. මේ උත්ප්‍රේක්ෂායෙහි ගෙළුණු අතිශයෝක්ති යි.

'සැදි ගත තිල් කොළ' ග
හෙළ කඳිනුදුළ එහි නු ඝ
මහ සමුදුර සම ඝ
වැන්නැ එසැවුණු වතළ පුර ග ඝ'

(කවි සේකර)

උපමායෙහි ගිලුණු අතිශයෝක්තියෙකි.

'මුහුල'ත් තඹුරු විත් — දකත'ගතන් වුවත් සඳ
සමහර දිසි පියුම්රු — මිණි මැදුරැ සී මැදුරේ'

පද්මරාග මණි මන්දිරයේ කවුළුයෙන් මඳක් පෙනුණා වූ ගැහැණු මුහුණු නමැති සඳ මිනිසුන් ගේ මුකුලිත වූ අත් නමැති පියුම් ලැබී යැ. මැදුරැ පියුම්රුමිණිමුවා යැ යනු එක් අතිශයෝක්තියෙකි. මඳක් පෙනුණු ගැහැනු මුහුණ බාල චන්ද්‍රයා මැ යැ යි ගන්නා තරම් මැ වියැ යනු තවත් අතිශයෝක්තියෙකි.

අතිශයතාලඞ්කාරයෙහි ප්‍රභෙද මහත් ගණනකි. කවර අලංකාරයකට වුව ද අතිශයතය මුසු වියැ හැකි බැවිනි.

## අලංකාර යොගය

අලංකරණය සිතා බලා නතනා කළ යුත්තෙක් නො වේ. එ සේ කළ හොත් අලංකාර යැ යි සිතූ දෑ ඇතැම් විටැ දූෂණය වියැ හැකි යැ. සැලැකියැ යුත්තේ වස්තුව යි. වස්තුව අඛණ්ඩ වැ අවිකල වැ අසම්බාධ වැ අනධික වැ ගැලියැ යුත්තේ යැ. ගඟට එන ඇළ හෝ කඳුරැ ආදිය මෙන් ස්වාභාවික වැ එන අලංකාර වේ නම් අවුත් බැඳේ වා. එ බඳු අලංකාරය සැබැවින් මැ අලංකාරයෙකි.

එහෙත් අලංකරණාභ්‍යාසය නො කළ හැක්කේ නො වේ. තමා සිත ගත් අලංකාරයක් දුටු විටැ එය යොදා වැකි තැවැතැ තැවැතැ රැඝැයීමෙන් ඒ අලංකාරයට පුරුදු වැ එය තමා ගේ බවට පැමිණැවියැ හැකි යැ. එ සේ කරන්නට පෙරැ එහි නියම තත්ත්වය ඉඳුරා වටහා ගත යුත්තේ යැ. බොහෝ දෙන 'අලංකාර' යන නාම මාත්‍රයෙන් උදම් වැ අලංකාර ප්‍රදර්ශනය කරන්නට ගොස් ස්වකීය වාක්‍යයන් හාස්‍යොත්පාදක භාවයට පමුණුවත්.

ශක්තිය නැත්තෝ අලංකරණය හෙළා දකිති. හිඟන්නන් රන් රිදී මුතු මිණි අබරණ නිඟන්නා මෙනි. ශරීර ශොභාකර වූ ආභරණ, පොහොසතුන් විසින්, යම් සේ අගය කොටැ සලකනු ලැබේ ද, වාක්‍ය ශොභාකර වූ අලංකාර, දක්‍ෂයන් විසින්, එ සේ මැ අගය කොටැ සලකනු ලැබේ.

අලංකාර පිළිබඳ වැ බොහෝ දෙනා ගේ වැරැදි හැඟීමෙක් වෙයි. එ නම් 'අලංකාරය පද්‍යයට (වෘත්ත වාක්‍යයට) පමණක් අයත් යැ' යනු යි. මෙහි දු බොහෝ තන්හි නිදර්ශන පද්‍යයෙන් දක්වීම මේ වැරැදි හැඟීමට දුන් රුකුලක් වියැ හැකි යි. පද්‍ය හෝ වේ වා ගද්‍ය හෝ වේ වා වාක්‍යයෙක් වේ නම්, එය අලංකාර කළ හැක්කේ යැ. සමස්ථානුප්‍රාසය හැරැ අන් එක ද අලංකාරයෙන් පද්‍යයට පමණක් ඇරැණේ යැ යි නො කියැ හැකි. එ හෙයින් අලංකරණාභ්‍යාසය කරන්නවුන් විසින් පළමු කොටැ ගද්‍යය මැ පිහිට කොටැ ගැන්ම නුවණට හුරු වේ. පද්‍යය ගත් කල්හි, වෘත්තය රැකීම යැ අලංකාරයෙදීම යැ යි, බර දෙකෙක් වේ. එකක් වත් උසුලා ගන්නට බැරි වැ දඟ ලන තන්හි දෙකක් මැ කරට ගැනීම කෙබඳු පැවැත්මෙක් ද?

# 9. ප්‍රබන්ධාභ්‍යාසය

රීති නීති දැනැ ගැනීම මැ ප්‍රමාණ නො වන බව යටැ කියැවිණ. සමර්ථ භාවය තහවුරැ වනුයේ අභ්‍යාසයෙනි. එ හෙයින් දත් දත් දූය වහවහා අභ්‍යාසයට පෙරැළිය යුත්තේ යැ. ශිෂ්‍යයන් ගේ ප්‍රබන්ධාභ්‍යාසයට රුකුල් දෙන පිණිසැ ඒ ඒ වර්ගයෙහි ප්‍රබන්ධ මාතෘකා කිහිපයක් වින්‍යාස කොටැ දක්වනු ලැබේ. එක් එක් මාතෘකාව වින්‍යාස කළ හැකි ක්‍රම සිය ගණනක් මැ වියැ හැකි බව මෙතෙහි කළ මනා යැ.

මේ කැරෙනුයේ මඟට ඇඟිල්ලෙක් දිගු කිරීම වැනි නැතෙකි. මඟ තමා විසින් මැ සොයා ගත යුතු යැ. තෙමේ මැ ඒ මඟ ඔස්සේ යා යුතු යැ. ප්‍රබන්ධ මාතෘකාව ද තමාට රිසියෙන සේ, තමා ගේ ශක්තියට අනුරූප වන සේ, තමා විසින් මැ වින්‍යාස කැරැ ගත යුතු වේ.

'මට බැරි යැ, මට බැරි යැ' යන දීන චිත්තයට කිසි විටෙකැ ද ඉඩ නො දෙන්නැ. ඔබ ගේ අධිෂ්ඨානයත් උත්සාහයත් නො දෙදරා නම්, ඔබට බැරි දෙයෙක් ලොවැ නැත්තේ යැ. එ හෙයින් දීන නො වන්නැ.

බල, එකෙක් ඇති. ප්‍රබන්ධ මාතෘකාවක් ලැබුණු කලැ එය සිතට නඟන්නැ. එයට සුදුසු තරම් කරුණු ඔබ සිත් තුළැ වේ දැ යි විමසන්නැ. වේ නම් ඒ සියල්ල එක් කරන්නැ. එක්බිති ඒ කරුණු වගයන්නැ. (වැගැයීම නම් වර්ග කිරීමයි — ඒ ඒ වර්ගයට අයත් කරුණු ඒ ඒ වර්ගයෙහි බහා බෙදා වෙන් කැරැ ගැනීමයි.) පසෙකැ වස්තු වින්‍යාසය කරන්නැ. පබඳින්නැ.

ලැබුණු මාතෘකාව යටැ පැබැඳීමට සුදුසු තරම් කරුණු ඔබ සිතැ තුළැ නො වේ නම්, එ තන්හි කළ යුතු පැබැඳීම නො වේ, කරුණු සෙවීම යි. කරුණු නැති වැ කිසි කලෙකැ පැබැඳීමේ තැතක් නො කළ යුතු. එ සේ කිරීමෙනි පැබැඳුම

තිත්ත වන්නට පටන් ගන්නේ. ගෙඩි සහල් නැති වැ බත් පිසින්නට ලිපැ ගිනි මොලවන්නේ මෝඩයෙකි. පළමු මැ කළ යුත්තේ සහල් සැපැයීම යි.

## කථ්‍ය වස්තු

### වෘත්තාන්ත

#### 1. පොල් ලද සැටි

1. මානා නම් දඩ නායකයා — ඔහු ගේ පිරිස — දෙ තිස් දෙනා — දින පතා දඩයම්.

2. නියං සමයේ දිනෙකැ මහ වනයේ දඩයම — මහ දවල් පිපාසාව — දිය සෙවිල්ල.

3. වන මැද ගස — සිහින් දිග කඳ — පියා පත් වැනි කොළ — මහත් සැළි වැනි ගෙඩි.

4. ගසට ඇදීම — ගෙඩියක නටුව මහත් උත්සාහයෙන් කැපීම — ගෙඩිය මහ හඬින් බිම හීම.

5. එකකු ගෙඩියේ මුහුණ පොරෙවකින් බොහෝ වේලා කපා සිදුරු කිරීම — උල්පත.

6. තුන් තිස් දෙනාට මැ පැන් — ඉතිරි පැනින් එකකු නාවා පිරිසුදු කිරීම — වැයක් දී ඔහු ගෙඩිය තුළට යැවීම — ඔහු මද සැසැ පිටතට දීම — සියල්ලන් ගේ බඩ ගිනි නිවීම.

7. ඒ පිරිස පසු කාලයෙකැ දී ඒ ගසින් ගෙඩියක් ගෙනැ ගොස් ගමේ වැවීම — කැලෑවේ දී එ තරම් ලොකු ගෙඩි ගමේ දී කුඩා වීම.

සැලැකියැ : කථාවේ වින්‍යාස මාතෘකා පාඨ මාත්‍රයෙකි මේ. සාරය ගෙනැ කථාව විසිතුරු කොටැ පැබැඳියැ යුතු. මෙහි යෙදුණු පද මාලාව එ සේ මැ ගැනීම බලවත් වරදෙකි. අදහස් ගන්නැ. අඩුවක් පුරවන්නැ. වස්තුව ඔබ ගේ බවට පමුණුවන්නැ. ඔබ ගේ මැ බසින් රසයන්නැ.

## 2. අස් බිජුව

1. මහ දූතැමුත්තා දිනක් අසකු නැඟැ යන්නකු දකී — හෙ ද අසකු රුසී — අස් බිජුවක් ලබා ගන්නට එකකු යොදයි.

2. මහ අළු පුහුලක් ගෙනැ යන්නකු මඟැ දී සමු වේ — විමැසූ කලැ හේ ඒ අස් බිජුවෙකැ යි කියයි — අතැවැසියෙක් ගොස් මහ දූතැමුත්තාට කියයි — හේ එය ගන්නට අණ දෙයි.

3. අතැවැසියෝ අස් බිජුව ද ගෙන වන මැදින් එති. මහ පඳුරක් අසලැ දී අස් බිජුව ගත්තහු ගේ පයේ කටුවක් ඇනී අස් බිජුව ඔහු අතින් ගී බිඳෙයි — එ තැනින් සිවුපාවෙක් නැඟී මහත් වේගයෙන් දිවෙයි.

4. අස් පැටවා දිවෙති යි සිතූ අතැවැසියෝ ලුහුබඳිති — වන මැදින් දුවන කටු ඇනී ඔවුන් ගේ ඇඟැ සිරි ලේ ගලන්නට වේ — ඔහු නැවැතී මහ දූතැමුත්තා වෙතැ ගොස් සියලු පුවත් කියති.

5. ඔවුන් පුවත කි සැටි.

6. බිජුයෙන් එළියට ආ විගසැ මැ අස් පැටවා එ තරම් වේගයෙන් දිවී නම් උප ගිය බව මැ මැනැවැ යි ද තමාට උප ලැබී තමා ගෙනැ එ තරම් වෙගයෙන් දිවී නම් තමාට මරණය වියැ හැකි යැ යි ද කියා මහ දූතැමුත්තා අතැවැසියන් සනසයි.

7. පුහුල වැටී බිඳිණ — පඳුරේ උන් සාවෙක් තැති ගෙනැ දිවී යැ — අතැවැසියෝ උප අස් පැටවා නොවැ දුට හ.

## 3. වැඩි නුනුවණ කම

1. රජ කුමාරයෙක් ශාස්ත්‍ර උගන්නට තක්සලාවට යේ — හේ ඉතා දක්ෂ වැ ශාස්ත්‍ර උගනී — ගුරුට ඉතා ප්‍රිය වැ වෙසේ.

2. ඉගැනීම නිමවූ පසු ගුරු සිය දුව ඔහුට දෙයි — මහත් වස්තුව ද දෙයි — දෙදෙන කුමරු ගේ රට බලා නික්මෙති.

3. වනය මැදින් යන කලැ වැදි රජ හමු වෙයි — වැදි රජ කුමරිය ලබා ගන්නට සිතා කුමරු හා සටනට එයි — අවි පසෙකැ තබා ඔහු මල්ල යුද්ධයක් කෙරෙති.

4. වැදි රජ පරදී — ඔහු ගේ හිස කපන්නට කුමරු කඩුව ඉල්ලයි — වැදි රජුට කැමැති වූ කුමරිය කුමරුට කඩු කොපුව ද වැදි රජුට කඩුව ද දෙයි — වැදි රජ සැණෙකින් නැගී කුමරු ගේ හිස කපා හෙළයි.

5. වැදි රජ කුමරිය ගේ සියලු ආභරණ ද වස්තුව ද ගෙනැ ඇය පලවා හරී — ඇයි?

6. කුමරිය ගඟක් ළඟැ හිඳැ තැවෙයි — සිවලෙක් මස් කැටියක් ගෙනැ යනුයේ ගඟෙහි මස් කැටියේ සෙවණැල්ල දැකැ කටින් ගත් මස් කැටිය හෙළැ, ගඟට පනී — මස් කැටිය දියේ යයි.

7. කුමරිය සිනා සෙයි — දියේ සෙවණැල්ලට වඩා කැමැති වැ කටින් ගත් මස් කැටිය හෙළූ හ යි සිවලාට නින්දා කෙරෙයි.

8. සිවලා කුමරිය කළ දෑ දුටුවෙකි — මඟැ යන වැදි රජකුට ලොල් වී සිය සැමියා මැරවූ කුමරිය තමාට වඩා නුනුවණ කමක් කළ බව කියා සිවලා සිනා සෙයි.

## 4. වලස් කෝන් දබරය

1. වලසෙක් නිදයි — කෝන් ගසින් දිග අත්තක් කැඩී ඔහු මතැ වැටෙයි — තමාට පහර දුන් හ යි වලසා කිපෙයි — ගසට වෛර බඳී.

2. ගැලෙකැ සකෙක් කැඩෙයි — ගැල් කරු සකක් තනවා ගන්නට බලයි — වලසා පැමිණැ ගැල් සකට සුදුසු ගසක් පෙන්වමැයි කියයි — ගැල් කරු ඔහු හා යෙයි.

4. වලස් කෝන් ගස දක්වයි — ගැල් කරු එය කපන්නට වෙයි — ගසේ විසූ රුක් දෙවි පෙනී ගස කපන්නට වූ සැටි දැනැ, 'කෝන් ලීය සවි වන්නට නම් එහි වලස් සමක් බැන්ද යුතු යැ' යි රහසින් කියයි.

5. ගැල් කරු මුවින් නො බැණැ ගස කපයි — 'ගසින් පළි ගතිමි' යි සතුටු වූ වලසා ළං වැ බලා සිටී — ගැල් කරු ඔහු ගේ හිසට ද පොරෝ පහරක් දෙයි.

6. ගැල් කරු ගස කපා කෙළවර කොටැ වලස් සම තදේ බඳී  එ තැන් පටන් සියලු වලස්සු කෝන් ගසට සතුරු වෙත් ලු.

## 5. මන්ත්‍රානුභාවය

1. අසුරයෙක් මහ දෙවියාට සේවය කෙරේ — ඔහු ගේ මහත් භක්තිය නිසා පැහැදුණු මහ දෙවි ඔහුට කැමැති වරයක් ඉල්ලන්නට කියයි.

2. අතට මතුරා යම් කිසිවකු ගේ හිස පිටැ තුබූ කලැ ඔහු අළු කරන මන්ත්‍රයක් අසුරයා ඉල්ලයි — මහ දෙවි එය දෙයි — අසුරයා එයින් අතට මතුරැ මන්ත්‍රය අත් හදා බලනු පිණිසැ අත මහ දෙවියා ගේ හිසෙහි තබන්නට සැරසේ — මහ දෙවි දිවෙයි — අසුරයා ඔහු ලුහුබඳී.

3. මහ දෙවියාට වූ විපත විෂ්ණු දකී — හේ කාන්තා වේශයක් මවා ගෙනැ අවුත් මහැ ඔවිලි පදී.

4. අසුරයා එ තැනට එයි — කාන්තාවට කැමැති වැ ගමින් තබා ඇයට සිය සිත් හෙළි කෙරේ — තමා නො හරනා බවට දිවුරුම් දෙව යි කාන්තාව කියයි — අසුරයා දිවුරන්නට හිසැ අත තබා හළු වෙයි.

5. අසුරයා නො එන සේ දැකැ මහ දෙවි පෙරළා සෙමෙන් සෙමෙන් එයි — කාන්තාව දකී — ඇය පතයි — 'උමාව ගෙන් අසා එව'යි ඕ කියයි— මහ දෙවි යේ.

6. මහ දෙවියා එන විටැ කාන්තාව බිළිඳකු වඩා ගෙනැ සිටී — 'දරුවකු සමග ගැහැනියක ගෙනෙනුවාට කැමැති කරවා ගනුව' යි කාන්තාව ඔහු නැවැතැ යවයි — ඔහු එන විටැ කාන්තාවට දරු දෙ දෙනෙකි — 'දරුන් දෙ දෙනකු ඇති කාන්තාවක ගෙනැ එම් ද' යි අසන්නට මහ දෙවි හැරී යයි.

7. මෙ සේ එක් එක් වර එක් එක් දරුවකු වීමෙන් දරු ස දෙනෙක් වෙත් — කාන්තාව දරුන් ස දෙනා මහ දෙවියාට දී තමා හඳුන්වා දෙයි — මහ දෙවි දරුන් ස දෙනා එකකු කොටැ වඩයි — හේ යැ ස්කඳ කුමරු නම්.

## 6. ගණේසුරු ඔළුව

1. මහ දෙවි බැහැර යෙයි — උමා නහන්නට යනු කැමැති වෙයි — ගෙය බලන්නට කිසිවෙක් නැති — උමා පුරුෂයකු මවා අතට දඬක් දී දොර කඩැ නවතා යෙයි.

2. මහ දෙවි පැමිණේ — මුර කරු ඔහු නවතයි — කුමක් කිව ද ගෙට යන්නට නො දේ — මහ දෙවි කිපී මුර කරු ගේ හිස කඩා දමා ගෙට යෙයි.

3. උමා නගා පැමිණේ — තමා මැවූවහු ගේ හිස එක් දෙසෙකැ ද කඳ අන් දෙසෙකැ ද තිබෙනු දකී — පුවත දැනැ ගනී — ඔහුට දිවි දෙන තෙක් සැමියා හා සමඟ නො බෙණෙමි යි කියයි.

4. මහ දෙවි සිද්ධයන් ගෙන්වා, 'උතුරට හිස ලා නිදන්නකු ගේ හිස කපා ගෙනෙව්' යි අණ දෙයි — සිද්ධයෝ එ සේ නිදන ඇතකු දැකැ ඔහු හිස ගෙනෙති.

5. මහ දෙවි නියමයෙන් සිද්ධයෝ ඇත් හිස මළ කඳට ළං කෙරෙති — දෙසා බැඳේ — පණ එයි — උමා ඔහු පුතු කොටැ ගනී — හේ යැ ගණීසුරු.

## 7. ළින් කාඩය

1. මගැ යන්නකුට පිපාසාවෙක් වෙයි — අසලැ ගෙයකට නැඟී — බොන පැනක් ඉල්ලයි — ගෙයි ඇත්තෝ දිය මැස්ස දක්වති — හේ එහි තුබූ කළයෙකින් පැන් නමා ගෙනැ බොයි.

2. ආඃ, රස! එ තරම් මිහිරි, පැන්! 'කවර ළිඳේ දිය ද?' යි හේ අසයි — ගෙයි ඇත්තෝ ළිඳ තිබෙන ඉසව්ව දක්වති.

3. මැඟියා සිතිවිල්ලේ යයි — 'මේ ළිඳ නම් අපේ ගමට ගෙනැ යා යුතු යැ' යි සිතයි.

4. මහ රැ හේ මිනිසුන් දස දෙළොස් දෙනකු එක් කොටැ ගනී — ඔහු දඬු කඹ ආදිය ගෙනැ අර ළිඳ ළඟට යෙති — කඹ ලන ලෙසක් සිතති — ළිඳ මතැ මන දඬු තබා බඳිති — කර දී උස්සන්නට බලති.

5. අලුයම ද එයි — ළිඳ මදකුදු නො නැගේ — 'ළිඳ නො නැගෙන හෙයින් මිහිරි පැන් ටිකක් වත් බොමිහ' යි කළයක් සොයා පැන් ටිකක් ඇදැ බොති.

6. 'පුදුම යි — මේ මිහිරි පැන්! — අපේ ළිඳේ පමණ වත් පැන් හොඳ නො වේ' — මෙ සේ කියා අර මිනිසා ට බැණැ බැණැ මිනිස්සු යෙති.

7. එ ද ඔහු පූසයේ පැන් නො වේ — දිය මැස්සේ කිතුල් තෙලිජ් දිය කලයෙක් ද වියැ — හේ එය බී පැන් යැ යි මුළා වී යැ.

## 8. ලොකු මැ මෝඩ කම

1. යහළුවෝ තුන් දෙනෙකි — යහළු කම ඉතා තිර යැ.

2. මැගියෙක් ගමනක් යන්නට පිටත් වැ සමනළ ගල දෙසට හැරී නමස්කාර කෙරෙයි. එ අසළින් යන යහළුවෝ තුන් දෙන 'ඒ වැඳුම මට යැ. ඒ වැඳුම් මට යැ' යි කියමින් වාදයක් ඇති කෙරෙති.

3. 'වැඳුම් කාට ද?' යි මැගියා මැ විමසන්නට නියම කැර ගනිති — 'ලොකු මැ මෝඩයාට යැ' යි මැගියා කියයි.

4. ලොකු මැ මෝඩයා තෝරා ගන්නට වාදයෙකි — එකෙකුත් තමාට වැඩි ලොකු මෝඩයකු ඇති සේ නො අදහයි — එක එකා ගේ මෝඩ කම් කියන්නට පටන් ගනිති.

5. එකෙක් කියයි — 'මේ මගේ හිස — කෙස් එකෙකුත් නැ — එ හෙයින් මට තඩි තට්ටයා යැ යි කියත් — මෙය වූයේ කෙසේ ද? — බිරියෝ දෙදෙනෙකි — — එකක් මහලු යි — අනෙක තරුණ යි — මැහැල්ල කළු කෙස් උදුරයි — තරුණිය සුදු කෙස් උදුරයි.'

6. එකෙක් කියයි — 'මේ මගේ කකුල් දෙකෝ ගෙඩි දෙක යි — මගේ නම ගඩ ගෙඩියා — කෙසේ ද? — මගේ බිරියෝ දෙ දෙනෙකි — දෙන්නා කකුල්

දෙකට සාත්තු — වම් කකුලේ ගෙඩියක් — එය අයිති බිරිය එයට බොහෝ මැ සාත්තු — අනෙක් බිරියට ඉවැසිලි නැ, සාත්තු කරන්නට ඒ කකුලෙහිත් ගෙඩියක් නැති වැ — ඒ කකුළු තලසී, එකි තිය පොතු අනී, මිරිකයි, දස වද දෙයි — අනතිමයේ දී ඒ කකුලෙහිත් මේ ගෙඩියක්.'

7. ඉතිරියා කියයි — 'මගේ ද බිරියෝ දෙ දෙනෙකි — දෙ දෙනා ගේ තමා මගේ අත් දෙක — දිනක් දෙ දෙනා අත් දෙකට සාත්තු කරති — මීයෙක් පාතින් වැටියක් ගෙනැ යයි — දූල්වෙන පාන් වැටිය මගේ බඩ මතැ වැටේ — බඩ දසී, දසී, දයි — "මගේ අත නො දෙමි"යි එකක් දකුණත බදා ගෙනැ සිටී — "මගේ අත නො දෙමි" යි අනෙක වම් අත බදා ගෙනැ සිටී — පාන් වැටිය තිවෙන තෙක් මැ බඩ දයි — මෙන්න කැළැල — මගේ තම පාන් වැටියා.'

8. 'අපි තුන් දෙනා මැ එක් වැනි හපන්නු — වැදුම තුන් දෙනාට මැ' — මෙ සේ කි[illegible] ළොලවර කෙරෙති.

## 9. හිසේ කො[illegible]

1. සකල ලෝක සම්මෙලනයෙකි — 'බ්‍රහ්ම නියමය නො වෙනස් කළ හැකි යැ' යි එකෙක් කියයි — වැඩි දෙන එය පිළිගනිති — ගුරුළා නො පිළිගනී — 'ඉර නගින දෙස උපදිනා අසවල් කුමරිය ඉර බසින දෙස උපදිනා අසවල් කුමරුවාට බිරිය වියැ යුතු යැ යි මම උන් ගේ හිස්හි කොටමි' යි මහ බඹ කියයි — ගුරුළා 'එය වළකමි' යි පිළිත දෙයි.

2. කුමරිය ඉපැදී නොබෝ දිනෙකින් ගුරුළා ඇය පැහැරැ ගෙනැ ගොස් රකී — ඒ ළංවියැ නොහැකි උස් පර්වතයෙකි — එක් පසෙකැ මුහුද යැ.

3. දූත් කුමරිය තරුණියකි — දිනක් නැවක් වෙරළේ හැපී ඔබල වෙයි — තරුණයෙක් නැව මතැ සිට නැවේ — තරුණිය එ දෙස බලයි — ඔහුට සිත දෙයි — දෙදෙනා දෙඩති.

4. නැවෙහි කොටිඑවෙකි — ඌ මරා සම ගසා එයින් මල්ලක් කොටැ එහි තුළට වී සිටින සේ කුමරිය කියයි — තරුණයා එ සේ කෙරේ.

5. සවසැ ගුරුළා එයි — කැඩුණු නැවේ තිබෙන ඒ මිටිය ගෙන දෙන ලෙස කුමරිය කියයි — ගුරුළා එ සේ කෙරෙයි — කුමරිය ගුරුළා නො දන්වා තරුණයා රැකැ ගනී.

ශ්‍රිදු සජීලොක සම්මෙලන දිනය පැමිණේ — ගුරුළා කුමරිය ද ගෙනැ යන්නට සැරැසෙයි — 'අර සම් මල්ලෙහි මැ ලා මා ගෙනැ යන්නැ' යි කුමරිය කියයි — ගුරුළා එ සේ කෙරේ.

7. බ්‍රහ්ම නියමය ගැනැ වාදය උපදී — 'ඔහු දෙ දෙන බැඳුණෝ යැ' යි මහ බඹ කියයි. 'ලං වන්නට ද ඉඩ නො ලැබුණේ යැ. කුමරිය මේ මල්ලේ යැ' යි ගුරුළු කියයි — මල්ලේ කුමරිය පමණක් ද? — මල්ල ලිහති — කුමරකුමරියෝ එළියට එති — ගුරුළා ලජ්ජායෙන් පලා යයි.

## 10. පුරුදු හණ මිටිය

1. බැහැරැ ගොස් සිටැ ගමට යන්නට පිටත් වූ යහළුවෝ දෙ දෙනෙකි — හණ වැහැරි මිටි දෙකක් ගෙනැ ඔහු යෙති.

2. මගැ හණ හු වට තිකම් දෙන තැනෙකි — එකෙක් හණ වැහැරි දමා හු වට ගනී — 'අනේ මා මෙ තොක් තැන් ගෙනා හණ මිටිය කෙසේ හරිම් ද?' — මෙ සේ අනෙකා කියයි.

3. හණ පිළී දෙන තැනෙකි — පළමුවා හු වට දමා පිළී ගනී — දෙවනුවා හණ මිටිය මැ ගෙනැ යයි.

4. කොමු පිළී දෙන තැනෙකි — පළමුවා එය ගනී — දෙවනුවා හණ මිටිය මැ යි.

5. පට පිළී දෙන තැනෙකි — දෙ දෙනා ගේ පැවැත්ම පෙරැ සේ මැ යැ.

6. රන් රිදී මිණි මුතු දෙන තැනෙකි — දෙ දෙනා ගේ පැවැත්ම පෙරැ සේ මැ යැ.

7. ගෙදර — පළමුවා ගේ ගෙදර ජය කෙළි — දෙවනුවා ගේ ගෙදර සුසුම්.

8. සමහරු මුලැ දී ගත් මතයෙහි මැ එල්ලී සිටිති — පරණ හණ මිටිය මැ ගත්තහු මෙනි — නුවණැත්තෝ වනා නිවැරැදි මතය දුටු විටැ ගනිති — අගය අඩු දෑ දමා වැඩි දෑ ගත්තහු මෙනි.

## 11. ශූලායුධය

1. රාවණ ආකාශ යානයෙන් උතුර බලා යේ — කෛලාසය හමු වේ — ශිත නිසා ඉහළින් ගිය නො හැකි.

2. රාවණ බැසැ කෛලාසය එ තැනින් උගුළුවන්නට තැත් කෙරෙයි — මහ දෙවි සිනා මුහුණින් බලා සිටී.

3. කෛලාසය දෙදරයි — මහ දෙවියා ගේ නයා සැඟැවෙන තැනක් බලයි — ගොනා වැටෙන්නට යයි — උමා මහ දෙවියා බදාගනී — ස්කඳ කුමරු ද ගණේසුරු ද මව ගේ ඇඟෙහි එල්ලෙති — උමාව ගේ සිංහයා මෙන කුළහට පනින්නට බලයි — ස්කඳ කුමරු ගේ මොනරා පියා හමන්නට සැරැසේ.

4. මහ දෙවි රාවණයා හැඳවයි — ඔහුට සඞ්ග්‍රහ කොටැ ස්තුති කෙරෙයි — 'නො හැකි යැ' යනු වීරයාට අයත් බසෙක් නො වේ.

5. රාවණ මහ දෙවි යන දෙ දෙන යහළු වෙති — යහළු කමේ ලකුණක් ලෙසින් මහ දෙවි රාවණයාට ශූලායුධය දෙයි.

6. ශූලායුධය ඉතා දරුණු යැ — එයින් පහර කා ජීවත් විය හැකි නො වේ — රාම රාවණ යුද්ධයේ දී රාවණයා ශූලායුධය දමා ගැසූ කලැ රාමයා ගැලැ-වෙන අතක් නැති වැ සුසුම් හෙළී යැ — ශූලායුධය එයින් වැළැකිණි ලු.

## 12. කර දිය වලල්ල

1. උමා දරුවන් සුරතල් බලමින් හිඳී — පිටතැ අඹයක් වැටෙන හඬ ඇසේ.

2. 'කර දිය වලල්ල වටා ගොස් අවුත් අඹය මට ගෙනැ දුන්නේ මගේ හොඳ පුතා' — උමා මෙ සේ කියයි.

3. ස්කඳ කුමරු මොනරා නැඟී විදුලිය මෙන් මෙන් නික්-මෙයි — ගණ පති මඳක් සිතිවිල්ලට වැටේ — හේ මීයා නැඟී ගෙයි ලුණු දිය උතු කටුව වටා යයි.

4. ගණ පති අඹ ගස යටට පැමිණේ — අඹය ගන්නට නැමේ — 'මැණියන් ගේ ආදරය මට තමා' යැ යි ද කියයි.

5. මහ මුහුද වටා ගිය ස්කඳ කුමරු එ කෙණෙහි පැමිණැ අඹය ගන්නට නැමුණු සොහොයුරාට පහර දෙයි — ගණ පතිහු ගේ ඇත් හිස බිම ඇනී එක් දළෙක් බිඳේ — එහු එක්දත් වූයේ මෙ සේ යැ.

6. පුතු ගේ හැඬුම් අසා උමා පැමිණේ — ඕ ස්කඳ කුමරුට දොස් කියා ගණ පතිහු සනසයි — දෙ පුතුන් ගේ සපත් කමින් පිනා යයි.

# ඉතිහාස වස්තු

## 1. සිංහල නාමය

1. විජයාගමනය — ඔහු සිංහයෝ යැ — කෙසේ එනම් වූහු ද?

2 යක්ෂයනට වූ විපත්තිය — කුවේණිය ගේ මෝඩ කම — එහි විපාක ඕ මැ විඳී — යක්ෂයෝ පළි ගන්නට බලා සිටිති.

3 චිත්‍රා — නෛමිත්තික වාක්‍යය — චිත්‍රාවට ගජ ලකුණු ඇති වේ — ඇය කුම්රකුට පාවා දෙති.

4. පණ්ඩුකාභය කුමරු — මයිලන් ගෙන් ගැලැවෙමින් හේ වැඩේ — ශිල්ප ශාස්ත්‍ර උගනී.

5. පණ්ඩුකාභය රජය ගන්නට බලයි — මයිල්හු විරුද්ධ වෙති — යක්ෂයෝ පණ්ඩුකාභය පක්ෂය තර කෙරෙත්.

6. ලබු ගමැ යුද්ධය — සිංහ සංහාරය — සිංහයන් ලියූ හෙයින් (කැපූ හෙයින්) පණ්ඩුකාභය පළමු වන සිංහලයා වෙයි.

## 2. භූත බලිය

1. කුවේණිය සිය නැයන් නසන්නට විජය කුමරුට වහල් වේ— හේ කුවේණිය ගේ මන්ත්‍ර බලයෙන් නො පෙනී සිටැ යක්ෂ නායකයන් මඟුල් ගෙදරැ දී මරයි— ඉතිරි වූ යක්ෂ නායකයෝ වල් වදිති— රජය විජය කුමරුට යෙයි.

2. නගරයෙහි ඉතිරි වූවන් ගේ දුක්— වල් වැදුණවුන් ගේ දුක් — උන් යෝ කුස ගිති.

3. රාත්‍රි මන්ත්‍රණය — නුවරැ ඉතිරියෝ වල් වැදුණවුනට අහර සපයන්නට උපාය යොදති.

4. අහර තටුව — සුවඳ — සත් මාළු — දඹු වැට පහන් — වනයට ගෙනැ ගොස් තටුව ගසක් මතැ තබති — භූතයනට දෙන බලියක් යැ යි කියත්.

5. වල් වැදුණු යක්ෂයෝ මෙ සේ කුස ගිනි නිවති — ඔවුනට හදි කළවුන් ගෙන් පළි ගන්නට බලමින් සිටිති.

6. සැමියා විසින් පලවන ලද කුවේණිය වල් වදී — ඇය දුටු එක් යක් නාවෙක් ඇය එක් පහරින් මරයි — පණ්ඩුකාභය පක්ෂය ගත් යක්ෂයෝ සියලු සිංහයන් මරා රට නැවැතැ යක්ෂයනට ගෙනැ දෙති — සිංහල නාමය ද ඇති කෙරෙත්.

## 3. සූ විසි දහස

1. වඩකනාසික රාජ්‍යය — රටේ දුබල කම — නීති විරොධ ක්‍රියා.

3. නානා නාවනට කළ වරද — හේ සොළී රට යෙයි— එහි බඩ පුප්පන්නන් දකී — සිංහලයෙන් මිනිසුන් ගෙන'වුත් රට වවන ලෙස රජුට කියයි.

3. සිංහලයේ අභාග්‍ය දිනය — බිල්ලෝ — දොළොස් දහසක් තරුණ සිංහලයෝ සොළී රටට යති.

4. ගජබාහු රාජ්‍යය — පෙරැ කළ දෑ මතු වෙයි — ගජබාහු රජ සොළී කරයට යෙයි.

5. ගජබාහු වික්‍රමය — සොළී රජ බයි — සූ විසි දහසක් මිනිසුන් සිංහල රජුට දෙයි.

6. පාත්‍ර ධාතු, පත්තිනි සලඹ ආදිය ගෙනැ ගජබා රජ සිය රට එයි — මිනිසුන් මෙහෙයෙහි යොදා රට සමෘද්ධ කෙරෙයි — පත්තිනි සමයම ලක් දිවැ ඇති කෙරෙයි.

### 4. මහා විහාරයේ වරද

1. ලක් දිවැ නිකාය භේදය — වරින් වර ජය ලැබූ නිකායය — ජය ලැබූවන් පැරදුණවුනට කළ නිග්‍රහ.
2. වැඩි ජයට පැමිණියෝ — මහා විහාර නිකායය — ඔවුන් පැරදුණවුනට කළ දෑ.
3. ජේතවන අභයගිරි නිකාය දෙක — ඔවුන් ගේ ශාස්ත්‍ර — දඹ දිවැ මහායාන වාදයේ ශාස්ත්‍ර — ලක් දිවැ එ බඳු ශාස්ත්‍ර.
4. කළ යුතු වූ දෑ (පත පොත හළ කිරීම නොවේ. එහි වරද ඇත් නම් වෙන පත පොත කොටැ වරද පෙන්නා දීම යි) — මහා විහාර වාසීන් කළ දෑ — එයින් අපට වූ විපත.
5 ඉතිරි දෑ — සද්ධම්මෝපායනය — එයින් ණය ගෙනැ කළ ලෝ වැඩ සඟරාව — මහා විහාර වාසීන් ගේ පොත් හා සද්ධම්මෝපායනය හා සැසැඳිල්ල — එ බඳු තවත් බොහෝ පොත් කළාට සැක නැති බව.

### 5. සඞ්ඝමිත්‍ර වෛරය

1. ව්‍යවහාර තිෂ්‍ය සමයය — වෛතුල්‍ය වාද ගත් සඟ සැට දෙනකුට කළ දඬුවම.
2. කාවේරි පටුනෙහි සිද්ධිය — සඞ්ඝමිත්‍රයා ගේ ශපථ ය.
3. සඞ්ඝමිත්‍රාගමනය — දෙටුතිස් මහසෙන් දෙ කුමරු-වනට ශාස්ත්‍ර ඉගැන්වීම — දෙ කුමරුවන් ගේ දෙ ලෙස.
4. දෙටුතිස් රජය — සඞ්ඝමිත්‍ර පලායනය.
5. මහසෙන් රජය — සඞ්ඝමිත්‍රාගමනය — මහා විහාර පක්ෂයේ අභාග්‍යය.

6. ශාසන නාශනය — මහා විහාරයට දන් දුන්නවුනට දඬු නියමය — විහාර විනාශය — මහා විහාරය බිඳුවා බිමැ උඳු වැපිරුවීම — තවත් විහාර තුන් සිය ගණනක් නැසීම.

7. ජන පද කෝපය — මෙඝවණ්ණාභය කෝපය — සඞ්ඝමිත්‍ර මරණය.

## 6. කතර ගම

1. විජය කාලයට පෙරැ සිටැ පැවැතෙන්නෙකි — අතීත-යෙහි සමෘද්ධ රාජ්‍යයෙකි — කාවන්තිස් රජු විසින් නසන ලද දස රජ කෙනෙක් ඉතිහාසයෙහි ද සෙල් ලිපියෙකැ ද සඳහන් වෙති.

2. 'කතර ගම' නම් දෙවියා හිමි දෙවොලෙකි — දඹ දිව් වැසියන් ගේ ස්කන්ද කුමාර නම් මේ යැ — ලක් දිවැ තාරක නම් මහා අසුරයා නසන්නට මෙහි ආයේ ල — පසු වැ 'වල්ලි' නම් සිංහල කාන්තාවක පාවා ගෙනැ මෙහි විසී.

3 ඉතිහාසයෙහි නොයෙක් විටැ සඳහන් වේ — දුටුගැමුණු රජු ගේ බාරය — එය ඉටු කළ සැටි — හූව උඹව වූ සැටි.

4. දැන් පවතින සැටි — පුද පෙරහර — එයට ඇදෙන මහ සෙනඟ — හාස් කම්.

5. කතර ගම අයිතිය — එය ඒකාන්තයෙන් මැ සිංහල දේවාලයයෙකි: — හෙන්දුවයෝ — එය තමන් ගේ යැ යි කියත් — ඔවුනට පුද පවත්වා ගන්නට ඉඩ දුන් පමණින් එය අයත් කැරැ ගන්නට තැතැනීම වරදෙකි.

## 7. මහසොහොන් පුවත

1. ගොඨසිම්බර මිත්‍ර මහාසේන — වලස් දඩයමෙහි සමතෙකි — වලසුන් සමඟ පොර බදා දිනයි — හිස සහිත වලස් සමෙකින් ඇතැම් විටැ හිස වසා ගනී.

2. එළාර යුද්ධයෙන් පසු ඒ ඒ සෙනෙවියන් ගේ ගෙයි ජයොත්සව — ගොඨසිම්බර ජයොත්සවය — ආපානය — මහාසෙනඟා පමණ ඉක්මවා මී පැන් බොයි — වෙරි මත — ගොඨසිම්බර දෙවිය නො සලකා හැසිරෙයි.

3. මත් වැ සිටි ගොඨසිම්බර කිපේ — හටනකැ ලකුණු — සෙසු සෙනෙවියෝ අතරට පැනැ දෙ දෙනා දෙ පසට කෙරෙති — පිළිමල් හටනක් සැලැසේ — හටනට රජු ගේ අවසර.

4. හටන් දින — හටන් මඬුල්ල — දෙ පස සැරැසිලි — හටන් පලු (පාලක) — පිරිස්.

5. හටන් පිරුම — ජය දෙ පසට වැනුම — දෙ පසේ මැ වැර — දෙ පස මැ අවසරයක් නො පෑම — කෙළවර දී ගොඨසිම්බර හට ලැබුණු අවසරය — ඔහු උඩ පැනැ දුන් පා පහර — ඈතැ ගොස් වැටුණු මහසෙන් හිස.

6. හිස් සුන් කඳ මහ සොහොනට ඇරැ ලති— එකෙක් පුරුදු වලස් හම යොදති.

7. වලස්හිස් මිනිසා සොහොනෙහි දුටුවෙක් බිය ගනී — ඔහුට පිළියම් — මහාසේන මහ සෝනා වෙයි.

## 8. උපුල්වන් පුවත

1. මහා වංශයේ සඳහන් පුවත — ශක්‍රයා උපුල්වනු විජය පිරිස රක්නට යෙදී ලූ — හැඳූහියැ හැකි ද? — උපුල්වනු ලඞ්කාධිපති දෙවයා කොටැ සැලැකීම වඩා මැනැවි — ආදියෙහි පටන් මැ මේ ලක බැලී යැ.

2. උපුල්වන් විෂ්ණු ද — නො වේ — විෂ්ණු දඹදිවැ දෙවියෙකි — උපුල්වන් ලක් දෙවියෙකි — විෂ්ණුහු ගේ දේවී ලක්ෂ්මී යැ — උපුල්වනු ගේ දේවී චන්ද්‍රවතී යැ — විෂ්ණුහු ගේ පුත් ප්‍රද්‍යුම්න යැ — උපුල්වනු ගේ පුත් ධනු යැ.

3. උපුල්වනු දෙව් නුවර ගිය සැටි — දපුළුසෙන් රජු දුටු සිහිනය — වේරළට පා වූ කිහිරි කඳ — එයින් කැපූ උපුල්වන් දෙව් රුව — දෙව් නුවර උලෙළ.

4. ලක් දිවැ සතර වරම් දෙවිවරු — ඔවුන් අතුරින් නායක දෙව්.

## 9. කොත'වි මානය

1. මහා රාජසිංහ රජු ගේ මඩ කලපු ගමන — එහි ගිය සෙනඟ — රජ පෙරහර.

2. ගල් බය — එහි ගඟ — එ තන්හි වාඩි — ගල් බයේ කිඹුලා ගේ පුවත.

3. රජ කිඹුලා ගැනැ සෙවිල්ලේ සිටී — අදිසියේ කිඹුලා මතු වෙයි — රජ වහා පැනැ කොත'වියෙන් අනී — ඇති කොත'වියත් සමඟ කිඹුලා දිය යටට ඇදේ.

4. රජ අණ — කො'තවිය ගෙනැ දුන්නකුට මානයට ඒ ලැබේ.

5. කප්පාගොඩ මිනිසා ඉදිරියට වහා එයි — රජු වදී — දියට පනී — කිමිදී යෙයි.

6. දිය ඇවෑ ගලක් අස්සේ උන් කිඹුලා — මිනිහා කිඹුලා අල්ලා කටට අත යවයි — අත ගිරියට මෑ යවා උගුර කිදී — කොත'වියත් සමඟ කිඹුලා ඇදූ ගෙනෑ ගොඩට එයි.

7. රජු ගේ ප්‍රීතිය — සෙනඟෙහි ප්‍රීතිය — විජය කෙළි — මහ සෙනඟ මැද මහ රජ මිනිසාට රාජ ගෞරව දක්වා ඔහු උපන් සතර කොරළයට මාතන කොටෑ කොත'විය දෙයි. එ තැන් සිටෑ සතර කොරළයේ දිශාව ගේ පෙරහරෙහි ඒ කොත'විය ද මාතයක් මෙන් ගෙනෑ යන්නට වෙයි.

8. සතර කෝරළයට මෙ සේ ලැබුණු මාත පසෙකි — සෙසු සතර (1) ඉර සඳ කොඩිය (2) සවරම් කොඩිය (3) පච්ච ලංසය (4) දවුංඩය යන මේ යෑ.

## 10. නිකාය සාමග්‍රිය

1. නිකාය භේදය — තුන් නිකාය — සමගි කරන්නට කල නැත් — නො හැකි වීමට හේතු.

2. මහ පැරකුම්බා සමය — පළමු මෑ රජ සතුරෑ උවදුරු නසයි — ඉක්බිති සසුන නිරවුල් කරන්නට බලයි.

3. දිඹුලා ගල කාශ්‍යප සථවිර — රජ ඔහු ගේ වහල පතයි — සෑසෑදිලි කොටෑ ක්‍රියා මාගීය නිශචය කෙරෙයි.

4. දිනක් ලක් දිව පුරා ගිය රජ අණ -- සියලු භික්ෂූහු නියමිත දිනයෙහි නියමිත වේලායෙහි පොළොන්නරුවට රැස් වියෑ යුත්තෝ යෑ.

5. ලතා මණ්ඩපය— භික්ෂු සන්නිපාතය — භික්ෂූන් ගේ නානාවිධ විකාර — සියලු භික්ෂූහු ලතා මණ්ඩපයට රැස් වෙති.

7. මණ්ඩප ද්වාරයෙහි රජ — අසලැ අස්නෙහැ කාශ්‍යප සථවිර — එක් එක් ප්‍රව්‍රජිතයා ඉදිරියට එයි — රජ තනි වැ මැ ඔහු ගේ තතු විමසයි — නිසි වුව කාශ්‍යප සථවිර මතය ද අසයි — භික්ෂුභාවයට සුදුසු සේ හැඟුණ බැහැරැ යවයි — නො හැඟුණ එ තන්හි මැ සිවුරු හරවා යොග්‍ය වෘත්ති නියම කෙරෙයි.

8. එ දා රැය ද, නිකාය භෙදය ද, ශාසන කාලුෂ්‍යය ද එක් විටැ කෙළවර වෙයි — හවුරුදු දහස් ගණනක් මැ පැවැති නිකාය භෙදයෙකි.

---

# චරිත වස්තු

## 1. පණ්ඩුකාභය

1. මව — විජය රජු ගේ සොහොවුරු සුමිත්‍ර රජු ගේ පුත් පඬුවස් දෙව් රජු ගේ දූ චිත්‍රා — පියා — ශාක්‍ය වංශයට අයත් දීඝායු කුමාරයා ගේ පුත් දීඝ ගාමිනී නම් කුමාරයා යැ යි කියති — මදක් සැක සහිත යැ.

2. උත්පත්තිය — චිත්‍රාව ගේ පුතෙක් මයිලන් මරන්නේ යැ යි නෙමිත්තිකයෝ කී හ — බෑයෝ නඟා මරන්නට සැරැසුණාහ — දෙටු බෑ එය වළකා 'නඟාට දරු උපතක් නො වන සේ රකුම්හ' යි කී — එක්ටැම් මාළිගය — දරු උපතනට ලකුණු පෙනුණු කලැ මරන්නට සැරැසුණා හ — දෙටු බෑ එ ද වළකා 'පුතකු උපනි ඔහු මරම්හ' යි කී.

3. චිත්‍රාව ගේ දාරකොත්පත්තිය — චිත්‍රාව අන් ගැහැණියක ගේ දුවක ළං කොටැ ගෙනැ සිය පුතු ඇයට දුනු.

4. චිත්‍රාව පුතු ඒ ඒ තැනට යවා රැකි — පණ්ඩුකාභය නාමය — මයිලෝ පුවත අසා ඒ ඒ තන්හි ගොප් දරුවන් මැරවූ — පණ්ඩුකාභය කුමර කෙසේ නමුත් රැකිණි.

5. පණ්ඩුල බ්‍රාහ්මණයා ගේ ශාස්ත්‍ර — ඔහු පුත් චන්ද්‍ර — යුදට සැරසීම — යක්ෂයන් සියලු දෙසින් පණ්ඩු-කාභය පක්ෂයට වැදීම.

6. ගිරිකණ්ඩ සිව මයිලා ගේ දූ පාලිය පැවා ගැනීම.

7. යුද්ධය — ලබු ගමැ දී කළ අන්තිම යුද්ධයේ දී සිංහයන් වැනැසීම — යුද්ධයට නො ගිය දෙටු මයිලා ද පාලි පියා ද ඉතිරි වූ.

8. රාජ්‍යය — අනුරාධපුර නිර්මාණය — නගර පාලන සංවිධානය.

9. අභය මයිලාට කළ සැලැකිලි — චිත්‍ර රාජයා — ඔහුට කළ සැලැකිලි — එයට හේතු.

## 2. කුමාර දාස

1. ධාතුසේන රජු පුත් මුගලන් රජු ගේ පුත්‍රකැ යන වැරැදි හැඟීම — හේ කුමාර ධාතුසේන — මේ කුමාර දාස — රජය කෙළෙක් නො වේ.

2. උත්පත්තිය — තමා රජ කුලයට අයත් බව ද කාශ්‍යප අග්‍ර බෝධි යන දෙ මයිලන් විසින් වඩනා ලද බව ද කුමාරදාස මැ කියයි — මවුපියෝ නො සඳහන් හ — රාජශේඛර කුමාර දාසයා ජාත්‍යන්ධ බවක් කාව්‍ය මීමාංසායෙහි පවසයි.

3. තත්ත්වය -- ලෝක ප්‍රසිද්ධ කවියෙකි — දඹදිවැ කාලි-දාසාදි මහා කවීන් හා සම කක්ෂයෙහි ලා ගිණි-යැ හැකි සිංහල මහා කවියා.

4. කළ දෑ — ජානකීහරණ මහා කාව්‍යය — කථා වස්තුව — රාවණයන් විසින් රාම භාර්‍යා වූ සීතාව (ජානකිය) පැහැරැ ගෙනැ ඒම — සර්ග විස්සෙකි — ශ්ලෝක දහස් ගණනෙකි — ලෝකයෙහි ඉතා උසස් කොටැ සැලැකෙන කාව්‍ය කිහිපයකින් එකෙකි.

5. කාව්‍යය කිරීමට හේතු — තමන් රැකැ ගත් මයිලන් දෙ දෙනා ගේ ඇයැදීම යැ යි කුමාර දාසයෝ මැ කියත් — කුමාර දාසයා ගේ බාල වියෙහි දී මයිලන් වූ බාරයක් සිදු කිරීම සඳහන් වියැ හැකි.

6. කුමාරදාසයා ගේ ආගමය — විෂ්ණු ආගමය යැ යි ඇතැමෙක් සිතති — විෂ්ණු ස්තෝත්‍ර රූපයෙන් කාව්‍යය කළ හෙයිනි — එ මැ නිශ්චයයට ප්‍රමාණ නො වේ — බෞද්ධ භික්ෂූන් ගුණයෙහි පිහිටි සැටි, මෝක්ෂය ලැබූ සැටි, මහා ජනයාට ස්වර්ග මාර්ගය පෙන්වා දුන් සැටි කුමාර දාස කියයි — විෂ්ණු ස්තෝත්‍රයක් කළ ද කුමාර දාසයා බෞද්ධ වූ බ සිතීමට මේ කරුණු යැ — දැනුදු බෞද්ධයෝ විෂ්ණු පූජා කෙරෙති.

## 3. මහ පැරකුම්බා

1. මානාභරණ (රුහුණේ රජු) රත්නාවලී යන දෙ දෙනා ගේ පුත් — වංශය — පිතෘ පක්ෂයෙන් ද්‍රවිඩයෙකි — මාතෘ පක්ෂයෙන් සිංහලයෙකි — සියලු සිතින් සිංහලයෙකි.

2. කුමාර කාලය -- සියලු ශිල්ප ශාස්ත්‍රාදියෙහි නිෂ්පත්තිය -- පියා ගේ මරණය — ඉන් පසු පිහිට.

3. පොළොන්නරු ගමන — අතර මඟ සිද්ධි — පොළොන්නරුයෙහි දී කළ දෑ — 'මට සිංහල කඩුවක් දෙව' — ගජබා රජුට රාජ්‍යය කරන්නට ඉඩ දීම.

4. ගජබා මරණය -- රාජ්‍ය ප්‍රාප්තිය -- පොළොන්නරු රාජධානිය.

5. දිග්විජය -- පාණ්ඩ්‍ය දේශය -- අරමණ දේශය -- පරාක්‍රම පණ්ඩු ග්‍රාමය - දඹදිව සිංහල මිල.

6. දේශ සංවර්ධනය -- විහාරාරාමාදිය -- ආහාර නිෂ්පාදනය -- පරාක්‍රම සමුද්‍රය — 'කිමට වැටෙන එක් වැසි බින්දුවකුදු රටට වැඩ නො සලසා මුහුදට යන්නට නො දෙමි.'

7. ශාසන ශෝධනය — නිකාය සාමග්‍රිය — පරාක්‍රමබාහු කතිකා වත -- භික්ෂූන් පැවැත්ත යුතු සැටි නියම කොටැ ගල්හි කෙටැවීම.

8. මුළු ලොකයෙහි අතිබලසම්පන්න රජුන් අතරෙහි ගැණේ -- මහ අලික්සන්දර, අශොක, සීසර යනාදීන් හා සමාන යැ — තමා ගේ ම බලය තහවුරු කිරීමට ගොස් රජ පෙළපත් වැනැසී යැ — රුහුණ අබල කෙළේ යැ

## 4. ශ්‍රී රාහුල

1. මෞර්‍ය වංශයට අයත් හ යි ශ්‍රී රාමචන්ද්‍ර භාරතීහු පවසත් — 'කඳවුරු කුල උපන්' යැ යි තුමූ මැ කියත්.

2. මවුපියන් ගැනැ කිසි සඳහනෙක් නැති — ස වැනි පැරැකුම්බා රජු ගේ පුත් තැනෙහි වැඩුණු බව පමණෙක් සඳහති — 'උතුරු මුළ මහ තෙරිඳු මුණුපුරු' බව නම් කියැවිණි.

3. කුඩා කාලයේ මැ මහත් චාතුර්‍ය දක්වූ බවට සැක නැති — මහ විදගම තෙරුන් ගෙන් උගත් හ යි කියත් — ඒ බව පතපොතෙහි නො සඳහති — බාල කාලයෙහි මැ මහණ වූ හ යි සිතියැ හැකි.

4. එ කලැ පැවැති ශාස්ත්‍ර අතුරින් නො දත් දැයක් නො වූ හ යි සිතියැ යුතු තරම් යැ — පුදුම සිහියෙකි — ඇසූ කියැවූ සියලු දේ සිහියේ මැ වූ සේ යැ — එ කලැ දඹ දිවැ ද ලක් දිවැ ද තුබූ තාක් පොත් කියැවූ සේ යැ — සිංහල පමණක් නො වැ පාලි සංස්කෘත දෙමළ යන භාෂා ද ඉතා හොඳින් දත් බවට කළ පොත් මැ සාක්ෂ්‍ය දරයි — 'ෂඩ්භාෂා පරමේශ්වර' යනු විරුද නාමයෙකි — සංස්කෘත, ප්‍රාකෘත, මාගධ, අපභ්‍රංශ, ශෞරසේනි, පෛශාචි යන භාෂා සය දත් හෙයිනි.

5. බෞද්ධාගමයෙහි ද නොදත් තැනෙක් නැති — 'ත්‍රිපිටක වාගීශ්වර' යනු විරුද නාමයෙකි — තුන් පෙළ පමණක් නො වැ අටුවා ටීකා ආදිය ද කෙළවරට මැ දත් සේ යැ.

6. තොටගමුයේ පරිවේණාධිපතිත්වය — වාසය එහි යැ — වරින් වරැ ජය වර්ධනයට ද පැමිණිය හ යි සිතියැ හැකි — අනන්තර රජ සමයෙහි දී සඞ්ඝ රජ පදවිය.

7. කළ දෑ — පරෙවි සන්දේශය — කාව්‍ය ශේඛරය — සැළලිහිණි සන්දේශය — පඤ්චිකා ප්‍රදීපය — බුද්ධිප්‍රසාදනිය — ශාස්ත්‍ර ඥානය කොතරම් ද යනු පඤ්චිකා ප්‍රදීපයෙන් පෙනේ — ඒ පඤ්චිකා නම් මොග්ගල්ලායන ව්‍යාකරණ වර්ණනාවට ලියූ ගැට පදයෙකි — බුද්ධිප්‍රසාදනිය පද සාධන නම් පාලි ව්‍යාකරණයට ලියූ ටීකාවෙකි — එ දෙකින් මැ අන්‍යාචාර්ය-වරයන් ගේ බොහෝ කියුම් වැරදි බව දක්විණි.

8. කවියකු ලෙස උසස් නො වී — බොහෝ තන්හි අනුන් නිපැදවූ දෑ ගෙනැ සිංහලයට පෙරළූ බව පෙනේ — පරෙවි සන්දේශයත් කාව්‍ය ශේඛරයත් එ බඳු තැන්වලින් ගහණ යැ.

9. මන්ත්‍ර ශාස්ත්‍රයෙහි අතිදක්ෂයෙක් ල — පැරැකුම්බා රජු මුනුපුරු ලු දරු ජයබාහු රජු මරා සපුමල් කුමරු රජය ගත් කලැ, භූතයන් යවා ඔහු ගෙන්වා තජ්ජනය කළ බව කියත් — මළ කලැ භූතයෝ මළ සිරුර කිඳුරු ගලැ ලෙනෙහි තබා රැකියෝ ල — පරංගි සව්යෙල් සෙන් පති පසු කලෙකැ එය නෝර්වයට ගෙනැ ගියේ ල.

## 5. මහා මෛත්‍රෙය

1. ලක් දිවැ විසූ අතිබලසම්පන්න ස්ථවිර ගණයට අයත් යැ — ශාසනයට නො වැ රාජ්‍යයට සිත යැවූවෙකි.

2. ගම්පල බුවනෙකබා රජ සමයෙහි — උගතෙකි — ලෝ වැඩ සඟරා ආදිය කළ මෛත්‍රෙය තෙරහු ගේ ගුරු — තොටගමුයේ ශ්‍රී රාහුල, ජය මහ ලේනා, ඔහු පුත් පැරැකුම්බා යන මොවුන් ගේ ද ගුරු වූ හ යි කියති.

3. රාජ්‍ය තන්ත්‍රයෙහි අතිදක්ෂයෙකි — පැරැකුම්බා කුමාරයා රහසින් ඇතිදැඩි කෙළේ යැ — වීර අලකෙශ්වරයා රජ කම පැතූ කලැ එනට කැමැති සේ හඟවා අභිෂෙකය කැරැවීමට තෙමේ ම සැරැසී පැරැකුම්බා කුමරුට සිය'තින් කඩුව දී අලකෙශ්වරයා ගේ හිස කැප්පී යැ.

4. දැදිගම් පුරැ පරාක්‍රමබාහු රජයට පැමිණි කලැ අනෙකොපයෙන් රට වැසියන් ජයවර්ධනයෙහි පැරැකුම්බා රජුට පක්ෂ කරවා දැදිගම් පුරැ පරාක්‍රමබාහු විනාශ කැරැවී යැ.

## 6. වැලිවිට සරණංකර

1. තුම්පනේ මුදලි කෙනෙකු ගේ පුත්‍රයෙකි — බාල කලැ මැ මහණ වූයේ යැ — එ කලැ භික්ෂු තත්ත්වය ගැනැ මහත් දුකින් පසු විය — ඉතා මහත් උත්සාහයෙන් තැනින් තැනින් අවුලා ගෙනැ එ කලට පැවැති සේ ශාස්ත්‍රය උගත්තේ යැ.

2. සිල්වත් යැ — නිරහඞ්කාර යැ — කරුණාවත් යැ — දුටුවන් ගේ සිත් ගැනීමෙ සමත් යැ.

3. කීර්ති ශ්‍රී රාජසිංහ රජ අතිශයින් පැහැදුණේ යැ — සඟ රජ තනතුර දින — අමාත්‍යයකු ඒ බව දන්වූ කලැ පුස් කොළ කැබැල්ලෙකැ 'උඩගු නො ව මහණා' යනු තුන් වරක් ලියා සියතෙහි ගැසී ලූ.

4. රජු ගේ අනුග්‍රහයෙන් සියම් දෙසින් භික්ෂූන් ගෙන්වා මහ වැලි ගඟෙහි දී ලංකා භික්ෂූන් උපසම්පන්න කැරැවී යැ — මේ සියම් නිකායේ උත්පත්තිය සි.

5. බොහෝ පොත් කෙළේ යැ — සාරාර්ථ සංග්‍රහය ආදී බණ පොත් මැ බොහෝ යැ — සුප්‍රසිද්ධ භෛෂජ්‍ය මඤ්ජූසාවට සන්නයක් ද සැපැයී යැ.

6. ශාස්ත්‍ර ඥානය කුමක් වුව ද සාමාන්‍ය ඥානය උපන් පෙදෙසට සරි ලන සේ වී ල — බලු දන — 'සඟ රජ වුවත් උපන්නේ තුම්පනේ නො වේ ද?'

## 7. වාසල මුදලි ගුණවර්ධන

1. මාතර උපන්නෙකි — බාල කාලයෙහි පටන් ඉංගිරිසි උගත්තේ යැ — එහෙත් සිංහලයට මහත් ආදරය දැක්වී යැ — මෑතෙකැ දී ප්‍රසිද්ධියට හේතු වූයේ ඒ ආදරය සි.

2. රජ කාර්‍ය — ලිපිකරු තනතුර — අධිකරණ පරිවර්තක — අධ්‍යාපන පරිවර්තක — අපරාධ පරීක්ෂණ පරිවර්තක — නගර ප්‍රදේශ සභාසද — පාලි, සංස්කෘත, දෙමළ භාෂා සෞත්සාහයෙන් ඉගැනීම — රජයෙන් ලද මාන.

3. ගුත්තිල කාව්‍ය වර්ණනාව — එයින් ඇති වූ වාදය — කොතරම් ඇනුම් බැණුම් විදිය ද අවෙර්ඩයට නො පැමිණීම.

4. ප්‍රාචීන භාෂෝපකාර සමිතිය — ඒ මගින් කළ වැඩ — දෙමළ වාදය.

5. මයූර සන්දේශ වර්ණනාව — සුභාෂිත වර්ණනාව — සිද්ධාන්ත පරීක්ෂණය — කෝකිල සන්දේශ වර්ණනාව — සිළුමිණ සඟරාව — උපමාලඞ්කාර නම් කාව්‍යය.

6. අවසාන කාලයේ දී සිංහල ශබ්ද කෝෂ සම්පාදනයෙහි සභාය වී — එහි නියුක්තයනට දෙමළ තෙළිඟු ආදි භාෂා ඉගැන්වී — රෝගී වැ අස් වූයේ යැ — දෙඩුමට වැටුණු කලැ ශබ්ද කෝෂ කාර්‍යය ගැනැ ඉතා විසිතුරු පුවත් පළ කෙළේ යැ.

7. මහත් උත්සාහ ඇත්තෙකි — තමා ගේ දැනුම ගැනැ තෙමේ මැ උසස් අදහස් ඇති කැර ගත්තේ යැ — අනුනට රුදුරු පහර දීන — එ හෙයින් සතුරන් බෝ කැර ගත්තේ යැ.

8. අන්තිමයේ දී පක්ෂාඝාත රෝගය ඇඳට යැවී — වර්ෂයක් පමණ එයින් පෙළුණේ යැ — හවුරුදු සැත්තෑ ගණනක් ආයු වැළැඳී යැ.

## 8. විජය

1. වඟු රටැ සිංහ ගොත්‍රයට අයත් වූ වෙති — පියා සිංහ-බාහු — මව සිංහ සිවලි — ඔවුන් පිළිබඳ වැ පැවැති කථා.

2. තරුණ කාලය — සාහසිකත්වය — පාප මිත්‍රයෝ — ජන පද පීඩා — දෙශ ත්‍යාගය.

3 ලඞ්කාවතරණය — කුවේණි සම්බන්ධය— කුවේණියට දුන් දිවුරුම.

4. යක්ෂ සංහාරය — රජ පද ප්‍රාප්තිය — දරුවෝ.

5. අභිෂෙකය -- ඇමැතියන් ගේ ආයාචනය — විජයා කුමරිය ගෙන්වීම.

6. කුවේණිය ගේ වියොගය—ඇය ගේ ශාපය—කුවේණි පලායනය — දරුවන් ගැනැ කථා.

7. විජය ස්වභාවය — ඔහු ගෙන් ලක් දිවට වූ වැඩ අවැඩ — ඔහු ගේ පරපුර කෙළවර.

## 9. කුවේණි

1. ලක් දිවැ යක්ෂාධිපතියකු ගේ දූ — සුරූපි යැ — කාර්‍යයෙහි දක්ෂ යැ -- ශාස්ත්‍ර දත්තී යැ.

2. නෛමිත්තිකොපදෙශය -- දෙශාන්තරයෙන් පැමිණෙන කුමාරයකුට බිරිය වන බව -- එය සිද්ධ වන දින-යෙහි ඇය ගේ ළ මැද වූ මාංස ග්‍රන්ථියක් අතුරු-දන් වන බව.

3. ඒ දිනය -- මාංස ග්‍රන්ථිය අතුරුදන් වීම -- කුවේණිය ගසක් යටැ කපු කටිමින් හිඳීම -- විජය සේවක-යන් මන්ත්‍රානුභාවයෙන් අදෘශ්‍යමාන කිරීම.

4. විජය ප්‍රාප්තිය -- කුවේණිය සේවකයන් පාවා දී විජයයා ගේ භාර්‍යාව වීම — ඇය ගේ ශපථය.

5. යක්ෂ සංහාරය -- කුවේණිය ගේ මනොරථ සිද්ධිය.

6. අභාග්‍ය ප්‍රාප්තිය -- පලායනය -- මරණය.

7. කුවේණිය ගේ ක්‍රියායෙන් ජාතියට වූ හානි.

## 10. විභීෂණ

1. මවු පිය දෙ පස -- සහෝදර සහෝදරියෝ -- තත්ත්වය — රාවණයා මෙන් දක්‍ෂයකු නො වීම.

2. රාම රාවණ භෙදය — රාමයා චරයන් එවා විභීෂණයාට රාජ්‍යය ගෙනැ දීමට ගිවිසීම — විභීෂණයා රහසින් රට හෙද කිරීම.

3. රාමයා ගේ ම්ලෙච්ඡ සේනාවන් පැමිණීම -- විභීෂණයා ගේ උපකාර -- විභීෂණයා රාජ්‍යයේ ද, රාජයා ගේ ද සියලු රහස් සතුරනට කීම.

4. දෙළොස් හවුරුදු යුද -- එක් එක් තන්හි දී සිය රටට එන ජය විභීෂණයා සතුරන් අතට යැවීම.

5. රාම රාවණ යුද්ධය -- රාවණයාට සත්‍යය හෙළි වී ආයුධ දමා රණ මැද සිනා සිසී සිටීම -- නිරායුධ වූවහු රාමයා විසින් මරනු ලැබීම.

6. විභීෂණයා රාමයා සමඟ අයෝධ්‍යාවට ගොස් රාම සේවායෙන් පසු ලඞ්කා රාජ්‍යය ලැබැ පැමිණීම.

7. රාමයා ගෙන් ලැබුණු දෙවි බව -- ලක් වැසියෝ ද ඔහු පුදති -- ස්කන්ද පූජා, විභීෂණ පූජා, විජය සම්භාවනා යන තුන් තින්දුව.

# වර්ණ්‍ය වස්තු

## 1. නගුට

1. මිනිසාට නැති අවයවයෙකි — විජය රජුට නම් වී නඩුවක් පමණ නගුටෙක් වී ල — මුත්තා ගෙන් ලැබුණෙකි — පළමු වැනි තිරිසන් ලකුණ සේ සැලැකේ — එ හෙයින් නුවණ මද වූවකුට එය ඇති සේ හැඟැවෙන සරදම් කැරේ.

2. ඒ නිරර්ථක නො වේ — තිරිසත්තු එයින් හොඳ වැඩ ගනිති — උන් ඉන් ගන්නා වැඩ මිනිස්සු වෙන නොයෙක් අයුරින් ගනිත්.

3. චාමරය — මැස්සන් එළැවීම — අශ්වයා, ගවයා ආදී සත්තු.

4. අවිය — පහර දීම — කිඹුලා, ගොයා, තල්මසා ආදී සත්තු — ගොනුස්සා ගේ විෂ අවිය.

5. කණ්ණය (සුක්කානම) — ගමන නිසි අතට හැරවීම — මත්ස්‍යයෝ.

6. දූත්වීම් ලකුණ — අනුනට අන්තරායය හැඟැවීම — සාවා — අන්තරායයක් ඇති විටැ හේ නගුටේ යටි පිට දක්වමින් දිවේ — සෙසු සාවෝ අන්තරායයක් ඇති බව එයින් දැනැ ගනිති.

7. සූචිය — සිතේ සැටි දැක්වීම — බල්ලා — අභිනන්දය දැක්වීමට කෙළින් කෙරේ — භය දැක්වීමට දෙ කකුල අස්සේ රූවයි.

8. අත — බැඳීම — ඇතැම් රිළවු — නගුට අත්තක වටා ඔතා බඳති.

## 2. මල

1. වෘක්ෂලතාදිය උත්පාදකත්වයට සුදුසු වයසට පැමිණි බව දක්වන ලකුණ යි — ඒ ශක්තිය ඇති තාක් මල් හදයි.

2. ලෝකයෙහි ඇති රමණීය වස්තූන් ගෙන් උසස් එකෙකි — වර්ණ භේදය ගන්ධ භේදය අනන්ත යැ — නෙත් කලු යැ — මලට නො කැමැති මනුෂ්‍යයකු ඇතැ යි නො සිතේ.

3. මල කුමක් නිසා එ තරම් වර්ණසම්පන්න වේ ද? එ තරම් ගන්ධසම්පන්න වේ ද? එ තරම් ප්‍රියඞ්කර වේ ද? — අනුන් අදනා සඳහා යැ — දක්ෂිනු මලේ වර්ණය බලා ඇදී අවුත් මී බොති — මලෙහි පරාග සුදුසු තන්හි හෙළා ගෙඩි ඉපැදවීමට වහල් වෙති — භෘඞ්ගයෝ මලේ සුවඳ ඇඟැරැ අවුත් මල් පැණි බී තුමු ද තෘප්ත වෙති — මලට ගෙඩි ඉපැදවීමට වහල් වෙති — පැණි උපදවා රටට ද වැඩ කෙරෙති.

4. ඇතැම් විටැ පිරිමි මල් ගැහැනු මල් යැ යි මල් දෙ වගෙකි — පිරිමි මලේ පරාග ගැහැනු මලට නො වැටුණ හොත් ගෙඩි නො හටී — භෘඞ්ගාදීහු පිරිමි මලෙකැ හිඳැ එහි පරාග පාදයෙහි තවරා ගෙනැ ගොස් ගැහැනු මලෙහි හෙළති.

5. සියලු මල් සුගන්ධවත් නො වේ — ඇතැම් මල් දුර්ගන්ධ යැ —එ සේ වනුයේ අනතුරය කරන්නට එන්නවුන් පලවනු සඳහා යැ.

6. ඇතැම් මල් උගුල් යැ — කුහර සහිත මෙ මල් ඇතුළට මැස්සන් වන් විට වැසේ — අසු වූ මැස්සෝ මලට අහර වෙත් — වික්ටෝරියා උයනෙහි මෙ බඳු මලෙක් වේ — 'මැසි උගුල' යනු නම යි.

7. බුදුන් දෙවියන් පිදීමට මල් ගනිත් — මගුල් ඉලවු දෙකට ද ගනිත් — මඟුලෙහි සොම්නස වැඩි කරන්නට යැ — ඉලව්වෙහි ශෝකය තුනී කරන්-නට යැ.

## 3. ගෙඩිය

1. වෘක්ෂලතාවන් ගේ ජීවිත ඵලය — තමන් වග බෝ කිරීම — බොහෝ වෘක්ෂලතාවෝ ගෙඩියෙන් එය කෙරෙති.

2. ගෙඩියේ ඇටය — එය රකින්නට කටු ලෙලි ආදිය — එය වඩවන්නට ලොඳ මිද දිය ආදිය.

3. ගෙඩියේ පැහැය — පැසෙන්නට පෙරැ එකෙකි — ඒ බෙහෙවින් කොළයේ පැහැයට සමාන යැ — ඇයි? — පැසුණු පසු අනෙක් පැහැයෙකි — ඇයි?

4. ගස් වැල් ලොව පුරා පැතිරියැ යුතු — ස්වභාව ධර්මය ඒ කෙරේ — ඒ ඒ වර්ගවලැ ගෙඩි බෝ වීම පැතිරීමට සුදුසු වන සේ හට ගනී.

5. පක්ෂීන් නිසා පැතිරෙන වර්ග — පක්ෂීන් ගේ නෙත් ඇදීමට පැහැවත් වේ — ඇතැ ඉන්නවුන් ඇදීමට සුවඳවත් වේ — ලොබ වැඩීමට රසවත් වේ — එයින් පැතිරීමට මඟ පෑදේ.

6. දියෙන් ගොස් පැතිරෙන වර්ග — දියේ පා වීමට සුදුසු ගෙඩිය — සැහැල්ලු ගන ලෙල්ලෙකි — තද කටුවෙකි — පොල්.

7. සුළඟින් යන වර්ග — ඇටය පියා සහිතය — ගෙඩිය පිපුරැ කලැ ඇටය සුළඟේ ගොස් වැටුණු තැනෙකැ පැළ වේ — වරා.

8. ඇතට විසි වන වගී — ගෙඩිය පැසුණු පසු තදින් පිපිරේ — පිපිරීම් වේගයෙන් ඇට ඇතට විසි වේ — එහි පැළ වේ — පතගි.

අ ිංඝ වගී — ලං වන්නවුන් ගේ ඇඟෙහි ඇලී යයි — හුණු තැනෙක පැළ වේ — තුත්තිරි.

## 4. පැණි කුරුළු කූඩුව

1. පැණි කුරුල්ලා — කුඩා ය — ඉංචි දෙක හමාරක් පමණ දිග — එක හමාරක් පමණ මහත — කුරුල්ලා ගේ පිටත් හිසත් දිලිසෙන කළු පැහැය කිරිල්ල ගේ දුඹුරු පැහැය — දෙ දෙනා ගේ ළය ළා කහ පැහැය — සිහින් තුඩ ඉංචි බාගයකට මඳක් වැඩි ය — මල් පැණි බොති — කුඩා පණුවන් මකුළුවන් අල්ලා කති.

2. කූඩුව තනන්නේ බිජු ලන කාලයට — මිනිස් වාසය-කට නුදුරු තැනෙක — ඇයි? (මිනිසුන් නිසා වන රැක්ම) — ගසෙක තැමුණු හිසින් අතු අගෙක — ඇයි? (වෙන සතෙකුට අවුත් ඉදැ ගත නො හැකි — එය බොහෝ පරීක්ෂා කොට තෝරා ගනිති — පැරැණි අත්තක් නො විය යුතු — ඇයි? — ළා මැ අත්තක් නො විය යුතු -- ඇයි? -- අගැ කොළ වටා ගැවැසී සිටිය යුතු — ඇයි?

3. කූඩුව තැනීමට ගෙනෙන දෑ — කෙඳි — රෙඩු — පුලුන් කෙඳි දෙකක් අත්තේ උඩු පැත්තේ තබා යටට නමා යම් කිසි ලෙසෙකින් රැඳැවීම — මීට දෙ දෙනා මැ හවුල් වෙති — එහෙත් බොහෝ වේලා යෙයි — පුළඟට හැලේ — එය රඳවා ගත් පසු කටයුතු ඉක්මනි — ක්‍රමයෙන් පහළට විහිදීම — කෙඳි කනු රිටි ආදිය මෙන් සිටී — රෙඩුයෙන් වසනු ලැබේ — ඇතුළේ පුලුන් සිනිඳු ඇතිරියක් වැ

සිටී — අත්තේ රුදැවූ තැන සිහිනි — ක්‍රමයෙන් මහත් වේ — පහළ වට වැ කෙළවර වේ — සියල්ල මැද මහත් වම්බටු ගෙඩියක් වැනි — ඉංචි පහක් පමණ උස — තවයක් පමණ වට — තුන් දිනෙකින් පමණ නිමැවේ.

4. කූඩුවේ කොටස් — පිහිට අත්තේ — වට, බිතු යැ — ඇතුලේ වට ගබඩාව යි — පැටවුන් දෙ දෙනෙකුටත් මවටත් පමණ යැ — තනන කලැ ඇතුළට වී ඇඟ ඒ අතැ මේ අතැ අඹරවමින් ඉඩ මහත් කෙරෙති — ඇතිරිය ඉතා සිනිඳු යැ — කූඩුව නිමැවූවාට පසු ද දින ගණනක් පුලුන් ගෙනවුත් එය ගත කෙරෙති — එක් පසෙකැ ඉහළ කොනේ දොරටුව — කුරුල්ලකුට පහසුයෙන් යා හැකි — ඊට ඉහළින් පෙණය (hood) — වැසි දිය වළක්වන පිණිසැ.

5 කූඩුව නිමැවූවාට පසු රැ කිරිල්ල කූඩුවේ — කුරුල්ලා අසලැ ගසෙකැ — බිජු ලන තෙක් මෙ සේ යැ — බිජු ලූවාට පසු කිරිල්ල රකී — අතරින් පතර කෑමට යේ.

## 5. පහන

1. ශිෂ්ටාචාරයේ පුරාණතම ලක්ෂණය — ශිෂ්ටාචාරය ආලෝකය යි — ආලෝකය නැති විටැ ඇති කිරීමේ උපක්‍රමය.

2 ගිනි ඉපැදවීම — ගලෙකින් ගලකට පහර — ගිනි පුපුරැ — එය ඇල්ලීමේ ගුරැ කම — පුලුන් තණ ආදිය — ගිනි ගල් — ගිනි උපදවන දඬු.

3. ගින්න පැවැත්වීමේ අපහසුව — දර වියදම අඩු කිරීමේ තැන — තෙල් සොයා ගැනීම — වැටිය — දඬු වැට පහන (විලක්කුව.) — දෙලොස් මසේ පහන ඇති වූ සැටි.

4. පහන් පූජාව — එය වැදගත් බවට පැමිණීම — ගිතෙල් — දැවිල් පහන් පූජාව.

5. තව ද වියදම් අඩු කිරීම — ප්‍රයෝජනය වැඩි කිරීම — ගිනි වායු (ගෑස්) — එහි පහසු අපහසු කම්.

6. තව ද පහසු කම් — විදුලිය — එහි උසස් බව — පහසු අපහසු කම්.

7. මී ලඟ අභිය කුමක් විය හැකි ද?

## 6. පන්දු කෙළිය

1. මෙ රටැ පන්දු කෙළිය — බුහු ගැසීම — ඒ නම ඇති වීමට හේතු.

2. පිටිය — දිග පළල — මතු පිට කෙබඳු විය යුතු ද? — ඇයි?

3. උපකරණ — පන්ද — කෙසේ සලසා ගනු ලබන්නෙක් ද? — ලක (ඉලක්කය) -- කොහි පිහිටුවනු ලැබේ ද?

4 දෙ පිල -- එක පිලේ කී දෙනෙක් ද? -- පිල් බෙදන අයුරු — පිල් නා (පක්‍ෂ නායකයෝ.)

5. කෙළිය -- කෙළුවෝ (ක්‍රීඩකයෝ) — දුහුම (හැරීම -- 'දුවා' යැ යි කියති ) -- කී ලෙසකින් එය විය හැකි ද? -- ජය -- එක්බිති පොරය.

6. විශෙෂ නියොග -- දඩ -- ජල්ලි -- එහි සුදුසු නුසුදුසු කම.

7. සමත් බව කෙසේ ඇති වේ ද? -- කය බස සිත යන තුන් තන්හි සුදුසු කම්.

8 එය හා සම වන්මන් කෙළි.

## 7. පීනීම

1. කවර කවර කරුණු නිසා විශෙෂයෙන් පුරුදු කළ යුත්තේ ද?

2. පුරුදු කිරීමට සුදුසු තැන් -- සුදුසු වයස -- සුදුසු වේලාව.

3. පටන් ගැන්ම -- දියුණුවට බාධා -- එය දුරු කැර ගන්නා අයුරු — පටන් ගත යුතු තැන් -- වර්තමාන පාඨශාලාවලැ පීනුම් පොකුණු -- එහි පහසුව.

4. වැව, ගඟ, මුහුද යන තන්හි පීනීම -- සුදුසු තැන් — නුසුදුසු තැන් -- සිහියේ තබා ගත යුතු කරුණු.

5. පීනීමේ විශෙෂ ක්‍රම -- දක්ෂ භාවය ඇති කැර ගන්නා අයුරු — පීනුම් පොර (තරඟ.)

6. පීනීමට සුදුසු අය -- නුසුදුසු අය -- පීනීමට කිසි විටෙකැ නො යා යුතු අය.

7. පුදුම පීනුම් -- ඉංගිරිසි ඔඩය සරසැ -- ශාන්ත ලවරංසු දිය ඇල්ල සරසැ.

## 8. බූමරංගය

1. කිමෙක් ද? — (සතුන් මරනු සඳහා යෙදෙන අවියෙකි.) කා ගේ ද? — (ඕසෙත්‍රලියාවේ ස්වදෙශිකයා ගේ)

2. තනනු ලබන්නේ ලීයෙනි — හැඩය (අඩ සඳ වැන්නැ.) — දෙ කොන් උල් යැ — මැද දෙසට ක්‍රමයෙන් මහත් වැ යෙයි

3. යෙදීම — අගින් යැවේ — මණ්ඩලාකාරයෙන් යේ — ඉතා දුර වදී — මහත් සතකු වුව ද හෙළයි.

4. විස්තර — කෑංගරුවා ඉදිරියේ දිවේ — වැද්ද බූමරංගය එක් පසෙකින් යවයි — වළල්ලෙකැ දිවෙන අසෙකු මෙන් ඒ වටා ගොස් දිවෙන සතා ගේ ඇළයෙහි වැදී කය තුළට යෙයි.

5. පුදුමය — ලක වැරැදුණ හොත් බූමරංගය හිමියා ළඟට පෙරළා පැමිණේ — අවියේ හැඩය ද එය යවන විශේෂ ක්‍රමය ද නිසා ඒ වන්නේ යැ.

## 9. තැටිය

1. කිමෙක් ද? — කුමක් සඳහා යෙදේ ද? — දැන් කවර නම යෙදේ ද?

2. උපත — පත්‍රය — එය යෙදුණු සැටි — එහි සුදුසු නුසුදුසු කම් — පහසු අපහසු කම්.

3. පාත්‍රය — නම් වූ සැටි — පළමුවෙන් තැනුණු සැටි — මැත් පාත්‍රය (මැටි පය) — ලෝහ පාත්‍රය — පහසු අපහසු කම්.

4. තැටිය — හැඩය — එය ඇති කිරීමට හේතු — මැටි තැටි — ලෝහෝ තැටි— පිත්තල තැටි — රන් තැටි — තැටියේ පහසු අපහසු කම්.

6. පහසු කම් වැඩි කිරීම — තැටිය පැතැලි කිරීම — කුමකට ද? — ගැඹුර අඩු වැඩි කිරීම — කුමකට ද? — පිඟාන.

7. පිඟන් මැටි — සොයා ගත් අයුරු — එයින් වූ වෙනස — ඒ නිසා අභාවිත බවට ගිය දේ.

## 10. කිරීම

1. ශිෂ්ටාචාරය සමඟ පැමිණියෙකි -- කුමක් සඳහා ද?

2. කිරීමේ උපකරණය -- තරාදිය -- එහි කොටස් -- එයින් කිරීම කරන සැටි.

3. කුරක්කන් තරාදිය -- වෙල්ලිය -- එය තනන හැටි -- එයින් කිරන හැටි -- එහි සුදුසු නුසුදුසු කම්.

4. සිංහල කිරුම් බර -- එයින් හැඟෙනුයේ කිමෙක් ද? වත්මන් කිරුම් බර -- එහි භෙද.

5. කිරුම් පහසුව -- දුනු තරාදිය -- එහි ප්‍රභෙද -- එහි බර දක්වන ඉද්ද -- අලියකු වුවත් මහ ලොරියක් වුවත් දුන් කිරිය හැකි බව.

6. ශාස්ත්‍ර වර්ධනය නිසා ඇති වූ පුදුම වෙනස් කම් -- ටොන් පනස් දහසෙකැ නැවක් කිරීම -- පොළොව කිරීම -- සූර්යයා කිරීම -- පරමාණුවක් කිරීම.

## 11. කුඹුර

1. කිමෙක් ද? -- කුමක් සඳහා කැරෙන්නෙක් ද? -- කෙසේ කැරෙන්නෙක් ද? -- වත්මන් නමෙක් (වෙල).

2. කුඹුරේ අවශ්‍ය ලක්ෂණ -- දිය රැඳැවීම -- දිය බැස්සීම -- කවර හෙයින් රැඳැවිය යුතු ද? -- කවර හෙයින් බැස්සිය යුතු ද?

3. මිටි නියර -- මඟ නියර -- දරඬ -- කමත.

4. ලියද්ද -- යාය -- අවට.

5. තැනි කුඹුරු -- කඳු කුඹුරු.

## 12. නඟුල

1. ආදියෙහි වැපිරීමට බිම සකස් කළ හැටි -- උලින් පස් පෙරළීම -- උදැල්ල -- කාරියේ අපහසුව.

2. හෙයියන් හවුල් කැර ගැනීම -- උලෙකැ ලියක් බැඳැ හෙයියන් ලවා ඇද්දීම -- අපහසුව.

3. නගුල සොයා ගැනීම -- එහි කොටස් -- එක් එක් කොටසේ ප්‍රයොජනය.

4. නගුල යෙදන සැටි -- හෙයියන් මාරුව.

5. අලුත් නගුල -- දුම් නගුල් -- විදු ලිය නගුල් -- හෙයියන් ගේ අවාසනාව.

---

## විචාර්ය වස්තු

**1. ‘පැනැ යන මුවන් දැකැ නො දමවු තෙළු පලා’**

1. දෘෂ්‍යාර්ථ — තෙළු පලා අතෙහි යැ — ඒ ගැනැ සැකයෙක් නැති — මුව මස් පලාවට වඩා මැනැවි — මුවෝ ද වනයෙහි වෙති — ලං වුව පැනැ යෙති — පැනැ යන මුවන් දැකැ, ‘මුන් අල්ලා ගනිමැ’ යි සිතියැ හැකි — එ සේ සිතා තෙළු පලා දැමියැ යුතු නො වේ — මුවා අල්ලා ගැනීම සැක සහිත බැවිනි.

2. තෙළු පලා දැමුව ද වරදක් නැති අවස්ථාව — මුව මස් ලැබුණු මැ විටෙකැ නම් එ සේ කළ හැකි යැ — මුව මස් ගැනැ සැකයක් නැති බැවිනි

3. ප්‍රතිපත්තිය — නිසැක දැය සැක දැයක් නිසා නො හළ යුතු යැ — පැල කඩන්නේ ගෙයක් තනා ගත්තාට පසු යැ — ගෙයක් තනමැ යි සිතා පැල කැඩුව හොත් වන්නේ මහත් විපතෙකි — ඇතැම් විටැ පැලත් නැති වැ ගෙයත් නැති වියැ හැකි.

4. සමාන න්‍යාය වාක්‍ය බොහෝ යැ — ‘විදු ලිය දැකැ හුළු නිවා තිබනු’ — ‘අතේ එක කුරුල්ලා පඳුරේ දහයකටත් වඩා වටී’ — ‘එ රට බතට වඩා මෙ රට කොස් හොඳ යැ.’

## 2. 'පිය දැක්මෙක් නැත නෙත් නැතත් සම යි'

1. සිතට දුකෙක් නො වේ නම් ඊට වැඩි වාසනාවෙක් නැත — සිතට දුක් හෝ සැප හෝ ඇතුළු කරන දොර පසෙකි – එකෙක් ඇස යි.

2. ඇස් දෙරින් සිතට දුක් යන්නේ කෙසේ ද? — සැප යන්නේ කෙසේ ද? — ඇස ලැබීමේ ඵලය කිමෙක් ද?

3. ඇසට කුමක් හමු වතොත් ද අප ගේ ප්‍රීතිය? — අපට ප්‍රීතිය ගෙනැ දෙන දැකුම නො ලැබෙන හොත් ලැබෙනුයේ කවර දැකුම් ද? — එයින් සිතට උපදනේ කිමෙක් ද?

4. අපට දුක් උපදවන දෙයක් වන හොත් අපි එයට කුමක් කරන්නට උත්සාහ කෙරෙමු ද? — නැති කරන්නට උත්සාහ නො කෙරෙමු ද? — ඇස අපට දුක් මැ උපදවා නම් අපට ප්‍රියයක් නො කෙරේ නම් ඒ ඇසින් කවර ඵලයෙක් ද?

5. මේ නයින් සිතා බලන කලැ අපට පිය දැක්මෙක් නො වේ — ඒ ඇස ඇතත් නැතත් සමාන යැ යි කියැ හැකි වේ — ඇස ඇතත් පිය දැකුමෙක් නැත — ඇස නැතත් පිය දැකුමෙක් නැත — ඉතින් ඇස ඇති වීමෙන් කවර වැඩෙක් ද?

6. තව ද දුරට තර්කණය ගෙනැ යත් හොත් —

'පිය දැක්මෙක් නැත නෙත් නැතොත් සැප යි'

යනු කියැ හැකි වේ — පිය දැක්මත් නැති නම් අපිය දැක්මත් නැති නම් ඇස ඇතත් නැතත් සම යි — එහෙත් පිය දැක්මත් නැති මැ අපිය දැකුම් මැ ඇති වත් හොත් ඇස නැති වීම සැපයෙක් නො වේ ද?

## 3. 'හැදෙන ගස දෙපෙත්තේ දී දැනෙයි'

1. බිජු වටක් හැප්සුණු කලැ පළමු මැ පෙති දෙකෙක් දෙ පසට ඇදේ — හැදෙන ගසෙක් ද නො හැදෙන ගසෙක් දැ යි ඒ අවධියේ මැ නුවණැත්තෝ කියති — ඇතැම් විටැ එය වැරැදි වියැ හැකි — එහෙත් බෙහෙවින් මැ නිවැරැදි වේ.

2 යහපත් මිනිසෙක් වේ ද? යහපත් ගැහැනියක් වේ ද යනු බිළිඳු කාලයේ දී මැ කියැ හැකි — බිළිඳු කාලයේ දැනැ ගැන්මට සිත නො බඳී නම් මෝඩයෙක් වේ — විනීත නො වේ නම් සැඩයෙක් වේ — තව ද දක්වන නුගුණ මතු කලැ දක්වයි.

3. හික්මැවීම බිළිඳු කලැ මැ පටන් ගත යුතු යි — උත්පත්ති ගුණය විපරීත වැ සිටිය ද දෙ ගුරුන් ගේත් ගුරුන් ගේත් උත්සාහය නිසි මඟැ යේ නම් දරුවා හොඳ අතට හරවා ගත හැකි වේ.

4 හැදෙන නො හැදෙන ගහ දෙපෙත්තේ දී දැනැ ගත් කලැ කුමක් කළ යුතු ද? — හැදෙන්න හදා නො හැදෙන්න නැසියැ යුතු නො වේ — නො හැදෙන්න වඩා සැලැකිල්ලෙන් බලා ගත යුතු යැ.

5. බිළිඳුට ද කළ යුත්තේ එ මැ යි — දුබල නම් නපුරැ නම් දුටු කලැ මඟ හැරැවීමට උපක්‍රම යෙදියැ යුතු — වැඩෙක් මැ වේ.

6 බොහෝ දරුවන් නො මඟ ව ඇදෙනුයේ වැඩි සිටියන් ගේ මෝඩ කම් නිසා යැ — බිළිඳු කෙළි දරුවකු කොටැ ගැනීම ඔවුන් ගේ සිරිත යි — බිළිඳු ගේ අනාගතය නො බලා තමන් ගේ වර්තමානය මැ බලා බිළිඳු නටවා තුමූ සතුටු වෙති — 'පසු වැ තැනියැ හැකි — දැන් මැ පිළිවන් ද?' යනු ඔවුන් ගේ කීම යි.

## 4. අඟේ ඉඳෑ කන කෑම

2. අඟ — කන — ආසන්නත්වය — අඟෙහි ඉඳීමේ පහසුව.

2. කපුටා බොහෝ විටැ සරකුන් ගේ අඟෙහි හිඳී — සරකා ඉවසයි — හිඳීමට ඉඩ දුන් බව ද නො සලකා කපුටා කන කයි — කොතරම් අසත්පුරුෂභාවයෙක් ද?

3. සරකා ගේ මෝඩ කම — කිතිතුල්ලන් ඇහිඳීම් ආදි ඇතැම් සාත්තු නිසා කපුටාට ඉඩ දේ — තුවාලයක් වුව හොත් එය සාරා කරන අවැඩ මෙනෙහි නො කෙරේ.

4. අසත්පුරුෂයාට ඉඩ නො දියැ යුතු යි — ඔහු ගේ බස් මිහිරි යැ — පළමු පළමු පැවැතුම් රසවක් යැ — උගුල අටවනුයේ හොඳට මැ ළං වන්නට ලැබුණු විටැ යැ.

5. නො රැවැටෙනු — මාළුවාට ඇම දෙයි — උගුලේ අහර ලති — අනර්ථයක් කිරීමට ළං වනු කැමැත්තේ පළමු හිතට හුරු දෑ කෙරේ — විශ්වාසය දිනා ගත් පසු අන්තරාය කෙරේ — අඟේ ඉඩ නො දෙනු — කන කනු එකාන්ත යි.

## 5. 'විද්දේ හාවාට, වැදුණේ පඳුරට'

1. මේ ඇතැම් විටැ සිදු වන්නෙකි — මැනීම හෝ වරදී — ලක (ඉලක්කය) හෝ සැලෙයි — පඳුරේ හාවාට විද්ද කලැ ඌට නො වැදුණ පඳුරට වදී.

2. කාදිම උද්දේශයෙකි — ඒ ඒ අය විසින් තමතමනට සුදුසු අන්දමින් වටහා ගත යුතු.

3. බොහෝ සතුරන් ඇත්තහු ඇසුරැ නො කළ මැනැවි — ඔහුට පහර දෙන්නට බලති — ඔහු මඟ හැරුණ තමාට වදී.

4. අන් කිසිවකු ගේ මරු කැපෙන්නට කියූ බසක් තමාට කියූ සේ නො ගන්නා — සිතාවට ලක් වීමට මෙයට වැඩි කරුණෙක් නැති — තමාට මැ කී සේ හැඟුණ ද නො එසේ යැ යි ගැන්ම තමා ගේ වාසියට සිටී.

5. තමා කරන දෑයක් නිසැක කොටැ නො වරදින සේ කරන්නා — එකක් සිතා ක්‍රියා කොටැ අනෙකක් සිදු වූ කලැ අසල්ලූ 'විද්දේ හාවාට වැදුණේ පඳුරට' යැ කියා සිනා සෙති.

6. අනුන් ගේ මරු කැපෙන බස් නො කියන්නා — එක් වන් මරු කිහිප දෙනකුට ඇති වියැ හැකි — නො මිතුරකුට කී බස මිතුරකුට වැදී මිතුරු කම් දෙදූරියැ හැකි — දුබලකුට ලක් කළ බස බලවතකුට වැදී ඔහු ගෙන් පහර ලැබියැ හැකි.

### 6. 'පෙරළුණු පිටට වඩා මේ පිට හොඳ යැ'

1. පෙරළු එකෙක් ඔරුවක් පැදි යැ — ඒ පෙරළිණ — පැදියේ පෙරළුණු ඔරු කඳැ පිටැ හිඳැ සිනා සිණ — 'පෙරළුණු පිටට වඩා මේ පිට හොඳ යැ' යි කී.

2. දෙ පිට කැපෙන න්‍යායයෙකි — තමා ගේ වාසියට යෙදියැ හැකි — අනුන් ගේ අවාසියට යෙදියැ හැකි — තෘප්තියේ ගුණ වැනීමට ගත හැකි.

3. යම් කිසිවක් කළ කලැ සිතුවාට ඉඳුරා වෙනස් එල ලැබුණ හොත් එය තමා ගේ වාසියට හරවා ගෙනැ මේ න්‍යායොක්තිය කියැ හැකි.

4. අනෙකකු එකක් සිතා කළ දෙයෙකින් නො සිතූ පරිදි අවැඩක් සිදු වූ කලැ ඔහුට පරිහාස මුඛයෙන් ද මෙය වැදූරියැ හැකි.

5. එකක් සිතා කොටැ අනෙකක් සිදු වූ කලැ එයින් හැකි තරම් වැඩ සලසා ගනිමින් තමා ගේ සන්තොෂය දක්වීමට මග සදා ගත හැකි.

## 7. 'ගිය ලූලා මහ එකා'

1. මස් වැද්දන් ගේ කියමනෙකි — අල්ලන මසුන් ගේ මහතින් නොතිත් වෙති — වඩවඩා මහත මසුන් මැ පතත් — අසු වූ මසුට වඩා ගැලැවී ගිය මසු මැ මහත් කොටැ සිතත්.

2. සතර උගත්තෝ ද ධන සපයන්නෝ ද කිසි කලෙකැ තෘප්තියට නො පැමිණියැ යුත්තෝ යැ — නූගත් සතර මැ වඩා මහත් යැ, වඩා අගනේ යැ — නො ඉපැයූ ධනය මැ වඩා මහත් යැ, වඩා අගනේ යැ — තවතවත් උත්සාහ කළ යුතු යැ.

3. දුන් අය ගේ කැරුම් මහත් කොටැ පෙරැ අය ගේ මැ කැරුම් උසස් කොටැ දක්වන්නවුනට ද මේ හොඳ හෙල්ලෙකි.

4. පසු බස්නා දිරිය ඇත්තවුනට මේ සඤ්ජීවනියෙකි — මෙය කල් බලා යෙදූ කලැ ඔහු අමුතු දිරිය ගනිත්.

5. ප්‍රත්‍යක්ෂය තිබියැ දී අප්‍රත්‍යක්ෂයෙහි එල්බැ වෙහෙසෙන්නහු ගේ මෝහය මෙයින් දුරු කළ හැකි — මුලා වූයේ ඇත්තට වඩා නැත්ත මහත් කොටැ සිතයි.

## 8. 'ගන්නේ සිල් ගහන්නේ ගල්'

1. කීම කිරීම යන දෙක මිනිසුන් ගේ තතු හොඳ හැටි හඳුන්වා දෙයි — විනිශ්චයයට මෙයින් එකෙක් පමණ නො වේ — දෙක මැ හොඳින් සසඳ බැලියැ යුතු — එ කලැ සතර වගෙකැ අය පෙනෙති.

2. කී ලෙසට වැඩියක් කරන්නෝ උත්තමයෝ — ඔවුන් ගේ කීම — කිරීම — වෙනස — එයට හේතු.

3. කී ලෙස මැ කරන්නෝ මධ්‍යමයෝ — ඔවුන් ගේ කීම — කිරීම — දෙක මැ සමාන යි— එසේ වීමට හේතු — ඔවුනට ප්‍රථම ස්ථානය නො දෙන්නේ ඇයි?

4. කීවාට අඩුවෙන් කරන්නෝ අධමයෝ — ඔවුන් ගේ කීම — කිරීම — දෙකේ වෙනස — එයට හේතු — ඇයි?

5. කී ලෙසට විරුද්ධ ලෙසක් කරන්නෝ — ඔවුනට කවර නමක් දියැ යුතු ද? — අමනුෂ්‍යයෝ? — ඒ සැටි කරන අමනුෂ්‍යයෝ යැ බොහෝ — එ හෙයින් ඒ නම මොවුනට දී අමනුෂ්‍යයනට නින්ද නො කළ යුතු — තිරශ්චීනයෝ? — ඔවුහු නො කියති — නො කියා මැ කරන දෑ කෙරෙති — එ හෙයින් කියූ ලෙස නො කළ හ යි උනට දොස් නො කියැ හැකි -- එ තරම් නිදොස් වූවත් ගේ නම මෙ තරම් සදොස් වුනට දුන් කලැ උනට නින්ද වේ — අනේ කවර නමක් දෙමු ද?

6. 'සිල් ගෙනැ ගල් ගසන්නෝ' යැ යි කියුව මදක් පිරිමැසේ — සිල් ගැනීම නම් නො කටයුත්තෙන් වැළැකෙන්නටත් කටයුත්තෙන් නො වැළැකෙන්නටත් ගිවිසුම් දීම යැ — ගල් ගැසීම නො කට යුත්තෙකි — සිල් ගෙනැ ඒ නො කටයුත්ත කරන්නේ කීමට විරුද්ධ වැ හැසිරෙන්නේ යැ.

## 9. වවුල් වත

1. 'දිනුම් පිලට හෝයියා!' — කෙළි බලන ඇතැම් අය ගේ සිරිතෙකි — ඔවුනට වුව මනා තමන් ගේ වාසිය — ඒ පිල දිනුවොත් ඔවුන් ඒ පිලට — මේ පිල දිනුවොත් මේ පිලට.

2. ඉතා පහත් ගතියෙකි — ස්ථිරත්වය ඉතා උතුම් මනුෂ්‍ය ධර්මයෙකි — උත්තම මනුෂ්‍යයෝ දිනුව ද උදම් නො වෙති — පැරැදිය ද දීන නො වෙති — දිවි ගිය ද සිය ලය එක් පසකට දී, එ පස පරදිනු බලා එය අනෙක් පසට නො හරවති.

3. මේ පිල් මාරුවෝ ජන සමාජයෙහි බෙහෙවින් ලැබෙත් — ඔවුන් බලන්නේ ඔවුන් ගේ මෑ බඩ යි — බඩට නො වරදින හැටියක් බලා කවර නීච කමක් වුව ද කෙරෙති — ඔවුන් හා හැසිරීම මහත් නින්දාවෙකි.

4. මෙ බදු මිනිසුනට වවුල් වත රක්නෝ යැ යි කියත් — පියාඹන හෙයින් වවුලා පක්ෂියෙකි — දරුවන් වදන හෙයින් කිරි පොවන හෙයින් මෘගයෙකි — වරක් පක්ෂි මෘග දෙ පක්ෂය අතරේ යුද්ධයෙක් වී ල — පක්ෂීන් ගේ පක්ෂයෙහි වූ වවුලා මෘගයනට ජය ලැබෙන්නා සේ බලා මෘග පක්ෂයට ගියේ ල — එක්බිති පක්ෂි පක්ෂයට ජය යන්නා සේ දැකැ පෙරළා පක්ෂි පක්ෂයට පැමිණියේ ල — 'ද්‍රොහියා' යැ යි පක්ෂීහු ඔහු නෙරැපූ හ — යළි මෘග පක්ෂයට වදනට බැලූ කලැ 'දෙගඩියා' යැ යි මෘගයෝ ද ඔහු පැලැවූ හ.

## 10. කිඹුල් කඳුළු

1. කිඹුලිය ගං ඉවුරේ පඳුරැ අස්සේ බිජු ලයි — බිජු පිපිරී පැටවුන් එළියට එන කාලය ඕ දන්නී යැ — එ කලැ බිජු ලූ තැනින් ගඟට බසින තැනැ දියට වී කට අයා ගෙනැ සිටී — එන එන පැටවා ඈය ගේ කටින් බඩට යේ.

2. පැටවුන් කිහිප දෙනකු එක් වර අව හොත් එකෙක් දෙන්නෙක් මව ගේ මරු කටින් බේරෙති — එ විටැ මව මහත් දුකට පැමිණේ.

3. ඇය ගේ දුක දුටුව හොත් තමනට ඇති ආදරය නිසා සොවිති යි දරුවන් සිතනු වියැ හැකි — එහෙත් ඇය සොවිනුයේ ඒ ගැලැවුණනුදු කටට යවා ගත නො හැකි වූ හෙයිනි — දුක් වීමට 'කඳුළු හෙළීම' යනු දු නමෙකි — එ හෙයින් එ වැනි ශොකයට 'කිඹුල් කඳුළු' යැ යි කියත්.

4. බොහෝ කුහක අසත්පුරුෂයෝ කිඹුල් කඳුළු හෙළත් — තුමූ මැ අනුනට උගුල් අටවත් — උන් නට කලැ, 'දුටු ද මගේ උගුල?' යි සැණකෙළිත් — උගුල වැරැදූ ගිය හොත් තමා ගේ උගුල බව නො හඟවා, 'අහෝ මෙබඳු අපරාධ කරන්නෝත් වෙත් ද?' යි කියා වලපිත් -- ඔවුන් ගේ කිඹුල් කඳුළුලට නො රැවැටියැ යුතු.

---

## විචාර්ය වස්තු

### 1. පොත ද? කෙත ද?

1. 'පොත' යනුයෙන් හැඟැවීම — ශාස්ත්‍රාද්ග්‍රහණය — නුවණ වැඩෙන මඟ — සිහිය වවන මඟ — ඇත්ත හෙළි කරන මඟ — අවශ්‍ය යැ — පිරිසුදු වනුයේ නුවණිනි.

2. 'කෙත' යනුයෙන් හැඟැවීම — ගොවි තැන — ආහාර ලැබෙන මඟ -- ධන සපයන මඟ -- අවශ්‍ය යි — ශරීරය නීරොග කෙරේ.

3. කිමෙක් වඩා අවශ්‍ය ද? කුමක් හැර කුමක් ගත යුතු ද? කෙත නැත එසින් මියැ යනු වෙයි – එ හෙයින් එය නො කළ හැකි මැ යි — පොත හරිමු ද?

4. මිනිසා ගේ ද තිරිසනා ගේ ද වෙනස — මිනිසා අහර ගනී — තිරිසනා අහර ගනී — දෙ දෙනා මැ එයට මග සලසා ගනිති — තිරිසනාට නුවණ වඩන මගෙක් නැති — මිනිසාට ඇති -- එය කළ නොත් මිනිසා ද තිරිසනෙකි — මිනිස් බව රකිතොත් එද නො කළ හැකි.

5. කිමෙක් ද කළ යුතු? -- මිශ්‍රණයෙකි -- අනුන් ගෙන් බත ලැබෙන කාලයෙහි වැඩියෙන් පොත ගත යුතු -- කෙත ද අමතක කළ යුතු — කෙතින් බත පමණක් නො වැ ශරීරයට ව්‍යායාමය ද ලැබේ -- නීරොග භාවයට ඒ අවශ්‍ය යි -- කෙතේ කටයුතු හොඳින් කිරීමට පොතින් ලැබියැ හැකි පිහිට මහත් වේ -- දැනැ කරනු -- දැනීමට පොත මහ වහලෙකි.

6. තමන් මැ සැපැයියැ යුතු කාලයෙහි වැඩියෙන් කෙත ගත යුතු -- පොත ද අමතක කළ යුතු -- කය සිත දෙක මැ ව්‍යායාමය පතයි -- කයට කෙත ව්‍යායාමය දෙයි -- සිතට පොත ව්‍යායාමය දෙයි -- කටයුතු අතරෙහි පොත විනොදය ද දෙයි.

7. විශෙෂඥයෝ -- ඔනු බෙහෙවින් පොත ගනිති — ඔවුන් ගේ විශෙෂඥ භාවයෙන් ලොවට වැඩ සලසා දියැ හැකි යැ -- ඔවුන් ගේ කාලය ද කෙතට ඇද්ද නොත් විශෙෂ පරීක්ෂණාදියෙන් ලොවට කළ හැකි සෙත මග හැරේ — අනුන් ගේ කෙත් ඔනුට පිහිට වියැ යුතු.

## 2. සිංහලයා ගේ වඳුරු ගතිය

1. ගැනීම, දැරීම, විමැසීම, යෙදීම යන සතර — නුවණ වැඩීමට මේ සතර මැ වුව මැනැවි — පොතෙකැ දුට ද කියනු ඇසුණ ද ගත යුතු — එය සිහියේ දැරියැ යුතු — නිකම් මැ නො හදහා විමැසියැ යුතු — හරි නම් ක්‍රියායෙහි යෙදියැ යුතු.

2. සිංහලයා ගේ පැවැත්ම මෙයට මඳක් වෙනසි — ඔහුට පිළිවන් කමෙක් නැත යනු ඔහු ගේ විශ්වාසය යි — පිටින් එන සියල්ල ඔහුට උසස් යැ — බලවත් තැනෙකින් අව වඩා මැ උසසි.

3. පුරාණ සියලු දේ ද සිංහලයා හදහයි — එහි වරදක් වියැ නො හැකි — විමැසීම පාපයෙකි — වරදක් කියුම මහත් මැ පාපයෙකි — විමසන්නහු හෙළා දකී.

4. ඇතැම් ගුරුවරු මේ නිහීන ස්වභාවයට රුකුල් දෙති — ගුරුත්වය රැකැ ගනු සඳහා යැ — බැලියැ යුත්තේ වර්ධනය යි — ගෝලයා ගුරුහුට වඩා උසස් වුව ගුරුහුට ප්‍රීතියක් වියැ යුතු — විමැසීම නැත්තේ කෙසේ උසස් වේ ද?

5. බාල කාලයෙහි මැ විමැසීමට රුකුලක් නො ලැබුණ හොත් ; ඒ නො පැමිණේ — එයින් ඇති වනුයේ කී සැටියක් අසා කළ සැටියක් එලෙස මැ කරන්නෙකි — උත්පාදක ශක්තියෙක් නො නැගේ — ජාතිය පහත් වේ.

6. සිංහලයා ගේ කැවුම — සිංහලයා ගේ ගැල — වෙන රටවලැ මෙ බඳු දෑ කවර තත්ත්වයෙකැ සිටී ද? — අපේ දෑ එ සේ නො වෙනස් වන්නේ ඇයි?

7. දුටු සැටියට මැ කරන්නෝ වදුරැ ජාතීහු යි — එ හෙයින් ඒ ගතියට 'වදුරැ ගතිය' යනු නම් — මේ ගතියට බෙහෙවින් මැ බුහුමන් කරන්නෝ සිංහලයෝ යැ.

## 8. යොධ වෘත්තියේ යොග්‍යත්වය

1. රට රැකීමේ යුතු කම — රට නො රැකී කලැ රට වැසියෝ සුඛිත මුදිත නො වෙති — කර්මාන්ත පිරිහේ — ධන නූපදී — ආහාර දුලබ වේ — භය රජ කම් කෙරේ — දිවියෙහි දු සැකය වෙයි.

2. රට රක්නෝ — යොධයෝ — රට වෙනුවෙන් සිය දිවි දු පුදන්නට සැරැසුණෝ — උසස් මැ වෘත්ති-යෙකි — උන් ගේ අගය සෙස්සෝ ඉදුරා නො දනිත්.

3. යොධ ගුණ — අභීතත්වය, වශ්‍යත්වය — නිර්දයත්වය, කාරුණිකත්වය -- ශක්තිය, ක්ෂමාව -- නාශකත්වය, රක්ෂකත්වය -- මෙ සේ අන්‍යොන්‍ය විරුද්ධ ගුණ යුගලයන් ගෙන් යුක්ත වූ යොධයා සියලු තන්හි යොග්‍ය වෙයි.

4. සියල්ලෝ මැ යොධ වෘත්තිය අභ්‍යාස කළ යුත්තෝ යැ — එයින්, ඇති දුර්ගුණ බැහැර වෙයි — නැති ගුණ ඇදී එයි — ලොක රක්ෂණයට මෙන් මැ ආත්ම රක්ෂණයට ද සුදුසු වෙයි.

5. විශෙෂයෙන් මැ සිංහලයා බලාත්කාරයෙන් යොධ වෘත්තියට පුරුදු කළ යුත්තේ යැ -- දීන ගති අත් හැරීමට උසස් ගුණ බෝ වීමට ඒ මඟෙකි -- දුසහ භාවය සපිර වනුයේ යොධ වෘත්තියට නො වැටුණු ජාතියට යැ.

## 4. සිංහල භාෂාව පවතී ද?

1. යමකුට අයත් වූවෙක් පවතී ද යනු ඔහු විසින් විනිශ්චය කළ යුතු — ඔහුට වුව මනා නම් ඒ පවතී — නුවුව මනා නම් නො පවතී.

2. සිංහලයාට වුව මනා නම් සිංහල භාෂාව නො පවතින්නට හේතු නැති — භාෂාව වත්තක් වැනි — ඇති දෙස් දුරු කළ යුතු — නැති දෙස් නො වැද්ද දියැ යුතු — ඇති ගුණ තර කළ යුතු — නැති ගුණ වැද්දියැ යුතු — සිංහලයා මේ සතර සම්‍යක්ප්‍රධානයෙහි නිරත වේ ද? — වේ නම් භාෂාව නො නසී — නො වේ නම් නසී.

3. නිදහසට වඩා වහල් කම උසස් කොටැ සලකන්නන් වැඩි වුව හොත් භාෂාවට තබා ජාතියට ද සරණෙක් නැති — මෙ රටැ බොහෝ අයට ස්වකීය දේ පහත් යැ — පරකීය දේ මැ උසස් යැ — මේ මහත් දුර්ගුණයක් දක්වයි.

4. සිංහලයෝ දෙ දෙනෙක් ඉංගිරිසියෙන් දොඩති — මේ කුමක් හඟවා ද? — නො ඉංගිරිසි වැ සිටැ ඉංගිරිසි බව හඟවන්නට තැත් කරන්නා ජාතියට නිඤුමෙකි — එ බන්දන් ගෙන් ජාතිය මැ නැසේ.

5. පුරාණ සිංහලයෝ පරකීය රජකුට ද වඩා ස්වකීය දාසයා ද උසස් කොටැ සැලැකූ හ — වර්තමාන සිංහලයෝ ස්වකීය මහොත්තමයකුට ද වඩා පරකීය දාසයා ද උසස් කොටැ සලකති — ස්වකීය භාෂාවට වඩා පරකීය භාෂාව උසස් කොටැ සැලැකීම පුදුමයෙක් ද?

6. ඉංගිරිසිය බෝ කළ යුතු යැ — සියලු පාසල්හි ඉංගිරිසිය දෙ වන බස කොටැ ඉගැන්වියැ යුතු — රජයේ බස වන හෙයින් ඒ අපට අවශ්‍ය යි — සුලභ වූ කලැ දුන් එයට පටවන බොරු අගය නැති වේ — සිංහලයේ අගය නඟී.

7. සිංහලයෙන් කුමක් වුව ද පැවැසියැ හැකි යැ — බොහෝ දෙනා ඉංගිරිසිය මැ දස දෙලොස් හවු-රුද්දක් ඉගෙනැ, මසක් දෙකක් උගත් සිංහලයෙන් අදහස් පැවැසියැ නො හැකි යැ යි වැලැපෙති — මුලාවේ මහත !

8. සිංහලයෙන් දෙඩීම ක්‍රමවත් කළ යුතු යැ — කාට කාටත් කටට ආ ලෙස දෙඩන්නට හැරීම භාෂාව ම්ලේච්ඡ බවට පමුණුවයි — පාඨශාලාවට රිසියේ නම් සතියෙන් භාෂාව කෙළින් කළ හැකි යැ.

## 5. නිකම් කම

1. දූත් ගිය ගිය අතැ නිකම් කම — එළියේ හිඟන්නෝ — නො හඟවා හිඟන්නෝ — බාගයට හිඟන්නෝ.

2. නිකම් කම වැඩීමට හේතු — ඉගැන්වීම නො මග යාම — උගත්තෝ නුවණ වඩන්නට නො වැ ජීවිකාව ලබන්නට උගනිති — උගන්වන්නෝ තමන් ගේ වෘත්තිය නිසා උගන්වති — නිකම්මූ බෝ වෙත්.

3. කර්මාන්තයට වඩා සේවාව උසස් කොටැ සැලැකීම — ඉඩම් අක්කර සතරක් පහක් ඇත්තේ ද එය නො වවා රුපියල් පසළොසකැ වැටුපක් පතයි — කලිසමක් අඳී — බඩ ගිනි විඳී — ඉඩම විකුණයි — හිඟන්නෙක් වේ.

4. වෙශයට ගෞරවය — කලිසම ඇඳි හිඟන්නා 'මහත්-මයා' — සළුව ඇඳි ධනවතා 'මිනිහා.'

5. ප්‍රතික්‍රියා — නුවණ සඳහා ඉගැනීම ඉගැන්වීම — සුදුසු විෂයෙහි දී නෛසර්ගික (ජන්ම) ශක්තිය විමැසීම — එයට රුකුල් දීම.

6. කර්මාන්තය සේවාවට වඩා උසස් කොට සැලකීම — සේවකයනට ගෙවන නො තරම් උසස් වැටුප් අඩු කිරීම — කර්මාන්තයට රුකුල් දීම.

7. උද්‍යෝගය ඇති කිරීම — එය කෙසේ කළ යුතු ද? — 'නිකම් නො කමි. මා නැති වැ බැරි වන ලෙසට මම සුදුස්සෙක් වෙමි. යම් කිසි එකෙකින් විශේෂ-දක්ෂයෙක් වෙමි' යන මෙ වැනි අධිෂ්ඨානයක් ඇති-කැර ගන්නට සැලැස්වීමෙනි.

## 6. පා සලේ පන්සලේ හික්මැවීම

1. 'පන්සලේ හික්මැවීම ඉතා මැනැවි' — 'අකුරු නිවැරදි ලෙස කියවන්නට පිළිවන් පන්සලේ උගත් අයට' — 'පැවැතුම් මනා ඔවුන් ගේ' — 'ඉගැන්වීම පන්සලට ඇරියැ යුතු යි' — මේ පන්සල් පක්ෂය කියන සැටි යි.

2. 'පන්සලේ උගත් අය පොත් පමණක් කියවති, ගණ-නක් නො සාදති, රූපයක් නො අඳිති, අත්තමක් නො කෙරෙති' — 'පොතේ මැ උගත් කමින් දූන් වැඩෙක් නො වේ' — මේ පාසල් පක්ෂය කියන සැටි.

3. දෙ පක්ෂයේ මැ කීමේ ඇත්ත ඇති විය හැකි — මධ්‍යස්ථ වැ විමැසියැ යුතු — කිමෙක් සත්‍ය ද? කිමෙක් අසත්‍ය ද? — ගිය කාලයෙහි කුමක් වුව ද මේ කාලයට එන කාලයට කිමෙක් සුදුසු ද?

4. ගිය කාලයෙහි වුව ද සියලු ඉගැනුම් පන්සලින් ලැබිණි ද? — කර්මාන්ත ඥනය යුද්ධ ශිල්පාදිය කොයින් ලැබිණි ද? — පන්සලින් නො ලැබුණු බවට සැක නැති.

5. එ ලොව මෙ ලොව දෙක මැ ආගමයට හැරුණු කාලයෙහි පත පොත ඉගැනීම පන්සලට මැ ඇරුණු හ යි සිතියැ හැකි — එහෙත් ඒ රටට හිත පිණිසැ වී ද? — සියලු සිත් ආගමයට හැරවුණු හෙයින් වූ දෑ — ජාතියේ ස්වාධීනත්වය නැති වීම — මෙසේ ඇතැමෙක් කියති — ඔවුන් ගේ මතයෙන් පරලොවැ ගැලැවිල්ල පන්සලින් — මෙ ලොවැ ගැලැවිල්ල බැහැරින්.

6. භාෂා පක්ෂයෙන් පාඨශාලාවලැ දුර්වලත්වය — ඇති වීමට හේතු — ප්‍රබලත්වයක් නො පැතීම — පාලකයෝ ද මවුපියෝ ද එය පතත් නම් මද කලෙකින් සියල්ල සරි යෙයි.

7. සසර කොට් කරන්නට වැර වඩන පන්සලට ඒ කාර්‍යයට අවසර දියැ යුතු — ඉගැන්වීම රජයේ යුතු කම යි — එය සුදුසු අයුරැ සැලැකියැ යුතු.

## 7. සිංහලය ස්වරාජ්‍යයට සුදුසු ද?

1. ස්වරාජ්‍යය නම් කිමෙක් ද? — රට ඇතුළතින් මැ රට රැජැයීම (ආංඩු කිරීම) — දැන් පවත්නේ කවර රාජ්‍යය ද? — ස්වාමි මතානුකූල රාජ්‍යය (රට අයත් වූවනට රිසියෙන පරිදි රැජැයීම.)

2. ස්වරාජ්‍යයට සුදුසු කම් — අභින්න - ප්‍රජත්වය (කෙසේ බෙදුණ ද එක ජන සමූහයක් ලෙස තමන් ගේ කටයුතු බලා ගන්නට කැමැති රට වැසියන් ඇති බව) — ධන ශක්තිය — පාලන ශක්තිය — රක්ෂණ ශක්තිය.

3. අභින්න - ප්‍රජත්වය ඇති වනුයේ රටෙකැ ඉතා වැඩි දෙන එකතු වීමෙකි—ටික දෙනකු විරුද්ධ වීම අභින්න-ප්‍රජත්වය නැති කරන්නේ ද?— විරුද්ධවාදීන් නැති ප්‍රජාවෙක් කිසි රටෙකැ වේ ද? — මේ අතින් සිංහලය ස්වරාජ්‍යයට සුදුසු ද? නුසුදුසු ද?

4. ධන ශක්තිය — රටේ කටයුතු නො අඩු වැ කරන්නට පමණ වන අය උපදී ද? — ඉසිලිය නො හැකි පරණ ණයෙක් වේ ද? — අය පක්‍ෂය ක්‍රමයෙන් නඟී ද? බසී ද? ළඟ අනාගතය කෙබඳු වන සැටි ද?

5. පාලන ශක්තිය — පාලනය පිළිබඳ පුරුද්ද — අතීතයෙන් ඒ සම්බන්ධ වැ හෙළි වුණු දෑ — වර්තමානයේ මැති ඇමැති ආදීන් ගේ ක්‍රියා මාර්ගය.

6. රක්‍ෂණ ශක්තිය — යොධ සේනාව — යොධයන් ගේ යොග්‍යායොග්‍යත්වය — සේනා වර්ධනයට ඇති පහසු අපහසු කම් — සමුද්‍ර රක්‍ෂණය — නාවික ශක්තියෙක් ඇත් ද? — නැත් නම් ඇති කැරැ ගත හැකි බවට ලකුණු පෙනේ ද?

7. නිර්ණය.

## 8. දෙශ සෙවාව

1. කිමෙක් ද? — පාලනය, සදාචාරය, ධන වර්ධනය, ශාස්ත්‍ර උන්නතිය යනාදි අතින් සිය රටේ දියුණුවට හේතු වන සේ පැවැත්ම.

2. දෙශ සෙවකයකු ගේ අවශ්‍ය ලක්‍ෂණ — ආත්ම පරිත්‍යාගය — කුහක නො වන බව — ශක්තිමත් බව.

3. ආත්ම පරිත්‍යාගය — වචනය මැ පමණ නො වේ — ක්‍රියාව ඇති විය යුතු මැ යි — දඹ දිවැ ගාන්ධි, නේරූ, චන්ද්‍ර භාෂ ආදීන් ගේ චරිත — සියලු උසස් දිවි පෙවෙත් හැරැ දමා ඇති වූ මහා ධනස්කන්ධය රටට පුදා දිවි දූ නො තකා පැවැත්ම — මෙ රටැ එ බඳු කී දෙනෙක් වෙත් ද?

4. අකුශලත්වය — කුශලත්වය බොහෝ දේශ සේවකයනට වැළැඳෙන රොගයෙකි — පිටින් ආත්ම පරිත්‍යාගය—ඇතුළතින් තමාට මැ ලාභයක් ලැබෙන සේ කටයුතු තැනීම — ස්වකීයයන් වඩන පරකීයයන් මඩින අදහසින් දේශ සේවාව කරන්නෝ — අනුන් ගෙන් වියදම් ලැබෙන තාක් මහාත්ම ගුණ දක්වන්නෝ.

5. ශක්තිමත් භාවය — කො තරම් ආත්ම පරිත්‍යාගය කළත් කො තරම් අකුශල වුවත් මැස්සෙක් මහ ගලක් පෙරළා ද? — ශක්තිය දේශ සේවායෙහි අත්‍යවශ්‍ය ලක්ෂණයෙකි — මානසික ශක්තිය යැ දේහ ශක්තිය යැ චරිත ශක්තිය යැ යි ශක්තිය ත්‍රිවිධ වේ — එක එක කො තරම් ඇති වියැ යුතු ද?

6. සැබෑ දේශ සේවකයනට ලැබෙන ඵල — නො නැසෙන කීර්තිය.

## 9. ආගම් භේදය

1. පුරාතනයෙහි කෙසේ වුව ද දැන් නම් මහා අඥ වූ කුශලයන් අතර පවතින්නෙකි — ජාතියකට මෙ තරම් අහිතකර වූ දෑයක් වෙන ඇති වියැ නො හැකි.

2. ආගමය නම් කිමෙක් ද? — එක් එක් පුද්ගලයාට වැටැහෙන සැටි යි — එ නිසා භේදයක් නුවුව මනා යැ — එක පවුලේ තුන් දෙනකුට මත තුනක් ඇති වියැ හැකි.

3. රස භේදය — එකෙක් මිහිර පතයි — එකෙක් කුළු රස පතයි — ඒ දෙදෙන විරුද්ධ වියැ යුතු ද? — මත භේදය ද එබඳු යැ — පර ලොව පිළිබඳ මත භේදය මෙ ලොවට හරස් නො වියැ යුතු.

4. එකකු ගේ රසයට අනෙකා ගෞරව කළ යුතු යැ — ගෙදරට එන අමුත්තන් කෙසේ සලකමු ද? — අපට ශක්තිය ඇත් නම් උන් රිසි අහර නො දෙමු ද?

5. එකකු ගේ හැදෑහිමට ද අනෙකා ගෞරව කළ යුතු යැ — ඔහු ගේ උසස් දිනයෙහි ඔහු ගේ සන්තොෂය වැඩීමට මොහු වහල් නො වියැ හැකි ද? — මොහුට ඔහු වහල් නො වියැ හැකි ද? — සාමයත් අන්‍යොන්‍ය ප්‍රීතියත් එයින් නො වැඩිනැ හැකි ද?

6. ආගම භේදය නිසා ගමේ රටේ භේද ඇති කරන්නෝ මහා මෝඩයෝ යැ — ආගම භේදය නිසා බඩ වඩන්නෝ කුමක් කියත් ද? — කුමක් කෙරෙත් ද? — ඇයි?

## 10. යොග්‍ය වෘත්තිය

1. කා හට වුව ද වෘත්තියක් වුව මැනැවි — කවර වෘත්තිය ද සුදුසු? — සියල්ලනට එක මැ වෘත්තිය? — ලොව නො පවතී.

2. කෙසේ තෝරා ගත යුතු ද? — ගුරු - දෙ - ගුරුන් ගේ යුතු කම් — කුඩා කාලයේ දරුවා විමැසීම — ඔහු ගේ යම් යම් පැවැතුම්වලින් ආත්ම ශක්තිය එළි වේ — ඒ මහැ යා යුතු — එයින් සුදුසු වෘත්තිය අසු වේ.

3. දෙ ගුරුන් ගේ මහත් වරද — තම තමා රිස්සන වෘත්තියක් දරුවාට පැවැරීම — රිසි උපදින්නේ කෙසේ ද? — නැයකු ගේ හෝ අසල් වැසියකු ගේ හෝ දරුවකු යම් කිසිවකට සමත් වී නම් එයට රිසි — 'මගේ පුතා ද, වෛද්‍යයකු කරමි' — 'නීතිඥයකු කරමි' — මෙයින් වන විපත්තිය — වඩුවකු වන්නට උපන් පුතා නීතිඥයකු කළ හොත් කිමෙක් වේ ද?

4. ගුරුන් ගේ මහත් වරද — සියල්ලන් එක සේ ඉගැන්වීම — දරුවන් ගේ ජන්ම ශක්තිය නො විමැසීම — එයින් වන මහත් අන්තරාය — නිකමුත් බෞ වීම — අළු යවැ අඟුර තුබුණු තැනැ මැ බලා තණ රොඩු ලා පිඹියැ යුතු — ගිනි දැල්වේ — අඟුර නැති තැනට කො තරම් පිඹිය ද වැඩෙක් නො වේ.

5. සිංහල පාඨශාලාවට යන වැඩි දෙනකු ගේ ඊසිය — ශික්ෂක වෘත්තිය — ඇයි? — දරුවන් අඳුරේ ලා ගෙනැ සිටීම — ඔවුනට පහසු උසස් ගරු බුහුමන් ලබන වෘත්තියක් සැටියට පෙනෙනුයේ ශික්ෂක වෘත්තිය පමණෙකි — මෙයට පිළියම්.

6. කර්මාන්තයට දක්වන අවමානය යොග්‍ය වෘත්තිය තෝරා ගැනීමට මහත් මැ බාධාව යි — කුමක් කළ යුතු ද?

---

## කල්ප්‍ය වස්තු

**සැලැකිය :** කල්ප්‍ය වස්තු වින්‍යාස කිරීම කල්ප්‍යත්වය නැසීමෙකි. වස්තු මාතෘකාව දුන් කලැ පබඳුවා (ප්‍රබන්ධකාරයා) විසින් මැ තමා ගේ උත්පාදකත්වය පළ කෙරෙමින් වින්‍යාසය කළ යුත්තේ යැ. නො එ සේ වුව කවර නම් කල්පනයෙක් ද? කවර නම් අභිනව නිර්මාණයෙක් ද?

මෙ රටැ නවීනයන් අතරෙහි පමණක් නො වැ ප්‍රවීණයන් අතරෙහි ද අතිශයින් විරල වූවෙක් නම් කල්පන ශක්තිය යි. අවිචාරයන් විසින් තමනට උත්පත්තියෙන් ඇති වූ ඒ ශක්තිය අන්ධ භක්තියෙන් මැඩී උදුරා දමන ලද්දේ යැ, දරුවන් කෙරෙනුදු උදුරා දමනු ලබන්නේ යැ. අහෝ!

අභිනව කථා නිෂ්පාදනය මෙහි අතිදුර්ලභය. කථාවක් කළ හොත් එහි මුල් ඉංගිරිසි කථාවෙකැ බැඳැ ඇති. පළමු කොටැ කථා කාරයා තමා වස්තුව ණයට නො ගත් බව හඟවන්නට තැත් කෙරෙයි. ගැලැවියැ නො හැකි පමණට මැ අසු වුව හොත්, 'ඒ වස්තුව මා ඇසුරු කළ බව සැබැයි. එහෙත් මේ එයට වඩා හොඳ කථාවෙකි' යනුවෙන් ස්වකීය ආටෝපය රක්නට බලයි.

පබඳුවකුට කල්පනය තරම් අවශ්‍ය වූ උත්කෘෂ්ට වූ රමණීය වූ අන්‍ය ශක්තියෙක් නැත්තේ යැ. එ හෙයින්, න්‍යාය විරෝධ වුව ද, විනෂ්ට වූ උත්පාදන ශක්තිය නැවැත නඟා ගැනීමට රුකුල් දෙනු සඳහා, කල්පිත වස්තු කිහිපයෙක් වින්‍යාස කොටැ දක්වනු ලැබේ. ශක්තිමත්හු, නන්දිමිත්‍රයා විජිතපුර ප්‍රාකාරයෙහි කණ්ඩුල මාර්ගය හැරැ තමා මැ කොටැ ගත් මාර්ගයෙන් නුවරට පිවිසියා සේ, මේ වින්‍යාස දුරු ලා තමන් විසින් මැ කොටැ ගත් වින්‍යාසයට අනුවැ පබඳිත් වා. අල්පශක්තීහු මෙය පිහිට කොටැ ගෙනැ එක් දෙ පබඳක් කොටැ, ඉක්බිති, 'අනුන් විසින් කල්පිත වස්තු අනුන් ගේ මැ යැ. ඇපි සොර කම් නො කරම්හ' යි දුපෙන්නට සැරැසෙත් වා.

### 1. අලුත් කතා

(සැලැකිය : වන්නියේ මහ ඇතකු පළමු මැ එ පෙදෙස මැදින් ගිය දුම් රියක් දැකැ, බා දිවැ ගොස්, සෙසු ඇතුනට එ පුවත කී සැටියට මේ පබඳ කරන්නේ යැ.)

1. මා උන් තැන — වේලාව (රෑ වියැ යුතු) — මා කෙරෙමින් සිටියේ කිමෙක් ද?

2. මට පළමු කොටැ මැ ඇසෙන්නට වූ ශබ්දය — ඒ ගැනැ මගේ හැඟීම — මදින් මද ශබ්දය පිළිබඳ වැ ඇති වූ වෙනස — එක්බිති පැනැ නැඟුණු මහ හූ හඬ.

3. මගේ සිත්හි ඇති වන්නට වූ වෙනස — පෙරැ කිසි කලෙකැ නුවූ හැඟීම් — සිනසිනා ඉන්නට ඉඩ නො ලැබීම — සතා පෙනෙන්නට මැ වීම.

4. මා නො දැනැ මැ මගේ පා මා ගෙනැ වන මැදට දිවීම — භයින් මා බැලූ සැටි.

5. සතාව වර්ණනය — පළමු කොටැ මැ පෙනුණු මහ ඇස — ඒ කොහි වී ද? — එහි පැහැය — ඇදී ගිය පසු පෙනුණු ඇස — ප්‍රමාණය — පැහැය — සතාවාගේ ප්‍රමාණය — පා ගණන — බඳ — පසෙකැ වූ මුව ගණන (කවුළු) — එයින් නිකුත් වූ එළිය.

6. ගමන — එයින් නැගෙන හඬ — හතිය — එහි හඬ — හති ලන කලැ හිස් මුදුනින් නිකුත් වන දේ — ගන වලා කුළු — දිළිසෙන තරු.

7. සතාවා ගැනැ හැඟීම — කිසි කලෙකැ නුදුටු සතාවෙකි — ප්‍රමාණයේ සැටියට දිනකට වුව මනා වියැ හැකි කෑම — කෙසේ වුව ද මේ වනය දුන් ඇතුනට භය සහිත බව — වෙන තැනක් සොයා ගත යුතු බව.

## 2. මත දෙළ පිරීම

1. කුරුල්ලන් දෙස බලා සිටීම — එයින් මට ඇති වූ හැඟීම් — පියා පත් ලැබීමට මගේ මහත් ආශාව.

2. දිනක් මගේ මත දෙළු පිරීම — පුදුමයෙකි — මගේ පියා පත් දෙක — එහි පමණ — පැහැය — හැකුළුණු කලැ හැඩය — විදහූ කලැ හැඩය.

3. මගේ ප්‍රීතිය — මට මා මැ මතක නැති වීම — අභිනව ජීවිතයට සුදුසු පරිදි ක්‍රියා කිරීම — පියා පත් විහිදේ — මම අහසේ.

4. අහෝ, දර්ශනය! — මුළු ලොව මට පහළින් — අපේ ගෙදර ළඟැ ගඟ — ගෙය — වත්ත — ගස් — එළ දෙන්නු — වසු පැටියෝ — මහ පාර — බස — මෝටර රිය — මට පෙනුණු සැටි.

5. තවත් ඉහළ නැගීම — ඈත මුහුද — වලා කුළක් මැදින් පියා හැඹීම — වලා කුළත් මට පහළ — තවත් කුරුල්ලෝ — උන් මට බා ඇතැ පියැඹූ සැටි.

6. වැස්ස — මගේ පියා පත් මතැ වැසි බිඳු වැටීම — එහි හඬ — පියා පත් තෙත් වන්නට වීම — බොහෝ තෙත වුව හොත් පියා හඹන්නට බැරි වේ දෝ හෝ යි මට භය — නැවැත කැදල්ලට යන්නට සිතීම.

7. කැදල්ලට පැමිණීම — කොහි ද මගේ පියා පත් — දෙ දසරුව අත ගා බැලීම — මගේ ශෝකය -- ඔරලෝසුවේ වැදුණු වේලාව.

## 8. මා මැරුණු සැටි

1. මගේ රෝගයට කළ පිළියම් නොපල වීම — අසාධ්‍යත්වයේ ලකුණු — නැදෑයන් ගේ මුහුණු — එයින් මා සිතට ගත් දේ.

2. මා සිත තතා ගැනීම — දැන් මරණය ළඟ යැ — මරණය අමාරු වේ ද? — මට මහත් වේදනා දැනේ ද?

3. මගේ නෑදෑයෝ — මගේ යාළුවෝ — පා සල — කෙළි සෙල්ලම් — මගේ පොත් -- මේ ගැනැ මගේ සිතිවිලි.

4. සියල්ල කෙසේ හරිම් ද? — කමෙක් නැ — කොතෙක් කල් සිටිය ද සියල්ල හැරියැ යුතු — පසු වැ හළ ද දැන් හළ ද හැරීම නියම යි — මරණ වේලාවෙහි දීන වීම නින්දුවෙකි — මම පිරිමියකු මෙන් මැරෙමි.

5. හැඬුම් ද ඇසිණි — මට ගණනකට නැති — දුන් බෙහෙත් පීමි — දුන් අහර ගතිමි — දැන් මගේ සිත නිසල යැ — ලෙඩේ අමාරු කම් ද නො දැනේ — සියල්ල රඳනුයේ සිත පිටැ යැ.

6. වරින් වර මට සිහිය ද නැති සේ යැ — දැන් අවසාන මොහොත ඉතා ළඟ යැ — හුස්ම දැන් එන්නේ යන්නේ අමාරුවෙනි — මම මැ මගේ අත් පා කෙළින් තබා ගතිමි — මැරුණු පසු ඉතිරියවුනට කරදර නො වන පිණිසැ — ඇස් පියා ගතිමි — මූව' තද කැර ගතිමි — හුස්ම නැවැතිණ — මම මැරුණෙමි.

7. කවුළුව අස්සෙන් ආ සිහිල් සුළඟ මා මරණයෙන් පිබිදැවී — පිටතැ සුළඟ සිනා සෙනු ඇසිණ — මම ද සිනා සිණිමි.

## 4. උපුල්වන් හමුව

1. උපුල්වන් දෙවියන් හමු වීමට බොහෝ කලක් මැ මට තුබූ ආශාව — අපේ රටේ දිළිඳු කම්, දුබල කම්, මෝඩ කම්, නපුරු කම් කියා දීමට — ලංකා රකින්නට උපුල්වන් දෙවියෝ පත් වූ හු ල — ඇයි නොරකින්නේ?

2. දිනක් මගේ ආශාව මුදුන් පැමිණි — දෙවියෝ මට පෙනුණාහ — මිණි ගිහිණි කිරුළ — රත් තලල් පට — රත් තෝඩු දෙක — ගෙළෙහි මුතු වැළ — ඇඟේ පැහැය — තොල් අතුල් පතුල් පැහැය — මියුර සංදේශ කාරයන් වැනූ සැටි සරි බව.

3. දෙවියන් ගේ සිතා — නිල් අහසේ සඳ කැලුම් — මට ආදරයෙන් දෙඩීම — දක්නට රිසි ඇති වීමට හෙතු විමැසීම.

4. මගේ පැවැසීම — රටේ දිළිඳු කම්, දුබල කම්, මෝඩ කම්, නපුරු කම් කීම — මෙ රටැ මිනිසුන් වනසන්නට ආ විජය කුමරුට පිහිට වීම — අපේ සතුරන් රැකීම — අප වැනැසීම.

5. උපුල්වනුන් ගේ තවත් සිතා — පැවැසීම — 'දෙවියෝ මිනිසුන් නො රකිති — මිනිස්සු දෙවියන් රකිති — මා විජය කුමරුට වහල් වූ සේ එතෙක් කියයි — විජය පරපුර වැනැසීමට පණ්ඩුකාභය කුමරුට වහල් වූ බව එකෙකුත් නො කියයි — ඔබ ගේ සතුරන් රකින සේ ඔබ කියති — ඔබ සතුරන් ගෙන් මේ තාක් රැකි සේ නො කියති.

6. 'දරුව, කවීහු දෙවියන් මවති — ඔවුන් ලවා තමන් රිසි රිසි දෑ කරවති — මිනිස්සු තමන් ගේ ක්‍රියා ගුණ-යෙන් නගිති — දෙවියනට පැසැසුම් දෙති — ක්‍රියා දෝෂයෙන් බසිති — දෙවියනට ගැරැහුම් දෙති — දෙවියෝ දෙක මැ ඉවසත් — කො තරම් හොඳ සත්තු ද?

7. 'ඇත්තක් කියමි — ඔබ කැමැති දෑයක් කරන්නැ — එය හරි යතොත් අප ගේ බලයෙනි — එය වරදි-තොත් ඔබ ගේ දොසිනි — ඉතින් දෙවියනට පැසැසුම් දී ඔබට මැ ගැරැහුම් තබා ගැනීම යි සුදුසු.'

8 උපුල්වනුන් ගේ මේ කීමෙන් මම පිබිදියෙමි — මගේ බොහෝ මෝඩ අදහස් අඳුරත් සමඟ ගිය වියැ.

### 5. බල්ලාට වල්ගය එපා වීම

1. බල්ලෙක් දිනක් කබර ගොයකුට පනී — වල්ගා පහර — යන්තම් බේරීම — ඌට ඇති වූ අදහස් — බල්ලකු හා පොරට වැදූ පසු කොත හරවා වල්ගා පහරක් දෙන්නට තැත් කෙරේ — ලජ්ජාව.

2. ගෝනෙක් වල්ගයෙන් මැස්සන් එලවයි — බල්ලා ගේ සිතිවිලි — මැස්සෙක් ඇඟ මතැ හිඳී — වල්ගයෙන් ඌ එලවන්නට වේ — මැස්සා සිනා සෙයි.

3. කුකුළෙක් වල්ගයෙන් පසු ඇඟ වසා ගෙනැ සිටී — බල්ලා ද එ සේ කරන්නට තැත් කෙරේ — කුමක් කළ ද ඇඟ නො වැසියැ හැකි යැ — ලජ්ජාවට පැමිණේ.

4. මිනිහෙක් තවත් එකකු ගේ වක් බව බලා 'බලු වල්ගය වාගේ යැ' යි කියයි — එය ඇසූ බල්ලාට වල්ගය නිසා මහත් දොම්නස් උපදී.

5. 'වෙන සතුන් ගේ වල්ගයෙන් වැඩ ඇත් — මගේ වල්ගයෙන් කළ හැක්කේ මගේ දුවීල නම් දක්වීම පමණ යි — මට එපා මේ වල්ගය.'

6. බල්ලා දෙවියන් යදී — දෙවියෝ බල්ලා ගේ සිතිවිලි මිනිසාට හෙළි කෙරේ — මිනිසා බල්ලා ගේ වල්ගය කපා දමයි.

### 6. මගේ මහලු වයස

1. කොපමණ හොඳ ද මහලු වීම — වැදගත් පෙනීම — බර ගමන — සුදු රවුල — ගැඹුරු කියුම්.

2. වයසට සැලැකිලි — ඇතියාටත් වඩා හගවන දනීම — හොඳක් දූයක් නැති තරම යි — සියලු තැනැ අවවාද, අවවාද, අවවාද.

3. මගේ මහලු වයස ඉක්මනට ආවොත් — හැම සභාවකට මැ යමි -- මූලාසනය මගේ — මගේ දේශනාව අසා ඉන්නා සැටි -- මගේ හර බර ඇති වචන -- සභාවේ සාධු නාද -- සෙසු මහල්ලන් ගේ ඊර්ෂ්‍යාව.

4. දත් කම හඟවන්නට එන තරුණයනට හොඳ පාඩම් — -- ඔවුන් දන්නා දෙයත් නො දන්නා හැටියට පෙන්වමි -- දෙ තුන් වරක් එ සේ කළ විටැ ඔහු බිය වෙති -- සියලු දෙය මගෙන් අසා බලා කරන්නට වෙති.

5. මඟුල් ගෙදරක් වුව හොත් එහි සිරිත් විරිත් කියා දෙන්නේ මම -- මම ටිකක් පසු වී යමි — එ තෙක් කළ සියලු දෙයට දොස් කියමි -- සියල්ල වෙනස් කරවමි — 'මා නැති කලෙකැ මොහු කෙසේ කටයුතු කෙරෙත් ද?' — මෙ සේ කියමින් මගේ තරම දන්වමි.

6 මගේ දූතමිති කම් නො ගෙනැ කටයුතු වරද්දා ගත් කලැ? -- එ දා තමා මගේ අගය දැනෙන්නේ — කිසිවක් නො කියා මම කොනකට වී සිටිමි — මගෙන් කමාව ඉල්ලන තෙක් ඒ දෙස වත් නො බලමි -- කමාව ඉල්ලුවා මැ මම නැගිට හොඳට උගුර පාදා පැයක් පමණ හොඳ දේශනාවක් කරමි — එයින් තමා මිනිසුන් ඉගෙනැ ගන්නේ.

7. සොලෝකයක් ගාථාවක් නැති වැ මම නො දොඩමි — මා සොලෝක කියන විටැ, වෙන අය අසා ගෙනැ ඉන්නා සැටි! -- මට කියැවෙන රෙඵ මහාප්‍රාණ! -- සොලෝකයක් දෙකක් කියා මම වට පිට බලා ඉගි කරමි.

8. මා ඉන්නා පුටුව ළඟ පුටුවෙකැ කිසිවෙක් නො ඉඳී — මට එ තරම් ගෞරව--රටේ ගැනු සියලු දෙනා මැ දරුවනට මා පෙන්නා කියාවි -- 'අන්න, අර වාගේ හැදෙන්නට ඕනැ' කියා.

## 7. මගේ යාළුවා රජ වීම

1. මගේ යාළුවා හරි පින් කද -- කේන්ද්‍රය බලන සියල්ලෝ මැ රජ යෝග තිබෙන බව කියත් -- ඔහු රජ වුණොත් මගෙත් වාසනාව.

2. දිනක් අපි දෙ දෙනා වික්ටෝරියා උයනට ගියමු --- එහි විසිතුරු බලමින් ඇවිද්දමු -- ලොකු පෙරහරක් -- පඤ්චාඞ්ග තූර්ය ඝෝෂය -- ඉදිරියෙහි සර්ව හස්ත්‍යාලඞ්කාර විභූෂිත හස්ති රාජයෙක් --- අපි නැවැතී බලා සිටියමු.

3. පෙරහර වික්ටෝරියා උයනට -- ඇතා වහවහා අප උන් තැනට ආයේ යැ — මගේ ළඟ ගැසෙන්නට වියැ — මගේ යහළුවා කෙළින් වී උදාර ලීලාව දක්වා එහනැ සිටියේ යැ.

4. ඇතා අවුත් මගේ යාළුවා ඉදිරියෙහි දණ නමා හොඬ බිමැ හෙළා සිටියේ යැ --- පෙරහරේ අං සර්වාභරණ විභූෂිත අමාත්‍යයෝ ද වැදැ සිටියෝ යැ --- 'මේ කිමෙක් ද?' --'දෙවයෙනි, මේ රටේ රජ කම ඔබට පැමිණියේ යැ.'

5. රන් හිණ -- එහින් මගේ යාළුවා මඞ්ගල හස්ති රාජයා පිටට නැගුණේ යැ -- මා දෙස ද බැලී යැ -- මම බිම බලා ගතිමි.

6. රජ මහ පෙරහර -- මඟුල් කෙළි -- රජ මාළිගයට පැමිණීම -- මුළු දා උත්සව -- ඉඩ ලැබුණු ලැබුණු විට රජ්ජුරුවන් මට දක්වූ කරුණාව.

7. අභිෂේකයට සැරසීම -- මට යන කල ගැනැ මගේ සිතිවිලි -- රජ්ජුරුවෝ කිසිවක් නො කියති -- එහෙත් මට මහ ඇමැති තනතුර ලැබෙනවාට සැක නැති -- මා විසින් ඒ තනතුරේ කටයුතු හොඳින් කළ යුතු.

## 8. අලියා පා සල් ගිය සැටි

1. ගෙදර දරුවන් පා සල් යනු දක්ම — උන් ගේ සැරසිලි — උන් ගෙනැ යන දෑ — උන් ගේ උදම්.

2. අලියා ද උන් සේ යන්නට කැමැති වෙයි — දිනක් ඔහු ගේ නො සන්සුන් කම — ගොවුවා දත් සේ ඔහු සන්සිඳුවන්නට තැත් කෙරේ — කැම දෙයි — බීම දෙයි — අකුස්ස පෙන්වයි — පලෙක් නැති.

3. අලියා ගොවුවා ගේ සරමක් ද බැනියමක් ද නිකම් ඇඟ මතැ ලා ගනී — දරුවකු ගේ ගල්ලැලි පොත් උදුරා ගනී — යයි — ගොවුවා ද පස්සෙන් වැටේ.

4. අලියා යයි, යයි, යයි — මඟැ මිනිස්සු බලා සිනා සෙති — දරුවෝ මඟැ හැරැ බලා සිටිති — ගොවුවා සිතිවිල්ලේ යයි.

5. අලියා පා සල දෙසට හැරේ — ගොවුවාට කාරණය මඳක් වැටැහේ — පා සල් දරුවෝ මිදුලේ රැස් වෙති — අලියා කෙළින් මැ මිදුලට යෙයි — ඇතැම් දරුවෝ පා සල තුළට වදිති — ඇතැම්හු ඈත් වී බලා සිටිති.

6. පා සල් දොරට යෙයි අලියා -- ඇතුළු වන්නට බලයි -- අාඃ, දොර කුඩා වැඩි යැ -- අලියා දොරින් සොඬ යවයි, හිස යවයි -- කඳ? -- ඒ නම් නො යයි.

7. අලියා ගොවුවා දෙස බලයි -- සොඬ හකුළුවා ගුරුතට ආචාර කෙරෙයි -- සියල්ලෝ මැ දුන් අලියා ගේ රිස්ස දනිති — එහෙත් ඔහුට පිහිට විය හැක්කෙක් නැති -- දරුවන් ගේ සිතා හඬ.

8. අන්තිමයේ දී අලියා ගල්ලෑලි පොත් පා සල තුළැ තබයි -- සරමත් බැනියමත් ගොවුවාට දේ — හැරේ — ගෙදර යේ.

## 9. මීයන් ගේ සිය රජය

1. මීයෝ එක් තැනෙකැ මුළු දෙති (රැස් වෙති.) — මූළුවේ (රැස් වීමේ) කටයුතු — සබා නා— සබා ලේකම් — දෙසුම්.

2. සබා නා කරුණු පහදා දේ — 'සතුරා — ඔහුට බිය — ඒ නිසා මැ ඉගැනීමක් නැ — කමාතානයක් නැ — දියුණුවක් නැ — සිය රජය නැ.'

3. 'එකකුට දහසක් යටත් වීම් — නිඤවෙකි — එකතු වුව හොත් එකා මැඩැ ලියැ හැකි — එකතු වවු, මීයෙනි' — 'එකතු වමූ එකතු වමූ' යි මූළුවේ මහ හඬ.

4. 'කුමක් කළ යුතු ද? — ආත්ම පූජාව කළ යුතු — දස දහසක් වෙනුයෙන් ආත්ම පූජාව කරන්නට සැරසෙන එකෙක් නො වේ ද? — නො වේ නම්, මීයෙනි, තොපි සිංහලයන් වැන්නෝ යැ' — 'මම ආත්ම පූජාව කෙරෙමි' — 'මම කෙරෙමි' යි හැම දෙසින් මහ හඬ.

5. 'සැරසෙවු — දස දහසක් කුමක් කෙරෙත් ද? — දහ-සක් කුමක් කෙරේත් ද? — සියක් සැරසෙවු — බළල් රුවක් කරවු — එය මතට පනිවු — එය දතින් සපවු — පුරුදු වවු.

6. 'එක්කිති බළලා සොයවු — සිය දෙන නො බා ඉදිරියට මැ යවු — හේ එනකු මරයි, දෙන්නකු මරයි, උඩත් පිරිසෙයින් දස දෙනකු මරයි — ඒ අවසරයෙහි සෙසු සියලු දෙන ඔහු ගේ ඇස සපවු, පා සපවු, සියලඟ සපවු — එක් දෙ මොහොතෙකැ දී බළලා මරු නින්දට වැටේ.

7. 'එවු ඉදිරියට කැමැති අය '— එක් වරැ දහස් ගණන් නැඟෙති — මූල් තැන ගන්නට සියල්ලෝ ඉදිරියට එති — පොරයෙකි — එකෙකුත් පසු නො බසී.

8. 'දරුවෙනි, දූත් මැ යවු බළලා සොයන්නට — සිය දෙනෙක් පෙළ ගැසෙවු — එකෙක් මූලට — කවරෙක් ඒ ද?' — සියල්ලෝ පසු බසිති — කවරෙක් ඒ ද? — එකෙකුත් නො ඒ.

9. 'දරුවෙනි, තොපි සිංහල මීයෝ — පෙර සිංහල මීයෝ නො වවු — අලුත් සිංහල මීයෝ.'

10. එකෙක් සබයෙන් නැඟී — 'බළලා නො වැ සිංහයා මරන්නට වුවත් සබාවක් තබතොත් මූල් අසුනට නම් මම එමි — මැරීමට යාමට නම් මදක් මැළිවෙමි.'

## 10. දිව්‍ය ලෝකය

1. ඇතා ගේ වලගෙහි එල්ලී දෙව් ලොව ගොස් පසු දිනැ ගෙදර පැමිණි ගමයා දෙව් ලොවැ සිරි වනයි.

2. ප්‍රාසාද — උස — දිග — පළල — දොර කවුළු — කොඹි උත්සව.

3. උයන් — කවර වීක්ටෝරියා උයන ද? — ගස් වැල් — මල් — මී මැස්සෝ — උන් ගේ පමණ — සමනලයෝ — කුරුල්ලෝ — උයනෙහි හැසිරෙන්නෝ.

4. පරසතු රුක — එහි පමණ — පඬුපුල් සලස්න — ශක්‍රයා — ඔහු ගේ මූහුණ බැලූ සැටි — ඔහු ගේ දෙසුම.

5. මාවත් — පලල — එළිය කළ සැටි — රථ වාහන — ශක්‍රයා ගේ විජයොත් රිය — අශ්වයෝ දහස් දෙන — දූත් නෑ — සියල්ල මෝටර රිය — ලොරි — බස.

6. දෙවියන් ගේ සෙල්ලම් — කඩුලු පන්දු (Cricket) — ඉනි තුනේ පමණ — පිත්තේ පමණ — පන්දේ පමණ — පා පන්දු — පන්දේ පමණ — තවත් නොයෙක් කෙළි.

7. රාත්‍රි විනොද — ජීවදර්ශන (Bioscope) — දක්වන්නෝ නර ලොවැ විගඩම් — ආපානාගාර — නෘත්‍යාගාර.

---

# 10. වින්‍යාසාභ්‍යාසය

## කථ්‍ය වස්තු මාතෘකා

### (1) වෘත්තාන්ත

1. මීයා මීයා මෑ වීම.
2. බළලා කඩු ඇසූ සැටි.
3. එළුවා බල්ලා වීම.
4. ඉතුරු නො වන්නට බාගයක් කෑම.
5. හඩ නැති හැඩ.
6. සැබෑ දයාවට දෙවියන් ගේ ත්‍යාගය.
7. යකා ගේ ගොරක දෙ පැල.
8. මූව හමට දඬුවම.
9. වතක වෙඩිල්ල.
10. සිවලා ගේ රජය.
11. කැකිල්ලේ රජය.
12. යුද්ධයටත් හොඳ කසය.
13. පඳුර සිවලා ලඟට ඒම.
14. දිවුම් පොරයෙන් දිනූ සැටි.
15. රිට්ටා දේවිය ගේ පිහිට.
16. නයි පොළොං දබරය.
17. දෙවියන් ගේ වරය.

( තව සිසතුත් අත් දෙකතුත් )

18. බැළලිය ගේ සිල්.
19. එළු දෙන ගේ කොටි මස් රිස්ස.
20. රන් යකඩ වීම.
21. ගඟ ගත් බිල්ල.
22. කිරිහන් පොල්ල.
23. මහ දූත මුත්තා අසු පිටින් යාම.
24. කිඹුලාට මඟුල් කතාව.
25. බූරුවා කිරීම.
26. සිංහ ඉදුබු පොරය.
27. කොටි කටුසු පොරය.
28. ඔටුවා ගේ ජීවිත පූජාව.
29. බළලාට නවා තැන් දීමේ විපාකය.
30. එක නුවණ.
31. මූරුංගා ගසින් පොහොසත් වීම.
32. බළලා පාන අල්ලා ගෙනැ සිටීම.
33. ගඟට ඉනි කැපූ සැටි.
34. ගමයා සිල් ගත් සැටි.
35. මසුරන් දහසේ නම.
36. නටවන වීණාව.
37. වරද කළ කකුල.
38. ඇඟිලි තොප්පි.
39. සතර පැනය.
40. හොඳ මී බැණා.
41. නූපන් මුණුපුරා ගේ මරණය.
42. කැටපතින් වෙන්නට ගිය විපත.
43. පණ පිටින් දෙව් ලොව ගිය සැටි.
44. පාත් කඩින් උණ.
45. අඹු – සැමියන් ගේ සමාන නුවණ.
46. ගසට නො ගොස් අඹ කෑ සැටි.
47. තිරිසනුන් ගේ ගිවිසීම.
48. අන්ධයන් ඇතා දුටු සැටි.
49. අන්ධයාට කිරි පැහැය කියා දීම.
50. පොතේ පණ්ඩිත කම.

## (2) ඉතිහාසය

1. ලංකාව බෞද්ධ වීම.
2. විජිත පුර යුද්ධය.
3. මාඝ උපප්ලවය.
4. අනුරාධ පුරය.
5. බෞද්ධ නිකාය භේදය.
6. ලක්දිවැ ක්‍රෛස්තව ධර්ම ප්‍රචාරය
7. විජිත පුර යුද්ධය.
8. ජයවර්ධනයේ ඉතිහාසය.
9. ගම්පළ රාජ්‍යය.
10. මහා බෝධි කථාව.
11. මෞර්‍ය වංශය.
12. සිංහල රාජාභිෂේකය.

13. දූති ගම් පුර රාජ්‍යය.
14. සන්දේශ පරම්පරාව.
15. පරංගි සමය.
16. ලංසි සමය.
17. විජයබා කොල්ලය.
18. කොළඹ කොටුවේ අඩස්සිය.
19. සිංහල කොල්ලය.
20. බැමිණිටියා සාය.
21. ජේත වන නිකායය.
22. පුරාතන ලංකාව දේශ හා කාල ගනු දෙනු.
23. ලඞ්කා නාම.
24. විජය ජන්ම භූමිය.
25. පණ්ඩුකාභය වංශය.
26. මෙහෙණවර වංශය.
27 රජ විරුද නාම.
28. ඌවේ කැරැල්ල.
29. 'රාජා හෝ මා හෝ සංඝා හෝ'
30. සොළී නරේ බඩ පිප්පීම.
31. නාග දිවයිණ දෙමළ වූ සැටි.
32. යාපා පටුන් විජය.
33. ආංශීවක්‍රවතී මදීනය.
34. චීන මායම.
35. ලක්දිව ශාස්ත්‍රයේ ස්වර්ණ යුගය.
36. ශාස්ත්‍ර පරිහාණිය.
37. අභය ගිරි නිකායය.
38. මහා මහෙන්ද්‍ර.
39. සිංහල අටුවා.
40. බලනේ සටන.
41. ලංකාව ඉංගිරිසීනට අයත් වූ සැටි.
42. කොළඹ ඉතිහාසය.
43. පොලොන්නරු ඉතිහාසය.
44. පණ්ඩුකාභය නගර පාලනය.
45. සිංහලාධිකරණය.
46. මුස්ලිම් කෝලාහලය.
47. මායාරට ඉතිහාසය.
48. විහාර දේවිය ගේ පිය පර පුර.
49. සෙංකඩගල ඉතිහාසය.
50. සෙංකඩගල සමයේ ශාස්ත්‍රය.

## (3) චරිත

1. ශ්‍රී ධර්මාරාම
2. මහාසෙන් රජ
3. ශාන්ත සාවියර
4. අරිට්ඨකී වෙංඩු
5. ස වැනි පැරැකුම්බා
6. බටුවන් තුඩුවේ දේව රක්ෂිත.
7. මිහිරි පැන්නේ ධර්මරත්න.
8. ගජබා රජ.

9. බුද්ධඝෝෂ.
10. අලගියවන්න මුකවෙටි
11. ජේම්ස් අල්විස්
12. ගජමන්
13. කැප්පෙටි පොළ
14. මාතර මහ ඉලංගක්කෝන් මුදලි
15. බරණ ඇදුරු
16. සපුමල් කුමර
17. ශ්‍රී වික්‍රම රාජ සිංහ
18. අත්තරගම රාජ ගුරු බණ්ඩාර
19. දි යෝගු සිල්වා
20. සිමන් කුරේ රාළ
21. අන්තෝනි බරෙත්තු
22. පත්තෑයමේ සමරජීව
23. කටුවානේ දිසානායක
24. බැදිගම රතනපාල
25. අඹගහ පිටියේ ඥානවිමල
26. සැම්සන් රාජපක්ෂ මුදලි
27. ද සොයිසා මුදලි
28. මාතර ධම්රත්න
29. තුඩාවේ පණ්ඩිත ගුණවර්ධන
30. කරතොට
31. බෝවල
32. කීර්ති සෙනාධිනාථ
33. අනවමදර්ශි
34. ශ්‍රී සඞ්ඝබෝධි
35. වලගම්බාහු
36. අනුලා
37 සඞ්ඝමිත්‍රා
38. ශ්‍රීමත් ජෝන් ඇන්ඩර්සන
39. ශ්‍රීමත් ජේම්ස් පීරිස්
40. ශ්‍රීමත් පොන්නම්බල රාමනාථ
41. ශ්‍රීමත් පොන්නම්බල අරුණාචල
42. උතුමන් කන්දේ සර්දියෙල්
43. තම්බි මුදලි
44. ශ්‍රීමත් ක්‍රිස්තෝපර උභයසේකර
45. මහගොඩ ශ්‍රී ඥානේශ්වර
46. කහවේ ශ්‍රී රතනසාර
47. සයිමන් ද සිල්වා වාසල මුදලි
48. ටිකිරි බංඩාර පාණබොක්කේ
49. පිළිමතලාව
50. ජෝන් තනාතියෙල් පෙරේරා වීරසේකර

## වාණිජ්‍ය වස්තු

1. ගොනා
2. දෙන
3. කුකුළා
4. අශ්වයා
5. බූරුවා
6. බල්ලා
7. කොටියා
8. වලසා
9. කබැල්ලෑවා
10. ඉත්තෑවා
11. ගෝනුස්සා
12. මකුළුවා
13. බමරා
14. ගෝණා
15. මූවා
16. උරුලෑවා
17. උණහපුළුවා
18. කෑරළපොත්තා
19. ගොයා
20. නයා
21. පොළොංගා
22. ගැරඬියා
23. සැල ලිහිණියා
24. ගිරවා
25. තාරාවා
26. පාත්තයා
27. කුහුඹුවා
28. කඩියා
29. දිමියා
30. කාවසියා
31. ලූලා
32. වෙක්කා
33. පොල්
34. තේ
35. කෝපි
36. වී
37. තිරිඟු
38. යව
39. මෑ
40. ඉරිඟු
41. තණ (ධාන්‍ය)
42. කොස්
43. කජු
44. අඹ
45. බෙලි
46. දිවුල්
47. ගොරකා
48. මිරිස්
49. ලුණු
50. දෙහි
51. දොඩම්
52. බංඩක්කා
53. තක්කාලි
54. මුරුංගා
55. කෙසෙල්
56. මීරන්
57. යකඩ
58. රිදී
59. තඹ
60. බෙලෙක්
61. පිත්තල
62. වානේ
63. විදුරු
64. වීදුරු
65. කපු
66. හණ
67. පට
68. ලොම් රෙදි
69. වඩු කම
70. රෙදි වියීම
71. උළු තැනීම
72. එඬේර කම
73. ගොවි කම
74. මුද්‍රණය

75. කඩදාසි
76. පුස් කොළ
77. පත් හිද
78. පෑන
79. පැන්සල
80. ගල් ලෑල්ල
81. තට්ටු පැනීම
82. කජු කෙළි
83. ගුළ කෙළිය
84. ලා ලී කෙළිය
85. කල්ලි
86. ගුඩු කෙළිය
87. චතුරංගය
88. රාජ විල් කෙළිය
89. පොර
90. කඩුව
91. දුන්න
92. පලිස
93. චක්‍රායුධය
94. කොත'ච්ඡ
95. අර්ධචන්ද්‍රය
96. පොරොව
97. කියත
98. කෙමන
99. අතංගුව
100. රු
101. අරක්කු
102. අකුර
103. නියන
104. ලියනය
105. යත්ත
106. යොත්ත
107. බත්
108. කැවුම්
109. හත් මාළු
110. තලප
111. කැද
112. අග්ගලා
113. රොටි
114. පාන්
115. පලා
116. පුසුල්
117. කැකිරි
118. දෙල්
119. කිරි
120. දී කිරි
121 පැණි
122. හකුරු
123. සීනි
124. දෙබර
125. වැව්
126. ගඟ
127. ඔරුව
128 නැව
129. ගැල
130. රිය
131. මෝටර රිය
132. දුම් රිය
133. ආකාශ යානය
134. සුසීයා
135. චන්ද්‍රයා
136. ඇමසනා නදිය
137. නයිල් නදිය
138. මිසිසිපි නදිය
139. සනත ලොරංසු නදිය
140. ගඞ්ගා නදිය
141. මහ වැලි ගඟ
142. පස් මහ විල
143. හිමාලයය
144. අලප්සය (Alps)
145. අන්දීසය (Andese)
146 සුවස් ඇළ
147. පැනමා ඇළ
148. මධ්‍ය ධරණී මුහුද
149. සහරා කාන්තාරය
150. නයගරා ඇල්ල

# විචාර්‍ය වස්තු

1. හිත ඇත් නම් පත කුඩා ද?
2. ලිහන මල්ල ඔබන්නේ කුමට ද?
3. ගහ දන්නා අයට කොළ පෑම.
4. ඉඟි කළ විටැ නො දැනේ නම් කෙළ මොහොලින් ඇන්න ද නො දැනේ.
5. අලියා වැහැරුණ ද ඕකාරගේ නැවියැ නො හැකි යි.
6. 'සිහි ඇති වැ මැ අසන — කී දැය යුහු වැ දැනැ ගෙන
   සිතින් තතු විමසන — මෙ බව සරි දැයි කියා දන්වන'
7. 'සැදැහැයේ ද මෙ සේ පල වෙයි දෙසෙක්'
8. 'කිරි දියෙනි දෙවියත් —
   අඟුරු සුදු වන කලෙක් නම් නැත්'
9. 'අඟින් කිරි දෙවියැ හැකි නො වේ'
10. 'සවනින් අසන බස — තුවනින් අසව යන ලෙස'
11. 'මල සිඳෙන පමණට — දවන රන් සේ ගිනි කොට'
12. 'සිඳු වඩ දිය නො වන — කලපුවැ දිය සිඳෙන මෙන'
13. 'අතු පතර කපමින — මොර කන්නවුන් විලසින'
14. 'අද අද යැ යි මරු පින් කැරැ ගන්නේ'
15. 'මාතර ඉපැදියැ යුතු, කළුතර හැදියැ යුතු'
16. 'පටවන්නා වැනි ලී බඩු මොරටුවට'
17. කපන්නට බැරි අත සිඹීම.
18. 'සෙවණැල්ලත් ඇදලූ අත් ඇරෙනා දීගේ'
19. 'නුපුරුදු දීගයට — පුරුදු කනවැන්දුම් යෙහෙකි මට'
20. කොකා මුහුදට දෙන් කීම.
21. බුලත් පයියට හෙණ ගැසූ කලැ කිල්ලෝටය බේරේ ද?
22. ගණේ ගිලැ පූ අලියාට අග්ගලාව මහ කජ්ජක් ද?
23. තරියාට ද බොක්ක සෝදන්නට දුන්නේ?
24. සොරු ගේ මව ගෙන් පේන ඇසීම.
25. බැරි සිල් නො ගනු.
26. තුවණ වැඩි නම් ඒ දංඩේ ද නො ගිය හැකි යි.
27. කණ කැස්බා විය සිදුරින් අහස දැකීම.

28. නො හැරෙන වෙද කමට කෝදුරු තෙල් හත් පට්ටය යි.
29. යකඩ බැඳි සළුවේ මල නො හැරෙයි.
30. 'උඹගු තද ගුණත් හට සැප නො තැනැ ඇති?'
31. වත්තට වැරදූ කෙ රුකෙක්?
32. 'සො දුරු කම් වුව හොත් සොදුරු යි පලත්'
33. 'වැටැහෙන්නේ නුවණේ අගේ දැනුයි'
34. රේන්ද කාරයා ගේ මල් බලිය.
35. 'වැටත් නියරත් ගොයම් කා නම් කාට පවසමු ඒ අමාරුව'
36. පරෙස්සමට තුබූ යකඩය ඇළියාවට සිටීම.
37. කැලේ මාරු වුණත් කොටියා ගේ පුල්ලි මාරු නො වේ.
38. 'මීගමු ගෙනැ ගියත් හිරමනය හිරමනේ'
39. අම්බලම කැඩුණාට ගව්ව කොට වේ ද?
40. 'කන කොක් සුද පෙනෙන්නේ ඉගිළුණු විටැ ලු'
41. 'ලබු වැල ගව්ව යි — ලබ්බ දෙ ගව්ව යි'
42. 'දුන්න දුනු ගොමුවේ — ඊතල කිතල ගොමු වේ
රාළ මී ගමු වේ — මූවකු ඇඬුවා සබර ගොමුවේ'
43. 'උඹරත් කැකුණ තලන විටැ හබත් කුකුළනට මඟුල්'
44. හිඟන්නාට කවර උණු බත් ද?
45. ගසින් වැටුණු මිනිසාට ගොනා ඇනීම.
46. බලු වල්ගය උණ පුරුකේ ලෑවත් ඇද නො යයි.
47. ලීයේ ඇදය අරින වැයේ ඇදය නො යයි.
48. උඹත් හකුරු යටින් කතුරු.
49. තම්බත් කපුරු හෑම් කට ගඳ ගසයි.
50. දඬුවමට ඉබ්බා දියේ දැමීම.
51. අඬන්නට සිටියහු ගේ ඇසට ඇඟිල්ලෙන් ඇනීම.
52. ගඟේ නෑවත් මූදේ නෑවත් කපුටා නම් කළු මැ යි.
53. බතට මාළු බඩ ගිනි යි.
54. බල්ලකු බිරුවාට කන්දක් මිටි නො වේ.
55. මූවා ගොයම කෑවේ, හමට තඩි.

# විචාර්ය වස්තු

1. පුරාණ පිරිමි ඇඳුම.
2. පුරාණ ගැහැනු ඇඳුම.
3. පුරාණ සිංහලයාගේ දින චර්යාව.
4. ඈත පෙර අකුරු කළ සැටි.
5. පුරාණ ආහාර වර්ග.
6. තුවක්කුව එන්නට පෙර යුද්ධය.
7. පුරාතන යුද ඇඳුම.
8. ලංකාව කවර හස්ත කර්මාන්තවලට සුදුසු ද?
9. පුරාතන වර්තමාන ස්වභාෂාධ්‍යාපන ක්‍රම.
10. පොරණ ලක් දිව පෙර දිගැ වී අටුව වී ලු.
11. කියවන පොත කටපාඩම් කිරීම.
12. දැන් සිංහලයාට සුදුසු ඇඳුම.
13. රාම සේතුව
14. ගෙ වතු වැවිල්ල.
15. ග්‍රාමීය අධ්‍යාපන ක්‍රමය.
16. ශාරීරික ප්‍රාගුණ්‍යය.
17. දරු සුරතල්.
18. සිංහල ආදරය.
19. පක්ෂපාතිත්වය.
20. ගුරු ගෞරවය.
21. අඬ හනතිය.
22. බලි තොවිල් ගුණ.
23. ස්වදෙශානුරාගය.
24. 'සිංහල' නාමය.
25. පෙර දිගැ වෙද කම.
26. දැන් පවත්නා දත් දුබල කම.
27. නගරය ද පිටිසර ද වාසයට වඩා හොඳ?
28. වැදගත් කම.
29. අප කෑම බීම ගන්නා සැටි.
30. ව්‍යායාම ප්‍රමාණය.
31. සිංහල හෝඩියේ අඩු වැඩි කම.
32. ඇති වියැ යුතු අකුරු ගණන.
33. ඉංගිරිසි හෝඩියේ විකාර.
34. සිංහලය ලොක භාෂාව වීමට සුදුසු ද?
35 ලොකයට එක මැ භාෂාවක් වුව මැනැවි ද?
36. යුද්ධය නො නැවැත්වියැ හැකි යැ.
37. ජීවිතයේ ඵලය.
38. ඇස යෙදියැ යුතු සැටි.
39. සිංහල නාටකය.
40. සම සමාජ ධර්මය.
41. ආගම හෙදය රාජ්‍ය තන්ත්‍රයෙකි.
42. රාජොපායය.

43. මරණ දණ්ඩනය.
44. සිංහලයේ අපරාධ වර්ධනය.
45. අපරාධ මර්දනය.
46. හිඟීම.
47. ණය ගැනීම.
48. ග්‍රාම පාලනය.
49. අපට සුදුසු කෙබඳු පාලනයෙක් ද?
50. ගුරු භක්තිය.

## කල්ප්‍ය වස්තු

1. කුවේණිය විජයයා ගෙන් වෙන් වන කලැ කළ දේශනාව
2. යම රජුට නරකය එපා වීම
3. ශක්‍රයා අට සිල් ගත් සැටි
4. සිංහ හස්ති සඞ්ග්‍රාමය
5 මට ලැබුණු දිව කන
6. ස්කන්ද වල්ලි විවාහය
7. (කැලණිතිස් දූ) දේවිය ගේ මුහුදු ගමන
8. මුහුද බත් වන දේවිය ගේ දේශනාව
9. පණ්ඩුකාභය කුමරු සෙනඟ යුද්ධයට මෙහෙයවමින් කළ දේශනාව
10. නෑයන් නො කැමැති සේ මහණ වන්නට යන්නකු ඔවුන් සැනැසීම
11. පාඨශාලාවෙන් අස් වැ යන ප්‍රධානාචාර්‍ය්‍ය වරයාට සුබ පැතුම
12. බල්ලා ගේ කැඳැවීමට හිවලා ගමට පැමිණීම
13. නිරිසනකුට හිර වූ ලොහො ගුළිය
14 නඟුල් උදලු වාදය
15. මා යළිත් බිළිඳකු වීම
16 මගේ පූජී ජීවිතය
17. බුදුන් කැලැණියට වැඩි දා මා දුටු සැටි
18. කතරගම උපුල්වන් හමුව
19. දිය බිඳෙකැ දිවි පෙවෙත
20. කුඹයෙකැ දිවි පෙවෙත

21. පිහාටු පැනේ වැලැපීම
22. කජු ගසෙකැ අත්තක් කඩා ගෙනැ මා හුණු හැටි
23. වේ වැලේ අහංකාරය
24. රිළවා තැන් පත් වන්නට බැලීම
25. මාළුවකු ගේ සීතල
26. සඳ බිම වැටීම
27. මා සඳට ගිය ගමන
28. මට ලැබුණු රුපියල් ලක්‍ෂය
29. අශ්වයාට අං දෙකක් ලැබීම
30. ගදුබුවා අශ්වයාට දුන් අවවාදය
31. හඳේ දිග නිවාඩුව
32. අධ්‍යාපනාමාත්‍යයා වූ විටැ මා කරන දේ
33. රාවණයා සිංහලයාට කරන අනුශාසනය
34. යම රජු ගේ කරදර
35. මා කැමැති ගෙය
36. බළලා පා සල් යාම
37. මා කැමැති ගම
38. මට රිසියෙන අලුත් යානය
39. බිජුව ඇතුළේ කුරුලු පැටියා ගේ හැඟීම්
40. හෙට මරනු ලබන සිර කරුවා ගේ අද හැඟීම
41. අහසින් යන පා වහන් යුවළ
42. ග්‍රහයන් අතරේ දබරය
43. අහසේ භවනය
44. අඟහරු ලෝකයෙන් මෙහි පැමිණි පිරිස
45. පොළොවේ මෙ පිටැ සිටැ අනිත් පිටට හරිමැදින් මගක් කැපීම
46. සමනළ ගල දඹ දිව යාම
47. දිනක් සූර්‍ය්‍යාට එන්නට මතක නැති වීම
48. යකකුට යකකු වැහීම
49. මිනිසාට තසි විස ලැබුණ හොත් පවතින හැටි
50. මීයන් ගේ මඟුල් මේසය

# 11. උත්කර්ෂාභ්‍යාසය

## (1) දෝෂාපහරණය

1. ප්‍රබන්ධ දෝෂ කෙතෙක් ද? එක එක හඳුන්වා නිදසුන් දෙන්නැ.

2. සිංහල ප්‍රබන්ධවලැ දූන් දූන් දෝෂ අධික වීමට හෙතු විමසන්නැ.

3 නිර්දෝෂත්වය පතන්නවුන් විසින් ගුරු කොටැ ගත යුතු ගද්‍ය පද්‍ය පොත් උසස් කමේ පිළිවෙළින් ලියා ලන්නැ.

4. පුරාණ වුව ද බෙහෙවින් ගුරු කමට නො ගත යුතු ගද්‍ය පද්‍ය පොත් සඳහන් කරන්නැ. කවර හෙයින් ඒ එක එක ගුරු කමට ගැනීම අන්තරායකර වේ ද?

5. සිංහල රචනයෙහි ලා දෝෂ නො සැලැකියැ යුතු යැ යි කියන්නෝ කවරහු ද? කවර හෙයින් ඔහු එ සේ කෙරෙත් ද?

6. ශබ්ද දෝෂ රචනා දෝෂ යැ යි දෙ වර්ගයක් වනුයේ කෙසේ ද?

7. අප්‍රසිද්ධත්ව දෝෂය දක්වන තැන් පසක් ලියා ඒ එක එක නිදෙස් කරන සැටි දක්වන්නැ.

8. අසිංහලත්ව දෝෂයට නිදර්ශන පහක් දෙන්නැ. ඒ දෝෂය දුරු කරන්නේ කෙසේ ද?

9. ග්‍රාම්‍යත්වය බෙහෙවින් ලැබෙනුයේ කෙබන්දන් ගේ පැබැඳුම්හි ද?

10. මේ තන්හි දෝෂයක් වේ නොහොත් එය කිමෙක් දැයි කියා නිදෙස් කරන සැටිත් සඳහන් කරනු මැනැවි :—

(අ) අනේ බෑන් අද උදේ සිටැ මගේ ඉසේ ඇම්ම යි.

(ආ) අද රේස්. පොකැට් එක එහෙම කොහොම ද ඔයි?

(ඇ) විෂ – පුවත්ජයකු අද මා දෂට කළා.
(ඈ) ගඳබ'ගනෝ මුනිඳුව මහ පුද කෙරෙති.
(ඉ) එය කාර්ත්ස්න්‍යයෙන් කවුරු කියත් ද?
(ඊ) අනෝ ගොයියෝ මේ පොටේ වැඩේ වරදිත්තා වාගෙයි.
(උ) ඔබ ආවේ බස් එකේ ද?
(ඌ) කුඹුවෙක් මඩෙහි ලගී.
(එ) පාවිත්‍ර්‍යය සැලැකියැ යුතු ගුණයෙකි.
(ඒ) මයිනා පඤ්ජරයේ නිශිදනය කෙරේ.
(ඔ) යුෂ්මතා කොහි යන්නෙහි ද?
(ඕ) අසමත් ශබ්ද වාච්‍ය තෙමේ ගෙදර යන්නෙමි.

11. අනනුරූපත්‍වය පෙනෙනුයේ කවර කාලයේ ප්‍රබන්ධවලැ ද?

12. අනනුරූපත්‍වයට බොහෝ නිදශීන සපයන පුරාණ ග්‍රන්ථයක් සඳහන් කරන්නැ.

13. අභින්නත්‍ව දෙෂයෙන් මිදීමට වාක්‍ය රචනයෙහි දී කුමක් සිහියේ තබා ගත යුතු ද?

14. ප්‍රධාන රචනා දෙෂ මගී උදාහරණත් සමග සඳහන් කරන්නැ. ඒ එක එක දෙෂයට ඒ නම සුදුසු බව ද පෙන්නා දෙන්නැ.

15. පුරාණ භාෂාවේ ද නවීන භාෂාවේ ද විරාමය විමැසුව මැනැවි.

16. නවීන ව්‍යවහාරයට සුදුසු විරාම ලක්ෂණ දක්වා එක එක යෙදියැ යුතු සැටි පෙන්වා දෙන්නැ.

17. පහතැ පෙනෙන වාක්‍යවලැ කවර දෙස් පෙනේ ද? කෙසේ නිදෙස් කළ යුතු ද?

(අ) ළමයා අද පාඩම් කෙළේ යැ. හේ ආහාර අනුභව කෙළේ යැ. හේ පොත් ගෙනැ පාඨශාලාව දෙසට සෙමෙන් ගමන් කෙළේ යැ
(ආ) හේ අද එන්නේ යැ. අපට මුදල් ද දෙයි.

(ඇ) මම උදේ නැගිට බත් කා බුදුන් වැඳැ මුහුණ සෝදා ගතිමි.

(ඈ) 'මිණි මුතු කොඳ කුමුදු
පැහැවතුරේ සබ සියල්
ගලම්හි මෙන් සසිනිඳු
දසනග ල සඳ කැල්මෙන්'
(මුවදෙව් දා)

(ඉ) මට හෝ මගේ පියා හට හෝ එය දියැ යුතු යැ.
(ඊ) මිනිහා දීර්ඝ සුසුමක් හෙළා නීල වර්ණ තණ ආස්තරණය උඩ සැතැපිණ.
(උ) පියා පුතා ද මා සමඟ ගිය යුතු යි.
(ඌ) මගේ ද ඔහු ද අත් කැපුණේ යැ.
(එ) ඔබ ගණන් පහක් වත් හැදුවේ නැ. දහයක් වත් හදන්නැ.
(ඒ) ඔහු ගේ පුත්තු ඉංගිරිසි උගනිති. දූන් විසින් සිංහල උගන්නා ලැබේ.

18. අර්ථ දෝෂ රචනා දෝෂයෙන් වෙන් කොටැ හැඳිනැ ගන්නේ කෙසේ ද?

19. ප්‍රධාන අර්ථ දෝෂ කවරේ ද? එක එකට නිදර්ශන දෙන්නැ.

20. මෙහි සඳහන් වාක්‍යවල කවර දෙස් පෙනේ ද? එක එක සඳහන් කොටැ නිදෙස් කරන්නැ.

(අ) නයා කො තරම් වේගයෙන් ඇදී ගියේ ද යත හොත් ඔහු ගේ පා ගැලැවෙන තරම් වියැ.
(ආ) ඒ බොහෝ දන ඇති නගරයෙකි.
(ඇ) සුදු සඳ රැස් කිරි දහර වැහෙන්නා සේ වී යැ.
(ඈ) රජ බිසොවට සැමියා රන් මාලයක් දුන්නේ යැ.
(ඉ) සූර්ය රශ්මියෙන් බබළන රාත්‍රියෙහි සොරු එළියට නො එත්.
(උ) ක්‍රෛස්තවයෝ අනාත්මවාදීහු යැ.
(ඌ) බුදුහු බ්‍රහ්මයා විසින් ලෝකය මැවිණැ යි දෙසූ හ.

(එ) ගායකයා නැහැයෙන් සින්දු කියා සභාව පිනැවී ය.

(ඒ) 'අස බමුණ ගම් වැසි —
මගැ රුදුණ අද තෝ නසී'
(කවි සේකර)

## රසාන්වෙෂණය

1. රස කීයෙක් ද? එක එකේ විශෙෂය කිම ? හැඳිනැ ගන්නේ කෙසේ ද?

2. පුරාතනයන් ශෘඞ්ගාර යැ යි කීයේ කවර රසයට ද? එය එ සේ මැ ගත් කලැ කවර අඩුවෙක් පෙනේ ද?

3. ශාන්තයෙහි රසයක් ඇති බව කෙසේ ඔප්පු කළ හැකි ද?

4. එක එක රසයට නිදර්ශන කොට වාක්‍යය බැගින් ලියන්නැ.

5. රෞද්‍ර, භයානක, බීභත්ස, යන තුන රස සේ ගැන්මට හේතු කිම?

## රීත්‍යනුගමනය

1. රීති කෙතෙක් ද? එක එකේ ලක්ෂණ කිම? උදාහරණ දෙන්නැ.

2. එක එක රීතියට සරි ලන පාඨ තුන බැගින් උම්මග්ග ජාතකයෙන් ද අත්තනගලු වංශයෙන් ද උපුටා දක්වන්නැ.

3. පද්‍ය ග්‍රන්ථවලැ කවර කවර රීති පැනේ ද? එ සේ වීමට හේතු කිම?

4. 94 වැනි පිටෙහි කොමල රීතියට නිදර්ශන කළ පාඨය (අ) ඝටිත රීතියෙන් ලියන්නැ, (ආ) මිශ්‍ර රීතියෙන් ලියන්නැ.

5 95 වැනි පිටෙහි ඝටිත රීතියට නිදර්ශන කළ පාඨය කොමල රීතියට නිදසුන් බවට සුදුසු කරන්නැ.

## අලඞ්කරණය

1. අලඞ්කාර කොතෙක් ද? කවර කවර ධර්මයන් සලකා එ සේ වගයන ලද ද?

2. ශබ්දාලඞ්කාරය විස්තර කරන්නැ. එහි භෙද කොතෙක් ද?

3. 'සුව පතමින් ඉදිත මා යහනතැ වැති ර
සුව දැල් කොසෙල් කැති තොබ එවූ ගිය ඉතිර
සුව දින් මෙදුන් ඔවදන් කැඩෙනුවට පෙ ර
සුව දත මා එ නො තබා කිවූ රස මිහි ර'

මෙහි ආදියෙහි පෙනෙන සාම්‍යය කවර නම් අලඞ්කාර-යෙක් ද? ග්‍රන්ථයෙහි ඒ දැක්විණි ද? නො දැක්විණි නම් කො තැනට එක් කළ යුතු ද?

4. සුළඟ මදින් මද හමයි
ලෙළ ලිය ළා දළු නමයි
මද පිපි මල් තුළට ද වැදූ
එන කලැ පිනි බිඳු තෙමයි

මෙහි පෙනෙනුයේ කෙ බඳු අනුප්‍රාසයෙක් ද? මෙයට කවර නම දියැ යුතු ද? මෙය නිසා ග්‍රන්ථයෙහි කවර කියමනක් වෙනස් කළ යුතු වේ ද?

5. ය, ව, හ, න්, සතර'කුරින් වන අන්ත්‍යානුප්‍රාසය කවර හෙයින් උපාන්ත්‍යානුප්‍රාසයක් පතා ද?

ද්විපාද උපාන්ත්‍යානුප්‍රාසය 'යමකන්' දෙෂ වළකතී යි. ඇතැමෙක් යෙති.

'අහිරික අනොතප ය
පවට විළි නැති නො බතු ය
නොසන්හුන් සිත නුය
දනුව උදහස් නමැයි සැබවය'

'පිළිවෙළිනුපද නෙන්
නො වේ ඉසුරු කරුනෙන්
සසර දුක් විසඳි න්
නිරොද නම් ඒ නිවනි සැපවන්'

යනු නිදර්ශන ද කෙරෙත්. විමැසුව මැනැවි.

7. ස්වරානුප්‍රාසය පහදා ලන්නැ.
8. වස්ත්වලඞ්කාර නම් කිම? කවර හෙයින් නම යෙදේ ද? පූරණ නම කිමෙක් ද?
9. වස්ත්වලඞ්කාරය පිළිබඳ ඇතැමුන් ගේ වැරැදි හැඟීම පහදා දෙන්නැ.
10. වස්ත්වලඞ්කාරයට සුදුසු නිදසුන් තුනක් බැහැරින් සැපැයුව මැනැවි.
11. විවරණාලඞ්කාරයට ඇතුළත් වනුයේ පුරාතනයන් වෙන් කොටැ ගත් කවර කවර අලඞ්කාර ද? 'විවරණ' නාමය ඒ එකාඑකට යෙදෙන අයුරු පැහැදුව මැනැවි.
12. 'ඒ මැණික එළියෙන් පහනක් වැන්නැ' — මෙය (අ) රූපක, (ආ) සන්දෙහ, (ඇ) භ්‍රාන්ති, (ඈ) අපහ්නුති, (ඉ) නිශ්චය, (ඊ) උත්ප්‍රෙක්ෂා, (උ) ව්‍යතිරෙක, යන මේ එක් එක් අලංකාරයට නිදසුන වන සේ වෙනස් කරන්නැ.
13. දෘෂ්ටාන්ත, නිගමන, නිදර්ශන, යන තුනේ භෙදය කිම? එක මැ නිදර්ශනය වෙනස් කොටැ දැක්වීමෙන් උත්තරය සනාථ කළ යුතු.
14. සංවරණාලඞ්කාර නම් කිම? එහි භෙද කෙතෙක් ද? එක එක හඳුන්වා නිදසුන් දෙන්නැ.
15. සඞ්ක්ෂෙපණය කී ලෙසකින් කළ හැකි ද? නිදර්ශන දියැ යුතු.
16. උපචාර භෙද නිදර්ශන සමඟ දැක් වියැ යුතු.
17. ඌන බව අලඞ්කාරයක් වනුයේ කෙසේ ද? එය දොෂයක් නො වන අයුරු පහදා දුන මැනැවි?
18. දීපක, සහොක්ති, විනොක්ති, සමාසොක්ති යන මේ එක එක කෙසේ සඞ්ක්ෂෙපණය කෙරේ ද?
19. පරිවර්තනය කී වැදෑරුම් ද? නිදර්ශන දෙන්නැ. නම කෙසේ සුදුසු වේ ද?
20. අතිශයනය විස්තර කොටැ නිදසුනෙකින් පැහැදිලි කළ මැනැවි.



